දිවයින
ඉරිදා සංග්‍රහය

ලිපි මාලාවක් ඇසුරින්

අතහැරීම 9

මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

ඉදිරිපත් කිරීම
ඉන්ද්‍රජිත් සුබසිංහ

මහ රහතුන් වැඩි
මඟ ඔස්සේ

අතහැරීම 9

ඉදිරිපත් කිරීම
ඉන්ද්‍රජිත් සුබසිංහ

දිවයින ඉරිදා සංග්‍රහයේ
ලිපි මාලාවක් ඇසුරිනි

© ඉන්ද්‍රජිත් සුබසිංහ

පළමුවන මුද්‍රණය - 2016 සැප්තැම්බර්
දෙවන මුද්‍රණය - 2016 සැප්තැම්බර්
තෙවන මුද්‍රණය - 2016 ඔක්තෝබර්
හතරවන මුද්‍රණය - 2016 නොවැම්බර්
පස්වන මුද්‍රණය - 2017 ජනවාරි

වෙබ් පිටුව:

www.maharahathunwedimagaosse.com
www.mrwo.lk

ISBN - 978-955-7887-17-3

පොත ලබාගත හැකි ස්ථාන :

දිවයින පුරා පොත් අලෙවිසැල්

විමසීම් -

දුරකථන: 0712199900
0112755768 (සතියේ දිනයන්හිදී පෙ.ව. 9.30 සිට ප.ව. 1.30 දක්වා)

ඡායාරූප
වාසල සේනාරත්න

මුද්‍රණය සහ බෙදාහැරීම
ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්
444/3B, පිටිපන දකුණ, හෝමාගම

(සෝයා තෙල් භාවිතයෙන් නිපදවනු ලැබූ, විෂ රහිත, පරිසර හිතකාමී තීන්ත භාවිතයෙන් මුද්‍රිත යි.)

මේ ලිපි මාලාව ලියූ ස්වාමීන් වහන්සේ මේ වන විට කොහි වැඩ සිටිනවා දැයි මම නො දනිමි. එහෙත් උන්වහන්සේ මේ පින්බිමේ කුමන හෝ ගැඹුරු වනගැබක අලි, කොටි, වලසුන් මැද ඒක විහාඬව දහම් සුව විඳිමින් සිටිතැයි මම විශ්වාස කරමි. මේ ඝෝර කටුක සංසාරයේ බිය දැක මේ ආත්මයේදී ම සසර =කින් එතෙරවීම අදිටන් කරගනිමින් ඍජුව නිවන් මඟේ ගමන් කළ උන්වහන්සේ ලබා ඇති මග ඵල ගැන කියන්නට තරම් මම සමතෙක් නො වෙමි. එහෙත් උන්වහන්සේ වැඩිය යුතු බවුන් වඩන උතුමකු බව කියන්නට මම නො පැකිළෙමි. තම අවබෝධය මෙන් ම අත්දැකීම් ද උන්වහන්සේ සතු වූ සටහන් පොත් කිහිපයක සංස්කරණය නො කළ සටහන් ලෙසින් මා අතට පත් කළ උන්වහන්සේ නො පෙනී ගියහ. එහෙත් ඒ සටහන් කෙතරම් දාර්ශනික ද, ගැඹුරු ද, ආශ්චර්යමත් ද, නිවන් ම'ට පිළිපන් ගිහි පැවිදි උභය පාර්ශ්වයට ම මෙය අගනා පූජාවක් වනු ඇතැයි මගේ පුහු=න් සිත කියයි. මේ සියල්ල ඔබ වෙත ඉදි%පත් වුව ද ඒවා ලියූ උන්වහන්සේගේ නාමය හෙළි නො කරන සේ කරන ලද ඇයැ=මක් ද විය. ක්තෲ අඥාත වුව ද මේ සියල්ල ඔබ හැමගේ යහපතට හේතු වනු නිසැක ය. ඒ නිසා ම මා ලද ඒ අතිශයින් අගනා දහම් පඬුර පොතක් ලෙසින් ඔබ අතට පත්කිඬිමට මට ඉඩ =න මැනවි!

(2012 වෙසක් පුන් පොහෝ දින)

මේ ඝෝර කටුක භයානක සංසාරයේ
සියදුක, මේ ආත්මභාවයේදීම
සසර දුකින් එතෙර වීමට
අධිෂ්ඨානය කරගන්න. වීර්ය වඩන්න.
මෙවා මග සොයා "දක්ෂ"
නිසි තුළදී උතුම්ම වචනයක්
මේ අනිත්‍ය ස්වභාවය
උපකාරයක්ම වේවා, ශක්තියක්ම වේවා
මාර්ගයක්ම වේවා
තම තමාම එළඹෙන සුමාර්ගයට
තම තමන්ගේ ජීවිත වලට ආලෝක ගන්නේවා.
අප්‍රම හෝ විහාරස්ථාන වලදී අනෙක්
ඔබ නොකළ වරදකට
ඔබ නොගැලපේ.
පුනරවර අනුකම්පා කෙරේවා
වරද නැතත් සමාවදී වෙය
නිවැරදි ලොව දකිනා.
මෙවන් සටහන් තැබූ ආර්යයන්වහන්සේ
ඔබ සුවපත් සැපවත් වේවා.
තම තමාටම පිහිට කොට ගන්නේවා.

(පින්වත් ඔබ වෙනුවෙන් මෙම සටහන් තැබූ භික්ෂූන් වහන්සේ විසින් ලියුවකි.)

'මහ රහතුන් වැඩි මඟ ඔස්සේ ' ලිපි මාලාව පින්වත් ඔබ වෙනුවෙන් පුදනු ලැබූ උන්වහන්සේ එදා ඒ සටහන් තබනු ලැබුවේ අප්‍රකටව ය. මහා ඝන වනන්තරයේ ඈත කුටියක සිට, සිතත්, පරිසරයත් සහමුලින් ම නිසල මොහොතක, ලොව ම නිදනා රාත්‍රියක, විටෙක රුස්ස ගස් අතරින් පෙරී එන ළහිරු කිරණ හෝ තවත් විටෙක ලන්තෑරුමේ දුප්පත් එළියේ පිහිටෙන් තැබූ ඒ සටහන් දිවයින සිසාරා සදහම් සුවඳ වී හමා ගියේ ය. ඒ සුවඳ හමන්නේ කොයි ඉසව්වෙන් දැයි සැදැහැති දනෝ විමසූහ. ඒ දහම් සුවඳින් හදවත සුවඳවත් කරගත් අයෙක් ඒ භාග්‍යවතුන් වහන්සේගේ ඒ දහම් සුවඳ පතුරුවාහළ බුදුපුතුන් දැකීමට ප්‍රාර්ථනා කළහ; සත්‍යක්‍රියා කළහ; තවමත් ගළපාගත නොහැකි දහම් ගැටලුවක් වේ නම් එය ඒ පින්වත් ස්වාමීන් වහන්සේගෙන් ම විමසා ගළපාගැනීමට උනන්දු වූ හ.

කාලයාගේ ඇවෑමෙන් ඒ ප්‍රාර්ථනා ඉටු විය. සටහනකින් ඔබ දුටු උන්වහන්සේව සියැසින් දැක ගැනීමට ඔබට හැකි විය. නැතිනම් ඔබට ඒ සඳහා හේතු තිබුණි. එතෙක් ඇසින් කියවූ දහම් ගැළපුම දෙසවනින් ඇසීම උදෙසා දසදහස් ගණනින් රැස් වූ හ. පිරිස කොතරම් උන්වහන්සේ වටා රැස් වුව ද, උන්වහන්සේ උන්වහන්සේගේ ස්වභාවයෙන් ම සිටි සේක. රැස් වන කඳු ගණන් පිරිකර ද, දහස් ගණන් පිරිවර ද ලෝකය වශයෙන් ම, මාරයා වශයෙන් ම දුටු සේක. ප්‍රශංසාවත්, සාධුකාරයත්, ගැරහුමත්, විවේචනයත් ධර්මයට ම ගැළපූහ.

වනයේ රුක්ෂ මණ්ඩලයක රැඳුණු හුදකලාව තමන් වහන්සේගේ විවේකය පිණිසත්, ගම නගරයේ සැකසුණු ධර්ම මණ්ඩපයක ඉල්ලීම ධර්මකාමී ජනතාවගේ පහසුව පිණිස කැපකිරීමක් ලෙසත් වස්කාලයෙන් වස්කාලය, උන්වහන්සේ ඉකුත් වසර කිහිපය ගෙවා දැමූහ. නමුත් උන්වහන්සේ අප සැම කෙරෙහි අනුකම්පාවෙන් අඛණ්ඩව ම ශ්‍රී සද්ධර්මය අප සැම වෙත දායාද කළ සේක. මේ එවැනි වූ තවත් උතුම් දහම් ගැළපුම් පෙළක එකතුවකි.

පිදුම

මේ අනන්ත වූ සංසාරයේ අප කරක් නො ගැසූ තැනක් වේ ද? අත් නො විඳි අත්දැකීමක් වෙද් ද? ඒ සා තැන්හි කරක්ගසා, ඒ සා අත්දැකීම් විඳ මෙලෙසින් තවත් උපතක් ලැබූ අපි මේ භව චක්‍රයේ තවත් කැරකෙමු ද? අප හැමදා ම කැරකුණේ එක ම තැනක් වටා ය; විඳගත්තේ ජාති, ජරා, ව්‍යාධි, මරණ වැනි එක ම අත්දැකීම් පෙළකි.

හිත හැරුණු අතේ, හිස හැරුණු අතේ යන්නන් වාලේ ගිය මේ ගමනේ වෙහෙස යනු 'දුක' යැයි කියාදුන්, ඒ දුකට සමුදීමේ ක්‍රමවේදය 'දුක අවබෝධ කිරීම' යැයි කියාදුන්, දුක අවබෝධ කිරීමේ උත්සාහයට වචනයකින් හෝ ආදර්ශයෙන් හෝ සවිය දෙන කල්‍යාණ මිත්‍රයෙක් යැයි කියන්නා වූ යමෙක් වෙත් ද, ඒ කල්‍යාණ මිත්‍රයා වෙනුවෙන් මෙය පුදමි.

ඉන්ද්‍රජිත්

පටුන

"ඔබ වහන්සේ රහත් වෙලා ද?" කියලා එක් භික්ෂුවක් ඇහුවා.	01
අවබෝධය යනු නිහඬතාවක් මිස සටන් පාඨයක් නො වේ.	06
ලෝකයේ ස්වභාවයෙන් ලෝකය තිබුණාදෙන්. පිංවත් ඔබ ලෝකය උපේක්ෂාවෙන් පිළිගන්න.	10
අනිත්‍යයත් අත්හැරීමත් යනු අන්තවාදයක් නො වේ.	15
විවෘත වූ දහමක කුමන ප්‍රශ්න ද? කුමන පිළිතුරු ද?	19
මේ ආත්මයේ පිංකම්වලින් පමණක් යැපෙන්නට හිතන්න එපා.	24
සිනහවක් දන් දෙන්න බැරි ඔබ සෝවාන් වීමට කලබල නො වන්න.	27
ධර්මයට වැරදි අර්ථකථන දෙන්නේ කෙලෙස්වල ගොරෝසුකමින් ම ය.	31
ඔබේ ඥාති පරම්පරාවේ සමූහ ඡායාරූපයක් හදාගන්න.	35
රහතන් වහන්සේ යනු දුවන ලෝකය තුළ නො දුවන චරිතයකි.	39
බැඳීමක් නැති ඇසුරක්......	43
කඳුළකට සවන් දී කඳුළු සාගරයක් නිවන්න.	47
දුර්වල වූ ශිල්පදය ගැන වැලපෙනු වෙනුවට....	51
කාවෙක් කියන කථාවක්....	56
අරටුව හඳුනාගන්න	60
සුළු දුකට ගැටී මහ දුකක් වැළඳගන්නා මෝඩකම (සියදිවි නසාගැනීම)	66

ඔබ යක්ෂයා ඉදිරියේ දෙවියෙක් ම වන්න. 69

දරුවාගේ පින අවදි කරවන්න - කඳුළු සාගරයක් දකින්න. 73

ඔබ මැරිමැරී උපදින්නේ මේ සසර බිය විශ්වාස නො කළ නිසා ම ය. 76

ඉසුරු සොයා යන්න ද කල්පනාව? බලන්න භික්ෂුවගේ සෞභාග්‍යය. 80

සැපයට අධිපති දුකේ මැවුම්කරු - ගෙන යයි ඔබ තව තැනකට නිරතුරු. 84

මම පැවිද්ද ඉල්ලුවේ මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගෙන්... 89

රහතන් වහන්සේලා, රහත් මෙහෙණින් වහන්සේලා සමඟම කාලය ගත කළෙමි. 93

'අභිගුණ්ඨික හාමුදුරුවො' කියන යෙදුම මට අපූරුවට ගැළපුණි. 95

චීවරය හෝදහෝදා මඩේ දැමීම නවතමු. 99

'තෙරුවන් සරණ මිස මට අන් සරණක් නැහැ'ය යන සිංහ නාදය කරන්න. 103

තෘෂ්ණාවෙන් තෙත් නොවුණු සතිය ම ය..... 107

සීලය ආස්වාදයේ ගොදුරක් නොවිය යුතු ය. 110

සීලය යනු සමාධියට සේන්දුවීමේ මාර්ගය පමණි. 112

මේවා ඇත්තේ විඳින්න, බැඳෙන්න නො ව, මිදෙන්න ය. 115

ඒවා ඒවායේ ස්වභාවයෙන් තිබුණා, භික්ෂුව භික්ෂුවගේ ස්වභාවයෙන් සිටියා. 118

අප කළ දෙය ම අප පසුපස එනවිට... 124

මහා කරුණාව යනු සතුන් සුරතල් කිරීමෙන් බොහෝ ඈතක ගිය දෙයකි. 127

රාග සිතකින් උපදින කල්පාන්තරයක දුක එක විදර්ශනා සිතකින් නිවා දමන්න. 131

දුවන මිනිසුන් අතර නවතින අතළොස්සට ඔබත් එකතුවෙන්න. 137

භාවනාවට ප්‍රවේශය

දකින්න, ශීලයෙන් භාවනාවට දෙන ජවය. 141

අවබෝධය උදෙසා හුස්ම රැල්ල යොදාගන්න. 146

මෙසේ දකින්න, පුද්ගල සංඥාවෙන් මිදෙන්න. 150

ඔබ දෙපය තබාගෙන සිටින්නේ ඔබේ ම යැයි සිතූ ශරීර මත ම නොවේ ද? 154

මරණය එන තුරු නො සිට මරණය දකින්න. 157

ධර්මය සරල පිළිතුරක් - එහි කොහිද ගැඹුරක්? 161

'ඔබ වහන්සේ රහත් වෙලා ද?' කියලා එක් භික්ෂුවක් ඇහුවා...

මේ වස්සාන කාලය. වස් තුන්මාසයෙන් හරි අඩක් ම ගෙවිලා ගිහිල්ලා. වේලාව පෙරවරු 10.30ට විතර ඇති. පරිසරය ම අඳුරු කරලා. වැසි වැටෙනවා. කුටිය ඇතුළ හොඳටෝ ම සීතලයි. කළුවර මැකෙන්න කුටියේ ඉටිපන්දමක් පත්තු කරලයි පිංවත් ඔබට මේ සටහන ලියන්නේ.

මේ දවස්වල ගම්මානයේ ගොවි මහත්වරු තම කුඹුරුවල බෝංචි වගා කරලා. පරිසරයේ වියළි කාලගුණය නැවතිලා. වැටෙන මේ වැස්ස ගොවි මහත්වරුන්ගේ බලාපොරොත්තු ශක්තිමත් කරනවා.

නමුත් බලාපොරොත්තු නැති හිස් ජීවිතයක් භික්ෂුව ඉදිරියේ තිබෙනවා. ඒ හිස් බව තුළ අපරාජිතභාවයකුත් තිබෙනවා. ඒත් එය බාහිර සමාජයට ප්‍රකට නැහැ. සමහර ගිහි පිංවතුන්ලා, සමහර ගෞරවනීය ස්වාමීන් වහන්සේලා භික්ෂුවට ඇවිත් කියනවා, "දායකයන් ආශ්‍රය කරන්න යන්න එපා. දායකයන්ගෙන් ඈත් වෙන්න. නගරයට යන්න එපා, කැලයේ ම වැඩසිටින්න. ධර්ම දේශනා කරන්න යන්න එපා, දන්න දෙය වුව සඟවාගෙන සිටීම නුවණට හුරුයි" කියලා. අවංකව ම ඒ අයට බයයි, මේ භික්ෂුවත් ඉහත දේවල්වලට ගිහිල්ලා පිරිහිලා යයි කියලා; සශ්‍රීක ගිහි දායක ඇසුරට වැටිලා පිරිහිලා යයි කියලා; ලැබෙන සිව්පසයට මංමුළාවෙලා වල්මත් වෙයි කියලා; ලැබෙන ප්‍රතිචාරයන්ට මත් වෙලා විකෘතියක් වෙයි කියලා.

ඊයේ කුටියට භික්ෂුව මුණගැසෙන්න තරුණ ස්වාමීන් වහන්සේ නමක් පැමිණියා. උන්වහන්සේ භික්ෂුවට ප්‍රකාශ කළේ 'ඔබ වහන්සේ දැන් ප්‍රසිද්ධයි' කියලා. එහෙම කියලා උන්වහන්සේ සිනාසුණා. ඒ සිනහව තුළ යම් යම් අර්ථයන් භික්ෂුව දැක්කා. එයින් ගම්‍ය වුණේ 'ඔබත් ප්‍රසිද්ධිය නිසා විනාශයට යනවා' කියන අර්ථයයි.

භික්ෂුව මේ සටහනේ මුල සඳහන් කළා භික්ෂුවට තිබෙන්නේ බලාපොරොත්තුවලින් හිස් වූ අපරාජිත ජීවිතයක් ය කියලා. අපි මේ උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ගමන් කරලා, ජීවිතය බලාපොරොත්තුවලින් හිස් කළාට පස්සේ, නැවත ජීවිතයට පුරවාගැනීමක් සිද්ධවෙන්නේ නැහැ. ඒ නිසයි භික්ෂුව අපරාජිතභාවය කියන වචනය පාවිච්චි කළේ.

භික්ෂුවක් උතුම් නිවන් මාර්ගයේ දී අපරාජිතභාවය ලබන්නේ දිනුමත්, පැරදුමත් දෙක ම පරාජයකොට දමලා; කඳුළුත්, සිනහවත්, උපේක්ෂාවත් තුන ම පරාජයකොට දමලා. මෙතැනට තමයි ලෝකෝත්තර සම්මා සතිය කියලා කියන්නේ. මේ සම්මා සතිය තුළ සකස්කොටගත් අපරාජිතභාවය නිරතුරුව ම පාර පෙන්වන්නේ ලෝකය ඉදිරියේ පළවෙනියෙක් වෙන්න නො වේ; ලෝකය ඉදිරියේ වීරයෙක් වෙන්න නො වේ; තවත් අසහාය චරිතයක් වෙන්න නො වේ; ලෝකයා ඉදිරියේ අන්තිමයා වෙන්න ම යි; ලෝකයා ඉදිරියේ දෙවැනියෙක් වෙන්න ම යි. මොකද, ඔහු සම්මා සතිය තුළින් ජීවිතයේ ඇලීමට අදාළ කුණුකන්දල්, ලාටු හිස්කරගත් කෙනෙක්. නිවන් මාර්ගයට පළිබෝධකයන් ලෙස දකිමින් ජීවිතයෙන් හිස්කොටගත් අපවිත්‍ර දෑ ඔහු නැවත ජීවිතයට පුරවාගන්නේ නැහැ. සම්මා සතිය කියන අර්ථයේ ශ්‍රේෂ්ඨභාවයයි ඔබ මේ දකින්නේ. ලෝකයේ උතුම් ම නිදහස උදෙසා නිවන් මාර්ගය අවහිර කරන, ලෝකයට බැඳෙන, ලෝකයට ඇලෙන සියලු ම අපද්‍රව්‍ය ජීවිතයෙන් හිස් කරනවා.

කල්ප සියක් කෝටි ප්‍රකෝටි ගණනක්, සම්මා සම්බුද්ධ ශාසන ලක්ෂ ගණනක් පසුකොට පැමිණි ගමනේ, තව ම අපට

ලෝකෝත්තර සම්මා සතිය කියන කාරණය සකස්කොටගන්න පුළුවන්කමක් ලැබිලා නැහැ. එම නිසා ධර්මය දකින ඇස වැසිලයි තිබෙන්නේ, විෂම අපද්‍රව්‍යවලින්. මේ අපද්‍රව්‍ය නිසා ම අපි ලෝකයට බයයි; ලෝකයාටත් බයයි. මොකද, ඔහු තාම පරාජිත චරිතයක්. අපරාජිත බවක් ජීවිතය තුළ නැහැ.

සාරිපුත්ත මහරහතන් වහන්සේ වරක් සිංහ නාදයක් කරනවා, මම හරියට සිඟමන් සොයා යන රොඩී රැළක රොඩී දරුවෙක් වගේ ය කියලා; හරක් රැළක ඉන්න අං කැඩුණු ගොනෙක් වගේ ය කියලා. උතුම් පැවිදි ජීවිතය කියන්නේ ලෝකය ඉදිරියේ පළවෙනියෙක් වෙන්න තියෙන කැමැත්ත පරාජයකොට දැමීමට යන ගමනක්. ඔහු ලෝකය තුළ දෙවැනියෙක් වුවත් පරාජිත ලෝකය හමුවේ අපරාජිත චරිතයක්. නිරතුරුව ම අපිව ලෝකය ඉදිරියේ පළවෙනියක් බවට පත්කරන්නේ අප විසින් ම පුරවාගත් බර නිසා. සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස කියන බර, කාම රාග පටිඝයන්ගේ බර, පංචඋපාදානස්කන්ධය නිත්‍ය යැයි කියන්නාවූ මෝහයේ බර නිසා අපි පුද්ගල සංඥාවට බැඳී යනවා. ගිහි ජීවිතය තුළ රූපයන් කෙරෙහි තෘෂ්ණාව නිසා ම, ඉහත බන්ධනයන්ට අපි කොටුවෙනවා වගේම පැවිදි ජීවිතයේ දී සීලය, සමාධිය, හුදෙකලාව, විවේකය කියන බැඳීම්වලට බැඳී යනවා. අපි තවම ලෝකෝත්තර සම්මා සතියෙන් පරිපූර්ණ නැතිනම්, ගිහි දායක බැඳීම්, සශ්‍රීක සිව්පසය, ලාභසත්කාර, කීර්ති ප්‍රශංසාවන් සර්පයන් හැටියටයි දැකිය යුත්තේ.

භික්ෂුව සාමණේර අවධියේ වැඩසිටි එක්තරා තුන් බිත්ති කුටියක, ලොකු හූනන් කිහිපදෙනෙක් නිතර ගැවසුණා. හූනන්ව කෑමට ප්‍රියකරන කුණකටුවා කියන සර්පයා මැටි බිත්ති දිගේ බඩගාමින් රාත්‍රියට හූනන් පසුපස හඹායනවා. ඒත් එදා භික්ෂුව එම කුණකටුවාට බිය වුණේ නැහැ. නමුත් එදා භික්ෂුව කුණකටුවාට වඩා දායක ඇසුරට, සශ්‍රීක සිව්පසයට, ලාභ සත්කාර, කීර්ති ප්‍රශංසාවලට බයවුණා. භික්ෂුවගේ පැවිදි ජීවිතයේ මුල් වසර හතර මනුෂ්‍ය සමාජය මගහැරලයි භික්ෂුව ජීවත් වුණේ. කාටවත්

ධර්මයක් දේශනා කළේ නැහැ. ඉහත ධර්මතාවයන් නිරතුරුව ම සර්පයන් වශයෙන් ම යි දැක්කේ.

නමුත් වර්තමානයේ භික්ෂුවට ඉහත ධර්මතාවයන් කෙරෙහි බියවීමට අවශ්‍ය නැහැ. ඒ වුණත් ඔබට බියක් දැනෙනවා. නමුත් භික්ෂුව බියෙන් මිදිලයි ජීවත්වෙන්නේ. භික්ෂුවට ඉහත කාරණය සපථ කිරීම උදෙසා ඔබට දෙන්න සහතිකයක් නැහැ. පිංවත් ඔබට දිය හැකි එක ම සහතිකය වෙන්නේ භික්ෂුව ආරක්ෂා කොටගත් උතුම් ප්‍රාතිමෝක්ෂ ශීලයයි.

එක පිංවත් භික්ෂූන් වහන්සේ නමක් ප්‍රශ්නයක් විමසුවා, "ඔබ වහන්සේ රහතන් වහන්සේ නමක් ද?" කියලා. භික්ෂුව එම ස්වාමීන් වහන්සේට ප්‍රකාශ කළේ, භික්ෂුව සටහන් තැබූ පොතපත තිබෙනවා, භික්ෂුව දේශනා කළ ධර්මය තිබෙනවා, පිංවත් ඔබ වහන්සේට මේවා පරිශීලනය කරලා කැමති තීරණයකට එන්න පුළුවන් කියලයි. භික්ෂුව සමාජය තුළ විවෘතව ජීවත්වෙන කෙනෙක්. එම නිසා භික්ෂුවගේ ශීලය, සමාධිය, ප්‍රඥාව කෙරෙහි චිත්‍රයක් ඔබට අවශ්‍ය නම් ඇඳගන්න පුළුවන්. එහෙම ඇඳගෙන කැමති තීරණයකට ඔබට එන්න පුළුවන්. ඔබේ තීරණය කුමක් වුවත් එය භික්ෂුවට අදාළ වෙන්නේ නැහැ. මොකද, භික්ෂුව ලෝකය ඉදිරියේ සිටින්නේ අන්තිමයා හැටියටයි.

හිස් කරපු ජීවිතයක්.... අපරාජිත චරිතයක්....

මේ ලස්සන වචන දෙක භික්ෂුවගේ ජීවිතයට හොඳින් ගැළපෙනවා. භික්ෂුව ඕනෑ ම ගිහිපැවිදි පිංවතෙකුට අවවාද කරන්නේ මාර්ග ඵලය ගැන සිතන්න එපා, ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ශක්තිමත්ව ගමන් කරනවා කියන කාරණය පමණක් සිතන්න කියලයි; මේ දුකෙන් නිදහස් වෙනවාය කියන කාරණය පමණක් සිතන්න කියලයි. මේ මාර්ග ඵල උන්මාදය කියන්නේ ලෝකය හිනස්සන, ධර්මයේ අර්ථය විකෘති කරන කෙලෙස් ගොඩක්. මාර ධර්මයන් විසින් වර්තමාන සමාජය තුළ උතුම්

අධිගමයන් හාස්‍යයට පත්කොට තිබෙනවා; විහිළුවක් බවට පත්කොට තිබෙනවා.

නමුත් මේ මොහොත සද්ධර්මයේ දීප්තිමත් ම මොහොතක්. බුදුරජාණන් වහන්සේ අද දවස එදා දිවැසින් දකින්න ඇති. ගෞතම සම්මා සම්බුද්ධ ශාසනයේ අවසාන අධිගමලාභීන් පහළවෙන මේ උතුම් වර්තමාන කාලය, අධිගමලාභීන් සිංහනාද පවත්වන යුගයයි; තරුණ, වීර්යවන්ත ස්වාමීන් වහන්සේලා හුදෙකලාව වනසෙනසුන් තුළ, පන්සල් ආරාම තුළ වීර්යවන්තව ආර්ය අෂ්ටාංගික මාර්ගය වඩන යුගයයි; ගිහි පිංවතුන්ලා ගිහි බැඳීම් තුළ සිටිමින් ම සතර අපායෙන් මිදීමට වීර්ය වඩන යුගයයි. එම නිසා බුදුරජාණන් වහන්සේ දවස යම් ධර්ම ශක්තියක් ලෝකය තුළ තිබුණා ද, වර්තමානයේ එම ධර්ම ශක්තිය ලෝකය තුළ මෝදුවී තිබෙනවා. මේ ගෞතම සම්මා සම්බුද්ධ ශාසනයේ මුල් ම රහතන් වහන්සේ කොණ්ඩඤ්ඤ මහ රහතන් වහන්සේ වගේ ම, මේ ශාසනයේ අවසාන මහරහතන් වහන්සේ වීමට ඔබට සුදුසු කාලය දැන් පැමිණ තිබෙනවා.

අවබෝධය යනු නිහඬතාවක් මිස සටන් පාඨයක් නො වේ

පිංවත් ඔබ ආර්ය අෂ්ටාංගික මාර්ගය උදෙසා ජීවිතය මරණයට දමලා බුදුරජාණන් වහන්සේව දකින්න. බුදුරජාණන් වහන්සේ දකිද්දී නැවත ඔබට ජීවිතය ලැබෙනවා. එම නිසා මේ උතුම් වර්තමානය අහිමි කරගන්න එපා. මේ උතුම් ධර්ම ශක්තිය බිඳින්න, අවසන් කර දක්වන්න මාර ධර්මයන් තදින් ම ක්‍රියාත්මක වෙනවා. ධර්මධර විනයධර ස්වාමීන් වහන්සේලා සශ්‍රීක සිව්පසයට, ලාභසත්කාර, කීර්ති ප්‍රශංසාවලට කොටු කර, විනාශ කර ඔවුන් ලවා විකෘති ධර්මයන් දේශනා කරනවා; උතුම් අධිගමනයන් හාස්‍යයට ලක්කරනවා; මන්ද බුද්ධික අධිගමලාභීන් බිහිකරනවා. මාරයාගේ මේ ක්‍රියාවලිය සමාජය තුළ වේගයෙන් සිදුවෙන බව පිංවත් ඔබට පෙනෙනවා.

මේ යුගයේ බිහිවන සද්ධර්මයේ සැබෑ ම ශක්තිය, සැබෑ ම අර්ථය විකෘති කිරීමටයි, මාරයාගේ මේ ව්‍යායාමය. හෙට දවසේ යමෙක් සැබෑ අර්ථවත් ආකාරයෙන් උතුම් සෝවාන් ඵලයට, උතුම් රහත් ඵලයට පත්වුවහොත් ඔහුව විවේචනය කරන්න මාරයා දහසක් දෙනාව සමාජය තුළින් ම ඇතිකරනවා. එයයි, වර්තමාන ලෝකයේ ස්වභාවය.

මෙම ස්වභාවය ධර්මය හැටියට දකිමින්, එය මාර්ගය වැඩීමට කමටහනක් කරගන්න. මේ ස්වභාවය සමාජය තුළ ඇතිකර ගන්නේ අසද්ධාව තුළින් ම යි. මිච්චා ශීලය, මිච්චා සමාධිය, මිච්චා ප්‍රඥාව තුළින් පෝෂිත අපේ සිතුවිලි අපව මාරධර්මයන්ගේ

ගොදුරු බවට පත්කරවනවා. පිංවත් ඔබ මුලින් ම මේ ජීවිතයේ දී "මම සතර අපායෙන් මිදෙනවා"ය කියන චිත්තය ඇතිකරගන්න. අපි මුලින් ම රහතන් වහන්සේ නමක් බවට පත්වීමට නො වෙයි, යායුත්තේ සතර අපායෙන් මිදීමටයි. සතර අපායෙන් නො මිදී අපට රහත්භාවයට පත්වීමට පුළුවන්කමක් නැහැ. අපි ආරම්භයේ දී ම රහත්භාවයට පත්වෙනවාය කියන අධි බලාපොරොත්තුව ඇතිකර ගතහොත් අපි තුළ අධිමාන්නය ඇතිවෙන්න පුළුවන්. දුර බලාපොරොත්තුවක් ඇතිකරගත් නිසා ම වේගවත් භාවයට පත්වෙන්න පුළුවන්. ඒ තුළින් ම අපි තුළ මාන්නය සකස් වී සෝවාන් ඵලයට පත්වීමට පෙරාතුව සෝවාන් ඵලයට පත්වුණාය කියන මිථ්‍යා විශ්වාසයට එන්න පුළුවන්. පටන් ගැනීම ම විකෘතිභාවයට පත්කර ගතහොත් ජීවිතය සක්කාය දිට්ඨියෙන් පිරීයනවා.

මෙවැනි ගිහිපැවිදි චරිත සමාජයේ දී අපට නිතර හමුවෙනවා. සතර අපායෙන් තව ම මිදිල නැහැ. නමුත් තමන් සකෘදාගාමී, අනාගාමී රහත් තත්වයට පත්ව ඇතැයි සිතනවා. මේ අධිමාන්නය නිසා සංසාරයේ අපට නිවන් මාර්ගය අහිමි ව ගිය අවස්ථා බොහෝමයක් තිබෙනවා. ඔබ ඉන්නේ කොතැන ද කියලා කොයි ම වෙලාවකවත් හිතන්න යන්න එපා. ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ඉන්නවා ද කියල හිතන්න.

භික්ෂුව ගිහි කෙනෙක් වශයෙන් මුලින් ම පැවිදිවීමට ගියේ අවුරුදු 24 දී. අදාළ තපෝ භූමියේ දී පැවිදිවීම අරමුණු කරගෙන දින දහයක් මම දසසිල්වෙලා හිටියා. මේ දින දහය තුළ දී මම දැක්කා, මා තුළ තිබූ රාගය, ද්වේශය භාවනාවෙන් යටපත් කරගන්න බැරිය කියලා. මම මට අවංක වුණා. ස්වයං පරීක්ෂණයක් සිදු කළා. මම තීරණය කළා, පැවිද්දට මම තව ම සූදානම් නැහැය කියලා. දින දහයකට පසුව නැවත නිවසට පැමිණියා.

ඉන් වසර විස්සකට පසුවයි භික්ෂුව පැවිදිභාවයට පත්වෙන්නේ. එම වසර විස්ස පුරාවට ම මම ගිහිවත සම්පූර්ණ

කළා. මම පැවිදි වන අවස්ථාවේ අධිෂ්ඨානයක් ඇතිකරගත්තා, කවදාහරි දවසක මගේ ඇස්දෙක පියවෙන මොහොතේ, ඒ කියන්නේ මැරෙන මොහොතේ ඇලීම්, ගැටීම්, උපේක්ෂාවන්ගෙන් තොරව මගේ අවසන් හුස්ම පිටවෙනවා කියලා. එතැන තමයි භික්ෂුව ඇතිකරගත් අධිෂ්ඨානය. භික්ෂුවට මාර්ගඵල උන්මාදය කවදාකවත් තිබුණේ නැහැ. ජීවිතයේ එක ම අධිෂ්ඨානය තිබුණේ අවසන් හුස්ම පොද ඇලීම්, ගැටීම්, උපේක්ෂාවන්ගෙන් තොරව පිට වේවා ය කියන අධිෂ්ඨානය. මේ තැන හරි සරල තැනක්, හරි ම නිවුණ තැනක්, මාර ධර්මයන්ට අතපොවන්න බැරි තැනක්. අධිෂ්ඨානය ම නිවුණ සිතුවිල්ලක්. මාර්ගඵල උන්මාදය කියන විකෘති උන්මාදය භික්ෂුව පරාජයකර දැමුවේ ඉහත උපක්‍රමය තුළිනුයි.

පිංවත් මහත්මයෙක් ප්‍රශ්නයක් විමසුවා, අපි සතර අපායෙන් මිදුණාය කියල දන්නේ කොහොමද කියලා. තමා සතර අපායෙන් මිදුණාය කියන විශ්වාසය තමාට ලබාදෙන්නේ ලෝකෝත්තර සම්මා සතියයි. සම්මා සතිය හේතුවෙන් ම සකස්වෙන සම්මා සමාධියත්, සම්මා සමාධිය හේතුවෙන් සකස්වෙන සම්මා ඥාණයත් තුළින් තමා තුළ විශ්වාසයක් ඇතිකර ගන්නවා, නැවත තමා සතර අපායට වැටෙන්නේ නැහැ කියලා. තමා සතර අපායෙන් මිදුණාය කියන විශ්වාසය ඇති කරනවා. ඔහු නුවණින් පීරපීරා බලනවා, තමා තුළින් මමත්වයේ දැඩිභාවය මැරී ගිහිල්ල ද කියලා; තෙරුවන් කෙරෙහි උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගය කෙරෙහි විචිකිච්ඡාව පහව ගිහිල්ලද කියලා; අන්‍ය ශීලව්‍රතයන් කෙරෙහි තිබෙන බැඳීම පහව ගිහිල්ලද කියලා. ඉහත ක්‍රමය හැර තමන් සතර අපායෙන් මිදුණාද කියල දැනගන්න වෙන ක්‍රමයක් නැහැ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නමකට හැර වෙනත් කිසිවෙකුට අනුන්ගේ අධිගමනයන් ප්‍රකාශ කිරීමට පුළුවන්කමක් නැහැ. ඒ නිසයි භික්ෂුව සඳහන් කළේ, ඔබ ඉන්නේ කොතනද කියල හිතන්න යන්න එපා, මාර්ගය තුළ ශක්තිමත්ව ස්ථානගතවෙන්න කියලා. ඔබ අවංකව ම සෝවාන් ඵලයට පත්වුණා නම් ඔබට ලැබුණා වූ ඵලය ගැන බෝඩ්ලෑලි ගහගන්න

යන්නේ නැහැ. ඔබ දකල තිබෙන්නේ රූපයේ අනිත්‍යභාවය; වේදනාවේ අනිත්‍යභාවය. රූපය අනිත්‍යයි කියලා දක්ක කෙනා රූපය ඔසවා තබන්න උත්සාහ ගන්නේ නැහැ. වේදනාව අනිත්‍යයි කියල දක්ක කෙනා වේදනාව තුළ මුසපත්වෙන්න යන්නේ නැහැ. අවබෝධය කියන්නේ හිස්වීමක්, පුරවාගැනීමක් නො වෙයි. අවබෝධය කියන්නේ විශ්වාසයක්, මංමුළාවීමක් නො වෙයි. අවබෝධය කියන්නේ නිහඬභාවයක්, සටන් පාඨයක් නො වේ. අවබෝධය කියන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ඵලයක්. මෙහෙයුමක අවසානයක්, ක්‍ෂණික ප්‍රතිඵලයක් නො වෙයි.

ලෝකයේ ස්වභාවයෙන් ලෝකය තිබුණාදෙන්. පිංවත් ඔබ ලෝකය උපේක්ෂාවෙන් පිළිගන්න

දැන් ඔබට සිතෙනවා, ඔබ සිතන්නට පටන් ගන්නවා, ඔබ මේ ලෝකයට පැමිණියේ අරමුණක් උදෙසා ම යි කියලා; ඔබට මේ කල්‍යාණමිත්‍ර ආශ්‍රය ලැබුණේ, ඔබට මේ නිවන් මාර්ගයට අදාළ ධර්මය ඇසෙන්නේ, හේතුවක් නිසා ම යි කියලා. කුසලයෙන් පරිපූර්ණ සිත විනිවිද දැකීමේ ශක්තිය ඇතිකොට දෙනවා.

දැන් ඔබට සිතන්න පුළුවන්, ඔබ ලෝකයට පැමිණියේ කාරණා තුනක් නිසා ය කියලා. මේ කාරණා තුන ම අපේ ජීවිතය තුළ සැඟවිලයි තිබෙන්නේ. එම කාරණා තුන තමයි, එක්කෝ මරණින් පසු සුගතියට යන්න, එක්කො මරණින් පසු දුගතියට යන්න, එක්කො සුගතියත් දුගතියත් දෙක ම අනිත්‍ය වශයෙන් දැකලා භව නිරෝධය දෙසට යන්න.

භික්ෂුවගේ ගිහි ජීවිතය තුළ මේ පළමු කාරණා දෙක ම සැඟවී තිබෙන බව හොඳින් දැක්කා. භික්ෂුවගේ ගිහි කාලයේ දී දුගතිය කියන දිශාවටත් ජීවිතය ගමන් කරල තිබෙනවා. ඒ වගේ ම යි, ජීවිතය සුගතිය කියන දිශාවටත් බොහෝ ම වේගයෙන් ගමන් කරල තිබෙනවා. නමුත් භික්ෂුවට දක්ෂභාවය තිබුණා, සුගතියෙත් දුගතියෙත් අනිත්‍යභාවය දකිමින් නිවීමේ මාර්ගයට අවතීර්ණ වෙන්න.

මෙය සටහන් තබන මොහොතේ භික්ෂුවට සිතෙනවා, භික්ෂුවට පෙර ජීවිතයේ දී නතර කළ තැනක් තිබුණා. මේ

ජීවිතයේ කුසලයේ බලවත් භාවය නිසා ම පෙර ජීවිතයේ නතර කළ තැන ශක්තිමත් ව මතු කරගත්තා. කල්‍යාණ මිත්‍ර ආශ්‍රය නිසා ම, සද්ධර්මය ශ්‍රවණය නිසා ම ඇති කරගත් සංසාරබිය, භික්ෂුවට භව නිරෝධය දෙසට ඇති පාර ම පෙන්වූවා. එහෙම නම් පිංවත් ඔබ දකින්න ඕනේ, ඔබ තුළ මේ පාරවල් තුන ම සැඟවිලා තිබෙනවා ය කියලා. ඒ නිසා බොහෝ ම පරිස්සමින්...! සුගතිය, දුගතිය කියන මංතීරු දෙක ම එක සමාන්තරවයි ගමන් කරන්නේ. පොඩ්ඩ බැරිවෙච්ච තැන දී වැරදි ගමනාන්තයට වැටෙන්න පුළුවන්. එම නිසා අරමුණු කෙරෙහි හොඳින් සිහිය පිහිටුවා ගන්න. ලෝකය නිවැරදි වෙන තෙක් ඔබ බලා සිටින්න එපා. වහවහා ඔබ නිදහස් වෙන්න. මතවාද, දෘෂ්ටි, විතර්ක බහුල ලෝකයක් මේක. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, අතුල කියන උපාසකතුමාට, "පිංවත් අතුල, නිශ්ශබ්ද ව සිටින විටත් බනිනවා. වැඩිපුර කතා කරන විටත් බනිනවා. ප්‍රමාණයට කථා කළත් බනිනවා. මේ ලෝකය අතීතයේ ඉඳල ම ඔහොම තමයි" කියලා. "එම නිසා පිංවත් අතුල, ලෝකයේ ස්වභාවයෙන් ලෝකය තිබුණාදෙන්. පිංවත් ඔබ ලෝකය උපේක්ෂාවෙන් පිළිගන්න ස්වභාවයට එන්න" කියලා. පිංවත් ඔබ ලෝකය යන දිශාව ප්‍රශ්නයක් කරගන්න එපා. ජීවිතය නැමති නැවේ පිරිලා තිබෙන විතර්ක, දෘෂ්ටි, මතවාද වතුර ඉවත දමන්න. වතුර හිස්වුණ නැව හරි සැහැල්ලුයි, නිවනට ඔබව යොමුකරනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

සංසාර බිය දකින පිංවතා රූපය කෙරෙහි තිබෙන තෘෂ්ණාව ක්‍රමානුකූලව අඩු කරගන්නවා. අනුන්ගේ දෙය තමන්ගේ කරගෙන එයා දුක් විඳින්නේ නැහැ. අතහැරීම ගැන කථා කරන විට සමාජයේ සමහර පිංවතුන්ලා ලොකු බියක් දකිනවා. එක් මහත්මයෙක් භික්ෂුවගෙන් ප්‍රශ්නයක් ඇසුවා, "ඔබ වහන්සේ අතහැරීම ගැන දේශනාකරනවා. ඔබ වහන්සේ කියන විදිහට අතහැරීමට ගියොත් රට ජාතිය ආගමට කුමක් වේවි ද" කියලා. ඒ වෙලාවේ එම පිංවතාට භික්ෂුව දුන් පිළිතුර වූයේ "මහත්තයෝ, මගධ රාජ්‍යයේ රජකම් කරපු බිම්බිසාර රජතුමා සෝවාන් ඵලය

අවබෝධ කරගත් රජකෙනෙක්. බිම්බිසාර රජතුමා සෝවාන් ඵලයට පත්වුණාය කියලා, මගධ රාජ්‍යය අනතුරට පත්වුණේ නැහැ, මගධ රාජ්‍යය තව දුරටත් රැකුණා මිසක්. විශාඛා උපාසිකාව සෝවාන් ඵලයට පත්වෙන්නේ ළමා වයසේ දී. එහෙම ළමා කාලයේ දී සෝවාන් ඵලයට පත්වුණාය කියලා විශාඛාවගේ සිටුසම්පත් අහිමි වුණේ නැහැ, ඒවා තවදුරටත් වැඩුණා මිසක්. එම නිසා මිථ්‍යාමතවලට එළැඹෙන්න එපා. අපේ මෝහචරිත අදහස්වලට වගකියන්න උතුම් ධර්මය බැඳිල නැහැ."

කාලය වේගයෙන් ගෙවිලා යනවා. කාලය ගෙවීයන වේගයෙන් ම සංස්කාරත් ගෙවීයනවා. සංස්කාර ගෙවීයන නිමේෂයේ දී ම අලුතින් සංස්කාරයන් අපි රැස් කරගන්නවා. ගෙවීයාමත් සමඟම හටගැනීමත් සිද්ධවෙනවා. මෙන්න මේ ගමනයි අපි කෙටි කරගන්න ඕන. පිංවත් ඔබ රට, ජාතිය, ආගම අතහරින්න අවශ්‍ය නැහැ. බිම්බිසාර රජතුමා රට, ජාතිය, ආගම අතහැරියේ නැහැ. ඒවා වෙනස් වෙන බව දකිමින් ඒවා ආරක්ෂා කළා. උතුම් ධර්මය තුළින් නො වෙනස් වන දෙයක් නැති බවට ලැබූ අවබෝධයෙන් වෙනස් වෙන දේවල් කෙරෙහි අසීමිත ආශාවක් ඇති කරගන්නේ නැහැ. අපි හිතනවා අපි අතහැරීම පුරුදු කළොත් ලෝකය හිස් වෙයි කියලා. පිංවත් ඔබ අතහැරීම පුරුදු කළාය කියල ලෝකය හිස් වෙන්නේ, අඩු වෙන්නේ නැහැ. ඔබ අතහරින දෙය අල්ලාගැනීමට මුළු ලෝකය ම බලා සිටිනවා. භික්ෂුවගේ ගිහි ජීවිතයේ දී භික්ෂුව අවබෝධාත්මක කලකිරීම තුළ යම් දෙයක් අතහැරියා ද, ඒවා සෑම දෙයක් ම ලෝකයා කැමැත්තෙන් තරගකාරීව අල්ලාගත්තා. හිස් වීමක් නැහැ, තව තව පිරීයාමක් මිසක්. එම නිසා රට, ජාතිය, ආගම රකින්න ඉපදුණ අය රට, ජාතිය, ආගම ආරක්ෂා කරාවි. මේ ජීවිතයේ දී සතර අපායෙන් මිදීම උදෙසා ඉපදුණ අය ධර්මාවබෝධය දෙසට ගමන් කරාවී. පෙර කී පිංවතුන්ලා විසින් රකින රට, ජාතිය, ආගම තුළ ප්‍රයෝජනයක් ගැනීමටත් පිරිසක් සිටිය යුතු යි. අපි ඒ ඵලප්‍රයෝජන අරගනිමු. එවිට එය රට, ජාතිය, ආගම රකින පිංවතුන්ලාට ද මහත්ඵල මහානිසංස පිංකමක් වනු ඇත.

අනිත්‍යයි කියන වචනය, අතහැරීම කියන වචනය අන්තවාදීව අල්ලාගත්තොත් එය ඔබට පීඩාවක් වෙනවා. අපි ධර්මය අන්තවාදීව අල්ලාගෙන ප්‍රශ්න ඇති කර ගන්නවා නම් එය ධර්මයේ වරදක් නො වෙයි. 'අතහැරීම' කියන වචනය අන්තවාදීව ජීවිතයට එකතු කරගත් ස්වාමීන් වහන්සේ නමක් පිළිබඳව මතකය භික්ෂුවට මේ මොහොතේ ඇතිවෙනවා.

උන්වහන්සේ වැඩිහිටි ස්වාමීන් වහන්සේ නමක්. හුදකලාව සිටීමට තමයි වඩාත් ප්‍රියකළේ. එම ස්වාමීන් වහන්සේ තුන්සිවුරත් පාත්‍රයත් පමණයි පරිහරණය කළේ. කල්‍යාණමිත්‍ර ඇසුරට නො ගිය නිසා ම හුදකලාවේ සිටියදී උන්වහන්සේගේ සිතේ විතර්කයක් ඇතිවෙනවා. ඒ විතර්කය තමයි තමා දරාගෙන සිටින තුන්සිවුරත් පාත්‍රයත් කියන්නේ අල්ලාගැනීමක්. මම තුන්සිවුරෙනුත් පාත්‍රයෙනුත් නිදහස් වෙන්න ඕනේ කියලා. ඒ කියන්නේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම්වලටත් එහා ගොස් අන්තවාදීව සිතන්න ගත්තා. අවසානයේ දී උන්වහන්සේ තුන්සිවුරත් පාත්‍රයත් අතහැරලා පසුගිය කාලයේ ඉන්දියාවේ නිගන්ඨ ආශ්‍රමයක අමුඩයක් පමණක් ඇඳගෙන නිගන්ඨ ව්‍රතයක් රකිනවා.

බලන්න, අන්තවාදී අතහැරීමක ශෝකාන්තය; එය මොන තරම් මෝහ මූලික ද කියලා. තුන්සිවුරෙනුත් පාත්‍රයෙනුත් නිදහස් වුණා. මිථ්‍යාදෘෂ්ටියේ අගාධයට වැටුණා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, සොරෙක් තව සොරෙකුට දරුණු විපතක් කරනවාට වඩා, තරහකාරයෙක් තවත් තරහකාරයෙකුට දරුණු විපතක් කරනවාට වඩා, මිථ්‍යාදෘෂ්ටියේ පිහිටි සිත තමාට දරුණු විපතක් ඇති කරනවාය කියලා.

මල් සොයන මාලාකාරයෙක් ලස්සන මල් සොයමින් ගස් වටේ යනවා වගේ, මිථ්‍යාදෘෂ්ටියේ වැටුණු පුද්ගලයා විතර්ක, දෘෂ්ටි, මතවාද පසුපස ම යනවා කියලා; මෙවැනි මිනිසුන් නිදාගෙන සිටියදී මුහුද ගොඩගලා ඔවුන්ව මුහුදට ගසාගෙන යනවා වගේ, විනාශය කරා ම යනවා කියලා. එම නිසා බුදුරජාණන් වහන්සේ

දේශනා කර ඇති උතුම් ධර්ම කාරණාවලට වැරදි අර්ථකථනයන් දීම බරපතළ පාපයක් වෙනවා; මිථ්‍යාදෘෂ්ටියට අතවැනීමක් වෙනවා.

අනිත්‍යයත් අත්හැරීමත් යනු අන්තවාදයක් නො වේ

ධර්ම දේශනාවක් අවසානයේ දී පිංවත් තරුණයෙක් ප්‍රශ්නයක් විමසුවා, "හාමුදුරුවන් කියනවා මේ මේසයත් අනිත්‍යයි, මේ මල් පෝච්චියත් අනිත්‍යයි, මේ කෝප්පයත් අනිත්‍යයි, මමත් අනිත්‍යයි, ඔක්කොම අනිත්‍යයි.... මෙහෙම හිතලා අපි කොහොමද ජීවත්වෙන්නේ" කියලා.

මේ මහත්තයා යම්කිසි ආවේගයකින් මේ ප්‍රශ්නය ඇසුවේ. ඒ මහත්තයා තුළ මේ උතුම් අනිත්‍ය ධර්මය කෙරෙහි යම් හාස්‍යයක් ඇතිවෙලා තිබුණා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මම ඔබලාට කාමයන්ගේ රූපයන්ගේ ආදීනවයන් දේශනා කරන්නේ, කාමයන්ගෙන් වෙන්වෙලා ජීවත්වෙන්න කියලා. එසේ කියන්නේ පිංවත් ඔබ කාලා, බීලා, හොඳින් ජීවත්වෙනවාට ඇති අකමැත්ත නිසා නො වේ.

මේ කාමයන් අපිව දුකට ම යි ඇද දමන්නේ; නිවන් මාර්ග යෙන් ඈතට ම යි ඔබව රැගෙන යන්නේ. ඒ නිසා ම යි බුදුරජාණන් වහන්සේ කාමයේ ආදීනවයන් ගැන ඒ තරම් දේශනා කරන්නේ.

බුදුරජාණන් වහන්සේ කොතැනදීවත් ගිහි පිංවතුන්ලාට දේශනා කරන්නේ නැහැ, කාමයන්ගෙන් සම්පූර්ණයෙන් ම බැහැරව ජීවත්වෙන්න කියලා. සිල්පද ආරක්ෂා කරගෙන කාමයන් ඇසුරු කරන්න කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ.

බුදුරජාණන් වහන්සේ කොයි ම වෙලාවකවත් සෝවාන් මාර්ගය තුළ සිටින ගිහි පිංවතුන්ලාට සීමාව ඉක්මවා ගියාවූ තහංචි පනවා නැහැ.

පිංවත් ඔබ හිතන්න, ඔබ ගිහි තරුණයෙක්. ඔබ සද්ධර්මය ශ්‍රවණය කරලා, සෝවාන් ඵලයට පත්වෙනවා. පිංවත් ඔබ සෝවාන් ඵලයට පත්වුණත්, ඔබ තුළ කාමරාග පටිසයන් තිබෙනවා. ඔබ කැමති නම් ඔබට ලබන සතියේ විවාහයකට යන්න පුළුවන්. සෝවාන් ඵලයට පත්වුණු ගිහි පිංවතා, පිංවතිය අවශ්‍ය නම් විවාහ වෙනවා. විවාහය කියන්නේ සිල්පද බිඳීමක් නො වේ. බලන්න, බුදුරජාණන් වහන්සේ අනිත්‍ය කියන ධර්මය කොයි තරම් ප්‍රායෝගික තැනකට ගෙනත් තිබෙනවා ද. ගිහි පිංවතුන්ලා උදෙසා මෙච්චර පැහැදිලි නිදහසක් ඔබලාගේ ගිහි ජීවිතය උදෙසා ලබා දී තිබියදී, සමහර පිංවතුන් අන්තවාදීව අනිත්‍ය කියන වචනය විවේචනය කරනවා.

එක් ගෞරවනීය ස්වාමීන් වහන්සේ නමක් භික්ෂුවගෙන් විමසුවා, සෝවාන් ඵලයට පත් වූ භික්ෂුවක් කාමය උදෙසා, සිවුරු හැර යයි ද කියලා. සෝවාන් ඵලයට පත් වූ භික්ෂුවක් කවදාවත් කාමයන් උදෙසා සිවුරු හැර යන්නේ නැහැ. උතුම් උපසම්පදා භික්ෂුවගේ ආර්යකාන්ත ශීලය බවට පත්වෙන්නේ උතුම් ප්‍රාතිමෝක්ෂ සීලයයි. එම නිසා ගිහි පිංවතා සෝවාන් ඵලයට පත්වෙලා, විවාහයකට ගියත්, සෝවාන් ඵලයට පත් වූ භික්ෂුවක් කාමයන් උදෙසා සිවුරු හැර යන්නේ නැහැ. මොකද, එම ස්වාමීන් වහන්සේ ආර්යකාන්ත ශීලයෙන් පිරිපූර්ණභාවයට පත් වී ඇති නිසා.

ගිහි පිංවතුන්ලා අතහැරීම ගැන කථා කරනකොට, හොඳ උදාහරණයක් විශාඛා උපාසිකාවගේ ජීවිත කථාව තුළ තිබෙනවා. දිනක් විශාඛා සිටු දියණිය, පළඳනාවක් ගෙල පැළඳගෙන බුදුරජාණන් වහන්සේ බැහැදැකීමට පූර්වාරාමයට ගියා. බුදුරජාණන්වහන්සේට වන්දනා කිරීමට පෙර, ඇය එම පළඳනාව ගලවා අසල ඇති මේසයක් මත තබනවා. බුදුරජාණන්

වහන්සේ වන්දනා කර, ධර්මයන් ශ්‍රවණයකොට, ඇයට ධර්මය කෙරෙහි ඇති වූ ප්‍රීතිය නිසා ම තමන්ගේ ගෙල පළඳනාව පූර්වාරාමයේ අමතකකොටදමා සිටු මැඳුරට යනවා. සිටු දියණිය සිටු මැඳුරට පැමිණි පසු සේවිකාවකගෙන් අහනවා, "ඔබ මගේ ගෙල පළඳනාව රැගෙන ආවා ද?" කියලා. සේවිකාව කියනවා, තමන් රැගෙන නො පැමිණි බව. ඒ වෙලාවේ තමයි විශාඛා සිටු දියණිය දැනගත්තේ තම ගෙල පළඳනාව පූර්වාරාමයේ අමතකව පැමිණි බව. ඒ වෙලාවේ ඇය තම සේවිකාවකට කියනවා, "ඔබ පූර්වාරාමයට යන්න. එහි ගොස්, යම් හෙයකින් මගේ ගෙල පළඳනාව ආනන්ද ස්වාමීන් වහන්සේ විසින් ආරක්‍ෂාව උදෙසා වෙනත් තැනක තබා තිබේ නම් නැවත එය ඉල්ලන්න යන්න එපා. එම පළඳනාව සංඝයාට ම පූජා වේවා කියලා සංඝයාට පූජා කොට එන්න. ගෙල පළඳනාව තබා තිබූ මේසය මත ම තිබුණොත් එය නැවත අරගෙන එන්න" කියලා.

ඉහත කථාව තුළ තිබෙනවා, සෝවාන් ඵලයට පත්වුණ කෙනෙකුගේ අතහැරීමේ ස්වභාවය. ඇය තුළ කාමරාග, පටිඝ ධර්මයන් තිබෙන නිසා ඇය අලංකාර ගෙල පළඳනාවක් පළඳිනවා. නමුත් ඇය දක්‍ෂයි, එය ඕනෑ ම මොහොතක අතහරින්න. එය අහිමිවීම තුළ ඇය කිසි ම ශෝකයක් ඇති කරගන්නේ නැහැ.

නැවත වතාවක් විශාඛා සිටු දියණිය සිය කෝටි ගණනක් වටිනා මහලිය පළඳනාව විකුණා, පූර්වාරාමය ගොඩනගලා, එය මහා සංඝරත්නයට පූජා කරලා, බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නය පූර්වාරාමයට ගෙවැදීමේ ප්‍රීතියට, තම දරු මුණුබුරන් ද සමඟින් තුටු ගී කියමින් පූර්වාරාමය තුළ සතුටු වුණා. භික්ෂූන් වහන්සේලා විශාඛා සිටු දියණියගේ මෙම හැසිරීම දැකලා, බුදුරජාණන් වහන්සේට සැලකොට සිටියා, විශාඛා සිටු දේවියගේ පිත කිපිලද කොහෙද, ඇය උමතුවෙන් හැසිරෙනවා කියලා. ඒ වෙලාවේ බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, විශාවගේ පිත කිසිවක් වෙලා නැහැ. ඇය ගෞතම සම්මා සම්බුද්ධ ශාසනයේ අග්‍ර දායිකාව කියන උතුම් තනතුර ලැබීමේ සතුටයි භුක්ති විඳින්නේ කියලා.

දක්ෂ මාලාකාරයෙක්, මල් මාලයක් ලස්සනට ගොතන්නාක් මෙන්, දක්ෂයා පිං සිදුකරගෙන සතුට ලබනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඉහත කාරණා තුළින් පිංවත් ඔබට දකින්න පුළුවන්, යම් ගිහි පිංවතෙක් සෝවාන් ඵලයට පත්වුණාය කියලා තමා පළඳින රන්, රිදී, මාල, වළලු අතහරින්ට උවමනා නැහැ. පිංවත් ඔබට ලස්සනට, තමන්ට ගැළපෙන පරිදි ඇඳපැළඳගෙන මඟුල් ගෙදරක යන්න බැරි කමක් ලැබෙන්නේ නැහැ. ඔබ මේවා පරිහරණය කරමින් ඒ කෙරෙහි ඇති තෘෂ්ණාවයි හීනකරගත යුත්තේ.

විවෘත වූ දහමක කුමන ප්‍රශ්න ද? කුමන පිළිතුරු ද?

පිංවත් ඔබේ අතින් අල්ලාගෙන මේ ගමන යන්න කෙනෙක් නැහැ. මේ සටහන් තබන භික්ෂුව අනික් ස්වාමීන් වහන්සේලා වගේ ම ධර්ම මාර්ගයේ දී යම් අත්දැකීමක් ලැබුවා වගේ ම සැඟවීමකින් තොරව එය මේ සටහන්වල සඳහන් කරලා තිබෙනවා. මේ භික්ෂුවට කළ හැක්කේ එපමණයි. එම නිසා පිංවත් ඔබ 'ඔබේ' අතින් ම අල්ලාගෙන ධර්ම මාර්ගයේ පෙරට යන්න. ඒ කියන්නේ සතිය, සිහිය තුළින් විඳීම් සොයන සිත විදර්ශනා ඥානයෙන් අල්ලාගෙන පෙරට යන්න කියන කාරණය යි. ඔබේ අත ඔබට අතහැරුණොත් අනුන් අත් සියයක් දිගු කළත් ඔබට ඉන් ඇති ඵලයක් නැහැ. මෙසේ පෙරට යනකොට ඔබට මුලින් ම හමුවෙන්න ඕනේ, සප්ත බොජ්ඣංග කියන ධර්මයන්. මෙතැනදි තමයි පිංවත් ඔබට සහතිකයක් ලැබෙන්නේ, ඔබ තුළින් ම ඔබ නිවැරදි බවට, ඔබේ මාර්ගය අර්ථවත් බවට. අනුන් නෙමෙයි ලකුණු දුන්නේ. ඔබ තුළින්මයි ලකුණු ලැබුවේ. පිංවත් ඔබ තුළින්ම ඔබට ලකුණු ලැබුණත්, ලකුණු ලැබුණාය කියන කාරණයෙන් පැහැදිලිවෙන්නේ එතැන තරගයක් තිබෙනවාය කියන කාරණය යි. තරගයක් තිබෙනවාය කියන කාරණයෙන් පැහැදිලි වෙන්නේ එතැන ජය, පරාජය තිබෙනවාය කියන කාරණය යි. ජය, පරාජය තිබෙනවාය කියන කාරණය තුළ පැහැදිලි වෙන්නේ එතැන ඇලීම, ගැටීම තිබෙනවාය කියන අර්ථය යි. එහෙමනම් පිංවත් ඔබ මේ ලකුණු ලැබෙන තරගය ද අත්හැරිය යුතු යි. එය කළ හැක්කේ ඔබ තුළ හේතුඵල ධර්මයන් තුළින් වැඩෙන සප්ත බොජ්ඣංග ධර්මයනුත් අනිත්‍ය වශයෙන් දැකීමෙනුයි.

සතිය ද, ධර්මවිජය ද, වීර්ය, එස්සද්ධි, ප්‍රීති, සමාධි, උපේක්ෂා ධර්මයන් ද අනිත්‍ය වශයෙන් අවබෝධකොට ගනිද්දී ඔබ තුළ හේතුඵල ධර්මයන්ට අනුව වැඩෙන්නේ ප්‍රඥාව යි. ප්‍රඥාව යනු සම්මා සම්බුද්ධ ඇකයේ ඔබ උපන් බවට ඔබට ලැබෙන විශ්වාසය යි. එම විශ්වාසය ලැබෙනුයේ ද ඔබ තුළින් ම ය. එසේ නම් ඔබ නැමති ආශ්චර්යවත් පුද්ගලයා තුළ සැඟවී ඇති අයෝමය ධර්ම ශක්තිය ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළින් ම පිංවත් ඔබත් මතුකොටගන්න. මමත්වයේ කුණුහැව සනභාවයට පත්කරන නිත්‍ය සංඥාව, සතර සතිපට්ඨාන ධර්මයන් උපයෝගීකොට විනිවිද දකින්න.

මේ සටහන කියවන, ධර්මය කෙරෙහි උනන්දුව අඩු, ජීවිතය ආස්වාදයක් කරගත් පිංවතෙකුට, පිංවතියකට "මේ තරම් ලස්සන, සුන්දර, තාරුණ්‍යයෙන් පිරුණු ජීවිතය දෙස ඇයි අපි අසුබවාදීව බලන්නේ" කියලා සිතෙන්න පුළුවන්. බාහිරින් ඔය 'පවුඩර් සාප්පුව' දිහා බැලුවහම නම් ලස්සන තමයි. නමුත් පිංවත් ඔබ ම සිතන්න, සුවඳ විලවුන්, පවුඩර්, ඇඳුම්පැළඳුම්, දත් මැදීම්, නෑම, ඇඟ සේදීම් නැති වුණොත් රූපයේ මොන ලස්සනක් ද?

මේ සටහන ලියන මොහොතේ භික්ෂුවට පේනවා, කුටියට මඳක් ඔබ්බෙන් මොනරෙක් පිල් විදහාගෙන නටනවා. 'සර සර' හඬ නඟමින් විහිදුණු පිල් එකිනෙක ගැටෙන හඬ භික්ෂුවට හොඳින් ඇසෙනවා. මොනරා රඟන රිද්මයට ම සෙබඩත් මොනරා වටා කැරකෙනවා. මේ සතුන් දෙදෙනාට හැඟීමක් නැහැ, භික්ෂුව අහලපහල සිටිනවා කියලා. මොකද, ඒ සතුන් රූපයෙන් භික්ෂුව හැඳිනුවත්, අර්ථයෙන් හඳුනන්නේ නැහැ. මේ මොනරත්, සෙබඩත් ආස්වාදයෙන් මත්වෙලා; හිරිඔතප් ගැන දන්නේ නැහැ. ආස්වාදයේ කෙටි මිහිර, ආදීනවයේ ප්‍රමාදීභාවයට පාර හෙළිකර දෙනවා, දෙදෙනාට ම. තව ටික දිනකින් සෙබඩ බිත්තර දමාවි. ඊට පස්සේ බිත්තර රකීවි. ඊට පස්සේ පැටව් එළියට ඒවි, පැටවුන් පෝෂණය කරාවි, කෙටි ආස්වාදයක දිගු ආදීනවය පෙනෙනවා නේ ද?

මේ මොනරා කීවොත් 'මම ලස්සනයි' කියලා සැබැවින් ම සාධාරණයි. මොකද, එම සතා සුවඳ විලවුන්, ඇඳුම්පැළඳුම්, නෑම් ඇඟ සේදීම්, දත් මැදීම් කිසි ම දෙයක් කරන කෙනෙක් නෙවෙයි. නමුත් සැබවින් ම ලස්සනට පේනවා. ලස්සන තිබෙන්නේ රූපය තුළ නො වෙයි, රූපය කෙරෙහි සකස්කොටගත් තෘෂ්ණාව තුළ යි. රූපයට ඇති තෘෂ්ණාව අඩුකරගන්න. එවිට ඔබට රූපය අසුබ දෙයක් වශයෙන් පෙනේවි. මේ ස්ත්‍රී පුරුෂ මිනිස් රූපය, යමෙක් ලස්සනය කියලා කියනවා නම්, සශ්‍රීක දිව්‍ය තලවල වැඩසිටින දිව්‍යාංගනාවන්, දෙවියන්ගේ දිව්‍ය රූපවල අසිරිය, රිද්මය, ලාලිත්‍යය, කාන්තිය වර්ණනා කිරීමට භාවිතා කළ යුතු වචනය මොකද්ද කියන්න භික්ෂුවට තේරෙන්නේ නැහැ. හැබැයි ලොව්තුරා බුදුරජාණන් වහන්සේට නන්ද ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කළ කාරණය මෙතැනදි වැදගත් වෙනවා. "ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස, දිව්‍ය තලයේ දිව්‍යාංගනාවන්ගේ අසිරිය දුටු මට ජනපද කල්‍යාණිව පෙනෙන්නේ පිච්චී ගිය හේනක සිටින වැඳිරියක් වගේ ය" කියලා. පිංවත් ඔබ භික්ෂුව සමඟ අමනාප වෙන්න එපා, මෙහෙම සටහන් කළාට. ඔබ අමනාප විය යුත්තේ ඔබගේ ම දෘෂ්ටිමය දුර්වලතාවයන් සමඟය. මේ දෘෂ්ටිමය දුර්වලතාවයන් බිඳුණු තැනදී, නන්ද ස්වාමීන් වහන්සේත් පසුව ජනපද කල්‍යාණියත් දෙදෙනා ම පසුව භව නිරෝධය සාක්ෂාත් කරගත්තා.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නන්ද ස්වාමීන් වහන්සේ උදෙසා අනුගමනය කළ ඉහත උපක්‍රමය, පිංවත් තරුණ ඔබට හුඟක් ප්‍රයෝජනවත් වේවි. එම නිසා ඔබ තුළ වීර්ය මඳනම්, රූපය කෙරෙහි තෘෂ්ණාව වැඩි නම් දිව්‍යතලයේ අසිරිමත්, දිව්‍යාංගනාවක් ලබනවාය, වෙනවාය කියන කාරණය චේතනාවක් කොටගෙන භාවනා කරන්න. අල්ලාගත්තත්, අල්ලාගත්තේ අසිරිමත් දිව්‍ය ජීවිතයක් නේ. උදය සවස කුණු පිටකරන, ගඳගහන මනුෂ්‍ය ශරීරයක් නො වෙයි නේ. සියල්ල අතහැරීම උදෙසා, අල්ලාගැනීමට අවශ්‍ය තැන් වෙතොත් ඒවා අතහැරීමට කලබල නො වන්න. භාවනාව තුළින් ඔබ ලබන සතිය, සිහිය සුදුසු තැනදී සුදුසු දෙයින් ඔබව දැනුවත් කරාවි.

තෙරුවන් කෙරෙහි විශ්වාසයෙන්, වීර්යෙන් යුතුව දුකින් මිදීමට ඔබ නැගී සිටින්න. දුකින් මිදීම උදෙසා එක ම දෙයයි ඔබ නැති කරගත යුත්තේ. ඒ, රූපය කෙරෙහි ඇති තෘෂ්ණාව යි. සියක්දහසක් දේවල් නිරතුරුව සිතන පිංවත් ඔබ ඒ සියල්ල ගැන සිතීම මොහොතක් නවතා, තෘෂ්ණාව නමැති එක ම කාරණය ගැන සිතන්න. එවිට ඔබට පෙනේවි, සියක්දහසක් දේවල් අපි සිතන්නේ තෘෂ්ණාව නිසා ම යි කියලා. ඔබ තුළ ඇතිවන සිතිවිලි නිරතුරුව ම ඔබේ පාලනයට ගන්න. සිතිවිලි අයාලේ යන්න ඉඩ දෙන්න එපා. අයාලේ යන සිත නිරතුරුව ම කාමයේ ආස්වාදය දෙසට ම යි ඇදී යන්නේ. එම නිසා දුවන සිත, අරමුණ උදෙසා ඔබේ පාලනයට ගන්න. පාලනය කරගන්නා වූ සිතෙන් ඔබ වැඩීමට බලාපොරොත්තුවෙන භාවනා අරමුණ මෙනෙහි කරන්න. සතිය, සිහියයි දැන් ඔබ තුළ පවතින්නේ. පිංවත් ඔබ වචනවල තේරුම සොයන්න යන්න එපා. වචන කියන්නේ විචාර, විතර්ක. විචාර, විතර්ක තමයි ඔබව සමාධියෙන් ඈත් කරන්නේ. ඒකෙන් අදහස් වෙන්නේ විචාර විතර්ක අයිති මාරයාට බවයි. ධර්ම මාර්ගය තුළ ගමන් කරන ඔබ කිසිවිටෙකවත් ප්‍රශ්න හෝ පිළිතුරු අතර සිරවෙන්න එපා. විවෘත වූ ධර්මයකුයි බුදුරජාණන් වහන්සේ දේශනා කර තිබෙන්නේ. එම නිසා නැති ප්‍රශ්නයක් ඔබ ඇති කරගතහොත් මිසක්, ප්‍රශ්න තිබෙන්න විදිහක් නැහැ. ප්‍රශ්නයක් නැති තැන පිළිතුරක් කෙසේ පවතින්න ද? නිවීම කියන්නේ ප්‍රශ්නයක් හෝ පිළිතුරකට ලඝු නො වන උතුම් අවබෝධයක්.

පංච උපාදානස්කන්ධය කියන වචනයේ අර්ථයක් තිබෙනවා. එම තේරුම් පසුපස අපි පැටලෙමින් සිට පලක් නැහැ. මොකද, පංච උපාදානස්කන්ධයේ සැබෑ ම අර්ථය අනිත්‍ය නිසා. මොනයම් හෝ වචනයක අර්ථයත් අනිත්‍ය යි. මොකද වචනයක් යනු පංච උපාදානස්කන්ධයක් ම නිසා. මේ සටහන් තබන භික්ෂුව කිසි ම අවස්ථාවක නිවීමේ මාර්ගයේ දී කිසි ම වචනයක අර්ථයක් සොයන්න වෙහෙසුණේ නැහැ. වචනවල අර්ථය සොයන්න

කියන සිත අනිත්‍ය වශයෙන් දැක්කා පමණයි. එතැන ම සතියත්, සිහියත්, සමාධියත් සකස් වුණා. ඒවායේ අර්ථය සොයන්න ගියා නම් සතියත්, සිහියත්, සමාධියත් ගිලිහී යන්න තිබුණා.

මේ ආත්මයේ පිංකම්වලින් පමණක් යැපෙන්නට හිතන්න එපා

අනාගතයේ ඔබට රට, ජාතිය නිසා, අඹුදරුවන් නිසා සැබවින් ම සතුටු වීමට අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. මොකද, මනුෂ්‍යයාගේ පංච උපාදානස්කන්ධය ගිනිගන්නා විට ගිනි රස්නය මත සිසිලස සෙවීම විහිළුවක් වෙනවා. දුශ්ශීල මාර්ගයන් තුළින් සකස්වෙන අකුසලයන් නිසා ම ගින්දර නිවාගැනීමේ මාර්ගය හැටියට ලෝකය දකින්නේ තවතවත් ගිනි අවුළුවා ගැනීමේ මාර්ගයක් ම යි.

පිංවත් ඔබ මේ ධර්ම මාර්ගයේ පෙරට එන විට ඔබ නිවැරදිව ඔබේ ශාස්තෘන් වහන්සේ කවුද කියල හඳුනාගන්න ඕනේ. අපේ ශාස්තෘන් වහන්සේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ම යි. වෙනත් බාහිර පුද්ගල චරිත ඔබේ මාර්ගය කරගන්න එපා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, පංචමහා ගංගාවන්ගෙන් කොතෙක් ජලය ගලාගෙන ඇවිත් මහාසාගරයට වැටුණත් මහසාගරය උතුරා නො යන්නේ යම් සේ ද, කොයි තරම් මනුෂ්‍යයින්, දෙවියන් නිවන් අවබෝධය කරා ගියත් ලෝකය හිස්වෙන්නේ නැහැ කියලා. එම නිසා, පිංවත් ඔබ නිවන් මාර්ගයේ ගමන් කළාය කියලා කවදාවත් රට, ජාතිය, ආගම අනතුරට පත්වෙන්නේ නැහැ.

අපි මේ ලෝකයට ඇවිල්ල තිබෙන්නේ යම් කාරණාවක් උදෙසා ම යි. ඒ කාරණය තමා තුළ සැඟවිලා තිබෙනවා. මේ, තමා තුළ සැඟවිලා තිබෙන කාරණය මතුකර දෙන්නේ කුසලය සහ

අකුසලය තුළිනුයි. මේ කුසලය සහ අකුසලය තමා තුළින් මතුකර දෙන්නේ සත්පුරුෂයා සහ අසත්පුරුෂයා කියන පුද්ගලයන් දෙදෙනා විසින් ම යි. බුදුරජාණන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් කල්‍යාණමිත්‍ර ආශ්‍රය ම සොයාගෙන යන්න. කල්‍යාණමිත්‍ර ආශ්‍රය තුළින් කුසලය ම ජීවිතයට එකතු කරගන්න. බුදුරජාණන් වහන්සේ දේශනා, කරනවා කල්‍යාණමිත්‍ර ආශ්‍රය සොයාගෙන යොදුන් දහස් ගණනක් වුව ද දුර යන්න කියලා; කල්‍යාණ මිත්‍රයින් මුණගැසෙන්න, සද්ධර්මය ශ්‍රවණය කරන්න, එම කල්‍යාණ මිත්‍රයින් අනුව ජීවත්වෙන්න කියලා. ජීවිතය තුළින් කුසල් පක්ෂය වැඩෙන විට අතීතයේ විපාක නො දී තිබූ කුසල් ශක්තිය අයෝමය ශක්තියක් ලෙසින් මතුවී එනවා. යමෙක් අකුසල් පක්ෂය නම් වඩන්නේ, ඔහු තුළින් අතීත අකුසල් ශක්තියයි මතුකර දෙන්නේ.

අපි දක්ෂ වෙන්න ඕන, අතීත භවයන්හි දී විපාක නො දුන් කුසල් ශක්තිය මතුකරගන්න. විපාක නො දුන් අප්‍රමාණ කුසල් ශක්තියක් අපේ ජීවිත තුළ සැඟවිලා තිබෙනවා. අතීතයේ සමහර බුද්ධෝත්පාද කාලවල අපි ඉපදිලා ගොඩාක් කුසල් දහම් කරගෙන තිබෙනවා. සමහර සම්මා සම්බුද්ධ ශාසනවල දී අපේ ආයුෂ අවුරුදු විසිදාහයි, සමහර සම්මා සම්බුද්ධ ශාසනවල දී අපේ ආයුෂ අවුරුදු හතළිස් දාහයි, හැටදාහයි.... ආදී වශයෙන් දීර්ඝ ආයුෂ අපි වින්දනය කර තිබෙනවා. මෙවැනි දීර්ඝ ආයුෂ වින්දනය කරපු කාලවල අපි ගොඩාක් පිංකම් සිදුකරගෙනත් 'උපාදාන පච්චයා භවෝ' කියන ධර්මතාවය නිසා අපි සතර අපායන්ට වැටිලා තිබෙනවා. සතර අපායට වැටුණාට පසුව සතර අපායෙන් ගොඩ ඒමක් නැහැ. සතර අපායේ සත්වයන් තුළ ලෝභ, ද්වේෂ, මෝහ, අකුසල මූලයන් ම වැඩෙන නිසා සතර අපායේ කාලය ඉතා දීර්ඝ වෙනවා. මේ හේතුවෙන් කළා වූ පිංකම්වලට විපාක දීමට ක්‍රමයක් නැහැ. පිංවත් ඔබේ ජීවිත තුළ සැඟවුණ මේ සියුම් තැන පිංවත් ඔබ නුවණින් මතුකරග න්න ඕන. සතර අපායන්ට වැටීම නිසා අතීතයේ විපාක නො දී තිබෙන මේ කුසල් කන්ද ඔබ මතුකර ගත යුතු යි.

මේ ජීවිතයේ දී ඔබ සිදුකරගත් පිංකම්වලින් පමණක් යැපෙන්න උත්සාහගන්න එපා. එය ඔබට ප්‍රමාණවත් මදි. විදර්ශනා නුවණ මතුකරගන්න.

ඔබ විවේකීව සිටින වෙලාවට, භාවනා මනසිකාරයක් තුළ සිටින වෙලාවට අතීත අතිදීර්ඝ සම්මා සම්බුද්ධ ශාසන පිංවත් ඔබ නුවණින් මෙනෙහිකොට දකින්න. එම අතිදීර්ඝ ආයුෂ වින්දනය කළ කාලවල දී ඔබ සිදුකළා වූ අයෝමය පිංකම් මනසින් මතුකරග න්න. අතීත බුදුරජාණන් වහන්සේලාගෙන් සද්ධර්මය ශ්‍රවණය කළ හැටි සිහියට නඟාගන්න. බුදුරජාණන් වහන්සේලාට, පසේ බුදුරජාණන් වහන්සේලාට, රහතන් වහන්සේලාට සිව්පසය පූජාකළල සැටි සිහියට නඟාගන්න. අතීත සම්මා සම්බුද්ධ ශාසනවලදී භික්ෂු, භික්ෂුණී වශයෙන් පැවිදි උපසම්පදාව ලබා ගත කළ පැවිදි ජීවිත නැවත නැවත නුවණින් මෙනෙහි කරන්න.

එම පැවිදි ජීවිත අර්ථවත් නො වීමට හේතු වූ කාරණා නුවණින් දකිමින් ජීවත්වෙන්න. විපාක නො දුන් මේ කුසල් ශක්තිය පිංවත් ඔබ වර්තමානයේ මතුකරගන්න. මේ අතීත කුසල් ශක්තිය නුවණින් මතුකරගැනීම තුළිනුත් වර්තමානයේ ඔබ කරන පිංකම් තුළිනුත් කුසලයේ අයෝමය ශක්තිය ඔබ මතුකරගන්න. මේ කුසලයේ අයෝමය ශක්තිය ඔබ තුළින් මතු වී පැමිණෙනවාය කියන්නේ ඔබ තුළින් තෙරුවන් කෙරෙහි සද්ධාව අයෝමය ලෙස වැඩෙනවාය කියන කාරණය යි.

පිංවත් ඔබට මේ කුසල් ශක්තිය විදර්ශනා නුවණින් දැකීමට මාර්ගය සකස් කරදෙන්නේ, තෙරුවන් කෙරෙහි සද්ධාව විසින් ම යි. ඔබ පසුබිම සකස් කරගන්න. විදර්ශනා නුවණ කියන කාරණය ඔබ තුළ තව ම වැඩෙන්නේ නැතිනම් ඔබ කලබල වෙන්න එපා. ඔබේ අතීත කුසල් ශක්තිය කෙරෙහි විශ්වාසය ඇතිකරගන්න. වර්තමානයේ කුසල් තුළින් අතීත කුසල් ශක්තිය මතුකරගන්න. එසේ නො වුණහොත් මට තව ම පාරමී මදි කියන මෝහමූලික සිතුවිල්ලේ ගොදුරක් බවට ඔබ පත්වෙනවා.

සිනහවක් දන් දෙන්න බැරි ඔබ සෝවාන් වීමට කලබල නො වන්න...

බුදුරජාණන් වහන්සේ යම් විනය කාරණාවක් දේශනා කළා නම්, එම විනය කාරණා දුර්වල කරගැනීමෙන් ලැබෙන විපාකයන් කවදාවත් අඩුවක් වෙන්නේ නැහැ. බුදුරජාණන් වහන්සේගේ පැනවීම් කවදාවත් කාලයට අනුව වෙනස් වෙන්නේ නැහැ. අපි ධර්මයෙන් බැහැරව යනකොට, අපේ හිත රවට්ටාගෙන අමුතු ආරක්ෂාවක් ලෙසින් විනය කාරණාවන් ලිහිල් කිරීමට ගන්නා වූ උත්සාහයක් සමාජයේ තිබෙනවා. නමුත් බුදුරජාණන් වහන්සේ අතීතයේ යම් විනය කාරණාවක් පැනවූවා නම්, එම විනය කාරණා දුර්වල කරගැනීම තුළ, ලැබෙන ආදීනවය අදත් එදා මෙන් ම යි. විනය කාරණා ලිහිල් කරගත්තාට එහි ආදීනවයන් නම් ලිහිල් වන්නේ නැහැ.

භික්ෂුවට මේ තැනට එන්න උපකාරී වුණේ මේ අතීත කුසල් ශක්තිය ම යි. මේ කුසල් ශක්තිය භික්ෂුව මතුකරගන්නේ ගිහි කාලයේ පිංකම් සහ සමාජ සේවය තුළිනුයි. කොටින් ම අනුන්ව සතුටු කිරීම තුළින්. තමා ළඟට පැමිණෙන සේවාදායකයා තමා ළඟට පැමිණෙන කිනම් මනුෂ්‍යයෙක් වුව ද අවම තරමින් සිනාවකින් හෝ සතුටු කිරීමට ඔබට හැකි නම්, ඔබේ සතුට අනුන්ගේ සැපය උදෙසා කැපකිරීමට ඔබ දක්ෂ නම්, එය තමයි ගිහි පිංවතාගේ අතහැරීම කියන්නේ. අනුන් සතුටු වෙනවා දැකලා එම සතුටින් ඔබේ ආධ්‍යාත්මය ශක්තිමත් කරගන්න. ඔබ වාඩිවෙලා යන බස්රථයේ ආසනය අවශ්‍ය කෙනෙකුට පරිත්‍යාග කිරීමට ඔබ අකමැති නම් ඔබ සෝවාන් ඵලයට පත්වෙන්න

කලබල වෙන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ඔබ සිනාවකින් තව කෙනෙක් සතුටු කරන්න අකමැති නම් ඔබ සෝවාන් ඵලයට පත්වෙන්න කලබල වෙන්න එපා.

පිංකමක් සිද්ධ කරනවිට සෑම මොහොතක ම එම පිංකම විචිත්‍ර ආකාරයට සිද්ධ කරන්න. පිංකමක විචිත්‍රභාවය වැඩිවෙන්න වැඩිවෙන්න එම පිංකම අවසානයේ දී ඔබ තුළ ඇති වන අනිත්‍ය සංඥාවන්ගේ ප්‍රමාණය වැඩිවෙනවා. පිංකම විචිත්‍ර වෙන විට එම පිංකම සංවිධානය කරන පිංවතුන්ගේ ලෝභී සිතුවිලි නැතිවෙනවා. පිංකමේ විචිත්‍රභාවය දකින විට භික්ෂුවට මතක් වෙන්නේ, භික්ෂුව ගිහි කාලයේ සිදු කළ විචිත්‍ර පිංකම්.

ගෙදරක සාංඝික දානයක් තිබුණත්, පිරිත් පිංකමක් තිබුණත් එය බොහෝ ම පිරිසිදුව, විචිත්‍රව සිදු කළා. මට මතකයි, මීට වසර විස්සකට විතර පෙරාතුව, මගේ තාත්තා මියගිය අවස්ථාවේ හත් දවසේ බණ පිංකමට ගෙදර වටේ තිබුණ මල් ගස්වලට පාට පාට බල්බ්වැල් දැම්මා. මේක දැකලා බණ ගෙදර පැමිණි සමහරු මට කීවා බණ ගෙදරත් මඟුල් ගෙදරක් කරගෙන කියලා. චෝදනාත්මක ස්වරූපයෙනුයි එය කීවේ. මට අවශ්‍ය වුණේ පිංකම විචිත්‍ර ආකාරයෙන් සිද්ධ කරන්නයි. ඒ විචිත්‍ර පිංකම් දැකලා සත්පුරුෂ දෙවියන්, මනුෂ්‍යයන් කොයිතරම් සතුටුවෙන්න ඇති ද? ඒ සතුටින් මම මගේ ආධ්‍යාත්මය ශක්තිමත් කරගත්තා. ඒ විචිත්‍ර පිංකම්වල ඵලය තමයි භික්ෂුව මේ මොහොතේ භුක්ති විඳින්නේ. එම නිසා භික්ෂුව භුක්ති විඳින මේ ඵලය, ඒ ලැබූව මාර්ගය පිංවත් ඔබලාට වළක්වන්න භික්ෂුව යන්නේ නැහැ. එම නිසා කුමන පිංකම් මහා සංඝරත්නය අරමුණු කරගෙන සිදුකළත් එම පිංකම පිරිසිදුව, විචිත්‍ර ආකාරයට සිද්ධකරන්න. එය ඔබට අයෝමය ශක්තියක් වෙනවා, නිවන් මාර්ගය මෝදු කරගැනීමට. තෘෂ්ණාවෙන් දුරුවෙන මාර්ගය විවෘත කරගන්න.

නිවීම කියන්නේ විදර්ශනාවේ පමණක් ඵලයක් නො වේ. විදර්ශනා නුවණ සකස් කරගන්න කුසල් පක්ෂයේ අයෝමය

ශක්තිය ඔබ තුළ මෝදුවෙන්න ඕනා. මේවා එකිනෙකට බැඳිලයි තියෙන්නේ. අයෝමය කුසල් ශක්තියේ පරිපූර්ණභාවයයි භික්ෂුවට විදර්ශනා නුවණ සකස් කරදෙන්නට මාර්ගය වුණේ.

මේ සටහන ලියන්නේ ගිහි පිංවතුන්ලාට. එම නිසා ගිහි බැඳීම් තුළ සිටිමින් ම නුවණින් මේ කාරණා ජීවිතයට එකතු කරගන්න ඕන. ගෞරවණීය ස්වාමීන් වහන්සේලාටත් තව ම විදර්ශනා නුවණ මෝදුකරගැනීමට ශක්තිය හීන නම් අපි උපක්‍රමශීලී විය යුතු යි. පිංවත් ඔබ උපක්‍රමශීලී නො වුණොත්, මට පාරමී මදිය කියන මුළාව තුළට කොටුවෙන්න පුළුවන්.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, දෙවියන්ට පිං අවශ්‍යයි, මනුෂ්‍යයාටත් පිං අවශ්‍යයි, පැවිද්දන්ටත් පිං අවශ්‍යයි කියලා.

මෙතැනදී පැවිදි පක්ෂය පින මතුකරගත යුත්තේ තමන්ට පැවරිලා තිබෙන වත තුළින්. එසේ නො වුණහොත් ස්වාමීන් වහන්සේලා ගිහි පිංවතුන් සම්බන්ධ කරගෙන පිංකම් සිදුකිරීමට ගිහිල්ලා උතුම් ශීලයට හානි පමුණුවා ගන්නවා. සිල්පද දුර්වල කරගෙන පිංකම් සිදුකරගෙන වැඩක් නැහැ. එය අනුවණ ක්‍රියාවක්. 'වත' තුළින් ම යි පැවිදි පක්ෂය පින මතු කරගත යුත්තේ. වැඩිහිටි ස්වාමීන් වහන්සේලාට උපස්ථානය කිරීමෙන්, සිල්පද ආරක්ෂා කරගෙන ජීවත්වෙමින්, භික්ෂු සමාජය තුළ සමගි සම්පන්නව ජීවත්වෙමින් කුසල් ශක්තිය මෝදුකරගැනීමට හැකියාව තිබෙනවා. දාන ශාලාව, වැසිකිළි කැසිකිළි පිරිසිදු කිරීම, මළුපෙත් ඇමදීම ආදිය තුළින් අපි තුළ කුසල් මූලයන් ශක්තිමත් කරදෙනවා. තමන්ට වඩා බාල ස්වාමීන් වහන්සේලාට ප්‍රිය වචනයෙන් කථාකරන්න. අනුන් සතුටුවෙනවා දැකලා එම සතුටින් ඔබේ ආධ්‍යාත්මය ශක්තිමත් කරගන්න. දායක පක්ෂයට ප්‍රිය වචනයෙන් කථා කරන්න. නමුත් දායක පක්ෂයේ ප්‍රතිචාරයන්ට බැඳී යන්න එපා, නිරතුරුව ශීලානුස්සතිය වඩමින් ජීවත්වෙන්න. මොනම හේතුවක් නිසාවත් විදර්ශනා නුවණ ඇතිකරගැනීමට

ශක්තියක් වෙන මේ කුසල් ශක්තිය දුර්වල කරගන්න එපා. මම කුසලයෙන් පරිපූර්ණ යයි තමා තුළ විශ්වාසයක් ඇතිවෙන තැනට සිතුවිලි ශක්තිමත් කරගන්න.

මෙතැනදී අමුතුවෙන් ඔබට කළයුතු දෙයක් නැහැ. ඔබ තුළ සැඟවිලා තිබෙන දෙයයි ඔබ මතුකර ගතයුත්තේ. පිංවත් ඔබ දාන ශාලාවේ පඩික්කමක් සේදීමට අකමැති නම්, ආරාමයේ වැසිකිළියක් පිරිසිදු කිරීමට අකමැති නම්, රෝගී භික්ෂුවකට උපස්ථාන කිරීමට අකමැති නම් විදර්ශනාව ගැන කථාකිරීමට අප කලබල විය යුතු නැහැ. තව ගොඩක් කසල අපේ ආධ්‍යාත්මය තුළ තිබෙනවා, පිරිසිදු නො වී. කුසලය තුළින් ම යි මේ අපිරිසිදු කසළ සෝදාහැරිය යුත්තේ.

ඔබ මේ කාරණාවන් මේ මොහොතේ හඳුනාගතහොත් මේ මොහොත ඔබේ ජීවිතයේ ලස්සන ම මොහොත වෙනවා; ඔබ ශක්තිමත් බවට ඔබ තුළින් ම විශ්වාසය ඇතිවෙනවා; හීනමානය ඔබ තුළින් දුරුවෙලා යනවා; ජීවිතයට අයෝමය ධර්ම ශක්තියක් මතුවෙනවා. මේ විශ්වාසය ඇතිවෙන මොහොතේ ම ඔබ තුළ විදර්ශනා නුවණ ඇතිවෙලා. මොකද, ඔබ මේ විශ්වාසය ඇතිකරගන්නේ සංසාර බිය දකිමින්.

ධර්මයට වැරදි අර්ථකථන දෙන්නේ කෙලෙස්වල ගොරෝසුකමින් ම ය

ඔබ ලෝකයට යන්න හැරලා, ලෝකය පසුපසින් යන්න. එවිට පිංවත් ඔබට ලොකු සැහැල්ලුවක් දැනෙනවා. ලෝකය අල්ලාග ැනීමට යෑම තුළින් ම යි අපි වෙහෙසට පත්වෙන්නේ. රූපයේ අනිත්‍යභාවය දකිමින්, කෙලෙස්වල තුනී භාවය ඇතිකරගන්න. සෝවාන් ඵලයට පත්වුණ බිම්බිසාර රජතුමා මගධ රාජ්‍යය පාලනය කළේ, රූපයේ අනිත්‍යභාවය දැකීම තුළින් ඇතිකරගත් කෙලෙස්වල තුනීභාවය තුළින් ම යි. යම් පිංවතෙක් පැවිදි වෙනකොට හෝ උපසම්පදා වෙනකොට අසන සාම්ප්‍රදායික ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය තමයි "ඔබ රාජ භටයෙක් ද?" කියන කාරණය. රාජ්‍ය හමුදාවන්ට අයිති භටයෙක් ද යන්න විනය කාරණාවක් බවට පත්වෙන්නේ බිම්බිසාර රජතුමා නිසා.

වරක් බිම්බිසාර රජතුමාගේ රාජ්‍යයේ ප්‍රාන්තයක සොරුන්ගෙන් ජනතාව පීඩාවට පත්වෙනවා. ප්‍රදේශය සාමකාමී කිරීම සඳහා රාජ නියෝගයෙන් යුද භටයන් අදාළ ප්‍රදේශයට පිටත්කොට හරිනවා. මෙහෙම යුද්ධයට ගිය දක්ෂ හමුදා නිලධාරීන්, ස්වාමීන් වහන්සේලාගෙන් බණ අහලා, අකුසලය කෙරෙහි බියවෙලා පැවිදිවෙනවා. බිම්බිසාර රජතුමාට දැනගන්න ලැබෙනවා, තම යුද සේනාවේ දක්ෂයන් පැවිදිවෙලාය කියන කාරණය. මේ හේතුව නිසා ම ප්‍රාන්තයේ සොරුන්ගේ ග්‍රහණය වැඩිවෙලයි තිබුණේ. බිම්බිසාර රජතුමා මේ ගැන බුදුරජාණන් වහන්සේට පැමිණිලි කරනවා, යුද්ධය සංසිඳවන්න, ප්‍රදේශය ආරක්ෂා කරන්න යොමුකරපු හමුදාවේ භටයන් පැවිදි කිරීම වරදක්ය කියලා. යුද

සේනාවේ පිරිස් පැවිදි කිරීම නිසා, සොරුන්, මංපහරන්නන් දැඩි ලෙස ප්‍රදේශයේ ජනතාව පීඩාවට පත්කොටගෙනයි තිබුණේ. මෙම කාරණාව ඇත්තක් බව දැනගත්ත බුදුරජාණන් වහන්සේ විනය කාරණාවක් පනවනවා, නීත්‍යානුකූලව රාජ්‍ය හමුදාවන්ගෙන් ඉවත් නො වූ කිසිවෙක් පැවිදි උපසම්පදා කිරීම තහනම් කරලා. මෙම විනය කාරණා පැනවෙන්නේ සෝවාන් ඵලයට පත්වුණු බිම්බිසාර රජතුමා නිසා. මේවායින් පැහැදිලි වෙනවා, යම් ගිහි පිංවතෙක් සෝවාන් ඵලයට පත්වුණාය කියලා, ඊට අදාළ ධර්මය ලෝකයට දේශනා කළාය කියලා, රට, ජාතිය, ආගම අනතුරට පත්වෙන්නේ නැහැ කියන කාරණය. අපේ කෙලෙස්වල ගොරෝසුකම නිසා ම අපි ධර්මයට වැරදි අර්ථකථන දෙනවා.

හොඳයි, නරකයි දෙක ම ලෝකයේ තිබෙනවා. දුකයි, සැපයි දෙක ම ලෝකයේ තිබෙනවා. හොඳ ගැන පමණක් කථා කරන්න බැහැ. නරකත් ලෝකයේ ම කොටසක්. ඒ වගේ ම යි, නිවන ගැන කියන ධර්මයකුත්, භවය ගැන කියන ධර්මයකුත් ලෝකයේ තිබෙනවා. මේවා එකිනෙකට බැහැරව ලෝකය ගැන කථා කරන්න බැහැ. එම නිසා උතුම් නිවීමේ මාර්ගය ගැන කථා කිරීමේ අයිතියක් ලෝකයට තිබිය යුතු යි. උතුම් නිවන් මාර්ගයේ දී අපේ ශාස්තෲන් වහන්සේ, ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ම බව මතුකොටගන්න අපි දක්ෂ වෙන්න ඕන.

අද උදේ පිණ්ඩපාතයේ වඩිනකොට හොඳට ම වැහැරීගිය ශරීරයකින් යුත් එළදෙනක් මහපාරට යාබදව ඇති වැව් පිටියේ බිම වැටී දඟලනවා. ඒ එළදෙනගේ අත්පා ගැහෙනවා. පෙබරවාරියේ කර්කශ ඉඩෝරයේ කටුකභාවය, වැහැරීගිය එළදෙනගේ ශරීරයේ ස්වභාවයෙන් ඉතා අර්ථවත්ව මතුකොට දෙනවා. සත්වයාගේ අකුසල් මෝදුකොට විපාකයන් සලස්වන්න, මේ කටුක, වියළි පරිසරය බොහෝ ම සමීපභාවයෙන් උපකාර කරනවා. තවම පෙරවරු 8.00ට වත් නැහැ. හිරුගේ තද හිරුරැස්, කාටත් සම සේ විපාකයන් විඳීමට සලස්වනවා. භික්ෂුව පිණ්ඩපාතයේ වැඩමකොට, නැවත කුටියට වඩිනකොට එම එළදෙනගේ

අයිතිකරු එළදෙනව සොයාගෙන ඇවිත්. එළදෙනගේ වැහැරුණු ස්වභාවය සමග බලනකොට එළදෙනගේ අයිතිකරු බොහොම පෘෂ්ඨිමත් කෙනෙක්. ඔහු බිම වැටී දඟලන එළදෙන ළඟට ඇවිත් බිම වැටී දඟලන එළදෙනගේ වලිගයෙන් අල්ලලා වේගයෙන් කැරකෙව්වා. එම පෘෂ්ඨිමත් මනුෂ්‍යයාගේ ශරීර ශක්තිය නිසා, භික්ෂුව හිතුවේ ඒ වැඩෙන් එළදෙනගේ වලිගය කැඩේවි කියලා. ඒත් එහෙම වුණේ නැහැ. එළදෙනගේ අකුසල් වගේ ම වලිගයත් ශක්තිමත්. වලිගය වේගයෙන් ඇඹරීම නිසා ඇති වූ වේදනාවෙන් එළදෙන දෙතුන්වරක් මහ පොළොව මත කැරකී නැගිට ගැහිගැහී දිවගියා. ඇය දිවගොස් බොහෝ ම උවමනාවෙන් තම ස්වාමියා දෙස බලා සිටියා. "අනේ! ඔබත් කවදාහරි එළදෙනක් වෙලා මේ විදිහට මේ දුක ම විඳිනවා නේ ද?" කියන අයුරේ අදහසක් එළදෙනගේ බැල්ම තුළින් භික්ෂුව දැක්කේ. නමුත් එළදෙනගේ අයිතිකරු තුළින් භික්ෂුව දැක්කේ එවැනි බැල්මක් නො වේ. ඊළඟ මාසයේ මස් කඩයට හරක් පටවන ලොරිය එන තෙක්, එළදෙන මැරෙන්නට නම් එපාය කියන අදහසකුයි ඔහුගේ බැල්මෙන් ජනිත වුණේ. මල් ගැන කථා කරනකොට සුවඳ ඊට බැඳිලයි තිබෙන්නේ. ඒ වගේ ම යි, ජීවිත ගැන කථා කරනකොට දුක ඊට බැඳිලා ම තිබෙනවා.

මේ ජීවිතයේ දී මේ දෙදෙනා එළදෙන සහ එළදෙනගේ හිමිකරු වශයෙන් හමුවුණත් සංසාරයේ කී වතාවක් නම් මේ එළදෙන, එළදෙනගේ වත්මන් හිමිකරුගේ අම්මා වශයෙන් ඉපදිලා ඇතිද. අවිද්‍යාව විසින් පෙර සංසාරේ තමන්ගේ අම්මාව මේ ආත්මයේ දී මසට විකුණාගෙන කන තැනට අපිව පත්කොට තිබෙනවා.

දැඩි නියඟය මැද්දේ, කුසට අහරක්, ජලයක් නොමැතිව, වැහැරීගිය ශරීරයකින් යුත් මේ එළදෙන දකිනකොට, භික්ෂුවට මතකයට එන්නේ, පෙර ජීවිතයක හොඳට හම්බකරලා, හොඳ රසවත් ආහාර තනිව ම භුක්ති විඳලා, හොඳින් දරුමුණුබුරන්

හදලා, සුඛෝපභෝගී ජීවිතයක් ගතකරලා, දැඩි ලෝභකම නිසා ම දන්දීම සිදු නො කර මියගිය කාන්තාවක් ම යි. දන් නො දීම නිසා ආයුෂ, වර්ණය, සැපය, බලය හොඳට ම දුර්වල කරලා. සීලයක් රැක්කේ නැති නිසා ම තිරිසන් ජීවිතයට වැටිලා.

ඔබේ ඥාති පරම්පරාවේ සමූහ ඡායාරූපයක් හදාගන්න

දන්දීමට අකමැති පිංවතුන් සමාජය තුළ කොතෙක් ජීවත් වෙනව ද. ඒ අය දන්නේ නැහැ, පූජා කරන දානය අයිති වෙන්නේ තමන්ට ම ය කියලා. මේ ගෞතම බුද්ධ ශාසනයේ ඇසිදිසි දානය පූජා කරගත්තේ කොසොල් රජතුමාගේ බිරිඳ, මල්ලිකා බිසවයි. රුපියල් කෝටි ගණනක් වියදම් කර මල්ලිකා දේවිය ඇසිදිසි දානය පූජා කිරීමෙන් අනතුරුව, කොසොල් රජතුමාගේ 'කාල' කියන ඇමතිවරයා, මෙම අසිදිසි දානය මහා මුදල් නාස්තියක් ය කියලා දුක්වුණා; විවේචනය කළා. මෙය දැනගත්ත බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, අනුවණයා දන්දීම ගරහනවා, දන්දීමට අකමැතියි, අනුන් දුන් දානයන් නිසා අකුසල් රැස් කරගන්නවා, නමුත් නුවණැත්තා අනුන් පූජා කළ දානයෙන් පිං අනුමෝදන් වෙනවා කියලා.

'වේලාම' කියන තරුණයා වෙලා බෝධිසත්වයෝ කෝටිපති පවුලක උපත ලබනවා. වේලාම තරුණයා කල්පනා කරනවා, "මේ කෝටි ගණන් දේපළ, ඉඩකඩම් සියල්ල ම හම්බ කළේ මේ ආච්චි, සීයා. ඒ දෙදෙනා මහා දුක් විඳලා මේ දේපළ හම්බ කරලා හිස් අතින් මැරිලා ගියා. ඊළඟට මේ දේපළ තව ශක්තිමත් කළේ මගේ අම්මා, තාත්තා. ඒ දෙදෙනාත් දුක් විඳලා මේවා හම්බ කරලා හිස් අතින් මැරිලා ගියා. මෙම දේපළ රැස්කරපු අය හිස් අතින් මිය ගියත්, මම මේ දේපළ සියල්ල අරගෙන යනවා" කියලා. එසේ සිතලා සියලුම වස්තුව දන් දුන්නා. සියලු වස්තුව දන්දුන්නට පස්සේ වේලාම තරුණයා සාදුකාර දුන්නා, "මම මේ සියල්ල අරගෙන

ගියා" කියලා. බෝධිසත්වයන් ඒ පිරුවා වූ දාන පාරමිතාවේ ශක්තියයි, වර්තමානයෙත් ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී නාමය ලබන්නේ. අපි අද දාන වස්තුවක් සකස් කරගතහොත් එහි අග්‍ර කොටස පූජා කරන්නේ බුදුරජාණන් වහන්සේට යි. ඒ අග්‍ර වූ ලැබීම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී නාමය වර්තමානයේ ලබන්නේ අතීත දාන පාරමිතාවේ ශක්තිය නිසා ම යි. අනුනට, දානමය චේතනාවෙන් දුන් දෙය ම යි අපි අරගෙන යන්නේ. රැස්කරපු දෙය අපේ ම දුකට හේතුවෙනවා. කුසට අහරක් නැතිව, ඉණට වස්ත්‍රයක් නැතිව දුක් විඳින මනුෂ්‍යයෙක් දකිනකොට, කුසට අහරක් නැතිව දුක් විඳින තිරිසන් සතෙක් දකිනකොට, එම මනුෂ්‍යයා තුළින්, තිරිසන් සතා තුළින්, අතීත සංසාරයේ දන් නො දුන් ලෝභී මනුෂ්‍යයෙක්ව ම දකින්න; දානයෙන් තොර ජීවිතය විසින් සකස්කර දෙන සංසාර බිය දකින්න.

භික්ෂුවට මේ මොහොතේ මතකයට එනවා, භික්ෂුවගේ ආච්චි, සීයාගේ පරම්පරාව. මගේ ආච්චි මියගියේ මගේ ඔඩොක්කුව මත. ආච්චි සීයාගේ පරම්පරාව, ඒ අය මියගියාට පස්සේ අම්මා තාත්තගේ පරම්පරාව. දැන් ඒ අය මියගිහින් ඉවරයි. එක පරම්පරාවක් ඉවර වෙනකොට, අලුත් පරම්පරාවක් බිහිවෙනවා. බිහිවෙන පරම්පරාව හිතන්නේ නැහැ. හිටපු පරම්පරාවට මොකද වුණේ කියලා. තමන්ගේ අලුත් පරම්පරාවක් හදන්නයි උත්සාහගන්නේ. දෙමව්පියන් දරුවන්ට මෝහය ම උගන්නලා දුකෙන් දුකට යනවා.

ඉහත කාරණය තුළ ඔබට මතුකොට ගැනීමට ගැඹුරු කමටහනක් තිබෙනවා. පිංවත් ඔබට මතක තිබෙනවානේ පිංවත් ඔබගේ ආච්චි, සීයාගේ පරම්පරාව; අම්මගේ, තාත්තගේ පරම්පරාව; ඒ අයගේ සහෝදර සහෝදරියන්ගේ ඥාතීන්. දැන් ඒ අය හුඟ දෙනෙක් මැරිලා. ඔබ මනසින් චිත්‍රයක් මවාගන්න, ඒ අය ගැන. මරණින් මතු ඒ ඥාතීන්ට වෙච්චි දෙය ගැන, චිත්‍රයක් මනසින් මවාගන්න. දැන් එම චිත්‍රයේ දෙවියන්, දිව්‍යාංගනාවන්, මනුෂ්‍යයින්, ප්‍රේතයින්, ප්‍රේතියන්, තිරිසන් සතුන් ගොඩක් ඔබත්

සමඟ එක පේළියට සිටීවි. ඔබ මේ කණ්ඩායම් ඡායාරූපය නිරතුරුව ම නුවණින් දකින්න; සංසාර බිය ඇතිකොටගන්න.

භික්ෂුව ළඟ තම මියගිය ඥාතීන්ගේ කණ්ඩායම් ඡායාරූපයක් තිබෙනවා. එහි දෙවියන්, මනුෂ්‍යයන් හුඟක් ම අඩුයි. මෙවැනි කණ්ඩායම් ඡායාරූපයක් හදාගත්තා නම්, ඔහු සක්කාය දිට්ඨිය හීන කෙනෙක් වෙන්න ඕනේ. සක්කාය දිට්ඨිය තියුණු කෙනෙක්ට මෙවැනි ඡායාරූපයක් ගැන හිතන්නවත් බැහැ. කොසොල් රජතුමාගේ බිසව අසිදිසි දානය පූජා කොටගෙනත්, අවසානයේ තිරිසන් කුලයකට මොහොතකට හෝ වැටුණාය කියන කාරණය නුවණින් දකින්න.

බුදුරජාණන් වහන්සේගේ කාලයේ ජීවත් වුණු ජානුසෝනි කියන බමුණා, බුදුරජාණන් වහන්සේට දානයට නිවසට ආරාධනා කරනවා. බමුණා මේ දානය පූජා කළේ, මියගිය ඥාතීන්ගේ සැපය උදෙසා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මියගිය ඥාතීන් කාය, වචී, මනෝ කර්මයන් සිදුකරගෙන ප්‍රේත ලෝකයේ පරදත්තරූපජීවී ප්‍රේතයන් වශයෙන් ඉපදෙනවා කියලා; ඒ අයට පමණයි පිං ගන්න පුළුවන්ය කියලා. මෙහෙම බුදුරජාණන් වහන්සේ දේශනා කරනකොට ජානුසෝනි බ්‍රහ්මයාට ලොකු මදිපුංචිකමක් සේ එය දැනුණා. ජානුසෝනි බ්‍රාහ්මණයා බුදුරජාණන් වහන්සේට කියනවා, "මගේ ඥාතීන් කවුරුවත් ප්‍රේත ලෝකවල උපදින්නේ නැහැ" කියලා. ජානුසෝනි බමුණාගේ දැඩි සක්කාය දිට්ඨිය නිසා ම, ඔහු පිළිගන්නේ නැහැ තම ඥාතීන් මැරිලා, ප්‍රේත ලෝකවල සිටිනවාය කියන කාරණය. ඒ වෙලාවේ බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ ජීවිතයේ ඔබේ ඥාතීන් ප්‍රේත ලෝකවල, නැතිනම් ඊට ඉහත ආත්මභවයේ ඥාති ප්‍රේතයින් මේ පින අනුමෝදන් වෙයි කියලා. ඒ වෙලාවේ ජානුසෝනි බ්‍රාහ්මණයා කියනවා, "ඉන් ඉහත ආත්මයේ මගේ ඥාතීනුත් ප්‍රේත ලෝකවල ඉපදිලා නැහැ" කියලා. ඒ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, එය කවදාවත් වෙන්න පුළුවන් දෙයක් නො වෙයි, අනන්තවත් ආත්මභවවල ඥාතීන් වූ

ප්‍රේතයන් අපේ පසුපස, පිං බලාපොරොත්තුවෙන් සිටිනවා කියලා. එවිට ජානුසෝනි බ්‍රාහ්මණයා කියනවා, කිසි ම ආත්මභාවයක මගේ ඥාතීන් ප්‍රේතලෝකවල ඉපදිලා නැහැ කියලා. ඒ වෙලාවේ බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ලෝකයේ එහෙම දෙයක් වෙන්න බැහැ. නමුත් එහෙම වුණාය කියමුකෝ. එහෙම වුණත් ඒ පින ජීවත්ව සිටින ඔබලාගේ ආයුෂ, වර්ණය, සැපය, බලය පිණිස හේතු වේවි කියලා. බමුණා තුළ තිබූ දැඩි සක්කාය දිට්ඨිය නිසා ම, තමනුත් තම මියගිය ඥාතීනුත් අසරණභාවයට පත්කොටගත් ආකාරය නුවණින් දකිමින්, සක්කාය දිට්ඨිය විසින් අපිට සකස් කොටදෙන සංසාර බිය ගැන නුවණින් මෙනෙහි කරන්න.

රහතන් වහන්සේ යනු දුවන ලෝකය තුළ නො දුවන චරිතයකි

කාලය නැවතිලා තිබෙන්නේ. ඉර, හඳ, තාරකා දුවන පස්සේ, මනුෂ්‍යයා අතීත, අනාගත, වර්තමාන වශයෙන් බෙදාගෙන දුවනවා. නමුත් රහතන් වහන්සේ නැවතිලයි සිටින්නේ. ඒ නිසා උන්වහන්සේට මේ වේගය හොඳින් දැනෙනවා. දුවන ලෝකය තුළ නො දුවන චරිතයක් බවට රහතන් වහන්සේ පත්වෙන්නේ එහෙමයි.

රූපය කෙරෙහි ඇති තෘෂ්ණාවයි අපිව මේ දිවීමේ තරගයට ඇද දමන්නේ. අවිද්‍යාව කියන ජවය, හඹායෑමේ ශක්තිය අපට ලබාදෙනවා. දැන් ඉතින් දුවන්නයි තිබෙන්නේ. මේ දිවීමේ දී ජය සහ පරාජය කියන කාරණාවන් දෙක ම ලැබෙනවා. මේ ජය, පරාජය කියන කාරණා දෙකත් රූපය අයිති කොටගැනීමේ තරගයේ දී අපි ම අයිති කොටගන්නා සම්මුතීන් දෙකක්. අයිතිකරගත් තැනදී 'ජය' කියලා යොදනවා. අයිති නො කරගත් තැනදී 'පරාජය' කියලා යොදනවා. රහතන් වහන්සේ රූපය අයිති කරගැනීමේ තරගයෙන් මිදිලයි සිටින්නේ. ඒ නිසා උන්වහන්සේ ජය පරාජයෙන් මිදිලයි සිටින්නේ. ජය පරාජයෙන් මිදුණ තැන උන්වහන්සේලා විසින් මතුකොටගන්නේ සංසාර බිය නුවණින් මෙනෙහි කිරීම තුළින් ම යි. ඒ නිසා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, දසදහස් ගණනින් වියදම් කර, මාසයක් ගානේ අවුරුදු සියයක් යාග සිදුකරත්, සිත දමනය කරගත් රහතන් වහන්සේ එක මොහොතකට කරන පූජාව අවුරුදු සියයකට වැඩිය සිදු කළ යාගයන්ට වඩා ශ්‍රේෂ්ඨයි කියලා.

ආමිස දානයයි, ධර්ම දානයයි කියලා දෙකක් තිබෙනවා. මේ දෙක අතරින් ධර්ම දානයයි අග්‍ර වෙන්නේ.

කෙනෙක් තවත් කෙනෙකුට කරන අනුග්‍රහයන් දෙකක් තිබෙනවා. එකක් තමයි ආමිසයෙන් කරන අනුග්‍රහය. අනෙක තමයි ධර්මයෙන් කෙරෙන අනුග්‍රහය. මේ අනුග්‍රහයන් දෙකෙන්, ධර්මයෙන් කරන අනුග්‍රහයයි අග්‍ර වෙන්නේ. ආමිසයෙන් කෙරෙන උපකාරයයි, ධර්මයෙන් කරන උපකාරයයි අතරින් ධර්මයෙන් කරන උපකාරයයි අග්‍ර වෙන්නේ කියලා, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

ඊයේ සවස් කාලයේ භික්ෂුව මුණගැහෙන්න තරුණ ස්වාමීන් වහන්සේ නමක් පැමිණියා. උන්වහන්සේ බොහෝ ම වීර්යවන්ත ස්වාමීන් වහන්සේ නමක්. නමුත් උන්වහන්සේ ඒ බවක් හැඟවූයේ නැහැ. මේ වෙලාවේ උන්වහන්සේව සිහිපත් වෙනකොට, බුදුරජාණන් වහන්සේ උතුම් පැවිද්ද ගැන කියා තිබෙන දේශනාවක් මතකයට පැමිණියා.

දෙවියන් අතර තුන් ආකාරයක කථාබහක් ඇතිවෙනවා. යමෙක් ගිහිගෙදරින් නික්මී, පැවිදි ජීවිතයකට පත්වීමට සිතනවා නම්, ඒ වෙලාවේ දෙවියන් අතර දිව්‍ය කථාබහක් ඇතිවෙනවා, මේ පුද්ගලයා මාරයා සමඟ යුද්ධ කරන්න සිතනවාය කියලා. මෙහෙම වෙලා, පැවිදි වුණාට පස්සේ දෙවියන් අතර කථාබහක් ඇතිවෙනවා ලු, මේ භික්ෂුව මාරයා සමඟ යුද්ධ කරනවාය කියලා. තුන්වැනිව එම භික්ෂුව ප්‍රඥා විමුක්තිය සාක්ෂාත් කරගන්න වෙලාවේ දෙවියන් අතර දිව්‍ය කථාබහක් ඇතිවෙනවා ලු, මේ භික්ෂුව මාර යුද්ධයෙන් දිනුවාය කියලා. උත්තරීතර නිවන් මාර්ගය තරණය කරන අවංක භික්ෂුවට දෙවියන් නමස්කාර කරනවාය කියලා, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, පැවිද්දට සහ පැවිද්දේ උතුම් අර්ථයන්ට දෙවියන් නිරතුරුවම වන්දනා කරනවා කියලා.

තමා තුළ ඇති උතුම් ශක්තිය මතුකොටගන්න අපි දක්ෂ වෙන්න ඕනේ.

භික්ෂුවක් උතුම් සමාධියෙන් පසුවෙනකොට සවස 2ට පමණ ආකාශය තුළ තමාට මීටර 150ක් පමණ උසින් තමා දෙස බලා සිටින බ්‍රහ්මයෙක් දර්ශනය වෙලා තිබෙනවා. ආකාශය මත පලසක් එළාගෙන එම පලස මත තමයි ඒ බ්‍රහ්මයා වැඩසිටියේ. පලස මත සිටගෙන සිටින ස්වභාවයෙන් බොහොම තැන්පත්ව භික්ෂුව දෙස බලාගෙන සිට තිබෙනවා. ඉණෙන් පහළට බොහොම ප්‍රභාශ්වර සුදු පැහැති වේට්ටියක්, උඩු කයට ප්‍රභාශ්වර සුදු පැහැති උතුරු සළුවක් පැළඳගෙන සිටියේ බොහොම තැන්පත් ආකාරයෙන්. වැඩුණු සුදු හිසකෙස්වලින් යුක්ත වුණා. ආකාශයේ සිටගෙන ම විනාඩි දෙකකට පමණ පසු උතුම් සමාධියෙන් දර්ශනය වූ මේ බ්‍රහ්මයා නො පෙනීගොස් තිබෙනවා. මේ බ්‍රහ්මයාගේ ස්වරූපය මනුෂ්‍ය ස්වරූපයක් ම යි. මේ බ්‍රහ්මයාට රූපාවචර, අරූපාවචර බ්‍රහ්මතලයක බ්‍රහ්මයකුගේ ලක්ෂණ නෙමෙයි තිබිලා තියෙන්නේ. භික්ෂුව මේ බ්‍රහ්මයා තුළින් දැක ඇත්තේ මාර්ගඵල ලාභී බ්‍රහ්මයකුගේ ස්වභාවයයි. එම භික්ෂුව උතුම් සමාධිය තුළින් මේ බ්‍රහ්මයාව දකිනකොට, එම දැක්කා වූ බ්‍රහ්ම රූපය දැක්කාය කියන තැනින් නතරකොට දැමීමයි සිදුකර තිබෙන්නේ. ඒ බ්‍රහ්ම රූපයත් ඒ මොහොතේ ම අට්ඨික සංඥාවෙන් දකින්න එම භික්ෂුව කටයුතුකොට තිබෙනවා. බ්‍රහ්මයාගේ රූපය තුළිනුත් ධර්මය ම යි දැක්කේ.

ඊයේ සවස් කාලයේ භික්ෂුව මුණගැසීමට පැමිණි තරුණ ස්වාමීන් වහන්සේ නමක් භික්ෂුවගෙන් ප්‍රශ්නයක් විමසුවා, තමා තුළින් හොඳින් සමාධිය වැඩෙනවා, නමුත් විදර්ශනාව දෙසට හිත යොමුවෙන්නේ නැහැ කියලා; එම නිසා විදර්ශනාව ඇතිකොට ගන්න හැටි පහදලා දෙන්න කියලා. දැන් බලන්න, පෙර සඳහන් කළ බ්‍රහ්මයාගේ රූපය, භික්ෂුවක් විසින් උතුම් සමාධියෙන් දකිනකොට, එම භික්ෂුව සමාධිය තුළයි සිටියේ. නමුත් සමාධිය තුළින් බ්‍රහ්මයාගේ රූපය දකින මොහොතේ ම එම බ්‍රහ්මයාගේ

රූපය දැක්කාය කියන තැනින් නතර කරගැනීමට දක්ෂ වුණා. එම බ්‍රහ්මයාගේ රූපය ඒ මොහොතේ ම අට්ඨික සංඥාවෙන් දකින්න දක්ෂ වුණා. විදර්ශනාත්මක සිතක් කියලා දෙයක් නැහැ. විදර්ශනාත්මක සිතක් සකස්වෙන්නේ අවම වශයෙන් සෝවාන් ඵලයට පත්වීමෙන් අනතුරුවයි. එතෙක් අපි සිත විදර්ශනාවට යොමු කරගත යුතු යි. පංච උපදානස්කන්ධය සකස්වෙන්නෙත් තමා තුළින් ම යි. එම පංච උපාදානස්කන්ධය අනිත්‍ය වශයෙන් දැකිය යුත්තෙත් තමා ම යි. ඒ කියන්නේ, තමා තුළ තිබෙන දෙයක් තමයි අපි ලෝකය තුළ සොයන්නේ. බ්‍රහ්මයා කියන රූපය තුළින් විදර්ශනා නුවණ ඇතිකරගත්තේ තමා ම යි. එහෙමනම් විදර්ශනා නුවණ ඇතිකරගැනීමේ ශක්තිය තමා තුළයි තිබෙන්නේ. ඒ නිසා ලෝකය තුළ සොයලා වැඩක් නැහැ.

බැඳීමක් නැති ඇසුරක්......

උතුම් සමාධිය තුළදිත්, සමාධියෙන් බැහැරවත් තමන්ට අරමුණු වෙන්නාවූ සෑම රූපයක් ම විනිවිද දකින්න. ඒ හැකියාව ඔබ තුළින් ම ඔබ මතුකරගත යුතු යි. පිංවත්, සීලයෙන් පරිපූර්ණ ඔබ තුළ විදර්ශනාව වැඩෙන්නෙ නැහැ කියන්නේ රූපය විනිවිද දකීමේ ශක්තිය හීනයි කියන කාරණය යි. පිංවත් ඔබට අරමුණු වෙන්නා වූ සෑම රූපයක් ම මළකඳක් කර දකින්න; කුණුවෙන මළසිරුරක් සේ දකින්න; ඇටසැකිල්ලක් කර දකින්න. කිසිදු රූපයක් විනිවිද දකීමෙන් තොරව මතුව යන්න දෙන්න එපා. මෙවැනි අවස්ථාවක ඔබේ සිත මන්දගාමී වෙනවා. එවිට ඔබ, ඔබේ රූපය මළකඳක්, ඇටසැකිල්ලක් කොට දකින්න. ඉහත මන්දගාමී ස්වභාවයට ඔබ රැවටෙන්න එපා.

විදර්ශනාව වැඩෙන විට හේතුඵල ධර්මයන් නිසා ම සකස්වෙන සප්ත බොජ්ඣංග ධර්මයන් ගැන අපි අවධානයෙන් සිටිය යුතු යි. මොකද, සප්ත බොජ්ඣංග ධර්මයන්ට අපි සමහර විටක අවබෝධය යැයි රැවටෙනවා. ප්‍රීතිය, පස්සද්ධිය, සමාධිය, උපේක්ෂාව කියන ධර්මතාවයන් විදර්ශකයාට මර උගුලක් වෙන අවස්ථා තිබෙනවා. එම නිසා ම සප්ත බොජ්ඣංග ධර්මයන් වන සති, ධම්මවිජය, වීර්ය, ප්‍රීතිය, පස්සද්ධිය, සමාධි, උපේක්ෂා කියන ධර්මතාවයන් අනිත්‍ය භාවයෙන් දකින්න අපි දක්ෂවෙන්න ඕන. අපි, මේ ගමන යද්දී කාය, චිත්ත, ධම්ම, වේදනා කියන සතර සතිපට්ඨාන ධර්මයන් අනිත්‍යයි කියල අවබෝධ කරගන්න ඕන. සතර සතිපට්ඨාන ධර්මයන් වැඩීම නිසා ඔබ තුළ සකස්වෙන ඒ සප්ත බොජ්ඣංග ධර්මයන් ද අනිත්‍යයි කියල

අවබෝධ කරගන්න ඕන. සතර සතිපට්ඨාන ධර්මයනුත් සප්ත බොජ්ඣංග ධර්මයනුත් අනිත්‍යයි කියලා අවබෝධ කරගනිද්දී ඔබ අවසානයේ අවබෝධකර ඇත්තේ පංච උපාදානස්කන්ධය අනිත්‍යයි කියන ධර්මතාවය යි. සතිය තුළින් ම ධර්මයේ අර්ථය වන අනිත්‍ය සංඥාව වැඩෙන ආකාරයට සප්ත බොජ්ඣංග ධර්මයන් විනිවිද දකින්න. සතියෙන් අනිත්‍යභාවය දකිමිනුයි අපි සතිය තුළ පිහිටන්න ඕනේ. මොකද, සතිය තුළින් තෘෂ්ණාව සැඟවිලා තිබෙනවා. තෘෂ්ණාවෙන් තොර සම්මා සතියයි අපිට වැදගත් වෙන්නේ. සතියේත් අනිත්‍යභාවය විනිවිද දැක, සම්මා සතිය ඇතිකරගන්න. ලෝකයා ලෝභ, ද්වේෂ, මෝහ ධර්මයන් වඩමින් ඉදිරියට යන විට පිංවත් ඔබ නවතින්න. ඔබ නවතින්නේ විදර්ශනා නුවණින් ලෝකය දකිමින්. විදර්ශනා නුවණට පුළුවන් ලෝකය ඔබ අභියස නවත්වන්න.

වර්තමානයේ ලොකු ප්‍රවණතාවයක් තිබෙනවා. සප්ත බොජ්ඣංග ධර්මයන් අවබෝධයක් කරගෙන සප්ත බොජ්ඣංග ධර්මයන් වඩවා ගැනීම තමයි භාවනාවෙන් එකම බලාපොරොත්තුව වෙන්නේ. හුඟදෙනෙක් සප්ත බොජ්ඣංග ධර්මයන් තුළින් පමණක් තෘප්තිමත් වෙනවා. වෙනස්වන දෙයක් කෙරෙහි අපි බැඳී ගියොත් එතන දුක ම යි සකස් වෙන්නේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සප්ත බොජ්ඣංග ධර්මයන් හුඟාක් වර්ණනා කරනවා. නමුත් උතුම් නිවන් අවබෝධය වළක්වන අවසාන මාරධර්මය බවට පත්වෙන්නේ සප්ත බොජ්ඣංග ධර්මයන් ම යි. නමුත් මේ සප්ත බොජ්ඣංග ධර්මයන් ම යි ධර්මයේ උතුම් ශක්තිය අප තුළට කාන්දු කරවන්නේ; ධර්මයේ වෙනස්වන ප්‍රතිභාවයන් අප තුළට ලබාදෙන්නේ. සප්ත බොජ්ඣංග ධර්මයන් හොඳින් වැඩෙන විට ඇතිවන සංසිඳීමට, නිවන යැයි රැවටුණ පිංවතුන්ලා භික්ෂුවට මුණගැසී තිබෙනවා. සප්ත බොජ්ඣංග ධර්ම තුළින් ඒ අයගේ කෙලෙස් යටපත්කොටයි තිබෙන්නේ, මුලින් උපුටලා දමලා නැහැ. තමන් තුළ කෙලෙස් ධර්මයන් මතුවීමට ඉඩ නො දී සප්ත බොජ්ඣංග ධර්මයන් තුළ ම ඒ පිංවතුන් වාසය කරනවා. අවසාන මාර බන්ධනය විදර්ශනා නුවණින් දකින්න දක්ෂ නැහැ.

මේ උතුම් නිවන් මාර්ගයේ දී සතර සතිපට්ඨාන ධර්මයන් අනිත්‍යයි කියලා දකිනවා වගේ ම සප්ත බොජ්ඣංග ධර්මයන් අනිත්‍යයි කියලා දකිනවා වගේ ම නිවන කියන කාරණයත් අනිත්‍යයි කියල දකින්න විදර්ශකයා දක්ෂවෙන්න ඕනේ. නිවනට බැඳී ගියොත් අපි එතැනදීත් පංච උපාදානස්කන්ධයට බැඳී ගියා වෙනවා. සියුම් ගමනක්, කලබලයකින් තොරව ඔබට යන්න තිබෙන්නේ. නිවන් මාර්ගයේ දී එක් සන්ධිස්ථානයක් එනවා, තෙරුවන් කෙරෙහි අචල විශ්වාසයෙන් ජීවිතය මරණයට දැමිය යුතු අවස්ථාවක්. ජීවිතය මරණයට දැම්මාය කියන්නේ පංච උපාදානස්කන්ධය අතහැරුණාය කියන කාරණය යි; රූපය කෙරෙහි වේදනාව, සංඥාව, චේතනාව, විඤ්ඤාණය කෙරෙහි තෘෂ්ණාව අතහැරුණාය කියන කාරණය යි. ජීවිතය මරණයට දමලයි, අපි කවදහරි ඉපදීමත් මරණයත් දෙක ම අවසන් කරගත යුත්තේ. මෙතනදී ජීවිතය මරණයට දමනවාය කියන්නේ වස බොනවා, බෙල්ලේ වැල දාගන්නවා, ගඟක මුහුදක පනිනවා වගේ වැඩක් නො වේ. නිවන් මාර්ගයේ දී ජීවිතය මරණයට දැමීමේ දී ආදරයත්, ද්වේශයත් යන දෙක ම අතහැරෙනවා; ඇලීමත්, ගැටීමත්, උපේක්ෂාවත් තුන ම අතහැරෙනවා. කොටින් ම මෙතැනදී නිවන කෙරෙහි තිබෙන කැමැත්තත් අතහැරෙනවා. බුදුරජාණන් වහන්සේ කෙරෙහි ඇති අයෝමය විශ්වාසයයි, ඔබව මේ උතුම් පරිත්‍යාගයට මෙහෙයවන්නේ. අපිට එය බලෙන් ඇතිකරගන්න බැහැ. බලධර්මයන්ගේ දියුණුවයි ඔබට මාර්ගය තුළ ශක්තිය සකස් කරදෙන්නේ. ආගමික හේතුවක් නිසා ගිනිතබාගෙන මරණයට පත්වීමත්, නිවන් මාර්ගයේ දී ජීවිතය මරණයට දමනවාය කියන කාරණයත් අහසයි පොළවයි වගේ වෙනස් දෙයක්. ආගමික කාරණයක් උදෙසා ගැටෙන සිතින් අපි ගිනිතබාගෙන මැරුණොත් අපි දුගතියටයි වැටෙන්නේ. නමුත් ධර්ම මාර්ගයේ ශක්තිමත් ආකාරයට ගමන් කරලා, අවසානයේ එක සන්ධිස්ථානයක් එනවා, මාරයාත් නිවනත් අතර සටන්භූමියේ දී. ඒ තැනදී භික්ෂුවට දැනෙනවා තමා භවය සමඟ බැඳී ඇත්තේ සියුම් නූලක් වැනි බැඳීමකින් කියලා. මෙන්න මේ සියුම් බැඳීම

බිඳින්නයි, භික්ෂුව ජීවිතය මරණයට දමන අධිෂ්ඨානයට එන්නේ. මේ සියුම් නූල වැනි බැඳීම සකස්කර දෙන්නේ සප්ත බොජ්ඣංග ධර්මයන් විසින් ම යි. එම නිසයි, භික්ෂුව ඉහතින් සටහන් කළේ, නිවන් මාර්ගයේ අවසාන තප්පරය ප්‍රමාද කරන මාරබලවේගය වෙන්නේ සප්ත බොජ්ඣංග ධර්මයන් ම යි කියලා. නමුත් අපි නිවන් මාර්ගය සුද්ද පවිත්‍රකර අවශ්‍ය ජවය ලබාගනිමින් ම සප්ත බොජ්ඣංග ධර්මයන්ගේ අනිත්‍යභාවය දැකීමට දක්ෂ විය යුතු යි. සතිය තුළින් ම අපි සතියේ අනිත්‍යභාවය දකින්න දක්ෂ වෙන්න ඕනේ. ප්‍රීතිය, පස්සද්ධිය තුළින් ම අපි ප්‍රීති, පස්සද්ධියේ අනිත්‍යභාවය දකින්න දක්ෂ වෙන්න ඕන.

ඉහත මාර්ග තුළ සිටිමින් පිංවත් ඔබ ඉක්මන් නො වී සිත විවේකයට ම ඉඩදෙන්න; ඒ විවේකයෙන් අනිත්‍යභාවය දකිමින් ඉන්න. දීර්ඝකාලීනව විවේකයට බැඳුණ පිංවතුන්ලා සමාජයේ කොතරම් සිටිනවා ද? මනුෂ්‍යයෙක් දකින්න අකමැතියි. මනුෂ්‍යයෙකුට කථා කරන්න අකමැතියි. මේවා විවේකයේ ම ආස්වාදය හැටියටයි අපිට දකින්න වෙන්නේ. මේවා අපිව රවට්ටන ධර්මයේ බොහෝ ම සියුම් තැන්. විවේකය අත්‍යවශ්‍යයි. ඒත් විවේකයට බැඳෙන්න එපා. කාලයට ගෙවීයන්න ඉඩදෙන්න. පිංවත් ඔබ නැවතී සිට ගෙවීයන කාලය දෙස විදර්ශනා නුවණින් බලන්න. එවිට ඔබ කාලයට, කාලසටහන්වලට බැඳී යන්නේ නැහැ. ජීවිතය කොතැනකදීවත්, කාටවත්, කොතැනකටවත් බන්දන්න එපා. ජීවිතය නිදහසේ තිබෙන්නට හරින්න. මෙය සටහන් තබන භික්ෂුව ලෝකය සමඟ ඇසුරු කරනවා. හැබැයි ලෝකයාට බැඳෙන්නේ නැහැ. බැඳීමක් නැති ඇසුරක්, මේ උතුම් සද්ධර්මයේ අර්ථය තුළ පමණයි තිබෙන්නේ.

කඳුළකට සවන් දී කඳුළු සාගරයක් නිවන්න

භික්ෂුවට පසුගිය මාස හතර, අවිවේකී මාස හතරක් දිගට ම ධර්ම දේශනා පැවැත්වූවා. පිංවතුන් බොහොම ශ්‍රද්ධාවෙන් ප්‍රතිචාර දැක්වූවා. දන් වස් කාලය පටන් අරගෙන, සති තුනක් ගෙවී ගිහින්. මේ මොහොතේ සිට ගෙවීගිය ධර්ම දේශනා පැවැත්වූ මාස හතර ගැන ආවර්ජනය කොට බලද්දි, එය මැකීගිය සටහනක් පමණයි. ක්‍රියාවක් තිබුණා, බැඳීමක් නැහැ. තැනකට බැඳෙන, තැනකට ඇලෙන තෘෂ්ණාවේ ලාටු, භික්ෂුව හොඳින් හඳුනාගෙනයි තිබෙන්නේ.

වේලාව සවස 5.00ට පමණ ඇති. මැටි කුටියේ ඉදිරිපස ඇති බංකු ලෑල්ල මත වාඩිවෙලා ඔබට මේ සටහන් ලියන්නේ. අඳුර වැටෙන්න ආසන්න වෙලාවේ තොරතෝංචියක් නැතිව කුරුල්ලන් කෑගසනවා. භික්ෂුවට අදහස් ගලා එනවා. ඒවා භික්ෂුව සටහන් තබනවා. මේ වන තුරු භික්ෂුව සටහන් තැබූ දෙයක් ප්‍රතික්ෂේප වෙලා නැහැ. ඒත් හෙට කුමක් වෙයි ද කියලා කියන්න බැහැ. අතීතයේ ස්වාමීන් වහන්සේලා නිසා පිංවත් ජනතාව තුළ උද්යෝගය වැඩිවෙන අවස්ථා තිබී තිබෙනවා. ඒත් එම උද්යෝගය කාලයත් සමඟම නැතිව යනවා. මෙය සටහන් තබන භික්ෂුවට ලැබෙන ප්‍රතිචාරයන්, තව මොහොතකින් නැවතිලා යන්න පුළුවන්; ලෝකයාගෙන් අප්‍රමාණ විවේචන එන්න පුළුවන්. මනුෂ්‍යයාගේ චිත්ත සමාධිය පිරිහෙනකොට, එම මනුෂ්‍යයා නිරතුරුව අනුන්ව විවේචනයට පෙළඹෙනවා. අපි ඉදිරියේ තිබෙන්නේ ක්‍රමානුකූලව චිත්ත සමාධිය පිරිහීයන

සමාජයක්. එම නිසා අනාගතයේ දී විවේචන බහුල වෙන්න පුළුවන්. කොයි දෙයත් වෙනස් වෙනවා කියන, කොයි දෙයත් අපිට අයිති නැහැයි කියන උතුම් ධර්මයයි පිංවත් ඔබට මෙහි සටහන් තබන්නේ. උදෙයා්ගය නැගෙන තැනත්, එම උද්යෝගය හීනවන තැනත් තවත් එක් ක්‍රියාවක් පමණක් ම යි. ධර්මය අපිට කියා දෙන උතුම් සැනසිල්ලේ මාර්ගයයි අපි මේ දකින්නේ. අපි දකිනවාට වඩා ලෝකය හිතන්නේ හුඟාක් වෙනස් ආකාරයට. අපි දුක ගැන කතා කරනකොට ලෝකය අපට සැප පෙන්වනවා. අපි සංසාර බිය ගැන කතාකරද් දී ලෝකය අපට සංසාරය සැපයක් කොට පෙන්වනවා. අපි කියන දෙය, අපි පෙන්වන දෙය, අඩු පිරිසක් තමයි ජීවිතයට එකතුකොට ගන්නේ.

එක පිංවත් දරුවෙක් සිටියා, ඔහු වෛද්‍ය ශිෂ්‍යයෙක්. ධර්මයට ගොඩක් ලැදියි. මේ වෛද්‍ය ශිෂ්‍යයාගෙන් තමන්ගේ මිතුරන් ප්‍රශ්නයක් අසනවා, වෛද්‍ය විද්‍යාලයේදි අධ්‍යාපන පර්යේෂණ කටයුතු සඳහා මළමිනී කපනකොට, ඔබට අසුභය මරණානුස්සතිය වැඩෙනවාද කියලා. ඒ වෙලාවේ ඒ වෛද්‍ය ශිෂ්‍යයා කියනවා, මොන අසුභයක් ද, මළමිනියක් කපනකොට ම මට පෙනෙන්නේ ම සල්ලි කොළයි කියලා. ඒ කියන්නේ මළමිනිය කපනකොට, එම වෛද්‍ය ශිෂ්‍යයාට මැවිලා පෙනෙන්නේ අනාගතයේදි තමා වෛද්‍යවරයෙක් වෙලා, මුදල් හම්බ කරනවාය කියන උපාදානය යි. බලන්න, මෙච්චර ධර්මයට ලැදි වෛද්‍ය ශිෂ්‍යයා, මළමිනිය කපනකොට සල්ලි කොළ නම් දකින්නේ, අපි ඉදිරියේ කොයි තරම් භයානක අනතුරක් තිබෙනවා ද?

උරුවෙල කාශ්‍යප කියන ජටිල නායකයා දමනය කරන්න, බුදුරජාණන් වහන්සේ පෙළහර ප්‍රාතිහාර්යන් තුන්දහස් පන්සියයක් දක්වූවා කියලා ධර්මයේ සඳහන් වෙනවා. බලන්න, මොන තරම් බරපතළ දෘෂ්ටීන්වලට මනුෂ්‍යයා බැසගෙන සිටිනවා ද කියලා. නමුත් තමා තුළ ම ධර්මාවබෝධයේ ශක්තිය සැඟවී තිබියදීයි මෙවැනි දෘෂ්ටිවලට අපි බැසගෙන සිටින්නේ. බුදුරජාණන් වහන්සේ ජීවමානව නැති ලෝකය තුළ සංසාර බිය දකිමින් ම තමා තමාව දමනය කොටගැනීමට පිංවත් ඔබ දක්ෂ වෙන්න.

එක අම්මා කෙනෙක් ඉන්නවා, ඒ අම්මට වයස අවුරුදු අසූවක් පමණ ඇති. ඒ අම්මා කතා කළොත්, කතා කරන්නේ අනිත්‍ය ගැන ම යි. මෙය සටහන් තබන භික්ෂුව, දවසක් ඒ අම්මා අසනීප වෙලා සිටි වෙලාවක ධර්මය ටිකක් දේශනා කළා. නමුත් ඒ අම්මා භික්ෂුවට ධර්මය දේශනා කරන්න දෙන්නේ ම නැහැ. ඒ අම්මා කියන්නේ ම මේවා හැම දෙයක් ම අනිත්‍යයි කියලා. භික්ෂුව කල්පනා කළා, තවදුරටත් මේ අම්මට ධර්මය කියලා තේරුමක් නැහැ කියලා. භික්ෂුව කෙටියෙන් පිං අනුමෝදන් කරලා, එම නිවසින් වැඩම කරන්න ආසනයෙන් නැගිට්ටා විතරයි, මේ අම්මා කියනවා, හාමුදුරුවනේ, ඔබ වහන්සේ භාවනා කරලා, හැමදා ම මට නිදුක් නිරෝගීභාවය ප්‍රාර්ථනා කරන්නය කියලා. මෙච්චර වෙලා භික්ෂුවට ධර්මය කියන්න දුන්නේ නැහැ, අනිත්‍ය ගැන ම කියා සිටියා. අවසානයේ ඒ අම්මා කියනවා, භාවනා කරලා නිරෝගීභාවය ප්‍රාර්ථනා කරන්න කියලා. බලන්න, කතාවත්, ක්‍රියාවත් අතර කොච්චර පරතරයක් තිබෙනවා ද කියලා.

අපි හැම වෙලාවෙ ම තමන්ට වඩා ගුණවත්, සිල්වත් අයට සවන්දෙන්න පුරුදු විය යුතු යි. අපි දන්නා බව ප්‍රකාශ කරන්නට යාම නිසා, නො දන්නා දෙය දැනගන්න තිබෙන අවස්ථාව අපි අහිමි කරගන්නවා. සවන්දීම කියන කාරණය හුඟක් වටිනවා. භික්ෂුවගේ ගිහි ජීවිතයේ දී භික්ෂුව කැමතියි ඕනෑ ම අයෙකුට සවන්දෙන්න. දුප්පත් මනුෂ්‍යයකුගේ ජීවිතය තුළ, පොහොසත් මනුෂ්‍යයකුගේ ජීවිතය තුළ සැඟවිලා තිබෙනවා, බොහොම වටිනා කමටහන්. භික්ෂුවට මතකයි, එක්තරා ප්‍රභූ මහත්මයෙක් තමන් දූරු තනතුර අහිමි වෙච්ච වෙලාවේ, ඒ පිංවත් මහත්මයාගේ ඇස්වලට කඳුළු ගලාගෙන ආවා. ඒ කඳුළු පාලනය කරන්න ඒ මහතාට පුළුවන්කමක් ලැබුණේ නැහැ. එදා ගිහි කෙනෙක් හැටියට ඒ මහතාගේ මුවින් නික්මුණු වචනවලට පමණක් නො වේ නෙතින් රූටා වැටුණු කඳුළුවලට සවන්දුන්නා. ගෞරවයෙන් ඇසුරු කළ කෙනෙකුගේ නෙතින් ගලාගිය කඳුළක්. තවත්

කෙනෙකුගේ කඳුළු සාගරයක් නිවා දමන්න සවන්දීම කියන කාරණය හුඟක් උපකාර වුණා. අනුන්ගේ නෙතින් ගලායන කඳුළක් තුළිනුත් ඔබ සංසාර බිය ඇතිකොටගන්න. කඳුළ තුළින් සංසාර බිය දකින්න දක්ෂ කෙනා, සිනහව තුළිනුත් සංසාර බිය දකින්න දක්ෂ වෙනවා. මොකද, සිනහවත්, කඳුළත් දෙක ම තෘෂ්ණාවේ ඵලයන් නිසා. ඒ අයට සවන්දීමට අපේ ඇති දක්ෂතාව නිසා ම යි, අපිට ඒවා මතුකොට ගන්න හැකියාව ලැබෙන්නේ. හැබැයි සමහර පිංවතුන් සිටිනවා, ඒ අය සවන්දෙන්නේ දුර්වල තැන සොයන්න; අවසානයේ ඒවා විවේචනය කරන්න. අපි දක්ෂ වෙන්න ඕන, අබෝධය උදෙසා ම සවන්දීමට පුරුදු වෙන්න.

දුර්වල වූ සිල්පදය ගැන වැලපෙනු වෙනුවට....

බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩසිටි කාලයේ ස්වාමීන් වහන්සේලා උදය වරුවේ පිණ්ඩපාතයේ වැඩීමට කාලවේලා වැඩි නම් අන්‍ය තීර්ථකයින්ගේ ආරාමවලට ගිහිල්ලා, අන්‍ය තීර්ථකයින් සමඟ ධර්මය සාකච්ඡා කළ අවස්ථා රාශියක් තිබෙනවා. අන්‍ය තීර්ථකයින් ඉදිරිපත් කළ නො ගැළපෙන කරුණුවලට ස්වාමීන් වහන්සේලා පිළිතුරු දෙන්න යන්නේ නැහැ. එම කරුණු පිළිනොගෙන, ප්‍රතික්ෂේප ද නො කර බුදුරජාණන් වහන්සේ මුණගැසී එම ධර්ම කාරණා නිවැරදි කරගන්නවා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, නිවන් මඟ ගමන් කරන පිංවතා, කාරණා හතකට ගරු කළ යුතු යි කියලා. එම කාරණා හත තමයි, බුදුරජාණන් වහන්සේ, ධර්මරත්නය, සංඝරත්නය, සීලය, සමාධිය, අප්‍රමාදීභාවය, ධර්ම සාකච්ඡාව. ධර්ම සාකච්ඡාව නිවන් මාර්ගයට අදාළ ගරු කළ යුතු ධර්මයක් වෙනවා. ධර්ම සාකච්ඡාව සාර්ථක කරගැනීමට නම් සවන්දීමේ හැකියාව අපි ඇතිකරගත යුතු වෙනවා.

නිවන් මාර්ගයේ ගමන් කරන පිංවතාට නිහඬ පරිසරය හුඟාක් වැදගත් වෙනවා. අපි කොයි තරම් විවේකී ස්ථාන සොයමින් ගියත්, උතුම් සද්ධර්මයේ සැබෑ ම අර්ථය තුළ දී සැබෑ ම නිහඬතාව තිබෙන්නේ සෝෂාව තුළ යි. මොකද, සෝෂාව තුළදියි පිංවත් ඔබට හඳුනාගත හැක්කේ ඔබේ සිත කොයි තරම් නිහඬ ද කියලා. ලෝකය ගිනිගනිද්දී තමාගේ නිහඬ

සිත අත්දකින්න පුළුවන් සෝෂාව තුළදි ම යි. සෝෂාව තුළදි දකින නිහඬතාව තමයි ධර්මයේ සැබෑ ම අර්ථය කියන්නේ. අපි හුදකලාවට ඇලිලා, සෝෂාවට ගැටෙනවා නම් අපි යන්නේ ධර්ම මාර්ගයේ ආපස්සට යන ගමනකුයි.

භික්ෂුව දන්න එක ස්වාමීන් වහන්සේ නමක් හිටියා, උන්වහන්සේ බොහොම ගෞරවයෙන් වස් කාලයේ වස් සමාදන් වුණා. නමුත් කුටියේ ටික දවසයි වැඩසිටියේ. කුටියේ සිට කිලෝමීටර භාගයක් පමණ දුරින් තිබෙන ගමේ පන්සලේ හවස හයට ශබ්ද විකාශනයෙන් පිරිත් පටියක් විකාශය කරනවා කියලා, එම පිරිත් හඬ සමඟ ගැටී කුටිය හැරගියා. අපි උපාදානය කරගත් හුදෙකලාව කියන කාරණය, බුදුරජාණන් වහන්සේ ශ්‍රී මුඛයෙන් දේශනා කළ පිරිත් ධර්මයන් සමඟත් ගැටෙන ස්වභාවයට පත්වුණා. පිංවත් ඔබ කැමති දෙයට වගේ ම, අකමැති දෙයටත් සවන්දීමේ ශක්තිය ඇතිකොටගන්න. එවිට ඔබට පුළුවන්, උපේක්ෂාව කියන තැනට ඔබේ සිතිවිලි ඔසවා තබන්න.

අපි කැමති දේවල්වලට වඩා ලෝකය තුළ අපි අකමැති දේවල් තමයි වැඩිපුර තිබෙන්නේ. ලෝකය වෙනස් කරන්න අපිට බැහැ. අපි වෙනස් වෙන්න ඕනේ. අපි වෙනස් වෙන්න නම් කැමැත්ත, අකමැත්ත කියන තැන, අපි උපේක්ෂාව කියන තැනට ගන්න ඕනේ. එසේ නො වුණහොත් අපි අනුන් නිසා ප්‍රමාදයට පත් වූ අය බවට පත්වෙනවා.

භික්ෂුව දන්න එක්තරා ස්වාමීන් වහන්සේ නමක් උතුම් උපසම්පදාවෙන් බැහැරවෙලා, සාමණේර බවට පත්වෙලා. උන්වහන්සේ දැන් ප්‍රකාශ කරන්නේ නැවත තමන් උපසම්පදා සීලයෙහි පිහිටන්නෙ නැහැය කියලා. සීලයට බියවෙලා, කාටවත් ම සංසාර බියෙන් අත්මිදෙන්න බැහැ. උපසම්පදා වෙන්නේ නැහැ කියන්නේ උතුම් සීලයන්ගෙන් පලායනවා කියන කාරණය යි. සම්මා සම්බුද්ධ ශාසනය අයිති දක්ෂයාට යි. අදක්ෂයා නැති ප්‍රශ්න ඇති කරගන්නවා. සිල්පදයක් රැකීමත්, සිල්පදයක් බිඳීමත්, අපි තුළ සංසාර බිය ම යි සකස්කොට දෙන්නේ.

පිංවතුන් කල්පනා කරන්න පුළුවන්, සිල්පදයක් රැකීම කොහොමද සංසාර බිය ඇති කරන්නේ කියලා. සිල්පදයක් රැකීම තුළ අපිට ලැබෙන්නේ සුගතිය යි. පිංවත් ඔබ මේ ඉපදිලා සිටින මනුෂ්‍ය ලෝකය සුගතියටයි අයිතිවෙන්නේ. එහෙම නම්, සුගතිය කියන්නේත් සංසාර බිය ඇතිකරන තැනක් ම යි. ඒ නිසා අපි දක්ෂ වෙන්න ඕනා, සීලයේ ශක්තිය තුළින්, සුගතියත්, දුගතියත් දෙකම අනිත්‍ය බව දකිමින් විදර්ශනා නුවණ ඇති කරගන්න. ඒ කියන්නේ රැකෙන සිල්පදයත්, බිඳෙන සිල්පදයත් දෙක ම විදර්ශනා නුවණින් දැකලා, විදර්ශනා ඥානය ඇතිකර ගන්න අපි දක්ෂ වෙන්න ඕනේ. රකින සිල්පදය නුවණින් දැකලා, සෝවාන් ඵලයට පත්වෙන්න පුළුවන් වගේ ම, බිඳෙන සිල්පදයත් විදර්ශනා නුවණින් දැකලා සෝවාන් ඵලයට පත්වෙන්න පුළුවන්. මේ උතුම් ධර්මයේ තිබෙන සියුම් තැන් මේවා. පිංවත් ගිහි පිංවතුන් වන ඔබ අතින් සිල්පදයක් දුර්වල වුණොත් ඔබ කරන්නේ, ඒ දුර්වල වූ සිල්පදය ගැන සිතමින්, විතර්ක සකස් කරගනිමින්, තවතවත් අකුසල් රැස්කරගන්නා කාරණය යි. ස්වාමීන් වහන්සේලාත් සමහරවිට ඇවැත් දේශනා කරමින් පිරිසිදු විය හැකි සීලයන් ගැන, ඇවැත් දේශනා කිරීමෙන් අනතුරුවත් විතර්ක සිත් ඇතිකර ගන්නවා. නමුත් දක්ෂයා බිඳුණු සිල්පදය තුළින් නැවත පිරිසිදුභාවයට පත් වී, බිඳුණු සිල්පදය විදර්ශනා නුවණින් දකිමින් විදර්ශනා ඥානය ඇතිකර ගන්නවා.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ කාලයේ ජීවත්වුණු එක සර්පයෙක් දැකලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මේ සර්පයා අතීතයේ දී බොහොම දක්ෂයෙක් වෙලා සිටියා කියලා. මොකද, මේ සර්පයා කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයේ ජීවත්වුණු ස්වාමීන් වහන්සේ නමක්. දිනක් උන්වහන්සේ ඔරුවකින් ගංගාවක් තරණය කරනකොට, අනතුරක් සිද්ධවෙන්න ගිය මොහොතක, ළඟ තිබෙන අත්තක් අල්ලාගෙන තිබෙනවා. ඒ මොහොතේ ඒ අත්තේ තිබුණු කොළයක් කැඩිලා ස්වාමීන් වහන්සේගේ අතට ඇවිල්ලා. බුදුරජාණන් වහන්සේ පනවා ඇති

විනය කාරණා අනුව, උපසම්පදා භික්ෂුවක් ගසක කොළයක් කැඩීම වරදක් වෙනවා. ශීලයෙන් බොහොම පරිපූර්ණව ජීවත්වුණු මේ ස්වාමීන් වහන්සේට මේ කුඩා වරද හරි ම භිසරදයක් වුණා. ඇවතින් මිදීම සඳහා ඇවැත් දේශනා කිරීමට තවත් ස්වාමීන් වහන්සේ නමක් මුණගැසුණෙත් නැහැ. මේ කොළය කැඩීමේ වරද ගැන සිතමින්, දුක්වෙමින් සිටියා. එදින ම රාත්‍රියේ උන්වහන්සේ අපවත් වෙනවා. ඒ අපවත් වෙන මොහොතේ ගසක කොළයක් කැඩීමේ වරදයි උන්වහන්සේට සිහිපත් වුණේ. දෝමනස්ස සහගත සිතින් අපවත් වෙලා, සතර අපායට වැටෙනවා. ජීවිතය පරදුවට තබා රැකගන්න දක්ෂ වූ සිල්පද එකක්වත් සිහිපත් කරගන්න උන්වහන්සේ දක්ෂ වුණේ නැහැ. බලන්න, අදක්ෂකමක මහත. කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයේ අවුරුදු විසිදහසක් ආයුෂ වින්දනය කරලා, එම අවුරුදු විසිහයදහස තුළ හොඳින් සිල්පද ආරක්ෂා කරගෙන, බිඳුණු එක ම සිල්පදය නිසා, සතර අපායට වැටෙනවා. ලෝකය අසාධාරණයි කියන කාරණය මෙයින් මොන තරම් හොඳින් වැටහෙනව ද; සංසාරය කොයි තරම් නම් බියක් ද කියන කාරණය පැහැදිළි වෙනව ද.

පිංවත් ඔබ ඇස්දෙකටත් වඩා පරිස්සමින් සිල්පද ආරක්ෂා කරගන්න. වැරදීමෙන් හෝ සිල්පදයක් බිඳුණොත්, ඒ ගැන සිතමින් කම්පා වෙන්න එපා; ගැටෙන සිතක් ඇතිකරගන්න එපා. සිල්පදයක් බිඳුණොත් එම බිඳුණු සිල්පදය, අතීත පංච උපාදානස්කන්ධයක් හැටියට දකිමින්, බිඳුණු සිල්පදයෙන් රැස්වුණ සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකින්න. හැබැයි බිඳුණු සිල්පදය අනිත්‍යභාවයෙන් ඔබ විසින් යටකර දැමුව ද, බිඳුණු සිල්පදයට අදාළ අකුසලය තමාට අනාගතයේ දී විපාකය පිණිස පැමිණේවි. භව ගමනයි කෙටි කෙරුමට අවශ්‍ය වන්නේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, සෝවාන් ඵලයට පත්වුණ පිංවතාට, තව ගෙවීමට ඇත්තේ අතේ තිබෙන පස්මිටේ ප්‍රමාණයේ දුකක් ය කියලා; මහ පොළොවේ තිබෙන පස් ප්‍රමාණයට මොහු දුක් විඳලා තිබෙනවා කියලා.

එම නිසා ඔබ බුදුරජාණන් වහන්සේ අතට ගෙන පෙන්වන පස්මිටට බියවීමට අවශ්‍ය නැහැ. එම පස් මිටේ ප්‍රමාණයට දුක විශාඛා උපාසිකාවටත් තිබුණා. ඉහත කාරණයට උපසම්පදා භික්ෂුවක් සතරපාරාජිකාවට පත්වීම කියන කාරණය අදාළ වෙන්නේ නැහැ. එම වැරදිවල විපාකයන්, ආපසු හරවන්න බැහැ කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

කාවෙක් කියන කථාවක්....

අගෝස්තු මාසයේ මේ කඳුකරයට සුළඟ බොහෝ ම වේගවත්. කඩින්කඩ, වරින්වර සුළං ඇතිවෙනවා. සුළං හඬේ වේගවත් බව හරියට ගුවන් යානාවක් එන හඬ වගෙයි. සුළඟ කොච්චර වේගවත් වුණත් දිරාගිය අත්තක් මිසක් ගසකටවත් හානියක් නැහැ. වේලාව හවස හයහාමාරට පමණ ඇති. ලන්තෑරුමේ එළියෙන් ඔබට මේ සටහන ලියන්නේ. ගෝනෙක් බොහොම ළඟ කෑගහනවා ඇසෙනවා. දිය කඩිත්තේ වතුර බීලා යනගමන් වගෙයි. ඉඳහිට හෝතම්බුවෙක් වියළි කොළ මත දුවනවා ඇසෙනවා. කැලේ සතෙක් නිදහසේ ඇවිදිනවා දැක්කහම සතුටක් ඇතිවෙනවා. දඩයක්කරුවන් සිල් අරගෙන වගෙයි. රාත්‍රියට වෙඩි හඬ ඇසුණේ නැහැ. එක මනුස්සයෙක් සිල්පදයක් රකිනකොට සතුන් කොච්චර නම් සැනසිල්ලක් ලබනව ද. සතුන් ගැන සටහන් තබනකොට, බුදුරජාණන් වහන්සේගේ කාලයේ ජීවත්වුණ කාවෙක් ගැන මතක් වුණා.

එක්තරා ස්වාමීන් වහන්සේ නමක් සිටියා, උන්වහන්සේ සිල්පදවලට හුඟක් ගරු කරපු ස්වාමීන් වහන්සේ කෙනෙක් නො වන බවයි පෙනෙන්නේ. වස් කාලයට පෙරාතුව මෙම ස්වාමීන් වහන්සේට සිවුරක් කරගන්න හොඳ සළුවක් හම්බවෙනවා. ස්වාමීන් වහන්සේ කල්පනා කරනවා, වස් කාලයෙන් පසුව මේ සළුවෙන් සිවුරක් කරගන්න නම්, එතෙක් මේ සළුව තමන්ගේ නැඟණියට භාරදෙනවා කියලා. වස් කාලයෙන් පසුව නැවත ලබාගැනීමේ පොරොන්දුව මත සළුව නැඟණියට භාරදුන්නා. සළුවේ වටිනාකම දැක්කහම නැඟණියට සළුව ගැන ආශාවක්

ඇතිවුණා. ඇය මෙම සළුවෙන් තමන්ට ඇඳුමක් මසාගත්තා. වස් කාලයෙන් පසුව මේ ස්වාමීන් වහන්සේ නැඟණිය සොයාගෙන පැමිණ, තමා ප්‍රවේශමෙන් තබාගිය සළුව නැවත ඉල්ලා සිටියා. නැඟණිය ළඟ ස්වාමීන් වහන්සේට දෙන්න සළුවක් තිබුණේ නැහැ. ඇය වෙනත් රෙද්දක් ස්වාමීන් වහන්සේට ලබාදුන්නා. ස්වාමීන් වහන්සේ එය ප්‍රතික්ෂේප කළා. ස්වාමීන් වහන්සේගේ දැඩි ඉල්ලීම නිසා ම මුල් සළුවෙන් තමා මසාගත් ඇඳුම ස්වාමීන් වහන්සේට ලබාදුන්නා. ස්වාමීන් වහන්සේ මේ සළුව කෙරෙහි දැඩි තෘෂ්ණාවෙන් බැඳිලයි ඉඳලා තිබෙන්නේ. ස්වාමීන් වහන්සේ තම කුටියට ගිහිල්ලා, අර කාන්තා ඇඳුමේ මැහුම් ගලවලා එය නැවත සළුවක් කොට, පසුව සිවුරක් කරගත්තා. සිවුර මහලා ඉවරවෙලා, නැවතත් තම නැඟණියගේ නිවසට ගොස් එම සිවුර නැඟණියට දීලා කියනවා, "මම මේ සිවුර අරගෙන යන්න එනවා. එතෙක් ඔබ මේ සිවුර ප්‍රවේශමෙන් තබාගන්න කියලා. නමුත් රාත්‍රී කාලයේ දී කුටියේ දී ම මෙම ස්වාමීන් වහන්සේ අපවත් වෙනවා. ස්වාමීන් වහන්සේ අපවත් වුණු බව දැනගන්නා නැඟණිය තමා භාරයේ තබාගිය සිවුර සංඝයාට භාරදෙන්න, සිවුරත් අරගෙන ආරාමයට ගියා.

බුදුරජාණන් වහන්සේ ආරාමයේ වැඩ සිටිනවා. නැඟණිය සිවුර ස්වාමීන් වහන්සේලාට භාරදෙන්න හදනකොට බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා, තව සතියක් යන තෙක් එය සංඝයාට භාරදෙන්න එපා, නැඟණියට නිවසට රැගෙනගොස් තබාගන්නය කියලා. නැඟණියට ප්‍රශ්නයක්, ඇයි බුදුරජාණන් වහන්සේ සතියක් යන තුරු සිවුර භාර නො දී ගෙදර තබාගන්න කිව්වේ කියලා. ඇය මේ ගැන බුදුරජාණන් වහන්සේගෙන් විමසුවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, "ඔබට පේනවා ද ඔය සිවුර පුරා දුවන කාවෙක් ඉන්නවා. ඔය සිවුර පුරා දිවයන කාවා වෙන කවුරුවත් නො වෙයි. ඔබේ අපවත් වුණ සහෝදර ස්වාමීන් වහන්සේ ය" කියලා.

උන්වහන්සේ අපවත් වෙන වෙලාවේ, මේ සිවුර කෙරෙහි තෘෂ්ණාවෙන් අපවත් වෙලා, ඕපපාතික, ඇඳුම් මත ඉපදෙන කාවෙක් වෙලා. බලන්න උතුම් භික්ෂුත්වයක්, සළුවක් කෙරෙහි ඇතිකරගත් තෘෂ්ණාව නිසා ම කෘමියෙක් ලෙස නැවත උපත ලැබුවා.

පිංවත් ඔබ ඔබේ ඇඳුම්, වටින ඇඳුම්වලට කපුරු බෝල දමනවා නේ ද? ඇයි ඒ කපුරු බෝල ඇඳුම් අල්මාරිවලට දමන්නේ? කාවන්ගෙන්, කෘමීන්ගෙන් ඇඳුම් ප්‍රවේශම් කොටගන්න. දැන් පිංවත් ඔබට පේනවා නේ ද, ඔබේ ඇඳුම් අල්මාරියේ සිටින කාවෙක් කියන්නේ පෙර ජීවිතයක ඇඳුම් උපාදානය කර මියගිය මනුෂ්‍යයෙක් ම යි. ඔබේ රෙදි අල්මාරියේ දුවන කාවා තුළිනුත් ඔබට පුළුවන්, සංසාර බිය පිළිබඳව වටිනා කමටහනක් මතුකොටගන්න.

රෙදි අල්මාරිවල ඉන්න කාවෝ වගේ ම යි, පොත් අල්මාරිවල ඉන්න කාවොත්. පොත් උපාදානය කොටගෙන, පොත් මගේ කොටගෙන, පොත් ජීවිතය කොටගෙන ජීවත්වන මනුෂ්‍යයින් සමාජයේ කොපමණ නම් සිටිනවා ද. පුස්තකාලය ජීවිතය කරගත්තු, දැනුම එක ම දහම කොටගත් මනුෂ්‍යයෝ සමාජයේ කොපමණ නම් ජීවත්වෙනවා ද. ඒ අයගේ ධර්මය තමයි, පොත් විකිණීම, කියවීම, ලිවීම... සිත මේවා තුළ ගිලාබැසලයි තිබෙන්නේ. සූත්‍ර පොතක් කියවන්න කැමති නැහැ. ධර්ම පොතක් කියවන්න කැමති නැහැ. ලෞකිකත්වය තුළ ආස්වාදය සකස්කොට දෙන දැනුමට, විනෝදයට අදාළ අරමුණු මතුකොටදෙන පොත් උපාදානය කොටගෙන ජීවත් වෙනවා. උතුම් සද්ධර්මය කෙරෙහි ගෞරවයක් නැති පොත් උපාදානය කරගත් පිංවතුන් මැරෙන වේලාවෙත් මේ පොත් උපාදානය වුණොත්, පොත් අල්මාරියේම කාවෙක් වෙලා උපදින්න පුළුවන්.

සමහර පොත් අල්මාරි අරිනකොට, බොහොම කඩිසරව දුවන කාවන්, කෘමීන් අපි දැකලා තිබෙනවා. එහෙම කාවෙක් මීට පස්සේ දැක්කොත් ධර්මයෙන් බැහැරව පොත් උපාදානය

කරගත් මනුෂ්‍යයෙක්ව එම කාවා තුළින් දකින්න. පොත්ගුලේ සිටින කෘමිසතා තුළිනුත් සංසාර බිය දකින්න. උතුම් සද්ධර්මයට සම්බන්ධ පතපොතට ඉහත කාරණය අදාළ නො වන බව සලකන්න. සද්ධර්මයට අදාළ පතපොත පරිශීලනය කිරීමෙන් පිංවතුන්ලාට අර්ථයක් ම යි, මෝහයෙන් බැහැරවීමක් ම යි සිදුවන්නේ.

බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ උතුම් සූත්‍ර ධර්මයන් හැකිතාක් පරිශීලනය කරන්න. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අර්ථය ප්‍රකාශවෙන ඕනෑ ම පොතක් කියවන්න. හැකිතාක් සද්ධර්මය කෙරෙහි දැනුම වර්ධනය කොටගන්න. නමුත් යම් දවසක දැනුම කෙරෙහි තිබෙන තෘෂ්ණාව අත්හැරුණු විට තමයි ප්‍රඥාව සකස් වෙන්නේ කියන ධර්මතාවය සිහිකොටගන්න.

අරටුව හඳුනාගන්න

ධර්ම සාකච්ඡාවක දී පිංවත් මහත්මයෙක් ප්‍රශ්නයක් ඇසුවා හාමුදුරුවනේ, සමාධියෙන් තොරව භාවනාවක් කරන්න බැරි ද කියලා. අවංකව ම සමාධියෙන් තොරව භාවනාවක් කරන්න බැහැ. සමාධියක් නැහැය කියන්නේ, පංචනීවරණ සිතේ බහුලයි කියන කාරණය යි. පංචනීවරණ කියන්නේ, කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්චාව කියන ධර්මතාවයන්ට. මෙම අපද්‍රව්‍ය සහිත සිතේ ධර්මතාවයන්ට අදාළ භාවනාවක් වැඩෙන්නේ නැහැ. ලෝභ, ද්වේශ, මෝහ වැනි විෂම ධර්මතාවයන් නම් හොඳින් වැඩේවි. එම නිසා භාවනාවට පෙරාතුව සමාධිමත් සිතක් ඇතිකරගන්න අවශ්‍ය වෙනවා. ඊට උපකාරක ධර්මයක් සලස්වල දෙන්නේ සීලයේ පරිපූර්ණභාවය යි.

පංචනීවරණයන්ගෙන් විසිරුණු සිත බොහෝ ම කලබලකාරීයි; සැප සහිත අරමුණු ඔස්සේ හඹාගෙන යනවා. මේ කලබලකාරී බවට සතිය සැඟවිලා යනවා. මෙවැනි වෙලාවක සංසාරබිය දකිමින් ජීවත්වෙන්න; සතර අපාය සිහියට නඟා ගන්න. ධර්ම මාර්ගයත් ඔබත් අතර ඇති පරතරය දකිමින් බිය ඇතිකරගන්න. ඔබ ඔබව ලැජ්ජාවට පත්කරගන්න. එවිට භාවනා අරමුණු ඉදිරියේ සිත සන්සුන් වේවි. මෙවැනි උපක්‍රම තුළිනුත් ඔබේ සිතේ චංචල ස්වභාවය නවතින්නේ නැත්නම් ඒ වෙනුවෙන් ඔබ ආයාසයක් ඇතිකරගන්න. ඇස්දෙක පියාගෙන ආශ්වාස, ප්‍රශ්වාසයට පමණක් සිත යොමු කරන්න. ආශ්වාස ප්‍රශ්වාසය නවතාදමා මොහොතක් දෑස් පියාගෙන සිටින්න. නැවත නැවත මෙය සිදුකරන්න. මේ සියලු ක්‍රියාවන්ගේ අනිත්‍ය භාවය නුවණින් දකින්න.

අපි හැම විට ම සීලය, සමාධිය ගැන පමණයි කථාකරන්නේ. ප්‍රඥාව ගැන කථා කරනවා අඩුයි. සීල, සමාධි, ප්‍රඥා කියන්නේ මාර්ගයක්. එය ඵලයක් නො වේ; නිවන් අවබෝධ කරගන්නා වූ මාර්ගය. පිංවත් ඔබ දක්ෂ වෙන්න ඕන, මෙම මාර්ගයේ ගමන් කර ඵලයක් ලබාගන්න. එම ඵලයන් තමයි, සෝවාන්, සකෘදාග ාමී, අනාගාමී, අරිහත් ඵලයන්. සීලය තුළ හෝ සමාධිය තුළ නැවතී ඉඳල අර්ථයක් නැහැ. සීලය පමණක්, සමාධිය පමණක් තනිව අරගන්නේ නැතිව සීල, සමාධි, ප්‍රඥා මාර්ගය හැටියට නිවීමේ මාර්ගය දකින්න, ඔබ දක්ෂ වෙන්න.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ගසක අරටුවෙන් ප්‍රයෝජන ඇති මනුෂ්‍යයෙක්, හොඳ ගසක අරටුව තිබියදී ම අරටුව හඳුනා නො ගත් නිසා ම, අරටුව යැයි සිතාගෙන ගසේ කොළ, අතු කපාගෙන යනවා කියලා. තව කෙනෙක් ගසේ අරටුව යැයි සිතලා ගසේ පොත්ත කපාගෙන යනවා, තවත් මනුෂ්‍යයෙක් ගසේ අරටුව යැයි සිතා ගසේ සිවිය කපාගෙන යනවා, තවත් මනුෂ්‍යයෙක් ගසේ ඵලය කපාගෙන යනවා කියලා; මේ කිසිවෙක් ගසේ අරටුවෙන් ප්‍රයෝජන ගන්න දක්ෂ නැහැ කියලා.

එක කුලපුත්‍රයෙක්, ජාති, ජරා, ව්‍යාධි දුක දැකලා ඉන් මිදෙමියි කියල සද්ධාවෙන් ගිහිගෙදරින් නික්මිලා පැවිදි වෙනවා; පැවිදිභාවය හොඳින් කරගෙන යනවා. පැවිදිභාවයේ වටිනා ලක්ෂණ නිසා ම, ප්‍රසන්න, සිත්ගන්නාසුලු භාවය නිසා ම දායක පිරිස් ඇතිවෙනවා. ඒ නිසා ම ලාභ-සත්කාර, කීර්ති-ප්‍රශංසා රැස්කරනවා; මම ඇති අයෙක් වෙමි, කීර්තිය ඇති අයෙක් වෙමි, පිරිවර ඇති අයෙක් වෙමි, මහේශාක්‍ය වෙමියි සිතනවා; අන්‍යයන් පින් නැති, අල්පේශාක්‍යයන් හැටියට දකිනවා. උත්තරීතර, ප්‍රනීත ධර්මයන් ඇතිකරගන්න උත්සාහගන්නේ නැහැ. මෙවැනි භික්ෂුව, ගසේ අරටුව තිබියදී ගසේ අරටුව යැයි සිතා, කොළ, අතු කපාගෙන යන මනුෂ්‍යයෝ වගේ ය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

තවත් කුල පුත්‍රයෙක්, සද්ධාවෙන් පැවිදි වී, කීර්ති-ප්‍රශංසා සොයා නො ගොස්, තමා උසස්, අනුන් පහත් යැයි නො සිතා ප්‍රනීත ධර්ම වැඩීමට වෑයම් කරනවා. ඔහු සීලය හොඳින් පරිපූර්ණ කරනවා; සීලය උදෙසා ම තම පැවිදි ජීවිතය කැපකරනවා. ඉන් එහා, උත්තරීතර ප්‍රනීත ධර්මයන් වැඩීමට වෑයම් කරන්නේ නැහැ. මොහු සසුන ලිහිල්කොට ගත්තෙක් වෙනවා. මෙවැනි භික්ෂුව, ගසේ අරටුව තිබියදී ගසේ අරටුව යැයි සිතා, ගසේ පොත්ත කපාගෙන යන මනුෂ්‍යයා වගේ යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

තවත් කුල පුත්‍රයෙක්, සද්ධාවෙන් පැවිදි වී, සීලයෙන් පරිපූර්ණභාවයට පත් වී සමාධි සම්පත්තිය ඇති කරගන්නවා. ඔහු ඉන් එහා ප්‍රනීත ධර්මයන් වැඩීමට උත්සාහ ගන්නේ නැහැ. මොහු ධ්‍යාන සම්පත් ලබාගනිමින්, ඒවා උපාදානය කරගෙන ජීවත්වෙනවා. ඉන් එහා උත්තරීතර ධර්මයන් වඩන්නේ නැහැ. මොහුත් සසුන ලිහිල්කොට ගත්තෙක් වෙනවා. මොහු ගසේ අරටුව තිබියදී, ගසේ අරටුව ය යි සිතා, ගසේ සිවිය කපාගෙන යන මනුෂ්‍යයා වගේ යැයි බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

තවත් කුල පුත්‍රයෙක් සිටිනවා, ඔහු සද්ධාවෙන් පැවිදි වී, සීලයෙන් පරිපූර්ණභාවයට පත් වී, සමාධිමත් සිතෙන් වාසය කරනවා. ඔහු සමාධි සම්පත්තියෙන් නො සෑහී ඉන් එපිට චුතුපපාතඥාන, පූර්වේනිවාසානුස්සති ඥාන වැනි ප්‍රනීත ධර්මයන් සොයමින් වාසය කරනවා. ඉන් එපිට ධර්මයේ උතුම් හරයක් ගැන සිතන්නේ නැහැ. මේ භික්ෂුව, ගසේ අරටුව තිබියදී, ගසේ එලය කපාගෙන යන පුද්ගලයා වගේ ය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

තවත් කුල පුත්‍රයෙක් සිටිනවා. ඔහු දක්ෂයෙක්. ඔහු මේ ජාති, ජරා, ව්‍යාධි, මරණයන් දැකලා සද්ධාවෙන් පැවිදිවෙලා ලාභ-සත්කාර, කීර්ති-ප්‍රශංසාවලට බැඳෙන්නේ නැහැ. සීලයෙන් පරිපූර්ණභාවයට පත්වෙලා, උතුම් සමාධිමත් සිතෙන් වාසය

කරනවා. මොහු සීලයේවත්, සමාධියේවත් ආස්වාදයට බැඳෙන්නේ නැහැ. මොහු දක්ෂයි, රූපාවචර, අරූපාවචර ධ්‍යානඵල අනිත්‍ය බව දකින්න. උත්තරීතර ප්‍රනීත ධර්මයන් ජීවිතයට ලබමින් ම එම ප්‍රනීත ධර්මයන්ගේ අනිත්‍යභාවය දකින්න, එම භික්ෂුව දක්ෂයි. ඔහු සීලය නිසාවත්, සමාධිය නිසාවත් නැවත ලෝකයට බැඳෙන්නේ නැහැ; සංස්කාරයන් බියකරු හැටියට දකිමින් ම විදර්ශනා නුවණ ඇතිකරගන්නවා; සංසාර ගමන කෙළවර කරගන්නවා. මෙම භික්ෂුව ගසේ අරටුව සොයාගෙන ගොස් දක්ෂ ආකාරයෙන් ගසේ අරටුව ම තෝරාගත් දක්ෂයා බව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ ඉහත ධර්මය තුළින් පිංවත් ඔබටත් නුවණින් විමසා බැලිය හැකියි, ඔබ සද්ධර්මයේ අරටුව යැයි සිතා, ඔබ ගසේ අතුකොළ ද, පොත්ත ද, සිවිය ද, එලය ද පරිහරණය කරන්නේ කියල. මෙසේ සිතමින් ම ගසේ අරටුව හඳුනාගන්න උත්සාහගන්න, ඔබ දක්ෂ වන්න.

වර්තමාන සමාජය දෙස බලනවිට අපිට පෙනෙනවා, සමහරෙක් මහේශාක්‍යභාවය සොයාගෙන යනවා. තවත් පිංවතුන්ලා මස්මාංශ ද, නිර්මාංශ ද කියන තර්කයේ පැටලිලා සිටිනවා. තවත් පිංවතුන්ලා මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ශාසනය පැමිණෙන තෙක් බලාසිටිනවා. මේ සෑම ප්‍රශ්නයකට ම පිළිතුර, බුදුරජාණන් වහන්සේ ඉහත දේශනාවෙන් පැහැදිලි කර දෙනවා. මෙතනදි අපි කාගේවත් වරදක් නො වේ, දැකිය යුත්තේ. අපගේ ම ඉන්ද්‍රිය ධර්මයන්ගේ නො දියුණුභාවය යි. එහෙම නම් අපේ ප්‍රශ්නයට විසඳුම තිබෙන්නේ විවේචනය තුළ නො වෙයි, අපේ දුර්වලභාවය අපි ම හඳුනාගැනීම තුළයි. සද්ධර්මයේ උතුම් අරටුව අතුරුදහන් නො වී තිබියදීම අතුකොළ, පොත්ත, සිවිය, එලය විනිවිද ගොස් අරටුව මතුකර ගැනීමට අපි දක්ෂ විය යුතු යි. ජීවිතය කියන්නේ අවසානයේ මතකයක් පමණයි. ඒ මතකයන් මරල දමලා ජීවිතය මරණයට යනවා. අන්තිමට මතක් වෙච්ච මතකය තවත් ජීවිතයක් උරුමකොට දෙනවා. මියයාමත්, ඉපදීමත්

ජීවිතය කරගෙන භවය ගලාගෙන යනවා. භව නිරෝධයට අවශ්‍ය විසඳුම තව ම සන්දිට්ඨිකව තිබෙනවා. ගසේ අරටුව හඳුනානොගත් නිසා ම අපි අතු කොළ එකතු කරමින් ගස් වටේ කැරකෙනවා. දුකෙන් මිදීමට දුක ම සොයනවා. උතුම් සීලයත්, සමාධියත් අනිත්‍ය බව දකිමින් විදර්ශනා නුවණ, ප්‍රඥාව ඇතිකර ගන්න දක්ෂ වෙන්න.

පිංවත් මහත්මයෙක් ප්‍රශ්නයක් ඇසුවා, "හාමුදුරුවනේ සීලය විදර්ශනා නුවණින් දකින්නෙ කොහොම ද" කියලා. පිංවත් ඔබ කුමන සීලයක් සමාදන් වුව ද සිල්පද හොඳින් ආරක්ෂා කරගන්න. දැන් ඔබට පුළුවන්, එය භාවනාවක් කොටගන්න. සීලයෙන් ලැබෙන ආනිශංස තමයි, අප්‍රමාදීභාවය ඇතිවීම. ඒ කියන්නේ, සතර අපායන්ට වැටිලා ප්‍රමාද වෙන්නේ නැහැ. දෙවැනි ආනිශංසය, තමාගේ කීර්තිරාවය පැතිරෙනවා; ඕනෑ ම සභාවක් ඉදිරියට නො බියව යනවා; සිහිමුළා නො වී මැරෙනවා; සුගතියේ උපදිනවා. දැන් පිංවත් ඔබ නුවණින් මෙනෙහි කරන්න, මේ ආනිශංස සියල්ල විපාක දීල අනිත්‍ය වන දේවල්. මෙන්න මේ සීලයේ ආනිශංසයන්ගේ අනිත්‍යභාවය ඔබ නුවණින් මෙනෙහි කරන්න. එතකොට ඔබ භවයට බැඳෙන්නේ නැහැ. සිල් සමාදන් වෙලා එහි ආනිශංසයෙන් දෙවියෙක් වේවා යැයි ඔබට සිතුණොත්, සිල් ආරක්ෂා කරල, එහි ආනිශංසයෙන් නැවත සශ්‍රීක මනුෂ්‍යයෙක් වේවා කියලා ඔබට සිතුණොත්, අතීතයේ ඔබ සක්විති රාජ සම්පත් ලබල ජීවත් වෙලා, නැවත සතර අපායට වැටුණ හැටි නුවණින් මෙනෙහි කරන්න. ආනිශංසයේ ආස්වාදයට බැඳෙන්න එපා. විපාක දීල අවසන් වන සංස්කාරයන්ට ම බැඳෙන්න එපා. එවිට ඔබ තුළ ඇති චිත්තයයි සකස් වෙන්නේ.

සීලය විදර්ශනා නුවණින් දකිනව වගේ ම සමාධියේත් අනිත්‍යභාවය විදර්ශනා නුවණින් දකින්න. සමාධිය ඇතිවුණාය කියන්නෙ පංචනීවරණ යටපත් වුණාය කියන කාරණයයි. යටපත් වුණ පංචනීවරණ නැවතත් සකස් වෙනවාය කියන කාරණය නුවණින් දකින්න. සමාධියේ ආස්වාදය හැටියට ඔබ

ලබන ධ්‍යාන ඵලයන්ගේ අනිත්‍යභාවය දකිමින්, සමාධිය උතුම් විදර්ශනා නුවණ ඇතිකරගැනීම සඳහා උපයෝගී කරගන්න. සමාධිය කියන්නේ තාවකාලික සැපයක් මිස, දුකෙන් මිදීමක් නො වේ. දුකෙන් මිදීමක් සමාධිය තුළ සැඟවී තිබෙනවා. සමාධිය තුළ සැඟවී තිබෙන දුකෙන් මිදීමේ අර්ථය සමාධිය ම විදර්ශනා නුවණින් දැකීම තුළින් ඔබ මතුකරගන්න ඕනේ. එසේ නො වුණොත් සීලයත්, සමාධියත් අපිට තාවකාලික ආස්වාදයක් ලබා දී අවසානයේ සංසාරයමයි සකස්කර දෙන්නේ.

සුළු දුකට ගැටී මහ දුකක් වැළඳගන්නා මෝඩකම (සියදිවි නසාගැනීම)

පිංවත් මහත්මයෙක් භික්ෂුව මුණගැසීමට පැමිණියා. ඔහුගේ ම වචනවලින් කියනවා නම් ඔහුගේ මුළු ජීවිතය ම රෝගයක්. වෛද්‍යවරයෙකුට සොයාගන්න බැරි කායික වේදනාවකින් නිරතුරුව ම ඔහු පෙළෙනවා. මේ තරුණ මහත්මයා රෝගී තත්වය නිසා ම ජීවිතය නැති කරගන්න ගිය අවස්ථා කීපයක් ම තිබිල තියෙනවා. ඔහු කුටියට ඇවිත් භික්ෂුවට කියන්නේ, තමාට දිවිනසා ගැනීම හැර වෙනත් විකල්පයක් නැති බව යි. ඔහු කල්පනා කරනවා, ජීවිතය නැති කරගතහොත් මේ වේදනා සියල්ලෙන් ම මිදුණාය කියල. භික්ෂුව ඔහුට ප්‍රකාශ කළේ, ඔබ ලබාගන්නා සුදුසුකම්ලත් වෛද්‍ය ප්‍රතිකාර දිගට ම ලබාගන්න; මනෝ වෛද්‍යවරයෙක්ව මුණගැසෙන්න; හැකිතාක් බෝධිපූජා, දන්දීම්, ගිලන් අයට උපස්ථානය කරන්න කියලා; මෛත්‍රී චින්තනයෙන් සැමවිට ම ඉන්න කියලා; මේ කරන කුසල් ශක්තියෙන් තමාගේ ජීවිතයට බලපාන අතීත අකුසල් තිබේ නම්, එම අකුසල් විපාකයන් නැතිවන බව දකිමින් ජීවත් වන්නය කියලා; ලෙඩෙක්ය කියන කාරණය සිතන්නෙ නැතිව තමා හැම මොහොතක ම නිරෝගීය කියන කාරණය දකින්න කියලා. සමහර පිංවතුන්ලා සිත ලෙඩකරගෙන ජීවත් වෙන්නේ.

හිත ලෙඩ වුණොත් ශරීරය අනිවාර්යෙන් ම ලෙඩ ගොඩක් ම යි. බුදුරජාණන් වහන්සේ නකුල පියාට දේශනා කරනවා, පිංවත් නකුල, මේ කය ලෙඩ හැදෙන දෙයක්. කටුවකින් වැසීගිය බිත්තරයක් වගේ මේ කය පරිහරණය කරමින් යමෙක්

මොහොතක් හෝ නිරෝගීභාවයක් බලාපොරොත්තු වෙනවා නම්, එය අඥානකමක්. ඔබ මේ විදිහට හික්මෙන්න ඕන, මා හට අසනීපවලින් පීඩිත කයක් තිබුණට මම සිත විතරක් ලෙඩ කරගන්නේ නැහැ කියල. ඥානවන්ත ආර්ය ශ්‍රාවකයා සතර මහා ධාතුවෙන් හටගන්නා රූපය ආත්මය කරගන්නේ නැහැ. මා තුළ රූපය, රූපය තුළ මා සිටිනවා කියල ගන්නේ නැහැ. රූපය තුළ ආත්මයත් ආත්මය තුළ රූපයත් තිබෙනවාය කියල ගන්නේ නැහැ. එහෙම දකින කෙනා රූපය වෙනස්වෙන විට, රූපය ලෙඩවෙන විට පසුතැවෙන්නේ නැහැ, කනගාටු වෙන්නේ නැහැ කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

වර්තමානයේ සමහරක් රෝගාබාධවලට මූලික හේතුව මේ සිත ලෙඩ කරගැනීම. එක අම්මා කෙනෙක් සිටියා, ඇයගේ දියණිය පහේ ශිෂ්‍යත්ව විභාගයට බොහෝ ම මහන්සිවෙලා සූදානම් කළා. මේ කාලයේ දී ඇය උදයට නැගිට්ටෙ පාන්දර තුනට, දරුවාට අවශ්‍ය සටහන් පිළියෙල කරන්නට. අවසානයේ දරුවාගේ විභාග යේ ප්‍රතිඵල පැමිණියා. දරුවා විභාගය සමත්වෙන්න අවශ්‍ය සුදුසුකම් ලබල සිටියේ නැහැ. සිත ලෙඩවුණ ඒ අම්මා රෝගාතුර වුණා. දීර්ඝ කාලයක් ප්‍රතිකාර කරන්නට වුණා. තමන්ගේ දෙයත් තමන්ට අයිති නැති විට අනුන්ගේ දෙයක් තමාගේ කරගෙන දුක් විඳිනවා.

මුලින් සඳහන් කළ මහත්මයා භික්ෂුව මුණ ගැසෙන්නට පැමිණ ප්‍රකාශ කළේ, තමාගේ ශාරීරික වේදනාව ඉවසිය නොහැකි තැන, තමාට දිවිනසා ගැනීමට සිතෙනවාය කියල. ඔහු එවැනි උත්සාහයන් කිහිපයක් අතීතයේ අරගෙන තිබෙනවා. ඒ වෙලාවේ භික්ෂුව ඔහුට මතක් කළේ, ඔබ සිතන්න, මෙතැන දර කැබලි තුනකින් අවුළපු ගිනිගොඩක් තිබෙනවා. භික්ෂුව ඔබට කියනවා, මේ කුඩා ගිනිගොඩට විනාඩියක් ඔබේ ඇඟිල්ල දමාගෙන ඉන්න කියල. භික්ෂුව ඔහුගෙන් ඇසුවා, ඔබ විනාඩියක් ගිනිගොඩට ඇඟිල්ල දමාගෙන සිටින විට ඇතිවෙන වේදනාව ද වැඩි, ඔබේ ශරීරයේ රෝගය නිසා තිබෙන වේදනාව ද වැඩි

කියල. එවිට එම මහත්මයා කියනවා, මේ ඇඟිල්ල ගිනිගොඩට දමාගෙන සිටින විට ඇතිවෙන වේදනාව වැඩිය කියල. දැන් පින්වත් ඔබ නුවණින් මෙනෙහි කරන්න ඕනේ, සංසාරබිය නො දකින නිසා ම අපි අඩු වේදනාව අතහැරල, වැඩි වේදනාව උරුම කරගන්නවා; අඩු දුක අතහැරල, වැඩි දුක තෝරාගන්න යනවා. අසනීපය නිසා ඇතිවන ශාරීරික පීඩාව විඳගැනීමට නො හැකිව සියදිවි නසාගතහොත්, ඊළඟ උපත නිරයේ ම සිද්ධ වෙන්නයි බොහෝ දුරට ඉඩ තිබෙන්නේ. මෝහය නිසා ම, කර්මය, කර්ම ඵල විශ්වාසය නොමැති නිසා ම කැමැත්තෙන් ම පොඩි දුකක් අතහැරලා ලොකු දුකක් තෝරාගන්නවා. සියදිවි නසාගන්නවා කියන්නේ තමාගේ අකුසල් සංස්කාරවලින් තමා ම පලිගන්නවා කියන කාරණයයි; තමා කෙරෙහි තමා ද්වේශය ඇතිකර ගන්නවා කියන කාරණයයි. එහි විපාකය හැටියට ගිනි නිරයට වැටුණොත් ඒවායේ ආයුෂ කල්ප ගණන් දිග යි.

අපි ම කළා වූ අකුසල්වල විපාකයන් මතුවෙන විට, ඔබට සියදිවි නසාගන්නට සිතෙන්න පුළුවන්. එවැනි අවස්ථාවක කවදාකවත් ඉක්මන් වෙන්න එපා. කල්‍යාණමිත්‍ර ඇසුරත්, තමාට වඩා අවබෝධයෙන් වැඩි කෙනෙක් සොයාගෙන යන්න. අකුසල විපාකයන් බලවත් වෙන විට, ඒවා අපිට උපක්‍රමශීලීව විපාකයන් දීමට කටයුතු කරනවා. එම අකුසල් සංස්කාරයන්ගේ උපක්‍රමශීලීභාවය හඳුනාගතයුතු වන්නේ සද්ධාව තුළින් ම යි. ඒවාට පිළිතුරු සෙවිය යුත්තේ කුසලය තුළින් ම යි.

ශ්‍රද්ධාව රහිත පුද්ගලයාව පිරිහෙනවා. සංසාරබිය රහිත පුද්ගලයාව පිරිහෙනවා. ප්‍රඥාව රහිත පුද්ගලයාව පිරිහෙනවා. ඒ අයගේ ජීවිතය අවපසට යන සඳක් වගෙයි, සද්ධාව, සංසාරබිය ඇති, අලස නැති ප්‍රඥාවන්ත පුද්ගලයා පුරපසට යන සඳ වගේ දියුණුවෙනවා, සැප ලබනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

ඔබ යක්ෂයා ඉදිරියේ දෙවියෙක් ම වන්න

ධර්ම සාකච්ඡාවක් අවසානයේ දී එක් මැදිවියේ මහත්මයෙක් ප්‍රකාශ කළේ, තමන්ගේ බිරිඳ හරියට කේන්ති ගන්නවා, තමන් කොපමණ අවවාද කළත් ඇය අහන්නේ නැහැ, බිරිඳ ධර්මයට කැමති නැහැ, එයාට කේන්ති ගියහම හරියට යක්ෂණියක් වගේ කියලා. ඒ මහත්මයා අසනවා, "මම මොකද හාමුදුරුවනේ කරන්නේ" කියලා. ඒ වෙලාවේ භික්ෂුව ඔහුට ප්‍රකාශ කළේ, "ඔබ ම කියනවා, ඔබගේ බිරිඳ යක්ෂණියක් වගේය කියලා. බිරිඳ ඔබට ඔය බල කරන්නේ ඔබටත් යක්ෂයෙක් වෙන්න කියලයි. ඇය යක්ෂණියක් වුවදෙන්, ඔබ යක්ෂයෙක් වෙන්න එපා. ඔබ ඇය ඉදිරියේ මනුෂ්‍යයෙක්, දෙවියෙක් වෙන්න. පිංවත් ඔබට ගැටෙන්න මෙතන කිසි ම දෙයක් වෙලා නැහැ. ඔබ මේ දකින්නේ ධර්මයයි. බිරිඳක් ගත්තා නම් ඔබ ඒ ගත්තේ දුකක්. සැමියෙක් තෝරාගත්තා නම් ඔබ ඒ ගත්තේත් දුකක්. බිරින්දෑවරු වෙනුවෙන් ඔබ සංසාරයේ හෙළා ඇති කඳුළු, රුධිරය මහා සාගරයේ ජලයට වඩා වැඩිය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඔබේ බිරිඳ ඔබට ඔය බල කරන්නේ එම කඳුළු සාගරයට තවතවත් කඳුළු, රුධිරය එකතු කරන්නටය කියලා. ඔබ මෙතැනදි දක්ෂ වෙන්න ඕනේ, උතුම් සද්ධර්මය ප්‍රයෝජනයට අරගෙන මේ කඳුළු සාගරය උපරිම ආත්මභව හතකට සීමාකර ගන්න. නැවත බිරිඳ ඔබට බැන්නොත් ඔබ ඒ බැනුම් නිහඬව ඉවසන්න. බිරිඳ ඔබට පහරක් ගැසුවහොත් දෙවැනි පහරත් ගහන්න හිස නමන්න. පිංවත් ඔබ සිතන්න එපා, ඔබ ඒ හිස නමන්නේ තමාගේ බිරිඳට කියලා. ඔබ ඒ හිස නමන්නේ උතුම් සද්ධර්මයට යි. ඔබේ අකීකරු බිරිඳ තුළිනුත්, අකීකරු ස්වාමියා

තුළිනුත් ඔබ අධිෂ්ඨානයක් ඇතිකරගන්න, මම මේ භව ගමනේ ලබන අවසාන බිරිඳයි, අවසාන ස්වාමිපුරුෂයායි මේ ලැබුවේ කියලා"

දුක ඇතිකරන දේ කෙරෙහි අවබෝධයෙන් කලකිරීම ඇතිකරගන්න. අකීකරු බිරිඳව, ස්වාමිපුරුෂයාව කමටහනක් කොටගෙන, නැවත 'බිරිඳ', 'ස්වාමිපුරුෂයා' කියන දුකෙන් මිදෙන්න.

මාස 3කට විතර පසුව ආයෙමත් අර මහත්මයා භික්ෂුව මුණගැසිලා කියනවා, "හාමුදුරුවනේ, දැන් මගේ බිරිඳ හොඳයි. කේන්ති ගන්නේ නෑ" කියලා.

භික්ෂුව වැඩ සිටින ලෑලි බංකුව ඉදිරිපිට සක්මන් මළුවක් තිබෙනවා. එම සක්මන් මළුවේ පැති බැම්මේ කළුගලක් යටින් අඟල් දහයක් පමණ දිග ගැඩවිල් පණුවෙක් සක්මන් මළුව තුළ ඇදී යනවා. එම ගැඩවිල් පණුවා පසුපසින් කෙළ වැනි දියරයක් වැගිරෙනවා. ඒ නිසා පණුවා යන පාර හොඳින් සලකුණු වෙලා. පණුවා වටයක් ගිහිල්ලා එයා මුලින් මතුවූ ගල ළඟට ම ඇවිත් සිටිනවා. පණුවා සිතාගෙන සිටින්නේ එයා දීර්ඝ ගමනක් ගියා කියලා. නමුත් එයා පටන්ගත්ත තැනටමයි ආපසු ඇවිත් සිටින්නේ.

අපිත් සංසාරයේ කොපමණ නම් දීර්ඝ ගමනක් ගිහිල්ලා ආපහු පටන්ගත්ත තැනට ඇවිල්ලා ඇති ද? උතුම් මනුෂ්‍යයෙක් වශයෙන් ඉපදිලා, අකුසල් සිද්ධ කරලා, සතර අපායට වැටිලා, ඒවායේ කල්ප ගණන් දුක් විඳලා ආයෙමත් මනුෂ්‍ය ජීවිතයක් ලබනවා. අපි හරි ම සතුටුයි. අපි හිතන්නේ දුර්ලභ මනුෂ්‍ය ජීවිතයක් ලැබුවා කියලා. මෙවැනි දුර්ලභ මනුෂ්‍ය ජීවිත ලක්ෂ ගණනක් ලබා තිබුණාය කියන කාරණය දැක්කේ නැහැ. වැලි මළුවේ වටයක් කැරකුණු ගැඩවිල් පණුවා දැක්කහම අප පැමිණි සංසාර ගමනයි භික්ෂුවට සිහිවුණේ. ඒ ගැඩවිල් පණුවා තුළිනුත් සංසාර බිය ම යි සකස්වුණේ.

පාසලක ඉහළ ශ්‍රේණියක ඉගෙනුම ලබන දරුවෙක් පැමිණියා, භික්ෂුව මුණගැහෙන්න. ඒ දරුවාට ප්‍රශ්නයක් ඇතිවෙලා. ඒ දරුවාට දැනට ටික කාලයක සිට ඔහු මතු සම්මා සම්බුද්ධත්වයට පත්වෙනවාය කියලා අදහසක් ඇතිවෙලා. එම දරුවා අසන ප්‍රශ්නය තමයි, මතු බුද්ධත්වය ප්‍රාර්ථනා කිරීම සුදුසු ද කියලා. ලොකු අයගේ දේවල් ආදර්ශයට ගන්න ගිහිල්ලා පොඩි අයට ඇතිවන ප්‍රශ්න බලන්න....

කොහොම වුණත් පාසල් දරුවෙක්ගේ ජීවිතය තුළ මෙවැනි අදහසක් ඇතිවීම අගය කළ යුත්තක්. අපි දක්ෂ වෙන්න ඕනේ, එම අර්ථවත් අදහස තුළින් වඩාත් නිවැරදි දේ මතුකොටගන්න. බුදුරජාණන් වහන්සේ නමක් ලෝකයට පහළවෙන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගය මතුකොටගන්න. ඒ මතුකොටගත් ආර්ය අෂ්ටාංගික මාර්ගයයි, අපේ ධර්මයේ සැබෑ අර්ථයකොට ජීවිතයට එකතුකරගත යුත්තේ. වෙනත් අතුරු අරමුණු නො වේ. මෙතැනදි එම දරුවා මතුකොටගත යුත්තේ තමා තුළ සැඟවී තිබෙන අතීත කුසල් සංස්කාරයන්ගේ ශක්තියයි. එම අතීත කුසල් සංස්කාරයන් ළමාවියේ දී දරුවන්ට මතුකොට දෙන්නේ දෙමාපියන්ට, ගුරුවරුන්ට, වැඩිහිටියන්ට දක්වන කීකරුභාවය තුළින්; වැඩිහිටියන් වන්දනා කිරීම තුළින්; සිල්පද පහ ආරක්ෂා කරගැනීම තුළින්; දෙමාපියන් සමඟ බුද්ධ වන්දනාවන්ට සහභාගී වීම තුළින්; ඒ තුළින් දරුවන්ට පෙර භවයන්හි විපාක නො දුන් කුසල් ශක්තිය මතුකොටගන්න පුළුවන්. පෙර භවයන්හි කුසල් ශක්තිය මේ ජීවිතයේ දී ඔබට අධ්‍යාපන කටයුතු සාර්ථක කරගන්න හුඟාක් උපකාරී වෙනවා. එම නිසා අධ්‍යාපනය ලබන කාලය, ඉහත ගුණධර්ම ආරක්ෂා කරගෙන අධ්‍යාපනය උදෙසා පමණක් වැය කරන්න.

තරුණ ඕජාව ජීවිතයට ගලාගෙන පැමිණීමත්, අධ්‍යාපනයත් කියන කාරණා දෙක ම සිද්ධවෙන්නේ එක ම කාලවකවානුවේ. එම නිසා වැඩිහිටි පාසල් දරුවන් හුඟක් පරිස්සම් වෙන්න ඕනේ. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළට යොමුකර ඇති දැඩි තරගකාරී

බව නිසා පාසල් දරුවන් තුළ ද්වේශය, ඉරිසියාව, රාගය වැනි කාරණාවන් දැඩිව මතුකොටදෙන වටපිටාවක් නිර්මාණය වෙලා තිබෙනවා. එම කුරිරු වටපිටාවෙන් ඔබට පොදුවේ මිදෙන්නට බැහැ. තමතමන් තනිව ම යි නිදහස් විය යුතු වෙන්නේ. අපගේ අකුසල්වල විපාකයන් නිසා ම ඉදිරියේ දී ලෝකය නිර්මාණය වෙන්නේ දුක වැඩි දිශාවට. පොදුවේ ශිෂ්‍යයා නිසා ගුරුවරයාට සතුටු විය හැකි කාලයක් අනාගතයේ දී උදාවෙන්නේ නැහැ. එම නිසා පොදුවේ ගැලවෙන්න මාර්ගයක් අපට නැහැ. තමා තුළින් කුසලයේ ශක්තිය මතුකොට ගැලවෙන්න දක්ෂ වෙන්න ඕනේ.

පාසල් දරුවා තුළිනුත් අපි සංසාර බිය ම යි සකස්කොටගත යුත්තේ. දරුවන් ඇති අම්මලා දරුවන් නිසා මේ තරම් දුක් විඳිද්දිත්, දරුවන් නැති අම්මලා දරුවන්ව ම යි ප්‍රාර්ථනා කරන්නේ.

දරුවාගේ පින අවදි කරවන්න - කඳුළු සාගරයත් දකින්න

ලෝකය ගලාගෙන යනවා. කුසල් අකුසල් ඊට උපකාරී වෙනවා. පිංවත් ඔබට ලෝකය අවශ්‍ය නම් කුසලයයි ඔබ උපකාරකර ගත යුත්තේ. එම නිසා පාසල් දරුවන් සෑමවිට ම දෙමාපියන්ට, ගුරුවරුන්ට කීකරුව, පංචශීලය අර්ථවත්ව සමාදන්ව, නිරතුරුව ම බුද්ධ වන්දනාවන්ට සහභාගී වුවහොත්, සහෝදර ශිෂ්‍යයන් සමඟ සමගියෙන් කටයුතු කළොත්, දරුවන්ට පුළුවන් තමාගේ අතීත කුසල් ශක්තිය මතුකරගෙන අධ්‍යාපන කටයුතු සාර්ථක කරගන්න.

පිංවත් දරුවන් දෙමාපියන්ට, ගුරුවරුන්ට ගෞරවය නො කළොත්, පංචශීලය ආරක්‍ෂා කර නො ගත්තොත්, දිනපතා බුද්ධ වන්දනාවට සහභාගි නො වුණොත්, පිංවත් දරුවන් තුළින් මතුවී එන්නේ අතීතයේ අකුසල් සංස්කාරයන්ගේ ඵලය යි. වර්තමාන පාසල් දරුවා තුළින් ඔබ දකින්නේ මේ අනතුර යි.

සෝපාක පුංචි හාමුදුරුවෝ, නිග්‍රෝධ පුංචි හාමුදුරුවෝ, සංකිච්ච පුංචි හාමුදුරුවෝ, දබ්බමල්ල පුත්ත, පුංචි හාමුදුරුවෝ, චුල්ල පන්තක පුංචි හාමුදුරුවෝ ළමා කාලයේ දී ම උතුම් රහතන් වහන්සේලා බවට පත්වුණා. ඒ ළමා ජීවිත තුළ තිබූ අතීත කුසල් සංස්කාරයන්ගේ ශක්තිය මතුකරගත්තා. බලන්න, මොන තරම් අයෝමය කුසල් ශක්තියක් ළමා ජීවිත තුළ සැඟවිලා තිබෙනවා ද කියල. ළමා ජීවිතය තුළ සැඟවී තිබෙන අතීත කුසල් ශක්තිය, දරුවන්ට පමණක් තනිව මතුකරගන්න බැහැ. වර්තමානයේ පාසල් දරුවා තුළින් දෙමාපියන් මතුකොට ගැනීමට උත්සාහ

ගන්නේ අධ්‍යාපනය පමණක් ම යි. මෙතනදී හුඟාක් වෙලාවට අපි පැරදෙනවා. ගුණයෙන් තොර දරුවෙකුයි, අපි සමාජගත කරන්නේ. අවසානයේ ඒ දරුවන් දෙමාපියන්ටවත් සලකන්නේ නැහැ. එම නිසා දෙමාපියන්, ගුරුවරුන් හැමවිට ම වැඩිහිටියන්ට ගරුකිරීම කියන කාරණයේ දී, පංචශීලය ආරක්‍ෂා කිරීම කියන කාරණයේ දී, දිනපතා බුද්ධ වන්දනාව කිරීම කියන කාරණයේ දී දරුවන්ට ආදර්ශවත් විය යුතු වෙනවා.

භික්‍ෂුවට මතකයි, භික්‍ෂුවගේ ගිහි පාසල් ජීවිතය. ගිහි කාලයේ දී භික්‍ෂුව ඉගෙනගත්තේ ක්‍රිස්තියානි පාසලක. පාසලේ හතේ ශ්‍රේණිය දක්වා බුද්ධාගම විෂය අපිට ඉගැන්නුවේ නැහැ. බුද්ධාගම විෂය තිබෙන වේලාවට අපිව පුස්තකාලයට යවනවා. අ.පො.ස (සා.පෙ) විභාගය ඉලක්ක කරගෙන අටේ ශ්‍රේණියේ පටන් තමයි අපිට බුද්ධාගම විෂය ඉගැන්වූයේ. භික්‍ෂුව ජීවිතයේ කවදාකවත් දහම් පාසලකට ගිහිල්ල නැහැ. භික්‍ෂුව බුද්ධ වන්දනාවට අදාළ ගාථා කියන්න, කරණීයමෙත්ත සූත්‍රය කටපාඩමින් කියන්න ඉගෙනගත්තේ අම්මා සමඟ නිවසේ දී බුද්ධ වන්දනාව කරද්දියි. අම්මා කියල දුන්න, අම්මාගෙන් ඉගෙනගත්ත ගාථා පෙළයි, අදත් ඔබ සමඟ බුද්ධ වන්දනාව කරන විට සජ්ඣායනා කරන්නේ. බලන්න, අම්මා කෙනෙකුට දරුවෙකුගේ ජීවිතයේ යහපත උදෙසා මොන තරම් ආදර්ශයක් දෙන්න පුළුවන් ද කියලා.

දරුවන් නිසා දුක්වෙන අම්මලා සමාජයේ අප්‍රමාණ සිටිනවා. මේ අය සිතන්නේ තමන් පැමිණි භව ගමනේ තමන්ට ලැබුණු පළවැනි දරුවයි මේ ලැබිල තිබෙන්නේ කියලා. සංසාරයේ දිග, පළල, ගැඹුර දකින්නේ නැහැ. දරුවන් උදෙසා අතීතයේ මහා සාගරයේ ජලයට වඩා කඳුළු හෙළල තිබෙන බව දකින්නේ නැහැ. දරුවා කියන කාරණය මහා බියක්. දරුවා කියන කාරණය මහා දුකක්. දරුවා කියන කාරණය මහා බැඳීමක්. දරුවෙක් ඉපදුණාය කියන්නේ දුකක් ඉපදුණාය කියන කාරණය යි. සංසාර බිය නො දකින නිසා ම ලෝකයට අපව බැඳ තබන කාමවස්තුව දරුවායි. දරුවන් නිසා අප කොච්චර නම් අපාගත වෙලා ඇත්ද? තම

දරුවා අසාධ්‍ය තත්වයෙන් රෝහලේ ඇඳ මත වේදනාවෙන් පෙළෙනවිට එම අම්මා තම දරුවාට කියනවා, පුතේ, ඔබ සුවපත් කරන්න මම අපායට උණත් යන්න ලෑස්තියි කියල. අම්මල තාත්තල වශයෙන් අපි දරුවන් නිසා කල්ප ගණන් සතර අපායේ දුක්විඳල තිබෙනවා. දරුවා තුළින්, ඇති මේ සංසාර බියයි මතුකරගත යුත්තේ. එතන තමයි මේ දුකෙන් මිදෙන මාර්ගය තිබෙන්නේ. ධර්මානුකූලව සිතීමෙන් තොරව, අපට මේ අනතුරෙන් ගැලවෙන්න බැහැ. තවත් අපි අනතුරුවලටයි යන්නේ. දරුවන් නිසා දුක්විඳින දෙමාපියන් ස්ථිර අධිෂ්ඨානයකට එන්න ඕන, මම මේ භව ගමනේ ලබන අවසාන දරුවයි මේ ලැබුවේ කියල. මේ ජීවිතයේ ලැබුණ දරුවන් හොඳින් පෝෂණය කරමින්, යුතුකම් ඉටුකරමින්, දරුවා තුළින් ම ලෝකයෙන්, දරුවාගෙන් මිදෙන ස්වභාවයට ඔබ පැමිණිය යුතු යි. එතන තමයි දරුවා කියන දුකේ නිමාව තිබෙන්නේ.

මේ සටහන් තබන භික්ෂුව අම්මා, තාත්තා කියන බැඳීමෙන් මිදුණේ අම්මා තාත්තාව කමටහනක් කරගෙන ම යි. දරුවන් හැටියට අපිව ලොකුමහත් කරන්න, උගන්වන්න අම්මා, තාත්තා ගත්තා වූ වෙහෙස, වින්දාවූ දුක ඇස් දෙකෙන් දැකලා ම යි අම්මා, තාත්තා කියන අර්ථයන් කෙරෙහි ඇති තෘෂ්ණාවෙන් මිදුණේ. අම්මා, තාත්තා විඳපු දුක දැකල ම යි දෙමාපියන් කෙරෙහි සංසාර බිය ඇතිකරගත්තේ.

අම්මාගේ නෙතින්, තාත්තාගේ නෙතින් මා උදෙසා නැගුණු සෑම කඳුළක් ම මා කඳුළු සාගරයක් කර දැක්කා. මහ සාගරය දකින හැම මොහොතක ම භික්ෂුව සිතන්නේ මේ සංසාරයේ මගේ අම්මලා, තාත්තලා මා උදෙසා හෙළූ කඳුළු සාගරයයි කියල. කඳුළු සාගරයේ ප්‍රමාණය දකින විට මේ මුළු ලෝකයේ ම සත්වයෝ මගේ අම්මලා, තාත්තලා හැටියට දකින්න මට දක්ෂභාවය ලැබුණා. මේ මොහොතේත් භික්ෂුව කරුණාවෙන් මේ සටහන් තබන්නේත් ඒ ඥාතීත්වය දකින නිසා ම යි.

ඔබ මැරිමැරී උපදින්නේ මේ සසර බිය විශ්වාස නො කළ නිසා ම ය

පහත සිද්ධිය පිංවතුනට දෙමාපියන්, දරුවන් අතර ඇති බැඳීම පිළිබඳ සංසාර බිය ඇතිකර ගැනීමට උපකාර වේවි.

භික්ෂුවක් උතුම් සමාධියෙන් පසුවනකොට, එම භික්ෂුවට ප්‍රේත මවක්, පාසල් ඇඳුමින් සැරසුණු, පොත් බෑගයක් කරේ එල්ලාගත් ප්‍රේත පාසල් දරුවෙක් සමඟ දර්ශනය වෙනවා. මේ ප්‍රේත අම්මා ප්‍රේත දරුවාගේ අතින් අල්ලාගෙන ප්‍රධාන පාසලක් ඉදිරිපිට බස් නැවතුමක සිටිනවා. මේ ප්‍රේත අම්මා දරුවාව පාසල් එක්කරගෙන ඇවිල්ලා. පාසල ඇරුණු පසු නැවත ප්‍රේත විමානයට යනවා වෙන්න පුළුවන්. එම ප්‍රේත පිරිස් බස් රථයේ නැගලා යනවා අපි දකින්නේ නැහැ. ප්‍රේතයින් ජීවත්වන ප්‍රේත විමාන තිබෙනවා. ඒවා හරියට අපිළිවෙළට, එක පෙළට හැදුණු සෙල්ලම් ගෙවල්, ගවගාල් වගෙයි. ජරාවාස වෙච්චි මුඩුක්කු පැල්පත් වගේ හරි අපිරිසිදුයි. අකුසල් නිසා ම මේ ප්‍රේත විමාන මැද්දෙන් අපිරිසිදු කානු ගලාගෙන යනවා. භූත මැස්සෝ, භූත බල්ලෝ, භූත කුකුල්ලු මේ ප්‍රේත විමානවල සිටිනවා. කකුල් ඉදිමුණු ප්‍රේතයෝ, ඇඟපුරා භූත මැස්සන් වැසූ ප්‍රේතයෝ ඉතාමත් අපිරිසිදුව මේවායේ ජීවත්වෙනවා.

පිංවත් ඔබට සමහරවිට මේවා විශ්වාස කරන්නට බැරිව ඇති. මේවා විශ්වාස කිරීමට අපි මැලි නිසයි ලෝකය තුළ තවමත් අපි මැරෙමින්, ඉපදෙමින් ජීවත්වෙන්නේ; සංසාරයේ කටුක බිය තවමත් අපි නො දකින්නේ. පියවි ඇසට නො පෙනෙන භවයේ

මේ කටුක යථාර්ථය උතුම් සමාධියේ ශක්තියෙන් දකින පිංවතායි සංසාර බිය ඇතිකරගෙන සංසාරයෙන් ගැලවී යන්නේ.

භික්ෂුවක් සමාධියෙන් පසුවන විට එක් ප්‍රේත විමානයක ප්‍රේතයන් දෙදෙනෙක් සහ ප්‍රේතියන් තුන්දෙනෙක් දර්ශනය වෙලා තිබෙනවා. භූත බල්ලන්, භූත කුකුළන් කිහිපදෙනෙක් එම ප්‍රේත විමානයේ ඉඳලා තිබෙනවා. මේ ප්‍රේතියන්ගේ ස්වභාවයෙන් භික්ෂුව හඳුනාගෙන ඇත්තේ ඔවුන් පෙර ජීවිතයේ මනුෂ්‍ය ලෝකයේ ගණිකාවන් බවයි. මේ ප්‍රේතියන් බීමත් ස්වභාවයෙන් තමයි ඉඳලා තිබෙන්නේ. පිංවත් ඔබට දැන් ප්‍රශ්නයක් මතුවෙන්න පුළුවන්, කොහොමද ප්‍රේත ලෝකයේ ප්‍රේත ප්‍රේතියන් බීමතින් සිටින්නේ කියලා. මත්වතුරට ලොල්වෙලා මියයන මනුෂ්‍යයන් ප්‍රේත ලෝකයේ උපත ලැබුවහම මනුෂ්‍යයින් මත්වතුර බොන තැන් ඇසුරු කරගෙන තමයි ජීවත්වෙන්නේ. අරක්කු තැබෑරුම් අසල මෙන් ම අරක්කු පාවිච්චි වන සාදවල ද මේ ප්‍රේත ප්‍රේතියන්, ඔබ පාවිච්චි කරන අරක්කු වීදුරුව ආස්‍රහණය කරනවා වෙන්න පුළුවන්. මේ හේතුව නිසා අරක්කුවලට ලොල්වුණු ප්‍රේත ප්‍රේතියන් වෙරිමතයට මත්වෙනවා වෙන්න පුළුවන්. පිංවත් ඔබ ඔබේ නිවසේ අරක්කු සාදයක් පවත්වනවා කියන්නේ ගමේ ම සිටින මත්වතුරට ගිජු ප්‍රේත ප්‍රේතියන් ඔබේ නිවසට ගෙන්වා ගන්නවා කියන කාරණය යි. අවසානයේ ඔබ කාගේ ආශිර්වාදය ද ලබන්නේ? ගමේ සිටින මත්වතුරට ලොල් වූ ප්‍රේත ප්‍රේතියන්ගේ 'මූසල ආශිර්වාදය යි'

බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩසිටි දවස 'උදය' කියලා බ්‍රාහ්මණයෙක් සිටියා. මේ උදය බ්‍රාහ්මණයාට සෝවාන් ඵලයට පත්වීමට පිං ඇති භාවය දැකලා ඔහු කෙරෙහි අනුකම්පාවෙන් බුදුරජාණන් වහන්සේ උදෑසන පිණ්ඩපාතය සඳහා උදය බමුණාගේ නිවසට වැඩියා. උදය බමුණා බොහොම ගෞරවයෙන් දන් පූජා කළා. බුදුරජාණන් වහන්සේ උදය බමුණාට පිං අනුමෝදන් කරලා නැවත වැඩියා. බුදුරජාණන් වහන්සේ දෙවැනි දිනයේත්, තෙවැනි දිනයේත් පිණ්ඩපාතය සඳහා උදය බ්‍රාහ්මණයාගේ

නිවසට වැඩම කළා. තෙවැනි දිනයේ උදය බමුණා බුදුරජාණන් වහන්සේට කියනවා, "ඔබ වහන්සේ මගේ ප්‍රනීත දානයේ රසයට ගිජුවෙලා ආයේ ආයෙමත් වඩිනවා නේ ද?" කියලා. බුදුරජාණන් වහන්සේ බමුණාට කියනවා "බමුණ, බිත්තර වී වපුරනවා. අස්වැන්න නෙළනවා. ආයෙ ආයෙමත් වපුරනවා. යාචකයන් ඉල්ලාගෙන එනවා. දානපතියන් දන්දෙනවා. ආයේ ආයෙමත් දන් දෙනවා, සුගතියේ උපදිනවා. එළදෙනගෙන් කිරි දොවනවා. කිරි එරෙනවා. ආයෙ ආයෙමත් කිරි දොවනවා. වසු පැටවා ආයේ ආයෙමත් මව් වැස්සිය ළඟට යනවා. සත්වයා ආයේ ආයෙමත් ගර්භාෂයකට යනවා. ආයේ උපදිනවා; මැරෙනවා. අමු සොහොනට යනවා. තියුණු ප්‍රඥාව ඇති කෙනා ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන්කොට නැවත උපදින්නේ නැහැ"ය කියලා. මේ ධර්මය නුවණින් මෙනෙහි කරලා සංසාර බිය ඇතිකොටගෙන උදය බමුණා උතුම් සෝවාන් ඵලයට පත්වෙනවා.

උදය බමුණා අවබෝධකොට ගන්නවා, බුදුරජාණන් වහන්සේ ආයෙ ආයෙමත් තමන්ගේ නිවසට පිණ්ඩපාතය වැඩියේ රසයට ගිජුවෙලා නො ව, තමා තුළ ඇති රසයට ගිජුභාවය නැතිකර දැමීමට ය කියලා. පිංවත් ගිහිපැවිදි අපි කවුරුන් වුව ද ආයේ ආයෙමත් උතුම් සංඝයා හමුවීමට යා යුත්තේ නැවත ගර්භාෂයකට යාමට නො ව, මේ ක්‍රියාවලිය නවත්වා ගැනීමට අදාළ ධර්මයන් ජීවිතයට එකතුකර ගැනීමට ය.

පිංවත් තරුණ මහත්මයෙක් ධර්ම සාකච්ඡාවක් අවසානයේ ප්‍රශ්නයක් ඇසුවා "ඔබ වහන්සේ ධර්මය ගළපා දෙද්දී උතුම් සමාධියෙන් අත්දැක්ක කාරණා රාශියක් සඳහන් කරනවා. ඔබ වහන්සේ ඔය කියන දේවල් අපි කොහොමද විශ්වාස කරන්නෙ" කියලා.

බොහොම අවංක ප්‍රශ්නයක්.

මේ කරුණු විශ්වාස කරන්න පුළුවන්කම ඇත්තේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව තුළින් ම යි. මහා සංසරත්නය

කියන උතුම් අර්ථයත්, එම උතුම් අර්ථය පෝෂණය කරන සතර පාරාජිකාවන්ගෙන් පෝෂණය වුන ප්‍රාතිමෝක්ෂ ශීලය ශක්තියක් කොටගෙනයි, ආභරණයක් කොටගෙනයි භික්ෂුව මේ කරුණු සටහන් තබන්නෙ; මේ ධර්මය දේශනා කරන්නේ. එතැන තමයි පිංවත් ඔබ ඇතිකොටගත යුතු විශ්වාසය. භික්ෂුවට ඔබට දිය හැකි සහතිකයත් එපමණ ම යි. මේවා සටහන් තබන භික්ෂුව පිළිබඳව ඔබ ප්‍රශ්නයක් ඇතිකොටගන්න එපා. සටහන් තබන ධර්මය ගැන පමණක් නුවණින් මෙනෙහි කරන්න. බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ උතුම් ධර්මයත් සමඟ ගලපා බලන්න. භික්ෂුව සටහන් තබන ධර්මය, දේශනා කරන ධර්මය සත්පුරුෂ ඔබට යහපතක් ම වේවි; සංසාර බිය ඇතිකොට ගැනීමට මාර්ගයක් ම වේවි.

ඉසුරු සොයා යන්න ද කල්පනාව? බලන්න, භික්‍ෂුවගේ සෞභාග්‍යය

භික්‍ෂුව හොඳින් දන්නා පිංවත් මහත්මයෙකුට මේ දිනවල ගැටලුවක් මතුවෙලා. ඒ ගැන භික්‍ෂුවගෙන් අවවාදයක් බලාපොරොත්තු වුණා. ඒ මහත්මයාට හදිස්සියේ ම බටහිර රටකට පදිංචියකට යන්න අවස්ථාවක් ලැබිලා. මේ හේතුව නිසා ඒ මහත්මයාගේ සිතේ මේ දවස්වල ලොකු යුද්ධයක්, යම්දෝ.. නො යම්දෝ... කියලා.

ඉහත ප්‍රශ්නය අරඹයා මේ මහත්මයාගේ සිත බොහොම ගැඹුරින් තර්ක විතර්ක කරනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, සිත කියන්නේ මාරයා කියලා. මේ මුළු ලෝක ධාතුවේ ම ආධිපත්‍යය දරන සමස්ත සත්ව ප්‍රජාවේ ම ඉරණම තීරණය කරන, ව්‍යවස්ථාව සම්පාදනය කරන මාරයාගේ අධිකරණ ක්‍රියාවලියක් තිබෙනවා. මේ අධිකරණ ක්‍රියාවලිය ඔස්සේ තමයි, මාරයා භවය නැමැති සිරගෙදරට සත්වයා සිරකරන්නේ. මේ අධිකරණ ක්‍රියාවලිය අපේ මනුෂ්‍ය ලෝකයේ ක්‍රියාත්මක වන අධිකරණ ක්‍රියාවලියට වඩා හාත්පසින් ම වෙනස්. අපේ මනුෂ්‍ය ලෝකයේ නම්, අධිකරණ ක්‍රියාවලියේ දී පැමිණිල්ල සහ විත්තිය මෙහෙයවන නීතිඥ පාර්ශව දෙකක් තිබෙනවා. නමුත් මාරයාගේ අධිකරණ ක්‍රියාවලියේ දී පැමිණිල්ලත්, විත්තියත් දෙක ම මෙහෙයවන්නේ මාරයාගේ පාර්ශවය විසින් ම යි. මේ ක්‍රියාවලිය පෘථග්ජන සිතකට හඳුනාගැනීමට නොහැකි, උතුම් සම්මා දිට්ඨිය තුළින් ම හඳුනාගත යුතු ක්‍රියාවලියක්. මාරයා අධිකරණයේ පැමිණිල්ලත්, විත්තියත් දෙක ම මෙහෙයවන

නීතිඥයා වූ කල අපූරු නීති, තර්ක සිත තුළ මතුකර දෙනවා. සශ්‍රීක ධනවත් හොඳ අනාගතයක්, විවේකය, හුදෙකලාව පිරුණු, ගැටුම් අඩු ජීවිතයක්, දරුවන්ට ඉංග්‍රීසි උගත් සරු අනාගතයක්..... පැමිණිල්ල බොහොම අපූරුවට තර්ක ගෙනහැර දක්වනවා. මේ තර්කවලට එරෙහිව විත්තියෙන් තර්ක ඉදිරිපත් කරනවා. දරුවන් බටහිර සිරිත්විරිත් ඉගෙනගෙන විනාශ වෙයි ද? ධර්මයේ අර්ථයන්ගෙන් අපේ ජීවිත බැහැර වෙයි ද? දෙමාපියන්, ඥාතීන් අසනීප වුවහොත්, මියගියහොත් බලන්න එන්න බැරි වෙයි ද? එම රටවල ශීතල දේශගුණය පවුලේ අයට ඔරොත්තු දෙයිද?............ විත්තියෙන් බොහොම අපූරුවට අදහස් ඉදිරිපත් වෙනවා. දෙපාර්ශ්වයේ අදහස් සමඟ යුද්ධයක් කරමින් තමයි ඒ මහත්මයා මේ දවස්වල ජීවත්වෙනවා ඇත්තේ.

නමුත් ඒ පිංවත් මහත්මයා දන්නේ නැහැ, මේ පැමිණිල්ලත් විත්තියත් දෙක ම මෙහෙයවන්නේ මාරයා කියන නීතිඥයා කියලා. කොයි මොහොතක හෝ ඒ මහත්මයා යනවා හෝ නො යනවා කියන තීරණය ගනීවි. තීරණය කුමක් වුවත්, එම තීරණය මාරයාගේ ම ය. ඒ මහත්මයා ගත්තා වූ තීරණය මාරයාගේ ම වූ කල භික්ෂුව ඔහුට කිනම් අවවාදයක් දෙන්න ද? භික්ෂුව පිංවත් මහත්මයාට මතක් කළේ, පවුලේ අය සමඟ කථා කරලා, සුදුසු තීරණයක් ගන්න කියලා. හැබැයි භික්ෂුවට මෙහෙම කියන්න සිතුණා:

"මහත්තයෝ, කොළ කැබලි දෙකක් ගන්න. එක කොළ කැබැල්ලක ලියන්න, 'මම රට යනවා' කියලා. අනික් කොළ කැබැල්ලේ ලියන්න, 'මම රට යන්නේ නැහැ' කියලා. දැන් කොළ කැබලි දෙක හොඳට රෝල් කරලා උඩ දමන්න. කොළ කැබලි දෙක බිම වැටුණාට පස්සේ ඔබ එක කොළ කැබැල්ලක් තෝරාගෙන දිගහැරලා බලන්න. එහි සටහන් වෙලා තිබ්බොත් 'රට යන්න' කියලා, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, රූපය මාරයා කියලා. පිංවත් ඔබ අතට ගන්න කොළ කැබැල්ල කියන්නේ මාරයා ම යි. එම නිසා 'මාරයා කියන දෙය මම කරන්නේ නැහැ' කියලා 'රට යන්න' යනුවෙන් ලියලා තියෙන

කොළ කැබැල්ල ඉරලා විසිකරන්න. දැන් ඔබ ඉතිරිවෙලා තිබෙන කොළ කැබැල්ල අතට අරගෙන දිගහැරලා බලන්න. එහි සටහන් කරලා තිබෙන්නේ 'රට යන්න එපා' කියලා. දැන් පිංවත් ඔබ පෙර සේ ම නැවත සිතන්න, කොළ කැබැල්ලක් කියන රූපයත් මාරයා, මාරයා පෙන්වන දේ මම කරන්නේ නැහැ කියලා. එම කොළ කැබැල්ලත් ඉරල විසි කරන්න".

දැන් පිංවත් ඔබ නුවණින් දකින්න ඕනා, රට යෑමත්, රට නො යෑමත් දෙක ම මාරයාට අයිති සිතිවිල්ලක් ම බව. රට යෑමත් නො යෑමත් දෙක ම මාරයාට අයිති නම්, පිංවත් ඔබ කුමක් ද කරන්න ඕනේ?

රට යෑමත්, රට නො යෑමත් දෙක ම අතහැරලා නැවතීම යි.

පිංවත් ඔබ කුමක් ළඟ ද නවතින්නේ?

ධර්මය ළඟයි.

රට යම්දෝ, නො යම්දෝ කියලා සකස්වන ඔය සිත අනිත්‍ය වශයෙන් දකින මොහොතේ ම ඔබ ධර්මය ළඟ නැවතුණා වෙනවා; මාරයාගේ සටකපට අධිකරණ ක්‍රියාවලිය හඳුනාගත් පිංවතෙක් වෙනවා. මාරයා අපට විකට ඇඳුම් අන්දවා, දූක නැමැති සංදර්ශනයට ඉදිරිපත් කරනකොට මාරයාට අපි පිළිතුරු දිය යුත්තේ ඉහත ආකාරයට යි.

එතකොට එම පිංවත් මහත්මයා භික්ෂුවගෙන් ප්‍රශ්න කරන්න පුළුවන්, ඔබ වහන්සේ කියන විදිහට සිතුවොත්, මම බලාපොරොත්තු වන වාසනාවන්ත අනාගතයට මොකද වෙන්නේ කියලා.

එහෙම ඇසුවොත් භික්ෂුවට කියන්න තිබෙන්නේ මෙහෙම යිඃ

මේ ලෝකයේ ජීවත්වන ශ්‍රේෂ්ඨ ම ධනවතුන්ගෙන් කෙනෙක් තමයි, මේ සටහන් තබන භික්ෂුව. ලෝකයේ යම් ශ්‍රේෂ්ඨ ධනයක් තිබෙනවා නම්, ඒ ශ්‍රේෂ්ඨ ධනයෙන් ලැබිය හැකි යම් ශ්‍රේෂ්ඨ

සැපයක් තිබෙනවා නම්, ඒ ශ්‍රේෂ්ඨ ධනයත්, ශ්‍රේෂ්ඨ සැපයත් භික්ෂුව අයිති කොටගෙනයි සිටින්නේ. මේ සා ශ්‍රේෂ්ඨ ධනවතෙක් වුණු භික්ෂුව සතුව තිබෙන්නේ තුන් සිවුරත් පාත්‍රයත් පමණයි. ඒවත් අනුන්ගෙන් සිඟමනෙන් ලැබුණ දේවල් ම යි.

සැබෑ ම ලොව්තුරු සැපයට පයින් ගසමින්, මාරයාගේ අධිකරණ ක්‍රියාවලියේ තීන්දුව ලැබෙන තෙක් බලාපොරොත්තුවේ දෑස් දල්වාගෙන බලා සිටින අපට සිතන්න දෙයක් ඉහත සටහනේ තිබෙනවා කියලා භික්ෂුව විශ්වාස කරනවා.

අපේ සමාජයේ ජීවත්වෙන බහුතරයක් පිංවතුන්ලා තමන්ගේ ප්‍රශ්න මාරයාගේ අධිකරණයට භාරදීලා නිවැරදි තීරණයක් බලාපොරොත්තුව සිටිනවා. ප්‍රශ්නයත් මාරයාගේ ම වූ කල, අධිකරණයත්, පැමිණිල්ලත්, විත්තියත් මාරයාගේ ම වූ කල තීන්දුව අනිවාර්යයෙන් ම දූකට අයත් දෙයක් වෙනවා.

සැපයට අධිපති දුකේ මැවුම්කරු
ගෙනයයි ඔබ තව තැනකට නිරතුරු

භික්ෂුව මේ මොහොතේ වැඩ සිටින කුටිය ඉහළින් නිරතුරුව ම ගුවන් යානා ගමන් කරනවා. මේ සටහන තබන මොහොතේ භික්ෂුව වාඩිවෙලා සිටින ගල් තලාවට ඉහළින් ගුවන් යානාවක් ගමන් කරනවා. එය බොහෝ ම සුඛෝපභෝගී ගුවන් යානාවක් විය හැකි බවකුයි, එහි හැඩහුරුකමින් භික්ෂුවට පෙනෙන්නේ. භික්ෂුව මහ පොළොවේ ගල් තලාවක් මත වාඩි වී සිටිය දී, භික්ෂුවගේ හිසට ඉහළින් ගමන් කරන පිංවත් ඔබ, මට වඩා කොච්චර පිං කරලා තිබෙන පිරිසක් ද. භික්ෂුවගේ හිසටත් ඉහළින් ගමන් කරන්නේ පින නිසා නේ. නමුත් ඒ උතුම් පින අපි උපයෝගී කොටගන්නේ, අනාගතයේ විපාකය පිණිස රැස්කොටගන්නා තවත් ලෝභ, ද්වේශ, මෝහ අකුසල් මූලයන් උදෙසා යි. පින නිසා ම අතීත භවයන්හි දී මෛත්‍රී ධ්‍යාන සකස් කොටගෙන, රූපාවචර ධ්‍යාන සකස් කොටගෙන, ආකාශයේ ඍර්ධියෙන් ගමන් කළ පිංවත් ඔබ, දිව්‍යතලවල සශ්‍රීක ඍර්ධිමත් දෙවිවරු ලෙස ඉපදිලා, ආකාශයේ නා නා විධ පෙළහැර පෑ ඔබ, සක්විති රජ ලෙස ඉපදිලා ඍර්ධිමත් ඇතුපිට, ඍර්ධිමත් අජානේය අසුපිට ආකාශයේ ඍර්ධියෙන් ගමන් කළ පිංවත් ඔබ, එදා තේරුම් නො ගත්, පින නැමැති සංස්කාරයේ අනිත්‍යභාවය වර්තමානයේ ගුවන් ටිකට්පතක් හිමිකරගෙන, විදේශ රටකින් වීසා අවසරයක් ලැබ, ගුවන් යානයක අහසින් ගමන් කරද්දී කෙසේ නම් තේරුම් ගන්න ද?

පිංවත් ඔබ, අතීතයේ ඍර්ධියෙන් ආකාශයේ ගමන් කරද්දිත්, ඒ ආස්වාදජනක සිත අයිති වූයේ මාරයාට ම යි. මේ මොහොතේ භික්ෂුවගේ හිසටත් ඉහළින් ගමන් කරන පිංවත් ඔබේ වර්තමාන සිතිවිල්ල අයිති වන්නේ ද මාරයාට ම ය. බලාපොරොත්තු කන්දක්, බාධක පොදියක් කරබාගෙන, බලාපොරොත්තු හිස් කළ භික්ෂුවගේ හිසටත් ඉහළින් පිංවත් ඔබ අදත් ගමන් කරනවා.

පසුගිය වසර කිහිපය පුරාවට භික්ෂුවට හොඳ අත්දැකීමක් තිබෙනවා. භික්ෂුවට මුණගැසුණ, හොඳින් පිංකම් කරන, හොඳින් දන්දෙන, ගෞරවයෙන් සංඝයා ඇසුරු කරන පිංවතුන්ලාට බොහෝ ම ඉක්මනට රැකියාවන් සඳහාත්, අධ්‍යාපනය සඳහාත්, ස්ථිර පදිංචිය සඳහාත් විදේශගත වෙන්න අවස්ථාව ලැබෙනවා. ඉහත කාරණය පුදුමයක් වෙන්න දෙයක් නැහැ. පින නැමැති සැපයට අධිපති සංස්කාරයේ යථා ස්වභාවයයි අපි මේ දකින්නේ. පින බොහොම බලවත් දෙයක්. ඒ වගේ ම පින වැරදි ආකාරයට කළමනාකරණය කළොත් එය ගින්දරක් බවටයි පත්වෙන්නේ. මහා සංඝරත්නයට පසඟ පිහිටුවලා වන්දනා කළ පිංවතුන්, මහා සංඝරත්නයට දන්පැන් පූජා කරලා පිං රැස්කරගත් පිංවතුන් එම පිනේ ශක්තියෙන්, ආශ්චර්යයෙන් මහා සංඝරත්නයේ හිසටත් ඉහළින් ගමන් කරනවා.

භික්ෂුව සිතන්නේ, පින සැපයට අධිපති වුණත්, වැරදි ආකාරයට කළමනාකරණය කරගත් පින හරි ම අසත්පුරුෂ ධර්මතාවයක් ය කියලා.

භික්ෂුව මේ මොහොතේ කුටිය ඉදිරිපිට ගල් තලාව මත වාඩිවෙලා, ඇස්දෙක පියාගෙන මොහොතක් අතීත ආවර්ජනයක යෙදෙනවා, භික්ෂුව ගිහි කාලයේ දී මුලින් ම අභියෝග කළේ සැපයට ද, දුකට ද කියලා.

භික්ෂුව ධර්ම මාර්ගයේ මුල් අවධියේ දී පළමුව අභියෝග කළේ සැපයටයි, පිනටයි. ආස්වාදයන් සොයමින් සැපයට ම යි අභියෝග කළේ. ආස්වාදයට ම බැඳී යන මාර සිතක් සමඟ

සැපයට අභියෝග කිරීම අපහසු කාරණයක් වෙනවා. භික්ෂුව සැපයට අභියෝග කිරීමෙන් ම යි ආස්වාදයේ අනිත්‍යභාවය මතුකොට ගත්තේ. පින නැමැති සංස්කාරය පිංවත් ඔබට සැපය නැමැති මිරිඟුව පෙන්නලා, සැපය සොයායන ගමනේ දී පිංවත් ඔබව නැවත නැවත අකුසල් මූලයන්ට යොමු කරනවා. විදේශගතව ජීවත්වන සමහරක් පිංවතුන් බොහොම වෙහෙසකාරී, අවිවේකී ජීවිතයි ගත කරන්නේ. එම ආගන්තුක රටවල ජීවන වියදමත් සමඟ, ආගන්තුක සංස්කෘතීන් සමඟ ගනුදෙනු කිරීමේ දී ඒ පිංවතුන්ලා ලෝභ, ද්වේශ, මෝහ අකුසල මූලයන්ට කොටුවෙන්න තියෙන අවස්ථා වැඩියි. පෙර පින නිසා ම සැපය නැමැති මිරිඟුව පසුපස හඹායන පිංවත් ඔබ දක්ෂ වෙන්න ඕනේ, ඔබ සතු පිංවත් භාවය ප්‍රඥාවේ උද්දීපනය උදෙසා යොමු කරගන්න.

සැපයට අධිපති, දුකේ මැවුම්කරු වන පින නැමැති සංස්කාරය පිංවත් ඔබ කවදා ද හඳුනාගන්නේ? කවදා ද මේ පින නැමැති සංස්කාරයන්ට ඔබ ධර්මානුකූලව අභියෝග කරන්නේ? පිංවත් ඔබ පිනට අභියෝග කරන මොහොතේ ම දුකටත් අභියෝග කළා වෙනවා. මොකද, (ඉකුත් සටහනේ දැක්වූ පරිදි) මාරයාගේ අධිකරණ ක්‍රියාවලියේ විත්තියත් පැමිණිල්ලත් දෙක ම මාරයා ම යි. ඒ නිසා ම විත්තියටයි, පැමිණිල්ලටයි දෙකට ම අභියෝග කරන්න අවශ්‍ය නැහැ. පැමිණිල්ලට ඔබ අභියෝග කරද්දී, විත්තියටත් ඔබ අභියෝග කළා වෙනවා. පිංවත් ඔබ ධර්මානුකූලව පිනට අභියෝග කරද්දී දුකටත් ඔබ අභියෝග කළා වෙනවා.

පිංවත් ඔබ, ආර්ථිකයෙන් දියුණුවෙන් දියුණුවට පත්වෙලා, කෝටිපතියෙක් වෙලා මැරෙන්න පුළුවන්. නමුත් ඔබ මරණයෙන් පසුව වැටෙන්නේ සතර අපායට නම්, ඒ කෝටිපතිකමින් ඇති ඵලය කුමක් ද? සල්ලි ගෝනියක් ගෙදර තබාගෙන ඒ සල්ලි ගෝනියට වැන්දා කියලා ලැබෙන ඵලයක් නැහැ. බියක් ම යි සකස් වෙන්නේ; කාමච්ඡන්දයක් ම යි සකස් වෙන්නේ.

කොටුවේ දුම්රියපොළට ගිහිල්ලා, තුන් වැනි පංතියේ ප්‍රවේශපත්‍රයක් මිලට ගෙන, අනුරාධපුරයට ගිහිල්ලා, තිසාවැවෙන් දිය නාලා, දොළොස්මහේ බත් දන්සැලෙන් බත් පිඟානක් අනුභව කරලා, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ, රුවන්වැලි මහ සෑ සමිඳුන් වන්දනා කරන මොහොතක් පාසා ම, ලෝකයේ උතුම් ම සැනසිල්ලක් ඒ මනුෂ්‍යයා අත්විඳිනවා. සම්මා දිට්ඨියට පත් පිංවත් ජනතාවට ආර්ථිකය නො වෙයි වැදගත් වෙන්නේ. සද්ධර්මයේ උතුම් අර්ථයන් ම යි. සද්ධර්මයෙන් තොරව අප ගන්නා වූ තීරණයන්, අවසානයක් නොමැතිව ගලායන ලෝකයට නිරතුරුව ම ආරම්භයක් මතුකොට දෙනවා. ප්‍රශ්නවලින් හෙම්බත් වෙච්චි මනුෂ්‍යයන්, ප්‍රශ්න අතරින් ම මතුවෙලා දුකෙන් මිදෙන්න ගන්න ආරම්භයත්, නැවතත් දුකට හේතුවන අකුසල මූලයක් ම සකස්කොට දෙනවා. දුක-සැප දෙක ම වංචාකාරී ලෙස පිංවත් ඔබව මුළා කරනවා. අකුසල් සංස්කාරයන්ගෙන් මිදී දුකෙන් පලායන ඔබ, නැවතත් සැපය අභියස දී අකුසල් මූලයන් ම රැස්කරනවා. අවසානයේ දුක-සැප මිරිඟුව අභියස පිංවත් ඔබ අසරණ මුව පොව්වෙක් වෙනවා.

දුකෙන් මිදීමත් සැප ලැබීමටත් ගන්නා උත්සාහයේ දී ඔබගේ පංච උපාදානස්කන්ධය නිරතුරුව ම ගිනිගන්නවා. ඒ ගින්නට ආහාර දමමින් අපි ලෝකය තව තව අවුළුවා ගන්නවා. අපි සිතන දේවල්වලින් කොච්චර පොඩ්ඩක් ද අපේ ජීවිතවලින් ඉටුවෙලා තිබෙන්නේ. බලාපොරොත්තු කන්දක්, බාධක පොදියක් කර තබාගෙන අපි ගමන් කරනවා. ඒත් වෙහෙසක් දැනෙන්නේ නැහැ. නැවුම් බලාපොරොත්තු, පිංවත් ඔබගේ ඉවරයක් නැති ගමනට තව තව ජවය ලබාදෙනවා. අල්පේච්ඡ ජීවිතයක, ලද දෙයින් සතුටුවෙන ජීවිතයක, සරල ජීවිතයක, මධ්‍යම ප්‍රතිපදාවට යටත් ජීවිතයක අර්ථය තුළින් පලායන අපි, සැපය නැමැති මිරිඟුව අභියස, නැවත දුකට අවශ්‍ය සාධක ම වපුරාගන්නවා.

මීට මොහොතකට පෙර භික්ෂුවගේ හිසට ඉහළින් වේගයෙන් පියඹා ගිය සුඛෝපභෝගී ගුවන් යානය, තවත් පැය කිහිපයකින් ලෝකයේ කොහේ හෝ ගමනාන්තයකට ගොඩබසීවි.

භික්ෂුව ඉහත සටහන් කළ, පින නැමැති සංස්කාරයේ අනිත්‍යභාවය පිංවත් ඔබ මේ ජීවිතයේ දී හඳුනා නො ගත්තොත්, පිංවත් ඔබ, මරණින් පසු ලෝකයේ කොහේ හෝ ගමනාන්තයකට ගොඩබසිනු ඇත. අවසානයේ පිංවත් ඔබගේ ජීවිතයත් තවත් ගුවන් ගමනක් ම වනු ඇත.

මම පැවිද්ද ඉල්ලුවේ මහා කාශ්‍යප මහරහතන් වහන්සේගෙන්...

(මෙම සටහන් ඇතුළුව ග්‍රන්ථයේ ඉදිරි සටහන් කිහිපය, පැවිදි ජීවිතවලට උපකාරයක් වන ලෙස සටහනක් තබන ලෙසින් තවත් පිංවත් භික්ෂුවකගෙන් ලද ආරාධනයක් මත ලියැවුණු ඒවා ය. නමුත් ගිහි ජීවිතවලට ද ඉන් ලබාගත හැකි හරයන් පිළිබඳව කරුණාවෙන් යුතුව මේ සටහන් තබන පිංවත් භික්ෂූන් වහන්සේ විසින් මෙය අප අතට පත් කරන ලදි.)

තරුණ ස්වාමීන් වහන්සේ නමක් භික්ෂුව මුණගැසිලා ප්‍රකාශ කළා, "අපි කුමක්ද කළ යුත්තේ?" කියලා. "බොහෝම සතුටින් පැවිදිවුණා. දැන් අසරණභාවයක් දැනෙනවා" කියලා.

අපි මුලින් ම සිතන්න ඕනේ, බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා, වසර 2600ක් ගිය තැනයි අපි මේ සිටින්නේ කියලා. ගෞතම බුද්ධ ශාසනය නැමැති පහන නිවීමට ආසන්න මොහොතේ ඇතිවන තියුණු ආලෝකය පසුබිමෙහි අපි සිටින්නේ. මේ ඉන්න තැන සිට ධර්මය මතුකොටගන්න උත්සාහ ගන්නකොට, අවංකව ම ඔබට අසරණභාවයක් දැනෙන්න පුළුවන්. මාරයා විසින් දෘෂ්ටි මතවාදවලින් පටලවපු ලෝකය තුළ, අසරණ බවක් මිස, සරණක් දැකීම දුර්ලභ දෙයක්. නමුත් එක සිතිවිල්ලකින් ඔබට පුළුවන් ජීවමාන බුදුරජාණන් වහන්සේ වැඩ සිටිය කාලයට යන්න; සාරිපුත්ත මහරහතන් වහන්සේ වැඩ සිටිය කාලයට යන්න. උන්වහන්සේලා පිරිනිවී ගියත්, බුද්ධරත්නයේ, ධර්මරත්නයේ, සංඝරත්නයේ සන්දිට්ඨික ගුණය තව ම නො නැසී පවතිනවා.

භික්ෂුවට මතකයි, භික්ෂුව පැවිදිවෙච්චි දවස. මට මතකයි, එදා ගිහිකෙනෙක් හැටියට මට යම් දේපළක් තිබුණා නම්, ඒවා භාරකරුවන්ට ලියලා, සුදු සරමක්, කමිසයක් බෑගයක දමාගෙන, මම පැවිදිවෙන්න යනවාය කියලා, කොළ කැබැල්ලක ලියා තබා මගේ කාමරයේ දොර වසා, උදේ 5.00ට තිබෙන බසයෙන් උපන් ගමින් නික්ම පැමිණි මොහොත. ඒ බුදුරජාණන් වහන්සේව පමණක් විශ්වාසකොට පැමිණි ගමනක්. භික්ෂුව පැවිදිවීමේ උත්සාහයේදි මුලින් ම හමුවුණු පැවිදි ගුරුවරයා, ගසක් යට වැඩ සිටි කෙනෙක්. උන්වහන්සේ වස් දහය සම්පූර්ණ කරලයි තිබුණේ. උන්වහන්සේ බුද්ධත්වය ප්‍රාර්ථනා කළ නායක ස්වාමීන් වහන්සේ නමක්.

මම සීලයට බොහොම කැමති කෙනෙක්. ඒ නිසා මෙම පැවිදි ගුරුවරයා මට හොඳින් ගැළපුණා, උතුම් පැවිද්ද ලබාගැනීමට. අසරණ භාවයෙන් මිදී, සරණක් සොයාගෙන යන්න යන ගමනේ දී, මම නුවණින් දැක්කා, මාව අසරණකොට ඇත්තේ තෘෂ්ණාව විසින් බව. මගේ පැවිදි ජීවිතයේ දී ජයගත යුතු ප්‍රධාන ම සතුරා, තෘෂ්ණාව බව මම හඳුනාගෙන සිටියා. ඒ නිසා ම මම පැවිද්දට පෙරාතුව ගුරුවරයාට දැනුම් දුන්නා, මගේ පැවිද්ද සඳහා ඔබ වහන්සේගේ පරණ සිවුරක් සූදානම්කොට දෙන්න කියලා; අලුත් සිවුරක් අවශ්‍ය නැහැය කියලා. නායක ස්වාමීන් වහන්සේ මතක් කළා, තමන් ළඟ මීයො කාපු සිවුරක් තිබෙනවා, එය මට දෙන්නම් කියලා. පැවිද්දේ ආරම්භක අඩිතාලම වැටෙන්නේ අතහැරීම මුල්කරගෙන. මේ වන විට මම විනය කියන කාරණය දැනගෙන හිටියේ නැහැ. ඒ නො දන්නාභාවය නිසා ම, මම පැවිද්දට පෙර මගේ පැවිදි ගුරුවරයාගෙන් ඉල්ලීමක් කළා. ඒ ඉල්ලීම තමයි පැවිදිවෙලා මාස තුනකට පසුව මට හුදෙකලා ව, කැලයට යෑමට අවසර දෙන්න කියලා. මම ඒ වෙලාවේ දැනගෙන හිටියේ නැහැ, සාමණේර නමක්, උපසම්පදා භික්ෂුවක් වසර පහක් තම ගුරුවරයා යටතේ සිටිය යුතු යැයි බුදුරජාණන් වහන්සේ විනය කාරණාවක් පනවා තිබෙනවා කියලා. නායක ස්වාමීන් වහන්සේ මාව ඒ ගැන දැනුවත් කළෙත් නැහැ. නො දන්නාභාවය ම, දන්නාභාවයට පැමිණීමට මට පාර විවරකොට දුන්නා.

මම පැවිද්දට පෙර, කතරගම දේවාලයත් කිරිවෙහෙරත් අතර තිබෙන මාවතේ වම්පස තිබෙන, වන්දනාකරුවන් විවේකගන්නා ගිමන්හලක මාසයක් දසසිල් සමාදන්වෙලා සිටියා. වටේට විවෘත, කුඩා ගිමන්හලේ වැස්සට, පින්නට වට ආවරණයක් තිබුණේ නැහැ. තවත් වයෝවෘද්ධ මහත්මයෙක් මේ ගිමන්හලේ නැවතී සිටියා. දිනපතා මැණික් ගඟට බැහැලා, දිය නාලා, කතරගම දායක මහත්වරුන් පිරිසක් ගෙනත් දෙන දානෙ පාර්සලය භුක්ති විඳලා, පැවිදි ජීවිතයට පෙරාතුව මාසයක දසසිල් ජීවිතය සම්පූර්ණ කළා. කිරිවෙහෙරෙන් නැඟෙන සාදු නාද හඬ, දේවාලයෙන් ඇසෙන සණ්ටානාද හඬ නිරතුරුව ම සිත තැන්පත් කළා. සෑම උදෑසනක ම දේවාලයේ මුරුතැන් බත්, මහත්මයෙක් විසින් ගෙනත් දුන්නා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මොහොතක් විවේකී සුවයෙන් වැඩසිටි පිං බිමක, පැවිද්දට පෙරාතුව මාසයක දසසිල් දිවිය ගතකළා.

ඉන්පසුව අනුරාධපුරේ ආරණ්‍යකයි මගේ පැවිද්ද සිද්ධවුණේ. මේවා සැලසුම්කොට නො වෙයි සිද්ධවුණේ. අහම්බෙන් ම යි. මම ගිහිකාලෙ කතරගම යන්න හරි ම ආසයි. පැවිද්දට පෙරාතුව අවුරුදු හතක් පමණ සෑම මාසයකට වරක් මම කතරගමට යනවා. නමුත් දේවාලයට නො වේ, කිරිවෙහෙර චෛත්‍ය රාජයාණන් වහන්සේ, කිරිවෙහෙර බෝධීන් වහන්සේ වන්දනා කරගන්න. දෙවියන්ට පිං අනුමෝදන් කරනවා. බෞද්ධ ජනතාව, අන්‍ය ආගමික ජනතාව කතරගම පූජාභූමියට ඇවිත්, තමතමන්ගේ ආගමික ඇදහිලි සිදුකරන ආකාරය හුඟ වෙලාවට මම බලාගෙන සිටියා. ඒ හැම කෙනාගෙ ම ඇදහිලි තුළින්, ලෝකයේ ස්වභාවය දකිමින්, මෝහයේ ස්වභාවය දකිමින්, මගේ සිතුවිලි, ධර්මයෙන් පන්නරය කරගත්තා. කතරගම පුදබිම කෙරෙහි තිබුණු ගෞරවය නිසා ම, පැවිද්දට පෙරාතුව දසසිල් ජීවිතය, කතරගම පූජාබිමේ දී ගතකරන්නට ධර්මය විසින් අවස්ථාව සලසලා දුන්නා. ඉන් පසුවයි, අනුරාධපුර ප්‍රදේශයේ දී භික්ෂුව උතුම් පැවිදිබව ලබන්නේ.

භික්ෂුවට මතකයි, භික්ෂුව පැවිදිවෙච්චි දවස. පාන්දර 4.00ට කහදියෙන් හිස සෝදලා, දැලි පිහියෙන් හිස මුඩු කරලා, නායක ස්වාමීන් වහන්සේ ම යි මේ කටයුතු සියතින් ම සිදුකළේ. පාන්දර 5.00ට පමණ තමයි මාව පැවිදිකළේ. නැකතක් කියන කාරණයක් තිබුණේ නැහැ. දන්නා හඳුනන ඥාතියෙක්, භික්ෂුව පැවිදිකරන මොහොතේ ළඟ සිටියේ නැහැ. ඒ අය දැනගෙන හිටියෙත් නැහැ. භික්ෂුව දෙතුන්වරක් පමණක් දැක ඇති, නො හඳුනන, කතරගම දායක ගම්වැසියන් පහළොවක් පමණ උදේ පැවිදි පිංකමට ඇවිත් සිටියා. ගස්වල පොතු කොටලා, සිවුරු පඬුකරලා, දින 2ක් වෙහෙස මහන්සිවෙලා, එම පිංවත් පිරිස පාත්‍රා සිවුරු සූදානම්කොට දුන්නා. තුන්සිවුරත් පාත්‍රයත් පමණයි භික්ෂුවගේ පරිහරණයට ලැබුණේ. උදේ පාන්දර 4ට පමණ මගේ හිසකෙස් මුඩුකරද්දී, මම දෑස් පියාගෙන, මගේ හිස මුඩු කරන්නේ සාරිපුත්ත මහරහතන් වහන්සේ ය කියලයි මම දැක්කේ. මම මගේ ගුරුවරයාගෙන් පැවිද්ද ඉල්ලුවේ, මහා කාශ්‍යප මහරහතන් වහන්සේගෙන් පැවිද්ද ඉල්ලනවා කියලා හිතේ මවාගෙන යි. ගුරුවරයා තුළින් ම, ගුරු ගෞරවය නිසා ම, ගුරුවරයා තුළින් මා දැක්කේ මහා කාශ්‍යප මහරහතන් වහන්සේවයි. කොටින් ම මම උතුම් පැවිද්ද ලැබුවේ මගේ මනෝභාවය තුළට වඩම්මවාගත් උතුම් රහතන් වහන්සේලාගෙන්. මට එදා ශක්තිය තිබුණා, ගුරු උපදේශවලින් තොරව ම එවන් දැකීමක් ඇතිකොටගන්න; එවන් උතුම් රහතන් වහන්සේලාව මනසින් ඇසුරු කරන්න. ඒ නිසා ම මගේ පැවිදි ජීවිතය තුළ, කොතැනකදිවත්, මට බියක්, කලකිරීමක්, අසරණභාවයක් ඇතිවෙලා නැහැ. භික්ෂු ජීවිතය තුළ අරමුණ කෙරෙහි හඹායෑමේ ජවය භික්ෂුව විසින් ඇතිකොටග න්නේ ඔය උපක්‍රම තුළින්.

රහතන් වහන්සේලා, රහත් මෙහෙණින් වහන්සේලා සමඟ ම කාලය ගත කළෙමි

භික්ෂුව භික්ෂුත්වය ලැබූ මුල් කාලයේ, සැම විට ම අතීතයේ වැඩසිටි, පිරිනිවී ගිය උතුම් රහතන් වහන්සේලාගේ ගුණයන් සිහිපත් කරමින් ජීවත්වුණා. උන්වහන්සේලා පිළිබඳ ආත්මීය සංඥාවක් ගන්න ගියේ නැහැ. තවමත් නො නැසී පවතින සංසරත්නයේ උතුම් ගුණයනුයි මම මගේ ශක්තිය කොටගත්තේ. භික්ෂුව පැවිදිවීමට පෙර ථෙර ථේරී ගාථා පොත කිහිප වරක් ම කියවා තිබුණා. මේ පොත ගොඩක් උපකාරී වුණා, මේ උතුම් මනෝභාවයන් ඇතිකරගැනීමට. ඒ ථෙර ථේරී ගාථා පොතේ ඇති උතුම් රහතන් වහන්සේලාගේ සිංහනාදයන් භික්ෂුවගේ චංචල හිත නිශ්චල කරන්න ගොඩක් හේතුවුණා. රහත් භික්ෂුණීන් වහන්සේලාගේ ඒ අභීත සිංහනාදයන් කියවනකොට, භික්ෂුවක් වශයෙන් අයෝමය ජවයක් මා තුළ ඇතිවුණා. කිසාගෝතමී රහත් භික්ෂුණිය තුළ, උත්පලවණ්ණා රහත් භික්ෂුණිය තුළ ඇති අයෝමය ධර්ම ශක්තිය දැක, පටාචාරා රහත් භික්ෂුණිය ගිහි කාලයේ අත්විඳි කටුක, අමිහිරි අත්දැකීම් දැක, භික්ෂුව භික්ෂු ජීවිතය තුළ අයෝමය ශක්තියක් මතුකරගත්තා.

මළ දරුවෙක් කරතබාගෙන නුවරක් පුරා දරුවාට පණදෙන්න යැයි කියමින් ඇවිද ගිය කිසාගෝතමිය වැනි කාන්තාවක්, දරුවා කියන රූපය කෙරෙහි ආත්මීය සංඥාවෙන් බැඳී ගිය කාන්තාවක්, ධුතාංගධාරී භික්ෂුණීන් අතරින් අග්‍රස්ථානයට පත්වූ හැටි දකිමින්, භික්ෂුව තමා තුළ යටපත්ව තිබූ ආධ්‍යාත්මික ශක්තිය මතුකොටගත්තා. බුදුරජාණන් වහන්සේ වන්දනා කිරීමට

ඍද්ධියෙන් වැඩි, දිරාගිය සිවුරක් දැරූ, නහර මතුවුණු කිසාගෝතමී රහත් භික්ෂුණියගේ රූපකාය, භික්ෂුවට සරල දිවියක අගය මතුකොටදීමට හුඟක් උපකාරී වුණා. මෙවැනි උපක්‍රම මගේ සාමණේර ජීවිතයේ ශක්තිය පිණිස හේතුවුණා.

භික්ෂුවගේ භික්ෂු ජීවිතයේ දී කවදාවත් තමා අසරණය කියන හැඟීමක් ඇතිවෙලා නැහැ; භික්ෂුත්වය පිළිබඳ කලකිරීමක් ඇතිවෙලා නැහැ. බුදුරජාණන් වහන්සේ ම කල්‍යාණ මිත්‍රයා කරගත් භික්ෂු ජීවිතයක ඵලයයි භික්ෂුව අත්දකින්නේ. පැවිදි පිංවත් ඔබත් ඔබේ භික්ෂු ජීවිතයේ අරමුණු කරා යන ගමනේ දී ඉහත අත්දැකීම් ගැනත් මොහොතක් සිතන්න. පිංවත් ඔබ ප්‍රමාද නැහැ. ඔබේ ඇස්දෙක පියාගෙන ශබ්ද නඟලා නමස්කාරය සජ්ඣායනා කරලා, ඒ උතුම්, පිරිනිවී ගිය රහතන් වහන්සේලාගේ සුරතින් ඔබේ පැවිදි ජීවිතයට ආශිර්වාදය ලබාගන්න. ථේර ථේරී ගාථා පොත නිරතුරුව ම පරිහරණය කරන්න.

ජීවිතය කියන්නේ සංස්කාරයක ඵලයක්. අපි කරපු දෙයයි අපට ලැබෙන්නේ. අපි පතන දෙය අපට ලැබෙන්නේ නැහැ. නමුත් කරපු දෙය ලබන්න නම් අපි සිතන්න ඕනේ.

‘අභිගුණ්ඨික හාමුදුරුවෝ’ කියන යෙදුම මට අපූරුවට ගැළපුණි

පැවිදිවෙලා හරියට ම මාස දෙකහමාරකට පස්සේ පොරොන්දු වූ පරිදි නායක ස්වාමීන් වහන්සේගෙන් අවසර අරගෙන මම හුදෙකලා වනගත ජීවිතයට යොමුවුණා. ඒ කාලය ත්‍රස්තවාදී කටයුතු රටේ බහුලව තිබුණු කාලයක්. ජාතික හැඳුනුම්පත නොමැතිව බස්රථයක යන්න පුළුවන් කමක් තිබුණේ නැහැ. ජාතික හැඳුනුම්පතක අවශ්‍යතාව ඉටුකරගන්න භික්ෂුව මුලින්ම උපන් ගමට පැමිණියා. හැමෝ ම භික්ෂුවගෙන් ඇහුවේ “ඔබ වහන්සේ කොයි ආරණ්‍යයේ ද වැඩ සිටින්නේ?” කියලා. මට එහෙම අහවල් ආරණ්‍යයක වැඩ සිටිනවා කියන්නට නිත්‍ය තැනක් තිබුණේ නැහැ. මොකද, මම පැවිද්ද ලබාගත්තේ ඒ කාලේ ගහක් යට වැඩසිටිය ස්වාමීන් වහන්සේ නමකගෙන් (දැන් උන්වහන්සේට ගමේ පිංවතුන් විසින් ආරණ්‍යයක් සාදා පූජාකර තිබෙනවා.) මම අහවල් ආරණ්‍යයේ යයි කියන්නට තැනක් එදා මට තිබුණේ නැහැ. ඒ කාලයේ සමහර පිංවතුන්ලා මට කීවේ ‘අභිගුණ්ඨික හාමුදුරුවෝ’ කියලා. ස්ථිර, නිත්‍ය තැනක් නැහැ. මගේ කනට ඇහිලා තිබෙනවා ඔවුන් මට ‘අභිගුණ්ඨික හාමුදුරුවෝ’ කියලා කියනවා. මේ ‘අභිගුණ්ඨික හාමුදුරුවෝ’ කියන නම මට ලැබුණේ, මගේ අතහැරීමේ ශක්තිය නිසා ම යි. පැවිදිවෙන්න පෙර දසසිල් සමාදන් වෙනකොට ම මට මගේ ජීවිතයේ අඩක් අතහැරිලා තිබුණේ. ඒකයි හෙටක් ගැන සිතන්නේ නැතිව, හෙට ඉන්නේ කොතැන ද කියලා සිතන්නේ නැතිව, ගහක් යට වැඩසිටිය ස්වාමීන් වහන්සේගෙන් මම පැවිද්ද ලබාගත්තේ.

උන්වහන්සේ එම ගහ යටදි මට මුණගැසුණේ මගේ වාසනාව, පින නිසා ම යි කියලයි මම හිතන්නේ. මොකද උන්වහන්සේ පමණයි උතුම් පැවිද්ද ලබලා තුන් මාසයකට පසුව, ස්වාධීනව කැලයට යන්න අවසරය දුන්නේ. උන්වහන්සේ යම් හැකියාවක් මගින්, මා තුළ සැඟව තිබූ කුසල් ශක්තිය සාකච්ඡාව තුළින්ම විනිවිද දැක්කා.

එදා පසළොස්වක පොහොය දවසක්. උන්වහන්සේ වැඩ සිටිය ගහ යට, එකසිය විසිපහක පමණ උවැසිඋවැසියන් පිරිසක් සිල් සමාදන් ව සිටියා. උදෑසන ඒ අයත් සමඟින් ම මාව දසසිල් සමාදන් කළාට පසුව ඒ සියල්ලන් ඉදිරියේ උන්වහන්සේ එක ප්‍රකාශයක් කළා. ඒ ප්‍රකාශය තමයි අනාගතයේ දී නැවතත් රහත් යුගයක් උදාවෙනවාය කියලා. මම සිහිනෙකින්වත් මෙවැනි ප්‍රකාශයක් බලාපොරොත්තු වුණේ නැහැ. උන්වහන්සේ ඇයි මෙසේ කීවේ, කොහොම ද එසේ කීවේ කියන්න මම දන්නේ නැහැ. නමුත් ඒ වදන් පෙළ මගේ පැවිදි ජීවිතයට අයෝමය ශක්තියක් වුණා. උතුම් පැවිද්දේ මූලික ම අරමුණ මගේ සිතේ සැඟවී තිබියදී, උන්වහන්සේ දැක්කාය කියලයි මම හිතන්නේ. දසසිල් බිමේ දී ම, ඒ සත්පුරුෂ නායක ස්වාමීන් වහන්සේ මා තුළ මාර්ගය කෙරෙහි අයෝමය විශ්වාසයක් ඇතිකළා.

ඉහත කාරණා මෙහි සටහන් කළේ ඔබේ පැවිදි ජීවිතය පිළිබඳව ඔබ තුළ ශක්තියක් ඇතිකරන්නයි. අතහැරීම කියන අර්ථය දසසිල් බිමේ දී ම, ජීවිතය තුළින් ක්‍රියාත්මක වූ හැටි ඔබට දක්වන්නයි.

පූජාබිමක, වන්දනාකරුවන් විවේකගන්නා ගිමන්හලක දසසිල් සමාදන් වෙලා, ගසක් යට ජීවත් වුණු ස්වාමීන් වහන්සේ නමකගෙන් උතුම් පැවිදිභාවය ලබලා, අභිගුණ්ඨික හාමුදුරුවෝ කියන නම ලබමින් පැමිණි ගමන තුළ භික්ෂුවට කවදාවත් තමා අසරණය කියලා දැනිලා නැහැ. භික්ෂුවට 'අභිගුණ්ඨික භික්ෂුවක්' කියන වචනය ඇසෙද්දී, භික්ෂුව හිතුවේ 'මම අභිගුණ්ඨිකයෙක්

නම් බුදුරජාණන් වහන්සේත් අභිගුණ්ඨිකයෙක් ම යි' කියලා. ඒ අතීතයේ වැඩසිටි අරිහත් උත්තමයන් වහන්සේලාත් අභිගුණ්ඨිකයන් ම යි. මොකද, උන්වහන්සේලාටත් මගේය කියලා තැනක් තිබුණේ නැහැ. එම නිසා අභිගුණ්ඨික භික්ෂුව කියන වචනය තුළින් මම මගේ පැවිදි දිවියේ සාර්ථකත්වයයි දැක්කේ. ස්ථිර තැනක් නැති කෙනාටයි 'අභිගුණ්ඨික' කියන වචනය පාවිච්චි කරන්නේ.

භික්ෂුවක් කියන්නේ තැනක් නැති කෙනෙක්. නැවත තැනක් බලාපොරොත්තු නො වෙන කෙනෙක්. තැනක් නොතැනක් පිළිබඳ ප්‍රශ්නයක් මතුවෙන්නේ නැහැ. ලෝකයේ බහුතරයක් නැවත උපදින්න තැනක් බලාපොරොත්තු වෙද්දී, භික්ෂුව කියන්නේ නැවත උපදින්න තැනක් බලාපොරොත්තු නො වන කෙනාටයි. එම නිසා අභිගුණ්ඨික කියන වචනය භික්ෂුවට හොඳින් ම ගැළපෙන වචනයක්. භික්ෂුවට එදා ලැබුණ ඒ අභිගුණ්ඨක ජීවිතයයි, මේ සටහන් ලියන්න ශක්තිය ලබලා දුන්නේ. මේ සෑම අභියෝගයකට ම මුහුණ දෙන්න භික්ෂුවට ශක්තිය ලබාදුන්නේ තෙරුවන් කෙරෙහි තිබූ ශ්‍රද්ධාව ම යි. ධර්ම මාර්ගය උදෙසා ඕනෑ ම මොහොතක ජීවිතය මරණයට දෑමීමේ ආත්ම ශක්තිය ඒ මොහොතේ භික්ෂුව තුළ මෝදු වී තිබුණා. අයෝමය ශ්‍රද්ධාවත්, ශ්‍රද්ධාව තුළින් ම ශක්තිමත් කොටගත් සීලයත් අරමුණ කරා හඹා යෑමට තව තව ආත්ම ශක්තිය ලබාදුන්නා.

මා පැවිදිභාවයට පත්කළ ඒ නායක ස්වාමීන් වහන්සේ, උන්වහන්සේගෙන් මා වෙන්ව යන මොහොතේ, අනුරාධපුර බස්නැවතුමට මා සමඟ වැඩමකොට, තම කැපකරුවා ලවා බස් ටිකට්පතක් ලබාදී බසයට ගොඩවෙන මොහොතේ මට ධර්මාවවාදයක් ලබාදුන්නා. ඒ ධර්මාවවාදය තමයි, "ඔබ කොහේ ගියත් කමක් නැහැ, ධර්මවිනය දෙක ආරක්ෂා කරගෙන ජීවත් වෙන්න" කියලා. ඒ ධර්මාවවාදයේ අර්ථය තුළින් ම, උන්වහන්සේගේ පැවිදි ජීවිතයේ පාරිශුද්ධත්වය මේ මොහොතේත් මට මැවී පෙනෙනවා. ඒ නායක ස්වාමීන්

වහන්සේගේ තිබූ සත්පුරුෂභාවයටත්, තම ශිෂ්‍යයා කෙරෙහි ඇතිකරගත් විශ්වාසයටත්, කරුණාවටත් මම අදත් හදවතින් බොහෝ ම ගරුකරනවා. අභියෝග කන්දක් කරතබාගෙන, උතුම් පැවිදි ජීවිතයට පියනැගූ මට, බුදුරජාණන් වහන්සේ හැර අන් සරණක් තිබුණේ නැහැ. ඒ උතුම් සරණ නිසා ම පැවිද්දෙන් අවුරුද්දයි මාස දෙකකට පසුව දොඩන්දූව සීමාමාලකයේ දී උතුම් උපසම්පදා සීලයේ පිහිටන්න මට අවස්ථාව ලැබුණා. මාගේ භික්ෂු ජීවිතයේ නව නායක ස්වාමීන් වහන්සේ වූයේ තපෝවනයේ ගෞරවනීය මහනායක ස්වාමීන් වහන්සේ යි. මේ සටහන ලියනකොට භික්ෂුවට හරි ප්‍රබෝධයක්, සතුටක් ඇතිවෙනවා. කටුක, අමිහිරි අත්දැකීම්වලිනුයි ඒ සතුට පෝෂණය වෙලා තිබෙන්නේ.

චීවරය හෝදහෝදා මඩේ දැමීම නවතමු

පිංවත් ඔබේ භික්ෂු ජීවිතයට ඔබ නැවත හැරෙන්න. කොතනකවත් ඔබට වැරදීමක් වෙලා නැහැ. ඔබ නිවැරදි තැනයි සිටින්නේ. නිවැරදි තැන කියන්නේ, ඔබ සිතන්න දක්ෂ තැනයි ඔබ සිටින්නේ. ඔබ සිතනවා නම් ඔබ ඉන්නේ වැරදි තැනකයි කියලා, මෙතෙක් ඔබ සිතුව ක්‍රමය වෙනස්කර ගන්න. ජවය, නිවැරදි ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ඉලක්කය කරා යොමුකර ගන්න. අතීත සම්මා සම්බුද්ධ ශාසනවල ඔබත් මමත් ඉපදිලා දසදහස් වතාවක් පැවිදිවෙලා සිටින්නට ඇති. බුදුරජාණන් වහන්සේලාගෙන්, රහතන් වහන්සේලාගෙන් කමටහන් අරගෙන අපි භාවනා කරන්න ඇති. ඒත් කොතනක හෝ අපිට වැරදිලා තිබෙනවා; මඟ නොමඟ අපි පටලවාගෙන තිබෙනවා. ඒ නිසා ම අතීතයේ සම්මා සම්බුද්ධ ශාසනවල දී උපසම්පදාව ලබා අපි පෙර වූ චීවර සෝදසෝදා මඩේ දැමීමක් තමයි අපි කරල තිබෙන්නේ. මෙවරත් අපි, අපි ම අතීතයේ මඩේ දැමූ චීවරය නැවත සෝදා දරාගෙන සිටිනවා. මෙවර ඔබ ස්ථිර තීරණයකට එන්න, නැවත මේ උතුම් චීවරය මඩේ දමන්නේ නැහැය කියල.

සම්මා දිට්ඨියෙන් තොරව, කවදාකවත් සම්මා සංකප්පයක් ඇතිවෙන්නේ නැහැ. සම්මා සංකප්පයන්ගෙන් තොරව, කවදාකවත් සම්මා වාචාවක් සකස් වෙන්නේ නැහැ. සම්මා වාචාවන්ගෙන් තොරව, සම්මා කම්මන්තයක් සකස් වෙන්නෙ නැහැ. මේ සියල්ලන්ගෙන් ම තොරව, සම්මා කම්මන්තයක් සකස් වෙන්නේ නැහැ. මේ සියල්ලන්ගෙන් ම තොරව, සම්මා සතියත්, සමාධියක්, සම්මා ඤාන, සම්මා විමුක්තියක් සකස් වෙන්නේ නැහැ. හේතුඵල

ධර්මයන් ගළපමින් බුදුරජාණන් වහන්සේ මාර්ගය බෝහෝ ම පැහැදිලිව දේශනාකර තිබෙනවා. මුතු වැලක් අමුණලා තිබෙනවා වාගේ මාර්ගය පැහැදිලිව තිබෙනවා.

භික්ෂුව දන්නා එක්තරා ස්වාමීන් වහන්සේ නමක් සිටියා. උන්වහන්සේ පැවිදිවීමට පෙර අන්‍ය ආගමික කෙනෙක්. බුදුදහම ගැන පැහැදුණු මේ පිංවතා පැවිදිවෙනවා. උන්වහන්සේ වැඩ සිටියේ කැලයේ ඈත කුටියක; තුන්සිවුරයි පාත්‍රයයි පරිහරණය කළේ; එක වේලයි වැළඳුවේ. හුදකලාව වැඩසිටි උන්වහන්සේගේ කුටියට අහම්බෙන් යද්දි උන්වහන්සේගේ කුටියේ අන්‍ය ආගමික, නායකයෙකුගේ රාමු කරපු කුඩා ඡායාරූපයක් තිබෙනවා. භික්ෂුවත් උන්වහන්සේගෙන් විමසල තිබෙනවා, ඇයි ඔබ මේ ඡායාරූපය තබාගෙන සිටින්නේ කියල. උන්වහන්සේ කියනව ලු මේ ඡායාරූපය දැක්කම මගේ සිත හොඳින් සමාධිගත වෙනවා කියල. බලන්න සම්මා දිට්ඨියෙන් තොරව, ඒ ස්වාමීන් වහන්සේ සම්මා සතියත්, සම්මා සමාධියත් හොයනවා. කවදා නම් මේ කාරණය සිද්ධවෙයි ද? තවම අමූලිකා සද්ධාව කියන තැනයි උන්වහන්සේගේ ජීවිතය තිබෙන්නේ.

මුලින් ම වැදගත් වන්නේ සමාධිය නො වේ. වැදගත් වෙන්නේ උතුම් සද්ධාවයි. සද්ධාවෙන් ජීවිතය පෝෂණය වුණ තැනයි සතිය, සම්මා සතියක් බවට, සමාධිය, සම්මා සමාධියක් බවට පත්වෙන්නේ. එතෙක් අපි සම්මා සමාධියේ නාමයෙන් මිච්චා සමාධියක් තුළ සිහින දකිනවා; මිච්ඡා සමාධියක් තුළ මාර්ගඵල සොයනවා. පිංවත් ඔබ තුළ සම්මා දිට්ඨියේ දුර්වල තැන්වලට පිළියම් සොයන්නේ නැතිව, සමථ-විදර්ශනා ගැන සොයන්න යන්න එපා. සමථ-විදර්ශනාවට වැය කරන කාලය තෙරුවන් කෙරෙහි සද්ධාව අර්ථවත්ව තියුණු කරගැනීමට යොදවන්න.

වරක් භාවනායෝගී ස්වාමීන් වහන්සේ නමක් භික්ෂුවට ප්‍රකාශ කළා, බෝධිවන්දනාව මිථ්‍යා දෘෂ්ටියක් කියලා. භික්ෂුව උන්වහන්සේගෙන් විමසුවා, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ ශ්‍රී

ලංකාවට වැඩමවාගෙන පැමිණි සංඝමිත්තා මහරහත් භික්ෂුණියන් මිථ්‍යා දෘෂ්ටික ද කියළා. උන්වහන්සේට දෙන්න පිළිතුරක් තිබුණේ නැහැ. සම්මා දිට්ඨියෙන් තොරව සතිය, සමාධිය සොයායාමේ අනතුරයි ඔබ මේ දකින්නේ.

මේ ලෝකයේ ජීවත්වුණ ගෞරවණීය ස්වාමීන් වහන්සේ නමක් සිටියා. උන්වහන්සේ ධුතාංගධාරී වනවාසී ස්වාමීන් වහන්සේ නමක්. උන්වහන්සේ සතිය ගැන, සමාධිය ගැන බොහෝ ම ඉහළින් කථාකළා. නමුත් සද්ධාව ගැන කථාකළේ හුඟාක් අඩුවෙන්; සංසාරබිය ගැන කථාකළේ හුඟාක් අඩුවෙන්. මේ ගෞරවණීය ස්වාමීන් වහන්සේ අපවත් වෙනවා. අපි දන්න එක ස්වාමීන් වහන්සේ නමක් උතුම් සමාධියෙන් අරමුණු කර බලලා තිබෙනවා, මේ අපවත් වූ ස්වාමීන් වහන්සේ නැවත උපත ලැබුවා ද, පිරිනිවන් පෑවා ද කියලා. මේ වෙලාවේ ඒ ස්වාමීන් වහන්සේ දකින්නේ අරූප බ්‍රහ්මතලයක උප්ත්තිය ලබල තිබෙනවා. මොකද මෙතනදි වෙලා තිබෙන්නේ?

උන්වහන්සේ වැඩිපුර ම කතාකළ සතියත් සමාධියත් සද්ධාවෙන් පෝෂණය වෙලා නැහැ. එහෙම පෝෂණය වුණානම් උන්වහන්සේ මාර්ගඵලලාභී දෙවියන් අතරයි උපත ලබන්නේ. සමහර විට පිරිනිවී යන්නත් තිබුණා.

අරූපී බ්‍රහ්මතලවල උපත ලබා ඇති බ්‍රහ්මයින්ට ඝනරූප සංඥාවක් නැහැ. අරූපී බ්‍රහ්මතලවල බ්‍රහ්මයින් සමාධියට අරමුණු වෙන්නේ එරමිණියා ගොතාගෙන සිටින, සියුම් මීදුමෙන් හැදුනාවූ රූපයක් වශයෙන්. සමහර පිංවත් ස්වාමීන් වහන්සේලා අදහස් දක්වනවා, අරූපී බ්‍රහ්මතලවල ජීවත්වන බ්‍රහ්මයින්ට රූපයක් නැහැය කියල. භික්ෂුව ඒ මතයට එකඟ නැහැ. බුදුරජාණන් වහන්සේ උතුම් පටිච්ච සමුප්පාද ධර්මය අනුව මේ ලෝකයේ සෑම සත්වයෙක් ම නාමරූප පච්චයා සළායතනා, සළායතන පච්චයා ඵස්ස කියන ධර්මතාවයන්ට යටත්වයි ජීවත්වෙන්නේ. ආයතන හයෙන් තොර සත්වයෙක් මේ ලෝක ධාතුවේ සිටින්නට

බැහැ. යමෙක් ප්‍රකාශ කරනවා නම් අරූපී බ්‍රහ්මතලවල ජීවත්වන බ්‍රහ්මයිනුත් රූපය තුළයි ජීවත්වෙන්නේ. නමුත් රූපයෙන් බැහැරව සිත පිහිටන නිසා රූපය ප්‍රකට වෙන්නේ නැහැ.

'තෙරුවන් සරණ මිස මට අන් සරණක් නැහැ'ය යන සිංහනාදය කරන්න

අපි මියයන වෙලාවේ සම්මා සතියෙන් තොර සමාධියකට සිත පිහිටියොත් භවයේ උපතක් සකස් වෙනවා. පළමුවැනි, දෙවැනි, තුන්වැනි, හතරවැනි ධ්‍යානතලවල සිත පිහිටියොත් රූපාවචර බ්‍රහ්මතලයක උපතක් සකස් වෙනවා. ඉන් ඔබ්බට අරූපය තුළ සිත පිහිටියොත් අරූපාවචර බ්‍රහ්මතලයක උපතක් සකස් වෙනවා. එම නිසා උපත නිරෝධය කිරීමට පක්‍ෂව අවසාන චුති සිත සකස්කර දෙන්නේ සම්මා දිට්ඨියෙන් පෝෂිත සිතක් ම යි. ඉහත හේතූන් නිසා ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ඇති වැදගත්කම, අනුපිළිවෙළින් මාර්ගය වැඩීමේ වැදගත්කම නුවණින් දකින්න.

ස්වාමීන් වහන්සේ නමක් භික්‍ෂුවගෙන් ප්‍රශ්නයක් විමසුවා, ඔබ වහන්සේගේ සූත්‍ර පිළිබඳ දැනුම කොහොමද කියලා. භික්‍ෂුව පැවිදිවෙලා මාස හයක් පමණ යන තුරු කිසි ම සූත්‍රයක් කියවල තිබුණේ නැහැ. ස්වාමීන් වහන්සේලා හරහා සද්ධර්ම ශ්‍රවණය කිරීම පමණයි කර තිබුණේ. පැවිදිවෙලා මාස නවයකට විතර පස්සේ භික්‍ෂුව සබ්බාවශ්‍රව සූත්‍රය කියවද්දී භික්‍ෂුවට දැනුණේ එම සූත්‍රය භික්‍ෂුව ලියපු සූත්‍රයක් කියලයි. සතර සතිපට්ඨාන සූත්‍රය කියවන විට භික්‍ෂුවට එම සූත්‍රය තමා ලියපු සූත්‍රයක් වශයෙනුයි දැනුණේ. එම සූත්‍රය කියවලා නැති උනත් එම සූත්‍රවල අර්ථය භික්‍ෂුවගේ ජීවිතය තුළ තිබුණා. පිංවත් ඔබ ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ සිටියොත් මුළු සූත්‍රපිටකයේ ම අර්ථය ඔබේ ජීවිතය තුළ තිබෙනවා. පිංවත් ඔබ අර්ථවත්ව ආර්ය අෂ්ටාංගික මාර්ගය

තුළ හික්මුණොත් නිරතුරුව ම බුදුරජාණන් වහන්සේ ඔබ ඉදිරියේ සිටිනවා.

ස්වාමීන් වහන්සේ නමක් ප්‍රශ්නයක් විමසුවා, අපි අතහැරීම පටන්ගත යුත්තේ කොහොමද කියලා. මුලින් ම ඔබ 'මිච්ඡා සම්මාදිට්ඨිය' අතහැරල ලෞකික සම්මා දිට්ඨියට පැමිණිය යුතුයි. දෙවැනිව ලෞකික සම්මාදිට්ඨියත් අතහැරලා, ලෝකෝත්තර සම්මාදිට්ඨියට පැමිණිය යුතුයි. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ මාර්ග අංග අට ම ඉහත ආකාරයට ඔබ තුළින් ක්‍රියාත්මක විය යුතුයි.

පිංවතෙක් ඇසුවා, "හාමුදුරුවනේ, මිච්ඡා සම්මාදිට්ඨිය කියන්නේ කුමක්ද?" කියලා. පිංවත් ඔබ දැකල ඇති, සමාජයේ සමහරු සිටිනවා, සර්ව ආගමික සරණ යාමක් ගැන කතාකරන. සියලුම ආගම් එක සමානයි කියන මත දරන අය සිටිනවා. විශේෂයෙන් දේශපාලනයේ දී මෙවැනි මත ප්‍රකාශ වෙනවා. මොකද, සෑම ආගමක ම අයෙකුගේ ප්‍රසාදය දිනාගන්න. සමහරු සිටිනවා, පසළොස්වක පොහොය දවසට පන්සලට යනවා. ඉරිදාට පල්ලියට යනවා. සිකුරාදාට කෝවිලට යනවා. මෙවැනි අය වැටෙන්නේ මිච්ඡා සම්මා දිට්ඨියටයි. ඔබ දක්ෂ වෙන්න ඕනේ, කුමන අභියෝගයක් හමුවේ වුව ද අර්ථවත් ආකාරයෙන් 'තෙරුවන් සරණ මිස මට අන් සරණක් නැහැ'ය කියන සිංහනාදය ප්‍රකාශ කරන්න.

මැරුණාට පසුව අපි නැවත ඉපදෙන්න පුළුවන්, නොයිපදෙන්නත් පුළුවන්. දන් දුන්නොත්, සිල් රැක්කොත් එහි විපාක තිබෙන්න පුළුවන්, නො තිබෙන්නත් පුළුවන්. හොඳ-නරක දේවල් කළොත්, එහි හොඳ-නරක විපාක තිබෙන්නත් පුළුවන්, නො තිබෙන්නත් පුළුවන්. මෙවැනි ප්‍රශ්නාර්ථ සහිත සිතිවිලි ඔබව මිච්ඡා සම්මා දිට්ඨියේ කොටස්කරුවන් බවට පත්කරනවා. මිච්ඡා සම්මා දිට්ඨිය හෙවත් අමූලිකා සද්ධාව ඔබව මිථ්‍යා දෘෂ්ටියටයි, දුගතියටයි ඇද දමන්නේ. ලෞකික සම්මා දිට්ඨිය ඔබව සුගතියටයි රැගෙන යන්නේ. ලෝකෝත්තර සම්මා දිට්ඨිය හෙවත් අචල සද්ධාව ඔබ තුළ විදර්ශනා නුවණයි සකස්

කරන්නේ. අචල සද්ධාව කියන්නේ විදර්ශනා නුවණින් පෝෂණය වුණ සද්ධාවයි. මෙතනදි පිංවත් ඔබ දක්ෂ වෙන්න ඕනේ ලෞකික සම්මා දිට්ඨියට අයත් වන තෙරුවන් කෙරෙහි සද්ධාව, කර්මය-කර්මඵල විශ්වාසය, මැරිලා හේතුඵල ධර්මයන්ට අනුව නැවත උපදිනවාය කියන විශ්වාසය, දන් දුන්නොත්, සිල් රැක්කොත් එහි ආනිශංස තිබෙනවාය කියන විශ්වාසය, අම්මා තාත්තාගේ ගුණයන් තිබෙනවාය කියන විශ්වාසය, ඉහත ධර්මතාවයනුත් විපාක සකස් කර දී අනිත්‍යභාවයට පත්වෙන සංස්කාර ධර්මයන් ය කියල දකින්න. එවිට ඔබ මේ සුගතියේ සංස්කාරයන්ට බැඳෙන්නේ නැහැ. ඒ සංස්කාරයන්ගේ අනිත්‍යභාවයට පත්වෙන සංස්කාර ධර්මයන්ය කියල දකින්න. එවිට ඔබ මේ සුගතියේ සංස්කාරයන්ට බැඳෙන්නේ නැහැ. ඒ සංස්කාරයන්ගේ අනිත්‍යභාවය දකින මොහොතේ ඔබ තුළ විදර්ශනා නුවණයි සකස් වෙන්නේ. මෙතනදි ඔබ දක්ෂ වෙන්න ඕනේ, බුදුරජාණන් වහන්සේගේ දෙතිසක් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් බබළන්නා වූ රූපකායත් අට්ඨික සංඥාවෙන් දකින්න. සාරාසංඛ්‍ය කල්ප ලක්ෂ ගාණක් පාරමීදම් පුරල ඇතිකරගත් දෙතිසක් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් බබළන සම්මා සම්බුද්ධ රූපකායත් පිරිනිවන් මංචකයේ දී අළුගොඩක්, ධාතුන් වහන්සේලා ගොඩක් වුණාය කියල දකින්න. අතිදීර්ඝ පාරමී ගමනක ඵලය වූ ඒ උතුම් සම්මා සම්බුද්ධ ඥානයන් පිරිනිවන් මංචකයේ දී අනිත්‍යභාවයට පත්වුණාය කියන කාරණය දකින්න. පිංවත් ඔබ බුදුරජාණන් වහන්සේටත් පොදු වූ මේ ධර්මතාවයන් ඔබේ ජීවිතයට ගළපා ගනිමින් අවබෝධය ලබාගන්න. පිංවත් ඔබ මේ යථාර්ථය දකින්න බය නම්, කවදාකවත් ඔබට විදර්ශනා නුවණ, ප්‍රඥාව ඇතිකර ගැනීමට හැකියාව ලැබෙන්නේ නැහැ.

බුදුරජාණන් වහන්සේගේ උතුම් රූපකායත්, ජාති, ජරා, ව්‍යාධි, මරණවලට යටත් රූපකායක් ය කියලා ඔබ දකින්න ඕනේ. මෙය සටහන් තබන භික්ෂුවට මේ මොහොතේ බුදුරජාණන්

වහන්සේගේ රූපකාය සිහිපත් වුණොත් ඊළඟ සිතිවිල්ල සකස් වෙන්නේ පිරිනිවන් මංචකයේ විසිරිලා තිබෙන අළු ටික, ධාතූන් වහන්සේලා සිහිපත් වෙලයි. ඊළඟ සිත සකස් වෙන්නේ, එම ධාතූන් වහන්සේලාත් අනිත්‍යයි කියන සිත සකස් වෙලා. සිත බැඳී යන්න, සිත රැඳී යන්න තැනක් නැහැ. මුලින් ම ඔබ ඔබේ මස් ඇසෙන් පෙනෙන රූපයේ අනිත්‍යභාවය දකින්න. මස් ඇසෙන් දකින රූපයේ අනිත්‍යභාවයයි, එහි එලයයි, කවදාහරි දවසක ප්‍රඥාවේ ඇසෙන්, ඥානදර්ශන තුළින් රූපයේ සැබෑ ම බිඳීයෑමේ වේගය දකින ඥානයක් ඔබ තුළ සකස් කොට දෙන්නේ.

රූපයේ අනිත්‍යභාවය වැඩීමේ දී, පිංවත් ඔබ නිරතුරුව ම බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ සතර සතිපට්ඨාන සූත්‍රයට අදාළව කටයුතු කරන්න.

තෘෂ්ණාවෙන් තෙත් නො වුණු සතිය ම ය.....

එක පිංවතෙක් ධර්ම සාකච්ඡාවක් අවස්ථාවෙදි දැඩිව ප්‍රකාශ කළා, බුදුරජාණන් වහන්සේ කියලා කෙනෙක් නැතිව, බුදුරජාණන් වහන්සේව අනිත්‍ය වශයෙන් දකින්නේ කොහොමද කියලා.

මෙවැනි අන්තයන්ට ඔබ කොටුවෙන්න එපා. එම පිංවතා ප්‍රකාශ කරන ආකාරයට බුදුරජාණන් වහන්සේ කියලා කෙනෙක් නැතිනම්, හතළිස් පස් වසරක් මේ උතුම් සද්ධර්මය ලෝකයට බෙදලා දුන්නේ කවුද? මේ ලෝක සත්වයාට උතුම් මහා කරුණා ගුණය බෙදාදුන්නේ කවුද? එම නිසා ම යි පිංවත් ඔබට මතක් කළේ, අනිත්‍ය සංඥාව වැඩීමේ දී සතර සතිපට්ඨාන සූත්‍රය ගුරු ඇසුරට ගන්නය කියලා. අපි යම් මොහොතක සෝවාන් ඵලයට පත්වුණාය කියන්නේ, තමා තුළ ඉන්ද්‍රිය ධර්මයන් සම ආකාරයට වැඩෙන්න ඕනේ. එම නිසා සද්ධාවත්, වීර්යත්, සතියත්, සමාධි කියන ධර්මතාවයන් විනිවිද දකින්න, විදර්ශනා නුවණ, ප්‍රඥාව මතුකොට ගැනීමට අපි දක්ෂ විය යුතු යි. ඉහත සද්ධා, වීර්ය, සති, සමාධි කියන ධර්මතාවයන්ගේ අනිත්‍යභාවය දකිමිනුයි, අපි එම ධර්මයන් තුළ ජීවත්විය යුත්තේ. එම අනිත්‍ය දැකීමයි, ප්‍රඥාව මෝදු කරගැනීමට අපට උපකාර වෙන්නේ.

සතියයි, සම්මා සතියයි කියන්නේ අහසට පොළොව වගේ වෙනස් දෙකක්. නමුත් සතිය අවශ්‍යයි, සම්මා සතිය ඇතිකොට ගැනීමට. සතියත් විදර්ශනා නුවණින් දැකීම තුළයි සම්මා සතිය ඇතිවෙන්නේ.

භික්ෂුව වරක් එක් ආරණ්‍යයක වැඩසිටියා. භික්ෂුව එම ආරණ්‍යයට වඩිනකොට එක් තරුණ භික්ෂූන් වහන්සේ නමක් එම ආරණ්‍ය භූමිය ඉදිරිපස ඉදලකින් අතුගාමින් සිටියා. භික්ෂුව උන්වහන්සේ ඉදිරියට ගියත් උන්වහන්සේ හිස ඔසවා බැලුවේ නැහැ. බිම බලාගෙන එම අතුගෑමේ ක්‍රියාවේ ම යෙදෙමින් සිටියා. එම ස්වාමීන් වහන්සේගෙන් කිසි ම ප්‍රතිචාරයක් නො ලැබීම නිසා, භික්ෂුව තනියම ආරණ්‍ය තුළට වැඩියා. උන්වහන්සේ බොහොම සතියෙන්, සිහියෙන් යුක්තවයි එම අතුගෑමේ ක්‍රියාව සිදුකරන්නේ. එතැන 'මගේ සතිය' කියලා ලොකු අල්ලාගැනීමක් තිබෙනවා. එම සතිය තුළ තෘෂ්ණාව බැසගෙන තිබෙනවා.

ස්වාමීන් වහන්සේ නමක් භික්ෂුවගෙන් ප්‍රශ්නයක් ඇසුවා, පැවිදි කෙනෙක් යම් කටයුත්තක් කළ යුත්තේ වේගයෙන් ද, එහෙමත් නැතිනම් සෙමින් ද කියලා. සැබැවින් ම මේ දෙක ම අන්ත දෙකක්; ඇලීම, ගැටීම බැසගන්නා වූ අන්ත දෙකක්. ධර්ම මාර්ගයේ ඇවතුම්-පැවතුම් ක්‍රියාත්මක විය යුත්තේ, මධ්‍යම ප්‍රතිපදාවට යටත්වයි. එම නිසා වේගයෙනුත් නො වී, සෙමෙනුත් නො වී සාමාන්‍ය වේගයෙන් ඒවා සිදුකරන්න. මොකද, සතිය තුළ තෘෂ්ණාව බැසගෙන තිබෙනවා. තෘෂ්ණාව හීන වූ සතිය සම්මා සතියයි. සමහරවිට අපි ඇස් දෙක පියාගෙන සිටිනවා. බොහොම සෙමෙන් ඇවිදිනවා. සෙමෙන් කථා කරනවා. මෙවැනි අවස්ථාවක දී අපි අපිව ස්වයං පරීක්ෂණයකට ලක්කරන්න ඕනේ. එවිටයි එවැනි ක්‍රියාවන් තුළ ගැබ්ව ඇති තෘෂ්ණාව මතුකොටගත හැක්කේ.

ඔබ සිතන්න, හරකෙක් සිටිනවා. මේ සතා නිදැල්ලේ හැරියොත් එයා මොකද කරන්නේ? වටේ ම තියෙන කෙසෙල් පැළ, ගොයම් පැළ ටික කනවා. අපි එම සතාව මීටර දහයක කඹයකින් බඳිනවා. දැන් එම සතා කන්නේ මීටර දහයේ ප්‍රමාණයයි. මේ මීටර දහයේ කඹය අයින් කරලා, මීටර පහක් දිග කඹයකින් බඳිනවා. දැන් එම සතා කන්නේ මීටර පහේ ප්‍රමාණය පමණයි. මීළඟට එම මීටර පහේ කඹයත් ඉවත් කරලා කණුවට

බෙල්ල තියලා බඳිනවා. දැන් එම හරකට සෙලවෙන්නවත් බැහැ. බෙල්ල කණුවට තියලා බැඳලා තිබෙන්නේ. බෙල්ල කණුවට තියලා බැඳුණත් මේ හරකා වටපිටේ තිබෙන කෙසෙල් පැළ, ගොයම් පැළ දෙස බලමින් කෙළ ගිලිමිනුයි සිටින්නේ. කඹය කඩාගන්නේ කොහොමද කියලා සිතමිනුයි මේ සතා සිටින්නේ. මෙතැන තමයි සතිය කියලා කියන්නේ. නැවතිලා සිටියාට තෘෂ්ණාව ක්ෂය වෙලා නැහැ.

සම්මා සතිය කියන්නේ, එම සතා කණුවට බෙල්ල තියලා බැඳලා තමයි සිටින්නේ. නමුත් එම සතා වටේපිටේ තිබෙන කෙසෙල් පැළ, ගොයම් පැළ දෙස බලමින් කෙළ ගිලින්නේ නැහැ; කඹය කඩාගැනීමට උත්සාහ ගන්නේත් නැහැ. මොකද, එයා තෘෂ්ණාව හීන කරලයි තිබෙන්නේ. මේ තමයි, සතිය සහ සම්මා සතියේ ඇති වෙනස. එම නිසා අපි කරන සෑම ක්‍රියාවක් තුළ ම තෘෂ්ණාව බැසගෙන තිබෙනවා ද කියලා පරීක්ෂා කරන්න ඕනේ.

සීලය ආස්වාදයේ ගොදුරක් නො විය යුතු ය

වරක් භික්ෂුව එක් ආරණ්‍යයක වැඩසිටින කොට එක් ස්වාමීන් වහන්සේ නමක් තම කුටිය ඉදිරිපිට සක්මන් මළුවේ සක්මන් කරමින් සිටියා, දෑස් බිමට යොමු කරමින්, බොහොම සෙමෙන් පියවර තබමින්. දකින කෙනෙකුට ප්‍රිය උපදවන ආකාරයකටයි උන්වහන්සේ සක්මන් කරමින් සිටියේ. නමුත් ආරණ්‍යයේ ම අත්‍යවශ්‍ය කටයුත්තක් හේතුවෙන් ඒ බව දැනුම්දෙන්න මම උන්වහන්සේට කථා කළා. කථාකරපු මොහොතේ ම උන්වහන්සේ සක්මනෙන් මිදුණේ දැඩි ආවේගශීලී භාවයකින්. බොහොම ආවේගයෙන් "මට බාධා කරන්න එපා" කියල අවවාද කළා. බලන්න, සතිය තුළ බැසගෙන සිටින තෘෂ්ණාවේ තරම. සම්මා සංකප්පයන්ගෙන් පෝෂණය නො වූ සතිය අපව මුලාවට පත්කරනවා. සම්මා සංකප්පයන් ජීවිතය තුළින් ක්‍රියාත්මක නො වන්නේ සම්මා දිට්ඨියේ දුර්වලතාවය හේතුවෙන් ම යි.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ආර්ය අෂ්ටාංගික මාර්ග යේ අංග තුනක් ම සීලයට අදාළව පනවනවා. සිල්පද ආරක්ෂා කරගැනීම නිසා අපට ලැබෙන්නේ සුගතිය. සංසාරයක් පුරාවට සම්මා සම්බුද්ධ ශාසනවල ඉපදිලා, ඔබ සිල් සමාදන් වීමට පෙරවූ සුදු සිල්රෙදි ප්‍රමාණය එක ගොඩක් ගැසුවොත් එය ගිජ්ජකූට පර්වතයට වඩා විශාල යැයි බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කරනවා ඒ තරමට සිල්රෙදිවලින් අතීතයේ මේ කය දවටලා තිබෙනවා. නමුත් ඒ සංස්කාරයෝ විපාක දීලා අනිත්‍ය වී ගියා.

සිල් රැකීම නිසා අපට ලැබෙන ආනිශංසයන් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. අපව සුගතියේ ඉපදෙනවා. සිහි මුළා

නො වී මැරෙනවා. කීර්තිරාවය පැතිරෙනවා. ඕනෑ ම සභාවක් ඉදිරියට නො බියව යනවා. ඒ කියන්නේ සීලයේ අර්ථය, භවයේ නැවත උපතක් කියන අර්ථය යි.

නමුත් අපි භව නිරෝධයයි සොයාගෙන යන්නේ. එහෙමනම් අපි සීලය ආභරණයක් කරගෙන, සීලය බරක් කොටගෙන වැඩක් නැහැ. සීලයෙන් ලැබෙන ලෞකික සැපයන් අනිත්‍ය වශයෙන් විදර්ශනා නුවණින් දකින්න අවශ්‍යයි.

එක් තරුණ ස්වාමීන් වහන්සේ නමක් සිටියා. උන්වහන්සේ සීලය මගේ කොටගත් කෙනෙක්. සීලය විදර්ශනාව සඳහා නො ව, උන්වහන්සේ සීලය උපයෝගී කොටගත්තේ ආස්වාදය උදෙසා යි. උන්වහන්සේ දිනකට එක වේලයි වැළඳුවේ. නමුත් උන්වහන්සේ අප දින දෙකකට වළඳන ප්‍රමාණය එක වේලකට වළඳනවා. ඒ හේතුව නිසා ම දානයෙන් පසුව දැඩිව කායිකව පීඩාවට පත්වෙනවා. උන්වහන්සේ පාන්දර පහට පෙර දාන ශාලාවට එනවා. උන්වහන්සේ උදේට දාන ශාලාවට වඩින්නේ අනික් ස්වාමීන් වහන්සේලා පාන්දර පහයි තිහට පෙර දානෙ වළඳනවද කියලා බලන්නයි. උන්වහන්සේ කප්පිය කුටියේ තිබෙන සීනි බෝතලයේ, කිරිපිටි බෝතලයේ පටන් සෑම ආහාර භාජනයක ම කොළ කැබැල්ලක් අලවලයි තිබෙන්නේ. මේවා දවල් 12න් පස්සේ කැපයි, මේවා දවල් 12න් පස්සේ අකැපයි කියලා. ප්‍රාතිමෝක්ෂ සීලය කෙරෙහි තෘෂ්ණාවෙන් උන්වහන්සේගේ ජීවිතය සීලයට බැඳිලයි තිබුණේ. උන්වහන්සේ දැක්කේ නැහැ ආස්වාදයක්ය මේ විඳින්නේ කියලා. අවසානයේ ඒ පිංවත් තරුණ ස්වාමීන් වහන්සේට සීලය මහා බරක් වුණා. සීලයේ ආස්වාදය තුළ ම ජීවත්වීම නිසා විදර්ශනා නුවණක් සකස් වුණේ නැහැ. තමා විසින් ම බරක් කරගත් මේ සීලයේ බර දරාගන්න බැරි තැන උන්වහන්සේ උතුම් උපසම්පදා සීලයෙන් බැහැරවෙලා සාමණේර බවට පත්වුණා. සම්මා දිට්ඨියෙන් සම්මා සංකප්පයන්ගෙන් පෝෂණය නො වූ සීලය, ආස්වාදයේ ගොදුරක් බවටයි අපව පත්කරන්නේ.

සීලය යනු, සමාධියට සේන්දු වීමේ මාර්ගය පමණි

භික්ෂුවට මතකයි, භික්ෂුව උතුම් පැවිද්ද ලබන වෙලාවේ, ප්‍රාතිමෝක්ෂ සීලය ගැන එක වචනයක්වත් කියවලා දැනගෙන හිටියේ නෑ; සතර පාරාජිකා, සංඝාධිශේෂ ආදිය දැනගෙන හිටියේ නැහැ; ධුතාංග සීලය ගැන දැනගෙන සිටියේ නැහැ. පැවිදිභාවයට පත්වී වසරක් ගෙවුණු තැන මාගේ උතුම් උපසම්පදාවට මාස දෙකකට පෙරාතුවයි මම උතුම් භික්ෂු ප්‍රාතිමෝක්ෂ සීලයේ සිල්පද 227 ගැන දැනගත්තේ. භික්ෂුව මේ ප්‍රාතිමෝක්ෂ සීලය හදාරල දැනගත්තට පස්සේ, ස්වයං ආවර්ජනයක් කර බැලුවා, භික්ෂුව ගෙවාගෙන පැමිණි සාමණේර කාලය පිළිබඳව. ප්‍රාතිමෝක්ෂ සීලය නො දැන සිටි සාමණේර කාලය තුළ භික්ෂුව තුළින් ප්‍රාතිමෝක්ෂ සීලය සියයට අනූවක් ම ආරක්ෂා වෙලා. පැවිදි ජීවිතය තුළ භික්ෂුව අනුග මනය කළ අතීත රහතන් වහන්සේලාගේ චර්යාවන්, එම උතුම් ඇවතුම්-පැවතුම් තමයි, භික්ෂුවට නො දැනුවත්ව ම ප්‍රාතිමෝක්ෂ සීලය ආරක්ෂා කොටගන්න භික්ෂුවට පාර පෙන්වූයේ.

භික්ෂුව සාමණේර අවධියේ දී කවදාවත් කුටියක රාත්‍රියට ආලෝකයක් පත්තු කළේ නැහැ. පරිසරය අඳුරු වුණත්, භික්ෂුවගේ ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ගෙවුණු සිත ආලෝකවත්වයි තිබුණේ. එම නිසා භූමිතෙල්, පොල්තෙල් පිළිබඳ ප්‍රශ්න මතුවුණේ නැහැ. භික්ෂුව සාමණේර අවධියේ දී කුටිවල සවසට ගිලන්පස

සාදාගෙන වැළඳුවේ නැහැ. ඒ නිසා සීනි, තේකුඩු ප්‍රශ්න මතුවුණේ නැහැ. සාමණේර අවධියේ දී භික්ෂුව පැරසිටමෝල් පෙත්තක්වත් ළඟ තබාගත්තේ නැහැ. පාවිච්චි කරන සබන් කෑල්ල ඉවර වුණොත් දායක මහත්මයෙක් සබන් කෑල්ලක් පූජා කරන තුරු කිසිවෙකුගෙන් ඉල්ලා සිටියේ නැහැ. මේ ස්වයං විනය භික්ෂුවට සාමණේර අවධියේදීත් උතුම් ප්‍රාතිමෝක්ෂ සීලය ආරක්ෂා කොටගෙන ජීවත්වෙන්න උපකාරී වුණා. ඒකයි භික්ෂුව කියන්නේ, සම්මා දිට්ඨියෙන්, සම්මා සංකප්පයන්ගෙන් පෝෂණය වුණ සිත, ආයාසයකින් තොරව ම ආර්ය සීලයෙන් පෝෂණය කරනවා කියලා. සීලය කියන්නේ සැහැල්ලුවක්; බරක් නො වෙයි. භික්ෂුව ඔබට මේ සටහන ලියන්නේ බොහොම සැහැල්ලුවකින්. ඒ සැහැල්ලුව භික්ෂුවට ලැබෙන්නේ ආර්ය සීලය තුළින් ම යි. සීලයේ සැහැල්ලුව තුළින් ම යි සම්මා වායාමයන් හොඳින් වැඩෙන්නේ; සම්මා සතිය හොඳින් පෝෂණය වෙන්නේ.

සීල, සමාධි, ප්‍රඥා කියන්නේ මාර්ගයක් මිස ඵලයක් නො වෙයි. අපි මාර්ගයයි, ඵලයක් කොට අල්ලගන්න හදන්නේ. මේ මාර්ගය තුළ ගමන් කරලයි අපි ඵලයන් සාක්ෂාත් කොටගන්නේ. එම නිසා සීලය මගේ කොටගැනීම සඳහා නො ව, සීලය සමාධියට සේන්දුවීමේ මාර්ගය වශයෙන් දකින්න. එම නිසා සීලය තුළ ශක්තිමත් වෙමින්, එම සීලයේ ආනිශංස විදර්ශනා නුවණින් දකින්න දක්ෂ වෙන්න. සීලයේ ආනිශංස හේතුවෙන් ඔබට නැවත සශ්‍රීක දෙවියෙක් වේවා කියල චිත්තයක් ඇතිවුණොත්, ඔබ අතීත භවයන්හි දී ශක්‍රයා වෙලා ඉඳලා, නැවත සතර අපායට වැටුණු හැටි නුවණින් දකින්න. ඔබට නැවත සශ්‍රීක මනුෂ්‍යයෙක් වේවා කියලා චිත්තයක් ඇතිවුණොත්, ඔබ අතීතයේ සක්විතිරජ වෙලා, රජ, සිටු, ඇමතිවරු වෙලා ඉඳලා නැවත සතර අපායට වැටුණු හැටි නුවණින් දකින්න. සිල් ආරක්ෂා කරලා ඔබට නැවත බ්‍රහ්මයෙක් වේවා කියලා චිත්තයක් ඇතිවුණොත්, පිංවත් ඔබ අතීතයේ රූපාවචර, අරූපාවචර බ්‍රහ්මතලවල කල්ප ගණන් ජීවත් වී නැවත සතර අපායට වැටුණු හැටි නුවණින් දකින්න. සීලය

ඔබට අනතුරුදායක භවගමන විවරකොට පෙන්වන කැඩපතක් නො වේ. එම කැඩපත ඔබට විවරකොටගත හැක්කේ, සීලය, ආර්ය සීලයක් බවට පත්කොට ගැනීමෙන් ය.

පිංවත් ඔබ උතුම් ගිහි-පැවිදි ජීවිතවල දී සීලයට මුල්තැන දෙනවා වගේ ම, ඔබ ආරක්ෂා කොටගන්නා සීලය, ආර්ය සීලයක් බවට පත්කොට ගැනීමට දක්ෂ වන්න. එවිට ඔබට සීලය කෙරෙහි තිබෙන බර අතහැරෙනවා. සීලය කෙරෙහි ඇති බර අතහැරෙන තැනයි ඔබට උතුම් සමාධියට අවශ්‍ය පසුබිම සකස් වෙන්නේ.

මේවා ඇත්තේ විඳින්න බැඳෙන්න නො ව, මිදෙන්න ය...

අතහැරීම ගැන කතා කරනවිට මහත්මයෙක් ප්‍රශ්නයක් ඇසුවා, හාමුදුරුවනේ, ඔබ වහන්සේ අතහැරීම ගැන කතා කරනවා. එහෙම අතහැරීම ගැන කතා කරනවා නම් ඔබ වහන්සේ ආරණ්‍යයක, කුටියක වැඩසිටින්න බැහැ. කැලයේ ගසක් මුලයි ඉන්න ඕනේ කියලා.

මතුපිටින් එම මහත්මයා අහන ප්‍රශ්නය දකිනවිට එහි සාධාරණ බවක් තිබෙනවා. නමුත් එම මහත්මයා එක අන්තයකට ගිහිල්ලයි ප්‍රශ්නය දකින්නේ. සකුළුදායි කියලා තරුණයෙක් බුදුරජාණන් වහන්සේගෙන් මෙවැනි ම ප්‍රශ්නයක් අතීතයේ විමසුවා. එම ප්‍රශ්නය නම්, "භාග්‍යවතුන් වහන්ස ඔබ වහන්සේට ශ්‍රාවකයන්, ගිහි දායක පිංවතුන් ගොඩක් පැහැදිලයි සිටින්නේ. මේ පැහැදීම ඇතිවෙන්න හේතුන් පහක් මම දකිනවා" කියලා සකුළුදායි තරුණයා එම හේතුන් පහ බුදුරජාණන් වහන්සේට ප්‍රකාශ කරනවා. එම හේතූන් පහ තමයි, බුදුරජාණන් වහන්සේ අඩු ආහාරයකින් ජීවත්වීම, පාංශුකූල තුන් සිවුරු දැරීම, දුෂ්කර සෙනසුන්වල ජීවත්වීම, පිණ්ඩපාතයෙන් පමණක් යැපීම, හුදෙකලා වනසෙනසුන්වල වැඩසිටීම.

සකුළුදායි එහෙම කියන විට බුදුරජාණන් වහන්සේ ඉහත කාරණා පහ ප්‍රතික්ෂේප කරනවා. "සකුළුදායි, ඔබ ඔය කියන කාරණා නිසා නො වේ, දෙවිබඹුන් සහිත ලෝකයා මට ගරු කරන්නේ. මම සැමදා ම අඩු ආහාරයකින් යැපෙන්නේ නැහැ.

සමහරක් දාට මම පාත්‍රයෙන් භාගයක් පමණ දන් වළඳනවා. මම පිණ්ඩපාතයෙන් පමණක් නො වෙයි යැපෙන්නේ. සමහර දාට රජ, සිටු මැඳුරුවලිනුත් දානය වළඳනවා. මම පාංශුකූල සිවුර පමණක් නො වෙයි දරන්නේ, පාංශුකූල නො වන සිවුරුත් දරනවා. මම වනසෙනසුන්වල විතරක් නො වෙයි ජීවත්වෙන්නේ. නාගරිකව ජේතවනාරාමය, පූර්වාරාමය වැනි ආරණ්‍යවලත් වැඩසිටිනවා. මම හුදකලා විවේකයෙන් පමණක් නො වෙයි වැඩසිටින්නේ. ශ්‍රාවක ශ්‍රාවිකාවන්, උපාසක උපාසිකාවන් දහස්ගණන් සමඟ කටයුතු කරනවා. බුදුරජාණන් වහන්සේට දෙවිබඹුන් සහිත ලෝකයා ගරුකරන්නේ, බුදුරජාණන් වහන්සේගේ සීලයට, ඥානදර්ශනයන්ට, අධිප්‍රඥාවට, සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්ට. මේ ආදී කාරණා නිසයි ලෝකයා බුදුරජාණන් වහන්සේට පහදින්නේ කියල බුදුරජාණන් වහන්සේ සකුළුදායි තරුණයාට දේශනා කරනවා.

බුදුරජාණන් වහන්සේ තමන් තුළ ඇති ගරුකළ යුතු ධර්මයන් වශයෙන් දේශනා කළේ ඉහත ධර්මයනුයි. එම නිසා අපි අපේ ජීවිත තුළින් මතුකරගත යුතු ගරුකළ යුතු ධර්මයන් නිවැරදිව තේරුම්ගන්න. අපේ උතුම් පැවිදි ජීවිත තුළින් අපි උත්සාහගන්නේ, "මම එක වේලයි වළඳන්නේ, අඩු පිණ්ඩපාතයෙන් යැපෙන්නේ, මම කැලයේ ම යි ජීවත්වෙන්නේ, හුදකලාවට පමණක් ම යි ප්‍රියවෙන්නේ, පාංශුකූල චීවර පමණක් ම යි දරන්නේ" කියන චර්යාවන් තුළින් පමණක් සතුටුවෙන්න නම්, එම සතුට අපේ පැවිදි ජීවිතයේ උතුම් ම සතුට හැටියට දකිනවා නම්, අපිත් සකුළුදායි තරුණයා කියන තැනයි සිටින්නේ. එම නිසා අන්තයන්ට නො ගොස් මධ්‍යම ප්‍රතිපදාව තුළ අපේ පැවිදි ජීවිත හික්මවන්න අපි දක්ෂ වෙන්න ඕනේ. එහෙම උනොත් පමණයි, අපේ උතුම් ශාස්තෲන් වහන්සේ තුළ තිබූ උතුම් ඥානයන්ගේ අඩි පාරේ අපිට යන්නට පුළුවන්කම ලැබෙන්නේ. අපේ උතුම් පැවිදි ජීවිත තුළ අපි සතුටුවිය යුත්තේ, "මම එකවේලයි, මම පාංශුකූලිකයි, කැලයේ පමණක් ජීවත්වෙන්නේ....." කියන

කාරණා තුළ නො වෙයි. අපි සතුටුවිය යුත්තේ, ඉහත කාරණා උපයෝගී කරගෙන සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් අප තුළ වැඩෙනවා නම් පමණකි; ආර්ය සීලය, ආර්ය සමාධිය අප තුළ වැඩෙනවා නම් පමණකි.

බුදුරජාණන් වහන්සේ සකුළුදායි තරුණයාට දෙන අවවාදය තුළ, 'අතහැරීම කියන්නේ ආරණ්‍යය, කුටිය අතහැරල ගසක් යට ජීවත්වීම' කියන අන්තය ප්‍රතික්ෂේප වෙනවා. අප අතහැරිය යුත්තේ ආරණ්‍යයවත්, කුටියවත් නො වේ. ඒවා කෙරෙහි ඇති තෘෂ්ණාවයි. මම දරන්නේ පාංශුකූල චීවරයයි කියල ඔබ පාංශුකූල චීවරය කෙරෙහි තෘෂ්ණාව ඇතිකර ගතහොත් එතැන ද සකස් වෙන්නේ දුක ම යි. මම කැලයේ ම යි ජීවත්වෙන්නේ කියලා කැලයේ හුදකලාවට ඔබ තෘෂ්ණාව ඇතිකර ගතහොත් එතැන ද සකස් වෙන්නේ දුක ම යි. පංච උපාදානස්කන්ධය නැමති මාරයා අපි ධර්ම මාර්ගයේ තබන සෑම පියවරක් ම විඳීම කියන අපද්‍රව්‍යයෙන් අර්ථ විරහිත බවට පත්කර දමනවා. එම නිසා මෙම උතුම් නිවන් මාර්ගයේ ගමන් කිරීමේ දී වනවාසී උතුම් හුදකලා ජීවිතයත්, එක වේලක් පිණ්ඩපාතයෙන් යැපීමත්, පාංශුකූල චීවරයත් අත්‍යවශ්‍ය ම සාධක වෙනවා. මේවා අත්‍යවශ්‍ය ම සාධකයන්, විඳීම කියන මාරධර්මයෙන් මුදවා ගැනීමට අපි දක්ෂ විය යුතු යි.

ඒවා ඒවායේ ස්වභාවයෙන් තිබුණා, භික්ෂුව භික්ෂුවගේ ස්වභාවයෙන් සිටියා

භික්ෂුවට මතකයි, සාමණේර අවධියේ දී වරක් ගම්මානයට පිණ්ඩපාතය වැඩියා. එය දුෂ්කර ගම්මානයක්. බතුයි එළවළුයි පමණයි දානයට ලැබෙන්නේ. පැණි රසක්, පලතුරක් ලැබුණේ ම නැහැ. එදා එක අම්මා කෙනෙක් පාත්‍රයට කේක් කැබැල්ලක් පූජා කළා. භික්ෂුව පාත්‍රය උරහිසේ එල්ලාගෙන කැලය මැදින් කුටියට වඩින විට එකපාරට ම පාත්‍රයේ තිබෙන කේක් කැබැල්ල මතක්වෙලා කෙල ගිලුණා. භික්ෂුව කැලයේ මැද නැවතුණා පාත්‍රය ඇරියා. කේක් කැබැල්ල අරගෙන ඈතට විසිකළා. එහෙම කරල මගේ සිතට ම තරවටුවක් සිදුකළා, "දැන් පුළුවන් නම් කේක් වළඳන්න" කියලා.

මාරධර්ම සම්මා සංකප්පයන්ගෙන්, සම්මා සතියෙන් පරද්දවන්න ඕනේ. අරමුණු අභිබවා සිතට යන්න දෙන්න නරකයි. කෙලෙස් සිත කියන්නේ නිවන් අරමුණට ප්‍රධාන ම හතුරා ම යි. කේක් කැබැල්ල විසිකළාට පස්සේ මම මට ම සිනාවෙලා කුටියට වැඩියා.

භික්ෂුව එක්තරා ආරණ්‍යයක වැඩසිටින විට එම ආරණ්‍යයට ආගන්තුක ස්වාමීන් වහන්සේ නමක් වැඩියා. උන්වහන්සේට කැලයේ ඈත කුටියක් අවශ්‍ය යැයි කීවා. එම නිසා ආරණ්‍යයේ ඈත ම තිබෙන කුටිය උන්වහන්සේට ලැබුණා. භික්ෂුවත් උන්වහන්සේ සමඟ එම කුටියට වැඩියා, කුටිය පවිත්‍ර කරලා දෙන්න. මේ ආගන්තුක ස්වාමීන් වහන්සේ, කුටියේ තිබුණ

සැතපෙන ඇඳ ගැලෙව්වා; මේසය, පුටුව කුටියෙන් ඉවත් කළා; කුටියේ තිබුණ ලන්තෑරුමත් කුටියෙන් ඉවත් කළා; දොරට දමන ඉබ්බත් කුටියෙන් ඉවත් කළා. දැන් කුටියේ තිබෙන්නේ පැදුරයි, කොට්ටයයි, ඉදලයි, කොස්සයි විතරයි. භික්ෂුවටත් සිද්ධ වුණා, කුටියෙන් ඉවත් කළ භාණ්ඩ ඔසවාගෙන ආරණ්‍යයේ ගබඩා කාමරයට ගෙනැත් දමන්න.

අප ඉදිරියේ කුටිය සම්පූර්ණයෙන් ම හිස් කරලා, මොකක්ද මේ ස්වාමීන් වහන්සේ අපිට පෙන්නන්න හදන්නේ. "මගේ අතහැරීම, මගේ සීලය........", උන්වහන්සේගේ අතහැරීමේ තරම පෙන්වන්නයි උන්වහන්සේ කුටිය මේ තරමට හිස්කළේ. බලන්න, මොන තරම් දුර්වල ක්‍රියාවක් ද. තෘෂ්ණාව තිබෙන්නේ සැතපෙන ඇඳේවත්, මේසයේ, පුටුවේ, ලැන්තෑරුමේවත් නො වේ, ඒවා කෙරෙහි තමන් ඇතිකර ගන්නා විදීම තුළයි. මේ ආගන්තුක ස්වාමීන් වහන්සේ කුටිය මේ විදියට හිස්කරන විට උන්වහන්සේ තුළ මොන තරම් තෘෂ්ණාවක් බැසගෙන තිබෙනවා ද කියන කාරණය භික්ෂුව දැක්කා.

සති දෙකකට පස්සේ උන්වහන්සේ එම කුටිය හැරගියා. විදීම කියන මාරධර්මය අපිව ආරණ්‍යයෙන් ආරණ්‍යයට, කුටියෙන් කුටියට ප්‍රදර්ශන භාණ්ඩ බවට පත්කරමින් ඇවිද්දවනවා.

භික්ෂුවට මතකයි, භික්ෂුවගේ පැවිදි ජීවිතයේ තීරණාත්මක කාලය ගතකරපු කුටිය. එය ගල් කුටියක්. ඉදිරිපස බිත්තිය මැටියෙන් කපරාදුකර සුදුහුනු ගාල තිබුණා. දීර්ඝ කාලයක් මේ කුටියේ ස්වාමීන් වහන්සේ නමක් වැඩ ඉඳල නැහැ. දසසිල් සමාදන් වෙච්ච, වයෝවෘද්ධ උපාසක සීයා කෙනෙක් මෙම කුටියේ ටික දිනක් නැවතී භාවනා කරල තිබෙනවා. භික්ෂුව මේ කුටියේ මාස දෙකහමාරක් ගතකළා. සාමණේර අවධියේ භික්ෂුව මේ කුටියට වඩිනවිට කුටිය පාළුවට ගිහිල්ලයි තිබුණේ. කුටියේ ඇඳක් තිබුණේ නැහැ. මේසයක් තිබුණා. පුටුවක් තිබුණේ නැහැ. පැදුරක්, කොට්ටයක්, ලැන්තෑරුමක් තිබුණා. ප්ලාස්ටික්

බාල්දියක් තිබුණා. එපමණයි කුටියේ තිබුණේ. භික්ෂුව මේසය, ලන්තෑරුම පරිහරණය කළේ නැහැ. නමුත් ඒවා කුටියෙන් ඉවත් කිරීමට ගියේ නැහැ. ඒවා ඒවායේ ස්වභාවයෙන් තිබුණා. භික්ෂුව භික්ෂුවගේ ස්වභාවයෙන් සිටියා.

මේ කුටියට වැසිකිළියක් තිබුණේ නැහැ. වැසිකිළිය හැටියට පාවිච්චි කළේ පැරණි වළක්. ළඟපාත වතුර පහසුකම් තිබුණේ නැහැ. කිලෝමීටර් කාලක් පමණ කුටියට පහළින් කැලය තුළ ලොකු ගල්වළක් තිබුණා. සවස අව්ව බැස ගියාම ගල් ළිඳට ගිහිල්ලා, පැන් පහසුවෙලා, ප්ලාස්ටික් බාල්දියට වතුර එකක් අරගෙන එනවා. එම වතුර බාල්දියෙන් තමයි උදේ ම වැසිකිළියට යන්නෙත්, මුහුණ සෝදාගන්නෙත්. දත් මැදල මුහුණ පමණක් සෝදාගෙන ගමට පිණ්ඩපාතය වඩිනවා. වතුර බාල්දියෙන් යැපුණත් පිරිසිදුකම හොඳින් තිබුණා. බීමට වතුර ගන්න කුටියට උඩපැත්තෙන් කිලෝමීටර් කාලක් පමණ එහායින් නළ ළිඳක් තිබුණා. ලීටර් පහේ සුදු කෑන් එකකට බීමට වතුර එකක් අරගෙන එනවා, පිණ්ඩපාතයෙන් පස්සේ.

භික්ෂුව මේ කුටියේ සිටිය මාස දෙකහමාරක කාලය තුළ කිසි ම ගිහි පිංවතෙක් මේ කුටියට ඇවිල්ල නැහැ. භික්ෂුවට මේ ජීවිතයේ කිසි ම දුෂ්කරභාවයක් දැනුණේ නැහැ. ඒ දිනවල භික්ෂුව පිණ්ඩපාතය කරගෙන ඒම සඳහා කිලෝමීටර් හයක් පමණ ගම්මානයට ඇවිද්දා. අඩු ආහාරයක් ලැබුණේ. ඒ නිසා ම භික්ෂුව හුඟාක් ම කෘශවෙලා සිටියේ. නමුත් බලෙන් ශරීරයට දුක් දුන්නේ නැහැ. ශරීරයට කිසිදු ඇල්මක් තිබුණේ නැහැ. මරණය බලාපොරොත්තුවෙන් ධර්මය තුළ භික්ෂුව සිටියා. මරණයට අබමල් රේණුවක තරම්වත් බියක් දැනුණේ නැහැ. භික්ෂුවට ඒ වෙනකොට දැනිලයි තිබුණේ, ජීවිතයට ආශාව තිබෙන තාක්කල් ධර්මාවබෝධය ලබන්න බැහැ කියල. භික්ෂුව තුළ ලොකු විශ්වාසයක් තිබුණා, මැරෙන මොහොතේ හෝ ධර්මය සාක්ෂාත් කරන බව.

දවසක් භික්ෂුව පිණ්ඩපාතය වඩිනකොට ගමට ඇතුළුවෙන තැන ම එක ගෙදරක මිදුලේ ගසක් යට පැදුරක් එළලා තිබුණා. එය භික්ෂුවට නුහුරු දර්ශනයක්. එදා පිණ්ඩපාතයට ඒ ගෙදර අයිතිව තිබුණේ නැහැ. එම ගෙදර නිවැසියන් වැට අද්දරට පැමිණ භික්ෂුවට ආරාධනා කළා, ගස යට එළා ඇති ආසනයේ වැඩසිටින්න කියලා. භික්ෂුව ආසනයේ වැඩ සිටියා. එම නිවසේ මැණියන් දෙපළක් ලොකු කුරක්කන් කැඳ කෝප්පයක් භික්ෂුවට පූජා කළා. දින කිහිපයකින් ම භික්ෂුව වැළඳූ එක ම එක ගිලන්පස කෝප්පය මෙය යි. එම කුරක්කන් කැඳ කෝප්පය භික්ෂුවගේ ශරීරයට හොඳ ශක්තියක් ඇති කළා. ඒ අම්මා ප්‍රකාශ කළා, "හාමුදුරුවනේ, ඔබ වහන්සේ ඊයේ පිණ්ඩපාතය කරගෙන මෙතනින් ආරණ්‍යයට වඩිනකොට, ඔබ වහන්සේ බොහෝ ම විඩාවෙන්, වෙහෙසෙන් ගමන් කළේ. අපි හිතුවා ඔබ වහන්සේට ක්ලාන්තය හැදෙයි කියලා. ඒ නිසා ම යි ඔබ වහන්සේට මේ කැඳ දානය පූජා කළේ" කියලා. මරණයට දමපු ජීවිතයක අවසන් හෝරා කිහිපයයි භික්ෂුව ඒ ගතකරමින් සිටියේ. නමුත් ලෝකයා දැනගෙන සිටියේ නැහැ. ලෝකයාට කොතැනකදිවත් දැනගන්න තිබ්බෙත් නැහැ. මාරයාගෙන් මිදෙන්න යන ගමනේ දී ලෝකයාවත් මාරයා හැටියට ම යි දැක්කේ. කොටින් ම ලෝකයා ගැන සිතුණේ නැහැ. මේ මොහොත වනවිට එක වේලෙන් යැපීම, පාංශුකූල චීවර දැරීම, වනවාසී ජීවිතය කියන අර්ථයන් භික්ෂුව තුළින් නිෂේධ වෙලයි තිබුණේ. විළි වසාගැනීමේ අරමුණ පමණයි, චීවරය තුළින් දැක්කේ. නිවන් අරමුණ පමණයි, චීවරය තුළින් දැක්කේ. නිවන් අරමුණ වැඩීමට පණකෙන්ද රැකීම කියන අරමුණ පමණයි, පිණ්ඩපාතයේ අර්ථය හැටියට දැක්කේ. වැස්සෙන්, පින්නෙන් ආරක්ෂාවීම කියන අර්ථය පමණයි කුටිය තුළින් දැක්කේ. පාංශුකූල චීවරය, එක වේලක් යැපීම, කැලයේ ජීවත්වීම කියන අර්ථයන් උපකාරක ධර්මයන් බවට පත්කොටගෙන භික්ෂුව තුළ සත්තිස් බෝධිපාක්ෂික ධර්මයනුයි දැන් වැඩෙන්නේ. දැන් පිංවත් ඔබට හොඳින් වැටහෙනවා ඇති (ඉකුත් සටහනේ සඳහන් වූ පරිදි), ලොව්තුරා බුදුරජාණන්

වහන්සේ සකුළුදායි කියන තරුණයාට දේශනා කරන ධර්මයේ සැබෑ ම අර්ථය. අත්දැකීම් තුළින් ම යි පිංවත් ඔබට මේ සටහන් තබන්නේ.

උතුම් පැවිදි ජීවිතය ගතකරන අපි, පාංශුකූල චීවරය, පිණ්ඩපාතයෙන් යැපීම, කැලයේ ම හුදෙකලාව ජීවත්වීම, එක වේලක් යැපීම කියන කාරණා නිවන් මාර්ගය මෝදුකොට ගැනීමට, සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන් වැඩීමට උපකාරක ධර්මයන් බවටයි පත්කොටගත යුත්තේ. එසේ නැතිව, එම උපකාරක ධර්මයන් නිවන් මාර්ගයේ ඵලයක් හැටියට ගැනීමට නො වෙයි. මොකද, භික්ෂුව දැකලා තිබෙනවා, සමහර පිංවත් ස්වාමීන් වහන්සේලා එක වේලක් පිණ්ඩපාතයෙන් යැපීම නිසා තමාගේ පැවිදි දිවියේ අරමුණු ඉටු වුණාය කියලා සතුටු වෙනවා; පාංශුකූල චීවරය දැරීම තුළින් තමාගේ පැවිදි දිවියේ අරමුණු ඉටු වුණාය කියලා සතුටුවෙනවා; වනයේ හුදෙකලාව වැඩසිටීමෙන් තමාගේ පැවිදි දිවියේ අරමුණු ඉටු වුණාය කියලා සතුටුවෙනවා. මේ සියලු ම කාරණා උතුම් නිවන් මාර්ගයට, නිවන් අවබෝධයට මග පෙන්වන උපකාරක ධර්මයන් පමණ ය කියන කාරණය අපි දකින්න ඕනේ.

නිවන් මාර්ගයට අවශ්‍ය කරන උපකාරක ධර්මයන් හෙවත් හේතූන්, ඵලය හැටියට ගත්තොත්, පිංවත් ඔබ සකුළුදායි තරුණයා සිටිය තැනයි සිටින්නේ.

භික්ෂුවට මේ මොහොතේ, වර්තමානයේ සිට ඒ අතීත භික්ෂු ජීවිතය දෙස ආවර්ජනාත්මකව බැලීමේ දී භික්ෂුවට පෙනෙන්නේ, කිසි ම සැලසුම් කිරීමකින් තොර ගමනක්, ඉතාමත් හොඳ සැලැස්මක් ඇතිව ඇවිත් තිබෙන ස්වභාවය යි. මා සැලසුම් නො කළ මේ ගමන, සැලසුම් කරනු ලැබුවේ මගේ සංස්කාර ධර්මයන් විසින් ම යි. සංස්කාරයන්ට පුදුමාකාර ශක්තියක්, හැකියාවක් තිබෙනවා, ගමනක් වැරදි හෝ නිවැරදි දිශාවට සැලසුම්කර දෙන්න. දුරු කළ යුතු දේ දුරු කරමින්, සමීප කරගත යුතුදෙය

සමීප කරගනිමින්, දුරු කළ දෙයත්, සමීප කොටගත් දෙයත් කෙරෙහි තෘෂ්ණාව හීන කොටගෙන පැමිණි ගමනේ අතීතය දෙස ආපහු හැරී බැලීමේ දී භික්‍ෂුව දකින්නේ හිස් වූ ජීවිතයක් මිස, කටුසටහන්වලින් යුත් මතක සටහන් ගොන්නක් නො වේ. මොකද, භික්‍ෂුව ජීවිතය ජයගත්තා හෝ පරාජය වූවා නො ව, තරගයෙන් ඉවත් වූවා පමණි. ජයත් පරාජයත් යන දෙක ම ලෝකයට විවෘත වූ ධර්මතාවයන් ය.

අප කළ දෙය ම අප පසුපස එනවිට...

ස්වාමීන් වහන්සේ නමක් භික්ෂුවගෙන් ප්‍රශ්නයක් ඇසුවා, අපි නිවීමේ මාර්ගයේ ගමන් කිරීමේ දී එම ගමන සාර්ථක කරගැනීමට සුදුසු ස්ථානයක් තිබිය යුතු ද කියලා. අතීතයේ රහතන් වහන්සේලා දහස් ගණනින් වැඩසිටි පැරණි ගල්ලෙන් සහිත ආරණ්‍යය, ගල්කුටි නිවන් මාර්ගය වැඩීමේ දී අපිට හුඟාක් උපකාරී වෙනවා. මෙවැනි පරිසරයන් තුළ නිවිච්ච ස්වභාවයක් කැටිව තිබෙනවා. ඒ වගේ ම හුදකලා වනවාසී කුටි අපේ ගමනට ශක්තියක් වෙනවා. එම නිසා අපේ සිත ද ධර්මය තුළ වැඩෙන, සුදුසු ස්ථානයක් අපි සොයාගත යුතු වෙනවා. මට සුදුසුයි කියන තැනදී ම එතැන තෘෂ්ණාව බැසගෙන තිබෙනවා. මොකද, මම කැමති තැනකුයි සොයන්නේ. මෙතනදී ඔබ ප්‍රවේශම් වෙන්න ඕනේ, ඔබට ලැබෙන තැන සුදුසු තැන බවට පත්කොට ගන්න.

භික්ෂුවට භික්ෂු ජීවිතයේ දී ලැබුණ හුඟාක් තැන් සුදුසු තැන් නො වේ. නමුත් ලැබුණ තැන සුදුසු තැනක් බවට පත්කොට ගැනීමට භික්ෂුව දක්ෂ වුණා. අපි හොඳ තැන් සොයසොයා යන්නේ අපේ තෘෂ්ණාව හඳුනා නො ගැනීම නිසා ම බව සිහියට නඟාගන්න. අවම වශයෙන් සතර අපායෙන් මිදෙන තුරු තැන්තැන්වල ඇවිදිමින් ගත කරන්න යන්න එපා. සුදුසු තැන් සොයමින් ආරණ්‍යයෙන් ආරණ්‍යයට, කුටියෙන් කුටියට යන්න එපා. එය බොහෝ ම අන්තරාකාරී ක්‍රියාවක්. එම නිසා කල්‍යාණමිත්‍ර ආශ්‍රය ලැබෙන, විනය කාරණාවන් සුරැකෙන, සිත නිවෙන තැනක අරමුණ ඉටුවෙන තෙක් නවතින්න. සංචාරකයෙක් කියන තැනින් මිදී, භව ගමන නවතන අරමුණු කෙරෙහි සිත යොමු කරන්න.

භික්ෂුව කුටියකට, ආරණ්‍යයකට වැඩම කිරීමට පෙරාතුව අධිෂ්ඨානයක් ඇතිකොට ගන්නවා, මේ ආරණ්‍යයේ මාසයක්, එහෙම නැත්නම් මාස දෙකක් වැඩසිටිනවා කියලා. එහෙම අධිෂ්ඨානයක් ඇති කරගෙනයි ආරණ්‍යයට, කුටියට වඩින්නේ. එහෙම වැඩම කරලා, අනිවාර්යයෙන් ම අධිෂ්ඨානය කළ කාලය එහි වැඩසිටිනවා. මොන ම අපහසුතාවක්, ගැටලුවක්, නො සලකාහැරීමක් පැමිණියත් හැරෙන්නේ නැහැ; ආපසු එන්නේ නැහැ. ඕනෑ ම අපහසු තැනක් තුළ, මගේ පාඩුවේ මම වැඩ සිටිනවා. මෙතැන තමයි කුටියක්, ආරණ්‍යයක් තෝරාගැනීමේ දී භික්ෂුවගේ ස්වභාවය වුණේ.

භික්ෂුව පැවිදි භූමියට පත් වූයේ වයස අවුරුදු 44 දී. ඒ හේතුව නිසා ම ආරණ්‍ය ජීවිතයේ දී කටුක අත්දැකීම් භික්ෂුව ලබලා තියෙනවා. භික්ෂුව කොතැන ගියත් මුකුත් ම නො දන්න කෙනෙක් හැටියටයි හැසිරුණේ. දන්නා බවක් පෙන්වන්න ගියේ නැහැ. භික්ෂුවට මතකයි, එක ආරණ්‍යයක දී පිංවත් ස්වාමීන් වහන්සේ නමක් කියනවා, මේ හාමුදුරුවො වැඩිය කතා කරන්නෙත් නැහැ, මුහුණ දෙන්නෙත් නැහැ. සිවුරු හැරලා යන්නද කොහෙද හදන්නේ කියලා. තැනකට ගිහිල්ලා එතන චරිතයක්, වීරයෙක් වෙන්න නො වේ, අපට අවශ්‍ය, අපේ නිවීමේ අරමුණ ඉටුකොට ගන්නයි.

භික්ෂුවට මතකයි, එක ආරණ්‍යයක වැඩසිටින කොට එහි සාමණේර ස්වාමීන් වහන්සේලා දහනමක් පමණ වැඩසිටියා. මේ අය ටිකක් දඟකාරයි. මේ ආරණ්‍යයේ සැමදා ම රාත්‍රී 7.00ට වන්දනාව තිබෙනවා. භික්ෂුව සාමණේර අවධියේ හැමදා ම වන්දනාවට යනවා. වන්දනාව අවසානයේ පැය 1/2ක භාවනාවක් තිබෙනවා. භික්ෂුව ඇස් දෙක පියාගෙන භාවනා කළා. මේ බුදු මැඳුරේ මදුරුවන් සිටින නිසා, මදුරු දඟර පත්තුකොට තිබෙනවා. භික්ෂුව භාවනා කරමින් සිටින කොට, භික්ෂුවට දැනෙනවා, යමෙක් මගේ නාසයට මදුරු කොයිල් දුම අල්ලනවා කියලා. මදුරු කොයිල් දුම මොළය විනිවිද යනවා. ඒත් භික්ෂුව ඇස් දෙක

ඇරියේ නැහැ. ඒ සාමණේර හිමිවරු ඒ ක්‍රියාව කරලා හිනාවුණා. ඒ අය අදටවත් දන්නේ නැහැ, ඒ අය කරපු ඒ ක්‍රියාව භික්ෂුව දන්නවා කියලා. තවත් දවසක භික්ෂුව භාවනා කරනකොට, සාමණේර හාමුදුරුනමක් භික්ෂුව පිටිපසට ඇවිත්, හිසට ඉහළින් ඇඟිලි පහ දික්කරලා, භික්ෂුවට අං ඇවිල්ල කියලා පෙන්නලා, අනෙක් සාමණේර හිමිවරු සමඟ එම විහිළුවට සිනාසුණා. ඒත් භික්ෂුව ඇස් දෙක ඇරියේ නැහැ. ඒ අය තාම දන්නේ නැහැ, ඒ අය කරපු විහිළුව භික්ෂුව දන්නවා කියලා.

තවත් ආරණ්‍යයක දී භික්ෂුව දවල් දානය බෙදාගන්න දාන ශාලාවට නියමිත වේලාවට වැඩියාම, දානය සියල්ල ම පාත්‍රවලට බෙදලා අවසන් කරලා. මට බෙදාගන්න දානය මේසය මත තිබුණේ නැහැ. බත් බේසමේ බත් දංකුඩ තිබුණා. වම්බටු ව්‍යංජනය තිබූ භාජනයේ වම්බටු ටිකක් තිබුණා. මම ඒ ටික සතුටින් බෙදාගත්තා. දාන ශාලාවේ දොරකඩින් පාත්‍රය රැගෙන එළියට එනකොට, එම ක්‍රියාව සිදු කළ සාමණේර හාමුදුරුවො මගෙන් අහනවා, අද හාමුදුරුවන්ට දානේ නැහැ නේ ද කියලා. ඒ වෙලාවේ භික්ෂුව ප්‍රකාශ කළේ, මම වළඳලා තිබෙන දානයන් එක්ක, මේ දානය රාජ භෝජනයක් ය කියලා. එහෙම කරලත් භික්ෂුව ගැටුණේ නැහැ. මෙවැනි නුසුදුසු තැනුත් භික්ෂුව, සුදුසු තැනක් බවට පත් කොටගෙන ජීවත් වුණා. මේ සෑම ක්‍රියාවක් ම භික්ෂුව ධර්මය හැටියටයි දැක්කේ. ධර්මය සමඟ ගැටෙන්න ගියේ නැහැ. සංසාරයේ අපි ම කරපු දේවල්, අපි පස්සෙන් එනවිට, අපි ඒවා සතුටින් පිළිගන්න ඕනේ. නුසුදුසු තැනක් අපට ලැබුණාය කියන්නේ එය අපේ අකුසල් සංස්කාරයන් විපාකදීමක්. මෙය අපේ ම, අකුසල් සංස්කාරයක් බව දකින්න දක්ෂතාවය තිබෙනවා නම්, අකුසල් නිසා අපි තව තව සුදුසු තැන් සොයමින් ඇවිදින්නේ නැහැ. මොකද, අපි සංසාරයේ පැවිදි වෙලා අපේ ම තැන්වල අපි වැඩසිටිනකොට, අනෙකුත් ස්වාමීන් වහන්සේලාට අපි අනේකවිධ බාධාවන් සිදු කොට තිබෙනවා. මේ අකුසල් විපාකයනුයි අපේ පසුපස විපාකය පිණිස පැමිණෙන්නේ. මේ බාධාවන් ම කමටහන් කොටගෙන ධර්ම මාර්ගය ශක්තිමත් කොටගන්න දක්ෂ වෙන්න.

මහා කරුණාව යනු සතුන් සුරතල් කිරීමෙන් බොහෝ ඈතක ගිය දෙයකි

පාසල් යන කාලේ පන්තියේ ගුරුතුමිය අපෙන් අහනවා, ලොකු වුණාම ඔබ කවුරු වෙන්නද කැමති කියලා. සමහර දරුවො කියනවා, මම ගුරුවරයෙක් වෙන්න කැමතියි කියලා; වෛද්‍යවරයක්, ඉංජිනේරුවරයෙක් වෙන්න කැමතියි කියලා. පුංචි කාලයේ මගේ කැමැත්ත තිබුණේ දේශපාලනඥයෙක් වෙන්න. මට මතකයි 1977 වසරේ දී මම පාසල් ශිෂ්‍යයෙක්. 1977 මහ මැතිවරණයේ දී පන්තියේ ශිෂ්‍යයන් සමඟ මම රුපියල් 2.00 ගානේ ඔට්ටු තුනක් අල්ලලා තිබුණා. ඒ ඔට්ටු තුනෙන් ම මම පැරදුණා. මගේ සිතේ කැමැත්ත දිව්වේ ඒ දිශාවට. රට, ජාතිය, ආගමට ඒ දිනවල මම ගොඩාක් ආදරෙයි. ළමා කාලයේ මම බොහොම කුළැටි ශිෂ්‍යයෙක්. පාසලේ සාහිත්‍ය සංගමය දවසට සින්දුවක් කියන්න කිව්වොත් මම හැමදා ම මඟහරිනවා. සභාවක් ඉදිරියට යන්න හරි ම ලැජ්ජයි. එම ලැජ්ජාශීලී බව නැතිකරලා, මාව සමාජය ඉදිරියට ගත්තේ, කිංස්ලි වික්‍රමරත්න කියන මහත්මයා. ඔහු මට ගිහි ජීවිතයේදි හුඟක් උපකාර කළා.

ජීවිතය දකින්න, ජීවිතය විඳින්න, ජීවිතය කලකිරෙන්න, ජීවිතයේ නිස්සරණය සොයාගෙන යන්න, මට ගොඩාක් ම ජීවිතාවබෝධය ලබාගන්න උපකාර වූයේ කිංස්ලි වික්‍රමරත්න මහත්මයා. මගේ ජීවිතයේ මට ලැබුණ හැම දෙයක් ම, නො ලැබුණ සෑම දෙයක් ම මට උපකාර වුණා, වර්තමානයේ සිටින තැනට එන්න. භික්ෂුවගේ ජීවිතේ කොතනකවත් භික්ෂුවට වැරදිලා නැහැ. විය යුතු දෙයයි වෙලා තිබෙන්නේ. ඒ නිසා

ලෝකයේ කිසිවෙක් මට හොඳක් කරලත් නැහැ, වරදක් කරලත් නැහැ. මම කරපු දෙයයි මම ලබලා තිබෙන්නේ.

භික්ෂුව වැඩසිටින කුටියට ඉහළින් තිබෙන ගසේ මල් පිපිලා. ලොකු දඬුලේනෙක් එම අතුපතර රිංගමින්, මල් ආහාරයට ගන්නවා. එයා කාලා ඉවත දමන මලේ පොත්ත, භික්ෂුව වැඩසිටින කුටියේ ඉදිරි පියස්සේ ඇති පොලිතින් වහලයට සටසට ගාලා වැටෙනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, රූපය මාරයා හැටියට දකින්න කියලා. එහෙම නො දැක්ක ස්වාමීන් වහන්සේ නමක් භික්ෂුවට, ආරණ්‍යයක දී මුණගැසුණා. උන්වහන්සේගේ පැවිදි භාවයට පත්වීමේ අර්ථයේ එක කොටසක් වූයේ තිරිසන් සතුන්ව සුරතල් කිරීමත්, පෝෂණය කිරීමත්. තිරිසන් සත්ව වේෂයෙන් අප ඉදිරියට එන මාරයාව අපි හඳුනාගන්න දක්ෂ වෙන්න ඕනේ. එම නිසා තිරිසන් සතාව නිරතුරුව මඟහැරලා ජීවත් වෙන්න කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. අපි පසුපසින් බැළලියක් ආවත් ඇය කාන්තාවක් හැටියට දකින්න දක්ෂ වන්න ඕනේ. මොකද, කාන්තාව තුළවත් බැළලිය තුළවත් නො වේ, රාගය තිබෙන්නේ. එම රූපය කෙරෙහි ඇති ඡන්දරාගය නිසා, අපි තුළයි රාගය ඇතිවෙන්නේ.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය කියන්නේ බල්ලන්, බළලුන් වටකරගෙන කෑම දෙනවා, සුරතල් කරනවාය කියන කාරණය නො වේ. බුදුරජාණන් වහන්සේ කොතනකවත් තිරිසන් සතුන්ව සුරතල් කරන්න, තිරිසන් සතුනට කන්න දෙන්න ගියේ නැහැ. බුදුරජාණන් වහන්සේ තිරිසන් සතුන්ගෙන් උපස්ථානයක් ලබලා එම තිරිසන් සතුන්ට සුගතියට මාර්ගයයි පාදලා දුන්නේ. බුදුරජාණන් වහන්සේ විනය කාරණාවන් උපසම්පදා භික්ෂූන්ට පනවා තිබෙනවා. තමන් දානය වළඳලා පාත්‍රයේ ඉතිරි ඉඳුල් ආහාර, සතුන් නැති ගලාගෙන යන ජලයකට දමන්න කියලා; තණකොළ නැති පොළවකට දමන්න කියලා. ස්වාමීන් වහන්සේලා දානය වළඳලා ඉඳුල් බත් ටික තිරිසන් සතෙකුට දෙන්න කියලා බුදුරජාණන් වහන්සේ

ස්වාමීන් වහන්සේලාට දේශනා කරලා නැහැ. මොකද තිරිසන් සතුන් උතුම් භික්ෂුත්වයට පළිබෝධයක් ම යි.

බුදුරජාණන් වහන්සේලාගේ උතුම් මහා කරුණා ගුණය සකස් වෙන්නේ, උන්වහන්සේ පූර්වේනිවාසානුස්සති ඥානයෙන් දකිනවා, මේ මනුෂ්‍ය ලෝකයේ ජීවත්වෙන සෑම මනුෂ්‍යයෙක් ම, සංසාරයේ මට අම්මා, තාත්තා වෙලා තිබෙනවා, දරුවෙක් ඥාතියෙක් වෙලා තිබෙනවා කියලා. බුදුරජාණන් වහන්සේ පූර්වේනිවාසානුස්සති ඥානයෙන් දකිනවා, ප්‍රේත, තිරිසන්, අසුර, නිරය කියන සතර අපායේ සෑම සත්වයෙක් ම සංසාරයේ මට අම්මා, තාත්තා, ඥාතියෙක්, දරුවෙක්, වෙලා තිබෙනවා කියලා; මේ හැම දිව්‍ය, බ්‍රහ්ම තලයක සිටින සෑම දෙවියෙක්, බ්‍රහ්මයෙක් ම මට සංසාරයේ අම්මා, තාත්තා, ඥාතියෙක්, දරුවෙක් වෙලා තියෙනවා කියලා. මේ උතුම් දැක්ම තුළ සිටිමිනුයි ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය ලෝකයට පැතිරෙන්නේ. අපි මේවා වැරදි, දුර්වල ආකාරයට තේරුම් අරගෙන තිරිසන් සතුන්ට කන්න දීම, සුරතල් කිරීම මහා කරුණා ගුණය හැටියට දකිනවා වගේ ම මෙවැනි දේවල් නිසා අපේ භික්ෂුත්වයත් විනාශ කොට ගන්නවා.

භික්ෂුව මුණගැසෙන්න කුටියට, තරුණ ස්වාමීන් වහන්සේ නමක් පැමිණියා. උන්වහන්සේ හුදකලාව ප්‍රිය කරන ස්වාමීන් වහන්සේ නමක්. උන්වහන්සේ බොහොම නොසතුටින් වගේ ප්‍රකාශ කළා මේ වස් කාලය සිත විසිරුණු වස් කාලයක් කියලා. මගේ කෙටි උපසම්පදා ජීවිතයේ නරක ම වස් කාලය මෙය බවයි උන්වහන්සේ ප්‍රකාශ කළේ. භික්ෂුව ඇසුවා, ඇයි මොකද සිත විසිරෙන්න හේතුව කියලා. උන්වහන්සේ කියනවා, කුටියේ කැපකරු කියන දෙය අහන්නේ නැහැ, දායක පිරිස් කුටියට එක්කරගෙන එනවා කියලා. භික්ෂුව ඇසුවා, නිතර ම දායක පිරිස එක්කරගෙන එනවාද කියලා. ඒ වෙලාවේ උන්වහන්සේ කියනවා, එක කට්ටියක් පමණයි කුටියට එක්කරගෙන පැමිණියේ කියලා. කැපකරු එක දායක පිරිසක් කුටියට එක්කරගෙන ආවය කියලා

උන්වහන්සේගේ මුළු වස් කාලය ම විනාශවෙලා. මේ ගැටීම සකස් වෙන්නේ මගේ හුදකලාව කියන ඇලීමේ බලවත්භාවය නිසා ම යි. ඇලීමේ බලවත්භාවය නිසා ම යි, ගැටීමේ උච්චභාවය සකස් වෙන්නේ. ඇලීමත් ගැටීමත් උච්ච තැනදී සිතේ විසිරීම ස්වාභාවික දෙයක්. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, රූපය කියන්නේ මාරයාය කියලා. එම නිසා අපි කැපකරුවනුත්, දායක මහත්මයාත් මාරයා හැටියට දකින්න දක්ෂ වෙන්න ඕනේ. අපිට මේ අය ප්‍රතික්ෂේප කරලා ජීවත්වෙන්න බැහැ. මේ අයත් අපේ පැවිදි ජීවිතයේ ම කොටසක්. අපි කැපකරුව ජයගන්න දක්ෂ නැතිනම්, දායක පිංවතා ජයගන්න දක්ෂ නැතිනම්, ඒ අය සමඟ ගැටෙන ස්වභාවයට, ඇලෙන ස්වභාවයට යනවා නම්, අපි කෙසේ සේනා සහිත මාරයාව ජයගන්න ද? මුලින් ම ඔබ කැපකරුව, දායක මහතාව ජයගන්න දක්ෂ වෙන්න. මේ අය සමඟ ගැලවීමට හැකි මායිමේ සිට ඇසුරු කරන්න දක්ෂ වෙන්න.

රාග සිතකින් උපදින කල්පාන්තරයක දුක, එක විදර්ශනා සිතකින් නිවා දමන්න

භික්ෂුව එක ආරණ්‍යයක වැඩසිටිනකොට එහි ලොකු මල් පෝච්චිවල සිටවපු මල්ගස් පහළොවක් පමණ තිබුණා. ඉඩෝර කාලය පැමිණි නිසා ඒවාට වතුර දැමීමට අවශ්‍ය වුණා. ආරණ්‍යයේ කැපකරු එම කටයුත්ත භික්ෂුවට පැවරීමට උත්සාහ ගත්තා. භික්ෂුව එයට අකමැති වුණා. අකමැත්ත ප්‍රකාශ කළ මොහොතේ පටන්, එම කැපකරුවා භික්ෂුව සමඟ ගැටෙන ස්වභාවයට පැමිණියා. පසුදින භික්ෂුව දාන ශාලාවේ දී කැපකරු මහතාට යම් ආහාරයක් පිළිගන්වන්න යැයි කියා සිටියදී, ඔහු එය නො ඇසුණාක් මෙන් මඟහැර ගියා. ඔහුට අවශ්‍ය වුණේ, භික්ෂුව සමඟ ආරවුලක් ඇතිකොට ගැනීමට යි. පසුදා පටන් භික්ෂුව එම මල් පෝච්චි පහළොවට වතුර දැම්මා. කැපකරු ගැටෙන ස්වභාවයෙන් මිදුණා. වැසි කාලය පැමිණි නිසා භික්ෂුවට එම කාර්ය සිදුකිරීමට සිදුවූයේ මාසයක් පමණයි. මේ කැපකරු මහතා නිසා එම ආරණ්‍යය හැරගිය ස්වාමීන් වහන්සේලා කිහිප නමක් ම අතීතයේ සිටි බව භික්ෂුවට පසුව ආරංචි වුණා. මෙවැනි මාර බලයක් අප ජයගැනීමට දක්ෂ නැතිනම්, මේවා සමඟ ඇලීම, ගැටීම නිසා විසිරුණු සිතක උරුමය ඔබට ලැබෙනු ඇත.

මෙවැනි විසිරුණු සිතක උරුමයයි (ඉකුත් ලිපියේ සඳහන් වූ) කුටියට පැමිණි තරුණ ස්වාමීන් වහන්සේට තිබුණේ. මාරයාව අවබෝධ කරගැනීමට අවශ්‍යව තිබියදී, මාරයා සමඟ ගැටෙන ස්වභාවයට ගිහිල්ලා, වටිනා වස් කාලයක් උන්වහන්සේ අවුල් කරගත්තා. භික්ෂුව එම ස්වාමීන් වහන්සේට දැනුම් දුන්නේ, "ඔබ

ඔය සකස්වෙන සිත නිත්‍ය වශයෙන් ගන්න එපා, ඔබ වහන්සේ ඔය ගැටෙන සිතට බැඳී ගිහිල්ලයි තියෙන්නේ. ඔබ වහන්සේ මේ මොහොතේ අධිෂ්ඨානයක් ඇතිකොට ගන්න, ඔබ වහන්සේගේ හොඳ ම වස් කාලය මේ වස් කාලයයි කියලා. අතීතයේ වෙච්චි හැම දෙයක් ම අතීත පංච උපාදානස්කන්ධයක් හැටියට දැකලා අමතකකොට දමන්න. මුලින් ම ඔබ කැපකරු ජයගන්න. කැපකරු ජයගතහොත් පමණයි, ඔබට මාරයා ජයගන්න මාර්ගයට අවතීර්ණ වෙන්න පුළුවන් වෙන්නේ. එතෙක් ඔබ මාරයාට ම අයත් සිතුවිලි සමඟ, මාරයා ජයගැනීමේ නිරර්ථක සටනකයි නියැලී සිටින්නේ" උන්වහන්සේ සතුටු සිතින් උන්වහන්සේගේ හුදෙකලා කුටියට නැවත වැඩියා.

ධර්මයේ අර්ථයක් නො දත් මනුෂ්‍යයෝ ආගමක් සරණ යන්නේ ලෝකය තුළ තිබෙන අනතුරුවලින් මිදිලා ආරක්ෂාවක්, සැනසිල්ලක් බලාපොරොත්තුවෙන්. මෙවැනි මනුෂ්‍යයන් අතර සමහරු සිටිනවා රාගය, ආගමක් කොටගත්ත. ඔවුන්ගේ ආගම තමයි රාගය. ඔවුන්ගේ විමුක්තියත් රාගය. රාගයෙන් ලබන විමුක්තියෙන් පිට විමුක්තියක් ඔවුන් දකින්නේ නැහැ.

එක තරුණයෙක් සිටියා, ඔහු බොහොම රාගික, සිංහල බෞද්ධ තරුණයෙක්. පාසල් වියේ දී ම අසම්මත ප්‍රේම සම්බන්ධතාවයක් ඇතිකොට ගන්නවා. ඔහු මේ කිසි ම ඇසුරකින් සෑහීමකට පත්වෙන්නේ නැහැ. අවසානයේ මොහුට මොහුගේ ම රාගයට ගැළපෙන තරුණියක් මුණගැසෙනවා. ඇය අන්‍යාග මික තරුණියක්. මේ සිංහල බෞද්ධ තරුණයා වෙනත් ආගමකට බැඳී ඇයව විවාහ කරගන්නවා. බලන්න, අවසානයේ ඔහුගේ ආගම වුණේ රාගයයි.

මේ වගේ ම සිංහල බෞද්ධ තරුණියක් සිටියා. ඇයත් අධිරාගික චරිතයක්. ඇය කිසි ම සිංහල බෞද්ධ තරුණයෙක්ගෙන්වත් තෘප්තිමත් වුණේ නැහැ. අවසානයේ ඇයට ඇයගේ රාගයට ගැළපෙන අන්‍යාගමික තරුණයෙක් මුණගැසෙනවා. ඇය එම

ආගමට බැඳී, එම තරුණියාව විවාහකොට ගන්නවා. මේ අයගේ ආගම, විමුක්තිය තමයි රාගය.

රාගය ආගම කොටගත් සමාජයක ජීවත්වෙච්ච මනුෂ්‍යයෙක් සිටියා. ඔහු කන්ද උඩරට ප්‍රදේශයේ ජීවත්වුණ කෝටිපති මහත්මයෙක්. ඔහුගේ ජීවිතයේ අංක එක ලැබුණේ රාගය. අංක දෙක ලැබුණේ ව්‍යාපාරයට. අංක තුන ලැබුණේ පිංකම්වලට. අනුපිළිවෙළට සටහන් තැබුවත් මේ කාරණා තුන ඔහු සමබරව කරගෙන ගියා. මොහු මීට වසර 25කට පෙරාතුව නුවර ප්‍රදේශයේ විහාරස්ථානයක විශාල බුදුපිළිම වහන්සේ නමක් තම ධන පරිත්‍යාගයෙන් ඉදිකොට විවෘත කරනු ලැබුවා. විවෘත කිරීමේ පිංකමට ඔහු රැගෙන ඇවිත් තිබුණේ මඟුල් බෙර කණ්ඩායමක්, වෙස් නැටුම් කණ්ඩායමක් නො වේ. රාත්‍රී සමාජ ශාලාවල රංගන ඉදිරිපත් කරන, කොට කලිසම් ඇඳගත්ත නාට්‍යාංගනාවන් දෙදෙනෙක්.

ඊට ම ගැළපෙන සංගීත කණ්ඩායමකුත් සිටියා. පන්සල මොහොතකට සමාජ ශාලාවක් වුණා. රැස්ව සිටි තරුණ පිරිස් සතුටින් කාමච්ඡන්දයන් විඳලා අකුසල් සිදුකොට ගත්තා. එහි සිටි වැඩිහිටි උපාසක පිරිස මේ අශෝභන සිද්ධිය ගැන ගැටිලා අකුසල් සිද්ධකොට ගත්තා. පන්සලේ ස්වාමීන් වහන්සේලාත් දානපති මහත්මයාට ඉහළින් කටයුතු කළේ නැහැ. දානපති මහත්මයා සතුටු සිතින් පිංකම අවසන් කළා. පිංකම තුළිනුත් කාමයන් වැඩෙන පරිසරයක් තමයි මොහු බලාපොරොත්තු වුණේ. මේවා වැරදියි කියලා දැක්මක් ඔහුට තිබුණේ නැහැ. ඔහුට අවශ්‍ය වුණේ, තමනුත් සතුටු වෙලා මිනිසුන්වත් සතුටු කරන්න. මේ දානපති මහත්මයා තම ජීවිතයේ දී විවාහයන් කිහිපයක් සිදුකොටගත් අයෙක්. මේ හැම විවාහයක් ම සිද්ධකොට ගත්තේ මුල් විවාහය නීත්‍යනුකූල දික්කසාදයක් කිරීමකින් තොරවයි. තව අපූරු කතා ගොඩක් ඒ මහත්මයාගේ ජීවිත කතාව තුළ තිබෙනවා. ඒවා මෙහි සටහන් තබන්නේ නැහැ. රාගයට බරව

ජීවත්වෙච්ච මේ මහත්මයා පිංකම්වලටත් මුල්තැන දුන්නා. මොහු තම ධනපරිත්‍යාගයෙන් ඉදිකරපු පන්සල්, බුදුමැදුරුවල මේ වනවිටත් සියගණනින් මනුෂ්‍යයෝ මල්පහන් පූජා කරනවා; මේ පිළිම වහන්සේ ඉදිරියේ භාවනා කරනවා. මෙසේ ජීවත් වෙලා මේ මහත්මයා රෝගී වෙලා එකතැන් වෙනවා. අවසානයේ දී මේ දානපති මහත්මයා තම බිරිඳ සමීපයේ දී මරණයට පත්වෙනවා. දැන් ඔබ නුවණින් ගළපල බලන්න, මේ මැරිච්ච දානපති මහත්මයා නැවත කොහේ උපත ලබන්නට ඇතිද කියලා. හේතුඵල ධර්මයට අනුව ගළපල බලන්න. මේ මනුස්සයා අහවල් තැන ඉපදුණාය කියලා ඔබ මේ මොහොතේ ඇති කරගත් උත්තරය වැරදියි.

භික්ෂුවක් උතුම් සමාධියෙන් අරමුණුකොට බලනවා, මේ රාගයට ලැදි, පිංකම්වලට ලැදි දානපති මහත්මයා නැවත ඉපදුණේ කොහෙද කියලා. ඒ වෙලාවෙ ඒ ස්වාමීන් වහන්සේ දකිනවා ඒ මහත්මයා මේ මනුෂ්‍ය සමාජයේ ම ස්ත්‍රීත්වය ලබලා ඉපදිලා. පෙර ජීවිතයේ කාන්තාවන් කිහිපදෙනෙක් විවාහ කරගත් මේ දානපති මහත්මයා වර්තමානයේ කාන්තාවක්. දැන් ඔබට සතුටක් ඇතිවෙන්න පුළුවන්, මේ දානපති මහත්මයා සතර අපායට වැටෙන්නෙ නැතිව මනුෂ්‍ය කාන්තාවක් වුණ එක වාසනාවක්ය කියලා. ඒ ස්ත්‍රීත්වය ඇයට කවදාවත් වාසනාවක් වෙන්නෙ නැහැ. මොකද, ඇය පිටුපස විපාක දීම සඳහා බලවත් කාමය වරදවා හැසිරීමේ අකුසල් ගොන්නක් තිබෙනවා, ගිය ජීවිතයේ දී දානපති මහත්මයා හැටියට සිදුකරපු. සමහරවිට ඇය තරුණ වියේ දී ම අසම්මත ප්‍රේම සම්බන්ධයකට යොමුවෙලා ජීවිතය විනාශ වෙන්න පුළුවන්. සෑම විවාහයක් ම දික්කසාදයකින් කෙළවර වෙන්න පුළුවන්. අවසානයේ ගණිකාවක් බවටත් පත්වෙන්න පුළුවන්. ඉහත සිද්ධිය නුවණින් විග්‍රහකොට දකින්න උත්සාහ ගන්න. ගිය ජීවිතයේ මේ දානපති මහත්මයා, මේ ජීවිතයේ දී ස්ත්‍රීත්වයක් ලැබුවේ, අතීත අකුසල් විපාකය පිණිස සකස්කොට, මේ ස්ත්‍රී ජීවිතයෙන් පස්සෙ අනිවාර්යයෙන් ම

සතර අපායට වැටෙන්නය කියන කාරණය මතුකොට ගන්න ඔබ දක්ෂ වෙන්න. රාගී සිතිවිල්ලක් තුළ සැඟවී තිබෙන අසම්මත භව ගමනේ කර්කශ බව නුවණින් මතුකොට ගන්න දක්ෂ වෙන්න. සතුටු වෙමින් අකුසල් රැස් කරන, එම අකුසල් විපාක දෙනකොට අකුසල් නිසා ම තව අකුසල් මෝදුකොට ගනිමින් දුකට පාර පෙන්වන අවිද්‍යාවේ මාර්ගය කල්‍යාණ මිත්‍ර ආශ්‍රය තුළින් ම නිෂේධ කිරීමට ඔබ දක්ෂ වෙනවා. රාග සිතුවිල්ලකින් සකස් වෙන කල්පාන්තරයක දුක, එක ම එක විදර්ශනා සිතකින් පරාජයකොට දමන උතුම් ධර්ම මාර්ගයට ඔබත් අර්ථවත්ව අවතීර්ණ වෙන්න.

වේලාව සවස 5.00ට විතර ඇති. භික්ෂුව වැඩසිටින කඳුකර ප්‍රදේශයට වේගයෙන් සුළඟ හමනවා; කඩින්කඩ වැසිත් ඇතිවෙනවා. පරිසරය අඳුරු කරලා තිබෙන්නේ. ලොකු වැස්සක පෙරනිමිති පේනවා. මේ වැස්සට ගම්වැසියෝ කියන්නේ මහියංගණ පෙරහැර වැස්ස කියලා.

අතුරුභෝග කුඹුරුවල වගාකරලා තිබෙන, ගමේ ගොවි මහත්වරුන්ට මේ වැස්ස බලාපොරොත්තු ඉහළ නංවනවා. වැස්ස ගැන කථා කරනකොට මතකයට එන්නේ, වැස්ස වලාහක දෙවියන්ව. වැස්සවලාහක දෙවියන්ට ලස්සන දූවරු දෙදෙනෙක් ඉන්නවා කියලා, බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ලොකු දුවගේ නම කෝකන්දා. පොඩි දුවගේ නම චුල්ල කෝකන්දා. මේ දිව්‍ය දියණියන් දෙදෙනා එයාලගෙ පිරිවර දිව්‍ය යෙහෙළියන් පිරිවරාගෙන වලාකුළු මත සෙල්ලම් කරනවා; කාමච්ඡන්දයන් විඳිනවා. මේ වැස්ස වලාහක දූවරු දෙදෙනා පිංකම්වලට ගොඩක් කැමතියි. මනුෂ්‍ය ලෝකයේ පිංවත් ස්වාමීන් වහන්සේලා ධර්ම දේශනා කරනකොට, මේ අය කාමච්ඡන්දයන් විඳලා වැසි වස්සන්නේ නැහැ. නමුත් මේ අයට පාලනය කරන්න බැරි වැසි තිබෙනවා. ඒවා ඇතිවන්නේ සතර මහා ධාතුවේ කිපීම් නිසා. අකුණු ගහලා, ගොරවලා, සුළඟ හමලා ඇතිවෙන ධාරානිපාත වර්ෂාවන්, සතර මහා ධාතුවේ කිපීම් නිසා ඇතිවන වැසි. මේවා

පාලනය කරන්න වැස්ස වලාහක දෙවියන්ට හෝ ඔහුගේ දූවරු දෙදෙනාට බැහැ. එම නිසා ඔබ කරන පිංකම්, ධර්ම දේශනා අසාර්ථක කරමින් ලොකු වර්ෂාවන් වහිනකොට, ඔබ වැස්ස වලාහක දෙවියන්ට, එම දිව්‍ය දියණියන්ට බනින්න එපා. ඒ අය අහිංසකයි. පිංවත් ඔබලා පිංකමක් කරනකොට පුංචි පුංචි මල්වැසි වස්සලා එම පිංකම්වලට ආශිර්වාද කරන්නේ එම පිංවත් දිව්‍ය දියණියන් ම යි.

::

භික්ෂුව මේ මොහොතේ වැඩසිටින කුටිය පිහිටි දූප්පත් ගම්මානයේ ගම්වැසියන්ට භික්ෂුව නිතර ම කියනවා, ධර්මයට සම්බන්ධ යම් ප්‍රශ්නයක් තිබෙනවා නම්, පිණ්ඩපාත වේලාවෙදි අහන්න කියලා. ඒ පිංවතුන් අසන්නේ දානයේ ලුණුඇඹුල් බලන්න හොඳ ද නැද්ද කියලා; බුද්ධ පූජාව පූජා කළාට පස්සේ එය විසිකරන්න හොඳ ද කියලා. ඉන් එහා ප්‍රශ්නයක් එම පිංවතුන් අසන්නේ නැහැ. එම නිසා ම සංසාර බියට අදාළව බණ ටිකක් ඒ අයට කියලා දෙනවා. මේ අයට සංසාරය තව කොතෙක් දීර්ඝ වෙයි ද? තවත් කල්ප විනාශ කිහිපයකට මේ අය මුහුණදෙයි ද? භික්ෂුව නැවතිලා සිටිනවා. ලෝකය ගලාගෙන යනවා. ගලාගෙන යනවා කියන්නේ, සංස්කාර රැස්වෙනවා. නැවතී සිටින තැන සිට ලෝකය දෙස බලනකොට කරුණාවක් ම යි සකස් වෙන්නේ. එම නිසා භික්ෂුව මෙලෙස සටහන් ලියනවා; බණ කියනවා. නමුත් ජීවිතය නැවතිලා. විපාකය පිණිස සකස්වෙන අතීත සංස්කාර හරිහරියට විපාක දෙනවා. කෙනෙකුට සංස්කාර විපාක දෙනකොට, තවකෙනෙක් හරිහරියට සංස්කාර රැස් කරගන්නවා. කෙනෙක් නැවතුණත්, තවකෙනෙක් ඔහු නිසා හරිහරියට දුවනවා. ලෝකය ඒ සුපුරුදු ආකාරයෙන් ගලාගෙන යනවා. නමුත් නැවතී සිටින භික්ෂුව එය දකිනවා. ජීවිතය කියන්නේ ප්‍රශ්නාවලියක්. එම ප්‍රශ්නාවලිය කථාකරලා විසඳගන්න බැහැ. උපත නිරෝධය කිරීමෙන් ම යි, ප්‍රශ්නාවලිය අවසන්කොට ගත හැක්කේ.

දුවන මිනිසුන් අතර නවතින අතළොස්සට ඔබත් එකතුවෙන්න

භික්ෂුව මුණගැසීමට මවුපිය දෙපළක් පැමිණියා. ඒ දෙපළ දීර්ඝ කාලයක් විදේශගතව ජීවත්වුණු අය. මේ දෙදෙනා කුටියට පැමිණිලා මුලින් ම භික්ෂුවට වන්දනා කළා. දෙවනුව දෙදෙනා ම අඬන්න පටන්ගත්තා. භික්ෂුව විමසුවා මොකක්ද ප්‍රශ්නය කියලා. ඒ වෙලාවේ ඒ මහත්මයා කියනවා, "හාමුදුරුවනේ, අපට ඉන්නේ එක ම එක දියණියක් විතරයි. එයාගෙ විවාහය උත්සවශ්‍රීයෙන් කරන්න අහවල් හෝටලයට මුදලුත් බැඳලයි තිබුණේ. ඒත් අවසන් මොහොතේ මනමාල පාර්ශ්වයෙන් මංගල්‍යය නතර කළා, ඇතිකරගත් වැරදි වැටහීමක් නිසා."

මේ වෙලාවේ භික්ෂුව කල්පනා කළේ, මනමාල පාර්ශ්වයේ වරද ගැන නො වේ. අදාළ දියණියට මෙවැනි බලාපොරොත්තු කඩවීමක් සිද්ධවෙන්න, ඇය පෙර ජීවිතයේ මොන වගේ අකුසලයක් කරගන්න ඇති ද කියලයි. ඔබේ ජීවිතය ඉදිරියට එන ප්‍රශ්නයට හේතුව, සැබෑ ම ඉලක්කයට යොමුකොට ඔබට දකින්න පුළුවන් නම්, මේ ජීවිතයේ දී ඔබෙන් සිදුවන අකුසල් සංස්කාරයන් බොහෝ දුරට අඩුකොට ගැනීමට ඔබට ශක්තියක් ලැබෙනවා.

කුසලයන් අකුසලයන් සමඟ දෝලනය වෙමින් යන මේ භව ගමන නැවතීමකින් තොරව ඉදිරියට ගලාගෙන යනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, අතීතයේ බුදුරජාණන් වහන්සේලා ලක්ෂ ගණනක් පහළ වූවා සේ ම, අනාගතයේ දී

බුදුරජාණන් වහන්සේලා ලක්ෂ ගණනක් පහළවෙනවා කියලා. ඒ කියන්නේ ලෝකය තව කල්ප සියක්කෝටි, ප්‍රකෝටි ගණනක් ඈතට ගලාගෙන යනවා. නැවතීමක්, නිමාවක්, අවසානයක් නැහැ. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ලෝකය කියන්නේ කැඩෙන, බිඳෙන, විසිරෙන අර්ථයයි කියලා. මොනවද කැඩෙන්නේ, බිඳෙන්නේ, විසිරෙන්නේ. සංස්කාර කැඩෙමින්, බිඳෙමින්, විසිරෙමින් ලෝකය ගලාගෙන යනවා. කුසල් සංස්කාර කැඩෙමින්, බිඳෙමින්, විසිරෙමින් ලෝකය ගලාගෙන යනවා. අකුසල් සංස්කාර කැඩෙමින්, බිඳෙමින් විසිරෙමින් ලෝකය ගලාගෙන යනවා. නැවතීමක්, නිමාවක් නැහැ.

දේශපාලනය කරන මහත්මයෙක් භික්ෂුව හමුවට පැමිණියොත්, ඒ මහත්මයාට අනිත්‍ය වඩන්න කියලා භික්ෂුව කියන්නේ නැහැ. ඒ මහත්මයාට කියන්නේ, සිල්පද පහ රැකගෙන දේශපාලනය කරන්න කියලයි. මොකද, දේශපාලනය කරන කෙනා අනිත්‍යය වඩන්න ගියොත් රට අරාජික වෙන්න පුළුවන්. කලා කටයුතු කරන කෙනෙක් භික්ෂුව මුණගැසීමට පැමිණියොත් ඒ කලාකරුවාට භික්ෂුව පායාස නිරය ගැන කියන්න යන්නේ නැහැ. ඒ මහත්මයාට කියන්නේ, සිල්පද පහ රැකගෙන කලා කටයුතු කරන්න කියලා. මොකද, ලෝකය පවතිනවා. ධර්ම දේශනා, පිංකම්, ලෝකයේ තිබෙනවා වගේ ම සංදර්ශන, සංගීත සංදර්ශන, උත්සව ආදියත් ලෝකයේ තිබෙනවා. මේවායින් බැහැරව ලෝකය දකින්න බැහැ. භාවනා කරන ස්වාමීන් වහන්සේලාත් ලෝකයේ වැඩ සිටිනවා. පිංකම්, ධර්ම දේශනා කරන ස්වාමීන් වහන්සේලාත් ලෝකයේ වැඩ සිටිනවා. ඒ වගේ ම යි, රට, ජාතිය, ආගම උදෙසා සටන් කරන ස්වාමීන් වහන්සේලාත් ලෝකයේ වැඩසිටිනවා. පිකටින්, පෙළපාළි යන ස්වාමීන් වහන්සේලාත් වැඩසිටිනවා. මේකට තමයි ලෝකය කියන්නේ. මේවායින් තොරව ලෝකය දකින්න බැහැ. අපි හිතනවා නම් ලෝකයේ සිටින සෑම ස්වාමීන් වහන්සේ නමක් ම භාවනා කළ යුතුයි කියලා, ඒ අපි දකින්න උත්සාහ ගන්නේ මෝහය යි.

සංස්කාරයෝ කැඩෙමින්, බිඳෙමින්, විසිරෙමින් ලෝකය ගලාගෙන යනවා. සුගතියත්, දුගතියත් දෙක අතර දෝලනය වෙමින් ලෝකය ගලාගෙන යනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මැරෙන මනුෂ්‍යයින් ලෝකයේ ම පස් හා සමාන නම්, සද්ධාව සකස් කොටගෙන ඇත්තේ මේ නිය පිට තිබෙන පස් ප්‍රමාණයටයි කියලා. සත්ව ලෝකයේ දුක මතුකොට පෙන්වන, අතිශය කටුකභාවය දනවන්නක් තමයි ඉහත උපමාව. බුදුරජාණන් වහන්සේ පිංවතුන්ලා ලක්ෂයකට ධර්ම දේශනා කළොත්, ඒ ධර්මය ජීවිතයට ගළපාගන්නේ කොයි තරම් සුළු පිරිසක් ද කියන කාරණය ඉහත උපමාවෙන් මතුකොටගන්න දක්ෂ වෙන්න. මේ කටුක ලෝක ස්වභාවය නුවණින් දකින පිංවත් ඔබ, ගලාගෙන යන ලෝකය තුළ නැවතුණු මනුෂ්‍යයෙක් බවට පත්වෙන්න. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නමක් ලෝකයට පහළවෙන්නේ මේ ගලාගෙන යන දීර්ඝ ලෝක ස්වභාවය මතුකොට පෙන්වලා, පිංවත් ඔබ ලෝකය තුළ නැවතුණ කෙනෙක් බවට පත්කිරීමට යි. ලෝකය තුළ නැවතුණා කියන්නේ, ලෝකය තුළ දිවීමට අවශ්‍ය සංස්කාරයන් රැස්කිරීම නැවැත්වූවාය කියන කාරණය යි.

භික්ෂුව මොහොතක් ඇස්දෙක පියාගෙන කල්පනා කළා, අදක්ෂ වූ ලෝකයාට ලෝකය තව කොතෙක් දුරවෙයි ද කියලා. අනාගතයේ දී බුදුරජාණන් වහන්සේලා ලක්ෂ ගණනක්, මුළු පෘථිවිය ම අළු දූවිලි බවට පත්වෙන කල්ප විනාශ සියදහස් ගණනක් පසුකොට ලෝකය ගමන් කරාවි. මනුෂ්‍යයා නොදැනුවත්භාවය නිසා ම, මොන තරම් දීර්ඝ, කටුක දුකක් කරා ද මේ ගමන් කරන්නේ. අවිද්‍යාවෙන් අන්ධ වූ මිනිස් සිත "රසයි රසයි" කියකියා "සැපයි සැපයි" කියකියා අතදිගහැර, නිර්ලෝභීව සංස්කාරයන් සකස්කොට දෙනවා, ඔබව මේ දීර්ඝ, කටුක දුකේ කොටස්කරුවෙක් බවට පත්කරන්න. ලෝකයට, ලෝකයාට කැමති සේ, සිත් සේ අනාගත දුක කරා ගලාගෙන යැමට ඉඩදෙන්න. ඔබ මේ කටුක යථාර්ථය නුවණින් හඳුනාගනිමින්

දුවන ලෝකය තුළ, නැවතුණ කෙනෙක් බවට පත්වෙන්න. නැවතුණ තැන දී පිංවත් ඔබට විවේකීව, විවෘතව ලෝකය දකින්න ලැබේවි. දීර්ඝ අබුද්ධෝත්පාද කාලයකට පසුව මුණගැසෙන, සම්මා සම්බුද්ධ ශාසනයක දී දුවන මිනිසුන් අතරින් නවතින මිනිසුන් අතළොස්ස අතරට පිංවත් ඔබත් එකතුවෙන්න.

දකින්න, සීලයෙන් භාවනාවට දෙන ජවය

පිංවත් ඔබ භාවනාවට යොමුවන්න ඕනේ මොන තරම් පෙර සූදානමකින් ද. පෙර සූදානම කියන්නේ, නාලා, පිරිසිදු වෙලා, ඇල්වතුර වීදුරුවක් බීලා, වේගයෙන් හුස්මක් අරගෙන, දොර ජනෙල් ඇරලා කියන කාරණා නො වේ. මේවාත් අවශ්‍ය තමයි. වඩාත් වැදගත් වෙන්නේ, කුමක් උදෙසා ද අපි භාවනා කරන්නේ, කුමක් නැති කිරීමට ද භාවනා කරන්නේ කියන කාරණාවත්, පංචනීවරණ යනු කුමක් ද, ඒවා ඔබ වෙන් වෙන් වශයෙන් හඳුනාගත්තා ද? යන කාරණාවන් ය.

කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ද, උද්ධච්ඡකුක්කුච්ඡ, විචිකිච්චා කියන කාරණාවල ස්වභාවය හඳුනාගෙන භාවනාවට යොමු වෙන්න. එසේ නො වුණහොත්, ඔබ භාවනා කරන කාලවේලාවේ දී වැඩි වශයෙන් වැඩෙන්නේ ඉහත මාර ධර්මයන් ම යි.

භික්ෂුවට හමුවූ තරුණ දරුවන් පිරිසක් භික්ෂුවගෙන් විමසුවා, මේකෙන් ගැලවෙන හැටි කියලා දෙන්න කියලා. ඒ දරුවන් පාවිච්චි කළ වචන ටිකයි ඉහත සඳහන් කළේ. කාගෙන් ගැලවෙන හැටි ද මේ දරුවන් අහන්නේ? බ්‍රහ්මයෙක්, දෙවියෙක්, යක්ෂයෙක්ගෙන් ගැලවෙන හැටි ද මේ දරුවන් අහන්නේ? අපිට ගැලවෙන්න තිබෙන්නේ මේ කාගෙන්වත් නො වේ. ඔබලා තුළ ම සකස් වෙන්නා වූ තෘෂ්ණාවෙන්. දුකට හේතුවන තෘෂ්ණාව තමා තුළ ම තබාගෙන, භික්ෂුවගෙන් අසනවා මේකෙන් ගැලවෙන්නේ කොහොමද කියලා. මේ දරුවන් අවංකව ම යි මේ ප්‍රශ්නය ඇසුවේ. එහෙම නම් ඇයි මේ ප්‍රශ්නය අසන්නේ?

චතුරාර්ය සත්‍යය පිළිබඳ දැනුම අඩු නිසා. ඒ වෙලාවේ භික්ෂුව එම දරුවන්ට ප්‍රකාශ කළා, චතුරාර්ය සත්‍යයේ දුක කියලා කියන්නේ ජාති, ජරා, ව්‍යාධි, මරණ, සෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස, උපායාස, පංච උපාදානස්කන්ධ දුක, ප්‍රියන්ගෙන් වෙන්වීම, අප්‍රියන් හා එක්වීමේ දුක, මේ සියල්ල ම දුක නම් මේ දුක සකස් වෙන්නේ ඔබලා තුළ ම නේ ද? දෙවනුව බුදුරජාණන් වහන්සේ සඳහන් කරනවා දුකට හේතුව තෘෂ්ණාව කියලා. දුක තමා තුළ නම් සකස් වෙන්නේ, දුකට හේතුව තෘෂ්ණාවත් තමා තුළ ම නේ ද සකස් විය යුත්තේ? තුන්වන ආර්ය සත්‍යය, 'දුකෙන් මිදීම' කියන්නේ තෘෂ්ණාවෙන් මිදීම කියන කාරණය. දුකත් තමා තුළ ම නම් සකස් වෙන්නේ, දුකට හේතුව තෘෂ්ණාව, තමා තුළ ම නම් සකස් වන්නේ, දුක නැති කිරීමට තෘෂ්ණාව නැති කළ යුත්තේ තමා ම නේ ද? එහෙම නම් තෘෂ්ණාව නැති කිරීමට ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කළ යුත්තෙත් තමා ම නේ ද? එහෙම නම් චතුරාර්ය සත්‍ය තමා තුළින් ම නේ ද ක්‍රියාත්මක විය යුත්තේ. එනිසා ඉහත ධර්මයන් භාවනාවට පෙර නුවණින් හැකිතාක් මෙනෙහි කරන්න. එවිට ඔබට හැකි වේවි, ලෝකයෙන් ඔබව හුදකලා කොට තබාගන්න. ඔබ අත්විඳින දුකේ දිගපළල දකිමින් දුක සකස්වීමට හේතු වන තෘෂ්ණාව, කෙලෙස් බරිත සිතුවිලි නුවණින් හඳුනාගෙන බැහැර කොට දමන්න.

මේ කාර්ය ඔබට පහසුවෙන් කරගැනීමට හැකියාව ලැබෙන්නේ ඔබ සීලයට ඔබේ ජීවිතය තුළින් ලබා දී ඇති වටිනාකමේ ප්‍රමාණය මත යි. ඔබ සීලයෙන් දුර්වල නම් ඉන්ද්‍රිය සංවරයක් ගැන සිතා ගැනීමටවත් නො හැකි වනු ඇත. මෙවැනි අවස්ථාවක ඔබ කළ යුතුව ඇත්තේ බුදු ගුණ භාවනාවට වැඩිපුර යොමු වෙමින්, තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව දියුණු කරගනිමින්, සීලයෙන් ශක්තිමත් වීමට උත්සාහ ගැනීම යි. මේ ධර්ම මාර්ගයෙන් අර්ථවත් අවබෝධයක් ලබාගැනීමට ඔබට අවශ්‍ය නම් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ අනුපිළිවෙළට මාර්ගය වඩන්න දක්ෂ වෙන්න. ඔබ ආහාර ගන්න

කොට හැම ව්‍යංජනයකින් ම ටිකටික බෙදාගෙන රස බලනවා වගේ, හැම දෙයකින් ම ටිකටික කරන්න යන්න එපා. හේතුඵල ධර්මයන්ට යටත්වයි, ධර්මයේ සෑම පියවරක් ම සකස් වෙන්නේ. ඔබ තුළ සමාධියක් සකස් නො වේ නම්, එය කමටහනේ වරදක් නො ව, සීලයේ දුර්වලතාවයකි; සමාධියට ඔබ තව ම සූදානම් නැහැ කියන කාරණයයි.

ධර්ම සාකච්ඡාවක දී පැමිණි පිංවතුන් සියලු දෙනා ම ප්‍රශ්න යොමු කළේ භාවනාව සම්බන්ධව, භාවනා කිරීමේ දී ඇති වන ගැටලු සම්බන්ධව. නමුත් එක මහත්මයෙක් පමණක් ප්‍රශ්න තුනක් යොමු කළා, සීලය සම්බන්ධව. පංචසීලයට අදාළවයි, එම ප්‍රශ්න තුන ම. නමුත් එතන සිටිය අනෙක් පිංවතුන්ට පෙනුණේ එම ප්‍රශ්න ප්‍රාථමික ගණයේ ප්‍රශ්න හැටියට. මොකද, සීලය ගැනනේ කතා කළේ, භාවනාව ගැන නො වේ. නමුත් ඉහත පිංවතුන්ගෙන් භික්ෂුව වඩාත් පසසන්නේ, ගරු කරන්නේ, සීලය පිළිබඳව ප්‍රශ්න කළ පිංවතාවමයි. මොකද, සීලය පිරිසිදු කොටගෙන, නිරවුල් කොටගෙන අහවර වෙලයි, භාවනාවක් අර්ථවත් වෙන්නේ. එතනයි භාවනාවේ ජයග්‍රහණය සඳහා සමාධිය සකස් වෙන්නේ. සමාධිමත් සිතයි යහපත් අයහපත් දෙක ම විදර්ශනාවට ලක් කොට දෙන්නේ.

යමෙක් සීලය ශක්තිමත් කිරීමට උත්සුක වෙනවා නම්, යම් දවසක ඔහු සමාධිය එතුළින් මතුකොට ගන්නවා. යම් දවසක ඔබ සතර අපායෙන් මිදෙනවා කියන්නේ සීලය, ආර්යකාන්ත සීලය හැටියට ආරක්ෂා වෙනවාය කියන කාරණය යි. ආර්යකාන්ත සීලයට පැමිණි කෙනා සිල් පදයක් බිඳීම දකින්නේ පිරිසක් මැද නිර්වස්ත්‍රව සිටීමටත් අන්ත දෙයක් විදිහට යි. ඒ නිසා කැඩුණු සිල් පදය වහා නිවැරදි කරගන්නවා. වැරැද්ද දකිමින් නැවත නො බිඳෙන ආකාරයෙන් නිවැරදි වෙනවා. සතර අපායෙන් මිදුණ පිංවතා තුළින් සාමාන්‍ය කෙනෙකුට වඩා අර්ථවත් ආකාරයෙන් සිල් පද ආරක්ෂා වෙන්නේ, පාණාතිපාතා වේරමණී සිල් පදය ඔහුගෙන් අර්ථවත් වෙන්නේ, මම නැවත සතර අපායන්ට වැටී,

හරකෙක්, එළුවෙක්, කුකුළෙක්, මාළුවෙක් ලෙස මැරුම් කන්නේ, පීඩාවට ලක් වන්නේ නැහැ කියන අර්ථයෙන්; එම විශ්වාසයෙන්. රහතන් වහන්සේ නමකගෙන් මුසාවාදා වේරමණී සිල් පදය ආයාසයකින් තොරව ම ආරක්ෂා වෙන්නේ, මේ ලෝකයේ ලොකු ම බොරුව වන, 'ලෝකය සැප ය' කියන මුසාවාදය නො කියන, ලෝකය, පංච උපාදානස්කන්ධය දුකයි කියන අර්ථය ම ප්‍රකාශ කරන උත්තමයා හැටියට. රහතන් වහන්සේ තුළින් අදින්නාදානා වේරමණී සිල් පදය ආයාසයකින් තොරව ම ආරක්ෂා වෙන්නේ, අර්ථවත් වෙන්නේ මේ රූපය මට අයිති නැහැ, රූපය නිසා සකස් වෙන ඵස්ස, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ මගේ නො වෙන නිසා, හේතුඵල ධර්මයන්ගෙන් සකස් වුණ රූපයක්, ඇසක්, කනක් මගේ කියා අන්සතු දෙයක් මගේ කරගන්නේ නැහැ කියන ඉහළ ම අර්ථයකින්.

පිංවත් ඔබ හොඳින් හිතලා බලන්න, අපි සියලු දෙනා ම, මගේ කියලා අයිති කරගෙන සිටින, බැඳිලා සිටින, ඇස, කන, දිව, නාසය, මනස, කය ඔබේ ම නො වේ නේ ද? ඔබට අයිති නැති දෙයක් ඔබ අයිති කරගෙන සිටින්නේ. ඔබට අයිති නැති ඵස්ස, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ ධර්මයන් ඔබ ඔබේ කරගෙන සිටින්නේ. ඒක තමයි මේ ලෝකයේ තිබෙන බරපතළ ම සොරකම. මේ සොරකම නිසා නේ ද, ඔබට සංස්කාර හේතුවෙන් භවයට ඇඟෙන යන බරපතළ වැඩ සහිත, අත්හිටවූ සිරදඬුවම් නියම වෙන්නේ.

රහතන් වහන්සේ නමකගෙන් කාමේසු මිච්ඡාචාරා වේරමණී සිල් පදය ආරක්ෂා වෙන්නේ, කාමය තිබෙන්නේ රූපය තුළ නො වේ, රූපය කෙරෙහි සකස්කොට ගන්නා වූ තෘෂ්ණාව නිසා ය කියන කාරණය අවබෝධ කොටගෙන, අනිත්‍ය භාවයට පත් වෙන රූපය, රූපයේ ස්වභාවයෙන් තිබීමට ඉඩහැර, අනිත්‍ය වූ දෙයක් කෙරෙහි ඇති තෘෂ්ණාව තමා තුළින් ක්ෂය කිරීමෙන් ය.

රහතන් වහන්සේට ඇසක් ඇත. බාහිර රූපය අරමුණු වනු ඇත. එහෙත් තෘෂ්ණාව නැත. ඵස්සය සිදුවෙද්දී ම රහතන් වහන්සේ අනිත්‍ය දකිනු ඇත. සිල් පදවල ආශ්චර්යවත් අර්ථය, පිංවත් ඔබව ඔසවා තබන ලෝක ධාතුවේ උත්තරීතර අවබෝධයේ විජයග්‍රහණයන් ගැන භාවනාවට පෙර ඔබ මෙනෙහි කරන්න. එසේ මෙනෙහි කිරීමෙන් ඔබට අයිති ආජීව අෂ්ටමක ශීලය අර්ථවත්ව රැකගැනීමට යොමු වන්න. සිල් පදවල අර්ථයන්ට ඇති දුරස්භාවය දකිමින් එම දුරස්භාවය අහෝසි කරගැනීමට වීර්ය ගන්න.

පිංවත් ඔබ බිරිඳට, ස්වාමිපුරුෂයාට, දරුවන්ට, දේපළට ඇති බැඳීම, ඒවා ආරක්ෂා කරගැනීමට දරන වීර්යට වඩා ශක්තියක් සීලය ආරක්ෂාව උදෙසා යොමු කරන්න. ඔබත් එවැනි ආශ්චර්යවත් උත්තමයෙක් වෙනවාය කියන අධිෂ්ඨානය ඇති කරගන්න. අනිත්‍ය අකුසල් සංස්කාර, ඔබේ අයෝමය වීර්යයෙන් ශක්තිමත් කරගත් කුසල් ශක්තිය යොදාගනිමින් යටපත් කොට දමා, තෙරුවන් කෙරෙහි සද්ධාවෙන්, සීලයේ ශක්තියෙන් භාවනාව උදෙසා නැගී සිටින්න. ඔබ තුළ සකස් කොටගත් චේතනාව, විඤ්ඤාණයේ හැඩරුව සකස් කොට දෙන බව හොඳින් දකින්න. භික්ෂුව මේ සටහන් කරන්නේ තවත් කතාවක් නො ව, පිංවත් ඔබට භාවනාවට (පෙර) පූර්වකෘතියක් බව නුවණින් දකින්න.

අවබෝධය උදෙසා හුස්ම රැල්ල යොදාගන්න

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සතර සතිපට්ඨාන සූත්‍රයේ දී බොහොම නිරවුල්ව දේශනා කරනවා, භව දුකෙන් අත්මිදීම සඳහා සතර සතිපට්ඨාන ධර්මයන් ජීවිතයෙන් ප්‍රගුණ කළ යුතු ආකාරය.

මේ තරම් පැහැදිලි සම්මා සම්බුද්ධ දේශනාවක් තිබියදී අපට ඇසෙනවා, බාහිර ක්‍රමවේදයන් පිළිබඳ සමාජයේ යම් ප්‍රවණතාවක් තිබෙනවා. මේ හැම ක්‍රමවේදයක් තුළින් ම මනුෂ්‍යයා යම් සහනයක්, සැහැල්ලුවක් ජීවිතයට ලබනවා. ඒ ගැන කිසි ම සැකයක් නැහැ. නමුත් අපේ අරමුණ ජීවිතයට සැහැල්ලුව, සහනයක් නම් එය බුදුරජාණන් වහන්සේ තම ශ්‍රාවකයන්ගෙන් බලාපොරොත්තු වුණ ජීවිතයේ අර්ථය නෙමෙයි. මොකද, සැහැල්ලුවත්, සහනයත්, ජීවිතයත් කියන කාරණා අනිත්‍යභාවයට පත්වෙන නිසා. බුදුරජාණන් වහන්සේගේ ධර්මය හැමවිට ම ඉලක්ක වූයේ භව නිරෝධය දෙසට මය, අකුසල මූලයන් සිඳෙන දිශාවට ම ය. එම නිසා මේ ධර්ම මාර්ගයේ අවබෝධයක් ලබන්නට නම්, බුදුරජාණන් වහන්සේගෙන් ම යි පාර අසා දැනගන්න ඕනේ.

මේ ධර්ම මාර්ගයේ දී මුල් ම අවබෝධය වන සෝවාන් ඵලය සාක්ෂාත් කරගැනීමට නම් බුදුරජාණන් වහන්සේ කෙරෙහි අචල ශ්‍රද්ධාව, ධර්ම රත්නය, සංඝ රත්නය කෙරෙහි අචල ශ්‍රද්ධාවට පැමිණිය යුතු වෙනවා. මෙතනදි සංඝ රත්නය කෙරෙහි අචල

සද්ධාව කියන කාරණය හොඳින් සිහි තබාගතයුතු වෙනවා. සම්බුදු වචනයට පරිබාහිරව පිංවත් ඔබ නවීකරණය කරන ලද කමටහන් ක්‍රමවේදයක් භාවිතයට ගතහොත්, ඔබට මාර්ගය වැරදෙන්න පුළුවන්. මොකද, වැරදි මාර්ගයේ ගියොත් ශ්‍රද්ධාව සකස් වෙන්නේ බුදුරජාණන් වහන්සේ කෙරෙහි නෙමෙයි, වෙන වෙන තමන් ගරුකරන ගුරුවරුන්, භාවනා උපදේශක පිංවතුන් කෙරෙහියි. මෙතැන බොහොම අවාසනාවන්ත තැනක්. භික්ෂුව දකලා තිබෙනවා 'බුදුරජාණන් වහන්සේ' කියලා කියපුවහම සාධුකාර නොදෙන සමහර පිංවතුන් තමන් ගරුකරන ගිහි-පැවිදි ධර්ම ගුරුවරයෙකුගේ නමක් කියනකොට සාධුකාර දෙනවා. මෙතැනදි පිංවත් ගෞරවනීය ගුරුවරුන් දක්ෂ වෙන්න ඕනෙ, බුදුරජාණන් වහන්සේයි අප සියල්ලන්ගේ ම ශාස්තෘන් වහන්සේ. උන්වහන්සේයි සියල්ලට ම වඩා ශ්‍රේෂ්ඨ කියන කාරණයෙන් තම ශිෂ්‍යයින් දැනුවත් කරන්න. භාවනාව තුළ දී තණ්හා, මාන්න, දිට්ඨි සකස්වීම නිසා ම යි මෙවැනි මනෝභාවයන් ඇති වෙන්නේ.

භාවනා කරන සෑම පිංවතෙකු ම දිනපතා තමා ගැන ස්වයං පරීක්ෂණයක් කරන්න ඕනේ. යමෙක් තුළ සතර සතිපට්ඨාන ධර්මයන් වැඩෙනවා නම්, ඔහු තුළින් මාන්නය කියන කාරණය අඩුවෙන්න ඕනා. මාන්නය අඩුවෙන්න අඩුවෙන්න, නිහතමානී බවයි ඔබේ ජීවිතයට එකතුවෙන්න ඕනේ. මේ ස්වයං පරීක්ෂණය දිනපතා ඔබේ ජීවිතයට එකතු කරගන්න. එවිට ඔබ තුළින් ම ඔබට නිවැරදි වෙන්න පුළුවන්. සතර සතිපට්ඨාන භාවනාව ගැන අවධානය යොමුකරන ඔබ, ජීවිතයේ සෑම ක්‍රියාවක දී ම සතියෙන්, සිහියෙන් යුතුව ඉරියව් පවත්වන්න. කරන කටයුත්ත කුමක් වුව ද එම ඉරියව් කෙරෙහි අවධානය, සිහිය පවත්වාගන්න. පිංවත් ඔබ ඉඳගෙන සිටියත්, ඇවිදිමින් සිටියත්, නිදන්නට වැතිරුණත් බාහිර අරමුණුවලට සිත ඇදීයෑමට ඉඩ නො දී, තමන් කරන කාර්යට ම සිත යොමන්න. මෙතැන තමයි සිතේ සංසිඳීමේ මුල. මේ සංසිඳීම තුළයි, ඔබ භාවනාවට යොමුවෙන්න සූදානම් වෙන්න ඕනේ. දැන් ඔබට පුළුවන් ආශ්වාස, ප්‍රශ්වාස කෙරෙහි සිහිය පවත්වාගන්න. ආශ්වාසයෙන් කය පුරවාගන්න.

නැවත හිස් කරන්න. නැවත, නැවත එසේ ම සිදුකරන්න. කාය සංස්කාරයන්ගේ ඇතිවීම, නැතිවීම දකින්න. දැන් ඔබට පුළුවන් ආශ්වාසයේ දිගභාවය, කෙටිභාවය දකින්න. මේ සෑම ක්‍රියාවක දී ම අනිත්‍ය කියන කාරණය ඔබ දැකිය යුතු යි. පිංවත් ඔබ ගන්නා හුස්මපොදින් කය ජීවත්වන හැටිත්, එම හුස්මපොද නාසයෙන් පිටකරන මොහොතේ 'මේ කය මැරෙනවා' කියන කාරණය නුවණින් දකින්න. ඕක තමයි ජීවිතය.

අහස්මාලිගා ගොඩනගාගෙන ජීවත්වුණත්, ජීවිතයත් මරණයත් අතර තිබෙන කාල පරතරය මොන තරම් කෙටි ද යන්න, ආශ්වාස ප්‍රශ්වාසය තුළින් දකින්න. ඕනෑ ම කෙනෙක් මැරෙනවාය කියන්නේ, ඉහළට ගත්තා වූ හුස්මපොද නාසයෙන් පිටවුණාය කියන කාරණය යි. හුස්මරැල්ලක් ඉහළට ගන්නකොට, 'ජීවිතය' කියලා දකින්න. එම හුස්මරැල්ල නාසයෙන් පිටවෙනකොට මරණය මනසින් දකින්න. නැවත නැවතත් මෙසේ මෙනෙහි කරන්න. ජීවිතයත් මරණයත් අතර ඇති කෙටි භාවය දකින්න. ජීවත්වීමට ඇති තෘෂ්ණාව හේතුවෙන් කාය සංස්කාර සකස්වෙන හැටි දකින්න.

පිංවත් ඔබ මොහොතක් ආශ්වාස ප්‍රශ්වාස කිරීම නවතාගන්න. ශරීරය දෙස හොඳින් අරමුණු කරන්න. ඔබට දැනේවි, පපුව ප්‍රදේශය තදවන ස්වභාවය. ශරීරය පුපුරන්න එනවා වගේ ස්වභාවයක් සකස් වෙනවා. මේවා මරණයේ පෙරනිමිති බව මනසින් දකින්න. ඉතා කෙටි මොහොතක් පමණක් පිංවත් ඔබ මෙය සිදුකරන්න. නැවත පියවි ස්වභාවයට, ආශ්වාස ප්‍රශ්වාසයට එන්න. දැන් හොඳින් කය වායෝ ධාතුවෙන් පුරවාගන්න. ශරීරයට දැනෙන ආස්වාදය මෙනෙහි කරන්න. හුස්ම නො ගෙන සිටියදී ඇතිවූ මරණීය විඳීමත්, හුස්ම ශරීරයට පුරවාගනිද්දී ඇතිවූ ආස්වාදය විඳීමත් අනිත්‍ය බව ම දකින්න. මේ විඳීම් දෙක ම සකස් වූයේ හේතුධර්මයන් නිසා බව නුවණින් දකින්න. පිංවත් ඔබ කැමති කැමති ආකාරයට අවබෝධය උදෙසා ආශ්වාස ප්‍රශ්වාසය ප්‍රයෝජනයට ගන්න. ශරීරයත්, ආශ්වාස ප්‍රශ්වාස වායෝ ධාතුවත් වෙන්කොට දකින්න. ශරීරය ඔබට අයිති නැති

බවත්, වායෝ ධාතුව ද ඔබට අයිති නැති බවත් මනසින් දකින්න. කාය සංස්කාරයන්ගෙන් තොරව ශරීරය නො පවතින බව නුවණින් මෙනෙහි කරන්න. තමාගේ ජීවිතයට වගේ ම තමා වැඩියෙන් ම ආදරය කරන අයගේ ජීවිතවලටත්, තමා කැමති අකමැති සැමගේ ම ජීවිතවලට මෙය ගළපා දකින්න.

මෙසේ දකින්න,
පුද්ගල සංඥාවෙන් මිදෙන්න

මීළඟට පිංවතුනි, ආයතන වශයෙන් මේ කය වෙන්කර දකින්න පුළුවන්. කුමක් හේතුවෙන් ද ඇස, කන, නාසය, දිව, කය, මනස සකස් වුණේ? නාමරූප ධර්මයන් නිසා. කුමක් නිරෝධය කළොත් ද නාමරූප නිරෝධය සිද්ධවෙන්නේ? අවිද්‍යාව නිරෝධයෙන්, සංස්කාරයන්ගේ, විඤ්ඤාණයේ නිරෝධයෙන් නාමරූප නිරෝධය සිද්ධවෙනවා. නාමරූප නිරෝධය හේතුවෙනුයි සළායතන නිරෝධය සිද්ධවෙන්නේ.

අපි එක පාරට ම නාමරූප නිරෝධය සළායතන නිරෝධය කියල ගත්තොත් සමහරවිටක අපි භාවනාවේ දී රැවටෙන්න පුළුවන්. මොකද, සමාධි භාවනාවේ දී ඇලීම් ගැටීම්වලින් තොර උපේක්ෂාව කියන මට්ටමේ දී ඇස, කන, නාසය, දිව, කය, මනස සංසිඳිලා තිබෙන්නේ; යටපත් වෙලා තිබෙන්නේ; සළායතන නො දැනී ගොස් සියුම්ව ගොස් තිබෙන්නේ. මෙන්න මේ ස්වභාවයට සමහරෙක් රැවටෙනවා, සළායතන නිරෝධය කියලා. ඒ සමාධි ඵලයේ දී ඉන්ද්‍රියන් සංසිඳී ගියත් අවිද්‍යාව තුළයි තමා සිටින්නේ. මෙන්න මේ හේතුව නිසා පටිච්චසමුප්පාද ධර්මය මුල, මැද, අග වශයෙන්, පියවරෙන් පියවර දකින්න අවශ්‍යයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, ඇස නිරතුරුව මැරෙමින් උපදිනවාය කියලා. එසේ නම් ඇස උපදිනවාය කියන්නේ කුමක් ද? ඇස මැරෙනවාය කියලා කියන්නේ කුමක් ද? ඇස ඉපදෙනවාය කියල කියන්නේ, ඇසත්, බාහිර රූපයත්, විඤ්ඤාණයත් එස්සය වීම හේතුවෙන් චක්ඛු විඤ්ඤාණය සකස්

වුණාය කියන කාරණය යි. චක්ඛු විඤ්ඤාණය සකස්වුණ සැනින් ඔබ මොකද කරන්නේ? ඇසෙන් දුටු රූපය ගැන මනසින් සිතන්න පටන්ගන්නවා. ඒ කියන්නේ මනෝ විඤ්ඤාණය සකස්වුණාය කියන කාරණය යි. ඇසෙන් රූපයක් දකිනවිට චක්ඛු විඤ්ඤාණය සකස්වුණා. ඇසෙන් දැකපු රූපය ගැන සිතනවිට චක්ඛු විඤ්ඤාණය අනිත්‍ය වෙලා මනෝ විඤ්ඤාණය සකස්වෙනවා. මෙසේ හිතනවිට ඔබව මදුරුවෙක් කනවා. ඒ මොහොතේ කාය විඤ්ඤාණය සකස්වෙනවා. චක්ඛු විඤ්ඤාණය අනිත්‍ය වෙලා, මනෝ විඤ්ඤාණය අනිත්‍ය වෙලයි කාය විඤ්ඤාණය සකස්වුණේ. ඔබ හොඳින් දැනගත යුතුයි, මේ ආයතන හයෙන් කුමක් හෝ එක ආයතනයක් පමණයි, වරකට ඉපදිලා තිබෙන්නේ. සෑම විට ම ආයතන පහක් මැරිලයි තිබෙන්නේ. චක්ඛු විඤ්ඤාණයට මනෝ විඤ්ඤාණය කියලා කියන්නෙ නෑ. මනෝ විඤ්ඤාණයට කාය විඤ්ඤාණය කියන්නේ නැහැ. එකක් අනිත්‍ය වෙලයි අනෙක සකස් වෙන්නෙ. මෙන්න මේ ආකාරයට විඤ්ඤාණ ආයතන හය තුළින් ඉපදෙමින් මැරෙමින් ගලාගෙන යනවාය කියන්නේ ආයතනයක් ඉපදෙමින් මැරෙමින් පුද්ගලයාගේ ආයුෂ උණුසුම පහව ගොස් මැරෙන මොහොතේ, විඤ්ඤාණය චුති චිත්තය හැටියට මේ ශරීරයෙන් බැහැරව තවත් මව්කුසකට හෝ ඕපපාතික උපතකට හෝ බිත්තරයක් තුළට බැසගන්නවා.

ඉහත හේතූන් නිසා ම යි ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ, ඇස, කන....... නිරතුරුව ම මැරෙමින් ඉපදෙනවාය කියලා. එසේ නම්, පිංවතුන් මගේ කරගෙන තිබෙන්නේ නිරතුරුව ම මැරෙන, ඉපදෙන ඇසක්. ඉහත කරුණු අනුසාරයෙන් ඇසේ ඉපදීමත් මරණයත් නුවණින් මෙනෙහි කරන්න. ඔබ රූපයක් දෙස හොඳින් බලන්න. ඔබට දැනේවි, ඇස පමණයි ඉපදිලා තිබෙන්නේ, අනෙක් ආයතන මැරිලයි තිබෙන්නේ කියලා. දැන් එම රූපය ගැන ඔබ සිතන්න පටන් ගන්නවා. එවිට ඔබට හොඳින් දැනේවි, ඇස මැරුණා, මනසයි

ඉපදිලා තිබෙන්නේ කියලා. මෙන්න මේ ඉපදීමේ, මියයාමේ ක්‍රියාවලියේ වේගවත් භාවය හොඳින් නුවණින් මෙනෙහි කරන්න. ඇස මැරෙමින් ඉපදෙන මොහොතක් පාසා මැරෙමින් ඉපදෙන විඤ්ඤාණය ගැන සියුම්ව මනසින් දකින්න උත්සාහ ගන්න. ඇස පමණක් නො වේ, අනෙකුත් ආයතන ගැන ද මෙසේ මෙනෙහි කරන්න. නිරතුරුව ම මියයන, උපදින ඇස කෙරෙහි ඇති තෘෂ්ණාවෙන් මිදෙන්න.

මීළඟට ඔබ, ශරීරය කොටස් හයකට මනසින් වෙන්කර ගන්න. ඇස මනසින් උගුල්ලලා පැත්තකින් තබන්න. කන, නාසය, දිව, හෘදවස්තුව, ඉතිරි මස්, කටු, නහර ගොඩ එක ගොඩකට ගන්න. මනස යැයි හෘදවස්තුව අනුමානයට ගන්න. දැන් පිංවත් ඔබ ඉදිරියේ වෙන් වශයෙන් ගොඩවල් හයක් තිබෙනවා. මේ ගොඩවල් හය දකිද්දී, ඔබට ඔබේ රූපය ගැන සංඥාවක් තිබෙන්න බැහැ. මනෝමය සංඥාවකින් ඔබ මෙය දකින්න පුරුදු වෙන්න. ඒ තරමට ම ඔබේ සතිය, සිහිය එම මස්ගොඩවල් හය කෙරෙහි යොමුවෙන්න ඕනේ. පුද්ගල සංඥාවෙන් මිදී මස්, රුධිරය පිළිකුල් ය, දුගඳය කියන සංඥාවෙන් මේ ගොඩවල් දෙස බලන්න. මේවා ඔබට අයිති නැති දේවල් බව දකින්න. නිලමැස්සන් මේවා බුදින හැටි මනසින් දකින්න. කබරයින්, කිඹුලන් පැමිණ මේ මස් තලුමරමින් බුදින හැටි දකින්න. පිංවත් ඔබේ ඔය රම්‍ය, සුරම්‍ය, සුභ වශයෙන් ගත්තා වූ සිරුර, 'මම' කිඹුලකුගේ, කබරයෙකුගේ කුසේ, ආමාශයේ වමනයක් බවට පත්වෙන හැටි, අශුචි බවට පත්වෙන හැටි මනසින් දකින්න. පිංවත් ඔබේ ආයුෂ, වර්ණය, සැපය, බලය අනිත්‍ය වී කිඹුලාගේ ආයුෂ, වර්ණය, සැපය, බලය වැඩෙන හැටි දකින්න. කිඹුලාගේ ආමාශය තුළ ඔබේ රූපයට සිතින් මවාගෙන දකින්න. රූපය ඇති තෘෂ්ණාවෙන් මිදෙන්න.

පිංවත් ඔබ, නැවත ඉහත මස්ගොඩවල් හය මනසින් දකින්න. පිංවත් ඔබ, වඩාත් ම කැමති, ප්‍රිය කරන, ආදරය කරන අයගේ රූප එකිනෙක අරගෙන, එම හැම රූපයක ම ඇස මනසින් උගුල්ලලා ඇස් ගොඩට දමන්න. කන් මනසින් උගුල්ලලා කන් ගොඩට

දමන්න. අනෙකුත් ඉන්ද්‍රියන් ද ඒ ඒ ගොඩවල්වලට දමන්න. ඒ පුද්ගල සංඥාවලින් මිදෙන්න. මස් හැටියට දකින්න. පිළිකුළ, දුගඳ, ලේ හැටියට දකින්න. ඔබේ නිවසේ ජීවත්වන සියලු දෙනා ම, ඔබේ ගමේ ජීවත්වන සියලු දෙනා ම, නගරය, රට හැටියට සියලු දෙනාගේ ම ශරීර, මනසින් ඉන්ද්‍රියක් වශයෙන් වෙන්කර ගොඩවල් හයට දමන්න. තිරිසන් සතුන්ගේ ඇස් පවා ඇස් ගොඩට දමන්න. දැන් ඔබ ඉදිරියේ ඇස් කන්දක්, කන් කන්දක්..... ආදී වශයෙන් (මනස ලෙසින් හෘදවස්තුව ගත්විට) පිදුරුතලාගල කන්ද වැනි උසට ගොඩනැගුණු මස් කඳු හයක් තිබෙනවා නේ ද? සත්ව පුද්ගල සංඥාවන්ගෙන් මිදී නුවණින් දකින්න. මම හැටියට, මගේ ඥාතීන් හැටියට, ලෝකයා හැටියට පිංවත් ඔබට දැන් අරමුණු වන්නේ ඇස් ගොඩකි, කන් ගොඩකි, මස්ගොඩවල් හයකි. නැවත නැවත මනසින් ඇස් ගොඩ දෙස බලන්න. තිරිසන් සතාගේ ඇසත්, මනුෂ්‍යයාගේ ඇසත්, මසත් අතර වෙනසක් නැහැ නේ ද? මනුෂ්‍ය, තිරිසන් භේදයක්, ස්ත්‍රී, පුරුෂ භේදයක්, ජාති, ආගම් භේදයක් නැහැ නේ ද? කුණුවෙන, දියවෙන මස් ගොඩවල් හය දෙස නැවත නැවත මනසින් දකිමින් අවබෝධය ලබන්න. පිංවත් ඔබේ ඇසට නො පෙනුණත් ප්‍රේත, තිරිසන්, දිව්‍ය, බ්‍රහ්ම ජීවිතවල ද සළායතනවල ස්වභාවය ඉහත ආකාරය ම, නුවණින් දකින්න. නිරතුරුව ම භාවනා කරන ඔබ, පුද්ගල සංඥාවෙන් මිදී ලෝකය ඇස් ගොඩක්, කන් ගොඩක් වශයෙන් දකින්න උත්සාහ ගන්න. එය රූපය කෙරෙහි ඇති ඡන්ද රාගය, ආත්ම දිට්ඨිය නැති කරගැනීමට මහෝපකාරී වේවි.

ඉහතින් සඳහන් කළා, මනස යනුවෙන් එක ගොඩකට හෘදවස්තුව ගන්න කියලා මෙතනදී ඔබ විතර්කයක් සකස් කරගන්න එපා. මනස කියන්නේ හෘදවස්තුවට ද, මොළයට ද, රුධිරයට ද, එසේත් නැතිනම් කුමක් ද කියන කාරණය ඒ විතර්කය සකස් කළ සිත අනිත්‍ය ය යි කියලා දැකලා මනස කියන ගොඩට හෘදවස්තුව දමන්න.

ඔබ දෙපය තබාගෙන සිටින්නේ, ඔබේ ම යැයි සිතූ ශරීර මත ම නො වේ ද?

දෙතිස් කුණුපය හැටියට ශරීරය කොටස් තිස්දෙකකට ගොඩවල් ගසා වෙන්කර දකින්න පුළුවන්. ඒ වගේ ම සතරමහා ධාතූන් වශයෙන් වෙන්කර දකින්න පුළුවන්. ශරීරයේ තද ස්වභාවයේ ඇති කොටස් වෙනමත්, ද්‍රව ස්වභාවයේ ඇති කොටස් වෙනමත්, මේ කොටස් දෙක තුළින් ම වායු ස්වභාවයත්, උණුසුම් ස්වභාවයත් දකින්න පුළුවන්. ඉහත ආකාරයට කමටහන් වඩන පිංවතා, පිංවතිය නිරතුරුව ම උත්සාහගන්න ඕනේ, පුද්ගල සංඥාවෙන් මිදිලා, මුලින් සඳහන් කළ මස්ගොඩවල් හැටියට ඔබව වගේ ම ලෝකයාවත් දකින්න.

ඔබට රූපයක් මුණගැහෙනවිට ම සහ සිතට නැගෙනවිට ම රූප සංඥාව මගහැරලා ඉහත ගොඩවල් හය හැටියට දකින්න, සුළුවෙන් හෝ උත්සාහ ගන්න. පසුතැවෙන්න එපා, බැහැ ය කියලා. උදම් අනන්නත් එපා, පුළුවන් ය කියලා. මේ කාරණා දෙකේ දී ම සකස් වෙන්නේ දුකට හේතුවන තෘෂ්ණාව යි. මේ සටහන කියවලා ඔබට සිතුණොත් මෙහි ජීවිතයට ගත හැකි යමක් තිබෙනවා ය කියලා, එක සිතුවිල්ලක් ඇතිකරගන්න. ඒ සිතුවිල්ලම ඇති, ඔබ අදක්ෂයින්ගෙන් පිරි ලොවක දක්ෂයෙක් ය කියන කාරණය හඳුනාගන්න. මොකද, මේ බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළ මාර්ගය නිසා. ඒ ශක්තිය ජීවිතයට එකතු කරගන්න. ඒ ශක්තිය එසේමෙසේ ශක්තියක් නො වේ. බුදුරජාණන් වහන්සේගේ ම ශක්තිය යි.

දැන් පිංවතුන්ලා සතරමහා ධාතූන් හැටියට මේ කය දකින්න. මෙතන දී ඔබ, ශරීරය මස්, බොකු, බඩවැල් ආදී තද ස්වභාවයේ අවයව එක ගොඩකට දමන්න. වායෝ ධාතුවත්, තේජෝ ධාතුවත්, පඨවි, ආපෝ ගොඩවල් දෙක තුළින් ම දකින්න. ඉහත ගොඩවල් ඔබ මනසින් දකිනවිට, ඔබේ පුද්ගල සංඥාව යටපත් වෙන්න ඕනේ. ඔබ විසින් ගොඩනගාගත් පඨවි, ආපෝ ගොඩවල් දෙකට, ඉකුත් සළායතන කමටහන්වල දී සඳහන් කළ පරිදි ඔබගේ නිවසේ, ගමේ, නගරයේ, රටේ, ලෝකයේ සෑම මනුෂ්‍යයෙකුගේ ම රූපයත් යොමුකරගන්න. මස් කන්දක් ලෙසත්, ද්‍රවගොඩක් ලෙසත්, එයට මැදිවූ වායෝ, තේජෝ ස්වභාවයන් වශයෙන් ලෝකය දකින්න. තිරිසන් සතුන් ද මනසින් කොටස් කර, ඉහත ගොඩවලට දමන්න. මනුෂ්‍යයාගේ රූපයත්, තිරිසන් සතාගේ රූපයත් එක ම ස්වභාවයේ වැගිරෙන, කුණුවෙන, දුගඳ හමන ස්වභාවයට අයිති බව දකින්න. මේ මස්ගොඩ, ද්‍රවගොඩ කුණුවී, දියවී මහ පොළවට පස්වන හැටි නුවණින් දකින්න. එම පස්වලින් ගහකොළ පෝෂණය වන හැටි නුවණින් දකින්න. දුගඳ හමන වායෝ ධාතුව සුළඟ සමඟ මුසුවී වායුගෝලයට මුසුවන හැටි දකින්න. මස් කුණුවී යනකොට එයින් නැගෙන උණුසුමින් පොළොව රත්වන හැටි මනසින් දකින්න. මහ පොළොවේ පසත්, ජලයත්, සුළඟත් පිංවත් ඔබේ ශරීරයට ගළපා බලන්න; සසඳා බලන්න. රූපයේ අනිත්‍යභාවය නුවණින් දකින්න. රූපයට ඇති ඡන්ද රාගයෙන් මිදෙන්න. ඔබ දෙපා තබාගෙන සිටින මහ පොළොව, සත්වයාගේ ම සතර මහා ධාතුවේ 'රූපයේ' අනිත්‍යභාවය තුළින් ම සකස් වී ඇති බව මෙන් ම එය නැවත නැවත අනිත්‍ය වන හැටිත් දකින්න. පිංවත් ඔබේ ශරීරය පස හැටියට, ගංගාවල ජලය හැටියට, සුළං රැල්ලක් හැටියට දකින්න දක්ෂ වෙන්න. ආධ්‍යාත්මික රූපයේ දී ද, බාහිර රූපයේ දී ද, සතරමහා ධාතුවේ අර්ථය අනිත්‍ය ම බව මනසින් දකින්න.

සතරමහා ධාතූන්ගෙන් තොර ලෝකයක් ඔබට කොතැනකදීවත් හමුවෙන්නේ නැහැ. පස ගත්තත්, ගින්දර, සුළඟ, ඉර, හඳ, තාරකා ගත්තත් මේ සෑම දෙයක් ම සතරමහා

ධාතුන්ගෙන්මයි හැදිලා තිබෙන්නේ. පිංවත් ඔබ ඉදිරියේ තිබෙන හිස් අවකාශය ගත්තත්, ඒ හිස් අවකාශය තුළ සතරමහා ධාතුවක්මයි තිබෙන්නේ. නමුත් පඨවිය එතැනදී ඉතා ම සියුම්. එම නිසා භාවනා කරන පිංවතා කොතැනකදීවත් සුබ ය, හිස් ය කියන අර්ථයෙන් රූපය දකින්න යන්න එපා. එය ඔබගේ අවබෝධයට බාධාවක් වෙනවා. සුබ ය හෝ හිස් ය කියලා ගන්න තැනක් ලෝකය තුළ, රූප ධර්මයන් තුළ නැහැ. නමුත් චතුරාර්ය සත්‍යය අවබෝධ කරගත් රහතන් වහන්සේට පමණක්, තම අවබෝධ ඥානයෙන් ලෝකය නාමරූප ධර්මයන් ශුන්‍යකොට, හිස්කොට දකින්න පුළුවන්. උන්වහන්සේ එසේ දකින්නේ සතරමහා ධාතුව විනිවිද ගිය, අවබෝධ ඥානයෙන් අභිබවා ගිය අනිත්‍ය ඥාන දර්ශනයක් තුළින් රූපය අවබෝධකර ඇති නිසා.

රහතන් වහන්සේට පුළුවන්කම තිබෙනවා, මුළු ලෝක ධාතුව ම නිෂේධ කර දකින්න. නමුත් එම දේ පිංවත් ඔබ කරන්න යන්න එපා. එහෙම කරන්න ගියොත් වැරදෙනවා; පැටලෙනවා. මොකද, ඔබ තව ම රූපය, සතරමහා ධාතුවේ අනිත්‍ය, අවබෝධ ඥානයෙන් ඥාන දර්ශන ඔස්සේ අවබෝධකර නොමැති නිසා. එම නිසා පිංවත් ඔබ, ලෝකය හිස් ය, ශුන්‍ය ය කියන කාරණයෙන් බැහැරව සෑම අවකාශයක් ම, රූපයක් ම සතරමහා ධාතුව වශයෙන් දකින්න. සතර මහා ධාතුව නිරතුරුව ම අතිප්‍රවේගයකින් වෙනස්වන අනිත්‍ය ස්වභාවය දකින්න උත්සාහ ගන්න.

මරණය එන තුරු නො සිට මරණය දකින්න

පිංවත් ඔබ, කුමන වයසක පසුවුව ද සමාධිමත් මනසින් සංහිඳීමට පත් වුණාවූ සිතෙන් තම අතීතයට යන්න. ඒ කියන්නේ, ඔබ වැඩුණ මව්කුසට. පිංවත් මෑණියන්ගේ මවුකුසේ නව මාසයක් ඔබ ලැබූ අත්දැකීම් මනසින් දකින්න. මෑණියන්ගේ උදරයේ මස්, ඇට, බොකු, බඩවැල්වලට මැදිවී, බැලුම් බෝලයක් වන් ගර්භාෂ කුටියක වකුටු වී සිටි ආකාරය සිහියට නගාගන්න. ලේ, සැරව තැවරුණ මොළකැටි රූපය මනසින් දකින්න. එතනින් නො නැවතී අතීත ජීවිතවල එළදෙනුන්ගේ, ඊරියන්ගේ, එළිච්චියන්ගේ, ඇතින්නන්ගේ, වැඳිරියන්ගේ මව්කුසවල ඔබ හැදීවැඩුණු හැටි සිහිකරන්න. ප්‍රේතියන්ගේ කුසේ පිළිසිඳගෙන ප්‍රේත දරුවන් ලෙස බිහිවුණ හැටි සිහිකරන්න. පිංවත් ඔබ වැඳිරියක් වෙලා, මෙය ලියන භික්ෂුව එම වැඳිරියගේ පැටවා වෙලා ඔබේ බඩේ එල්ලිලා, ගහෙන් ගහට පැනපු හැටි මනසින් දකින්න. ඔබ කිකිළියක් වෙලා, මෙය ලියන භික්ෂුව කිකිළි පැටවා වෙලා, ඔබ කැවූ පණුවන් ගණන ගැන සිහිකරන්න. දැන් නැවතත් පිංවත් ඔබ මෑණියන්ගේ මව්කුස අරමුණට ගන්න. ප්‍රසූතිකාගාරයක් තුළ දී ඔබ බිහිවුණ හැටි, ඔබ උපන් මොහොතේ ම එහි හෙද නිලධාරිණිය ඔබව දෙපයෙන් ඔසවාගෙන සිටිනවා මනසින් දකින්න.

මෙතැන් පටන්, ඔබේ ළමා, තරුණ, මධ්‍යම කාලය ගෙවුණ හැටි, මේ ශරීරය ජරා, ව්‍යාධි, මරණවලට පත් වූ ආකාරය මනසින් දකින්න. මනසින් ඔබ අංශභාග රෝගියෙක් වෙන්න. අනුන්ගේ

පිළිසරණක් නොමැතිව, මළමුත්‍රාගොඩේ රෝගීව දුක්විඳින හැටි මනසින් දකින්න. ඔබ රෝහලේ ඇඳක් මත නාසයට, මුඛයට, මුත්‍රාමාර්ගයට බට සවිකර ගෙන, මරණාසන්නව දුක්විඳින හැටි දකින්න. ඔබේ වයස ප්‍රශ්නයක් නැහැ. තරුණ පිංවතෙක් වුවත් ඊළඟ මොහොතේ මෙසේ විය හැකි යැයි මෙනෙහි කරන්න.

රූපය පිළිබඳ අවබෝධයෙන් ම කලකිරෙන්න.

පිංවත් ඔබේ ශරීරයේ ආයුෂ, උණුසුම, විඤ්ඤාණය පහව ගොස් මියයනවා දකින්න. ඔබේ දේහය මල්ශාලාවේ එම්බාම් කරනවා මනසින් දකින්න. තමාට හිමිව තිබූ හොඳ ම සුදු කමිසයත් කළු කලිසමත්, එසේත් නැතිනම් මඟුල් ඇඳුම් කට්ටලය අන්දවා, නිවසේ සාලය මැද සුදුවියනක් යට, කැටයම් කරන ලද පෙට්ටියක තමාගේ ම දේහය තිබෙනවා මනසින් දකින්න. ඥාතීන් හඬාවැටෙන අයුරු, මිතුරන් ගුණකථන පවත්වන අයුරු, ස්වාමීන් වහන්සේලා පාංශුකූලය දෙන අයුරු මනසින් දකින්න. දේහය කරමත තබාගෙන, විලාප තබමින් සුසාන භූමියට රැගෙන යන හැටි දකින්න. දර සෑයක් මත දේහය තබා ගිනිදල්වනවා දකින්න. ඔබේ මේ ශරීරය ගින්දරක් කොට දකින්න; තෙල් ගොඩක් කර දකින්න; දුමක්, අළුගොඩක් කොට දකින්න. එසේත් නොමැති නම්, ඔබේ මළසිරුර සුසාන භූමියේ දමා තිබෙනවා දකින්න. කුණුවෙන, වැගිරෙන මසත්, ඒ මස තලුමරමින් බුදින බලුකපුටු, කබර වැනි සතුන් මනසින් දකින්න. පිංවත් ඔබේ ඇස, කණ, තවත් තිරිසන් සතෙකුගේ ආයුෂ, වර්ණය, සැපය, බලය පිණිස හේතුවෙන හැටි දකින්න. ඔබේ ඇස බල්ලෙකු විසින් ගිලදමනවා දකින්න. ඔබේ ඇසත් බල්ලෙකුගේ අශූචිත් අතර ඇත්තේ රූපය අනිත්‍යභාවයට පත්වෙන වේගය පමණක් ම බව දකින්න. ජීවමාන ඇසේ සුන්දරත්වයත්, බලු අශූචියේ දුගඳත් යන දෙක ම සකස් කළේ ඵස්සය කෙරෙහි ඇති තෘෂ්ණාව විසින් බව දකින්න.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය තුළ සිටිමින් ඔබ කැමති කැමති ආකාරයට රූපයේ අනිත්‍ය සංඥාවන්

මතුවන දිශාවට මෙනෙහි කරන්න. නිත්‍ය යැයි කියන සංඥාවට අසුභයෙන්, මරණානුස්සතියෙන් වැට බඳින්න.

පිංවත් ඔබ, නින්දට යන සෑම රාත්‍රියක ම හෙට උදෑසන වනවිට මා මියයාවි ය කියන අදහසින් නින්දට යන්න. ඔබ උදෑසන සුව සේ නින්දෙන් ඇහැරුණොත් ප්‍රබෝධයෙන්, වීර්යෙන් යුතුව ඔබේ වගකීම්, යුතුකම් ඉටුකරන්න.

මීළඟට පිංවත් ඔබ, නැවත ආයුෂ, උණුසුම, විඤ්ඤාණය පහව ගොස් මැරුණාය කියන අවස්ථාවට සිත යොමුකරන්න. ඔබ මැරෙන මොහොතේ සතර අපායෙන් මිදී නො සිටියා නම් සංස්කාර හේතුවෙන් ඊළඟට සකස්වන උපත නිරයේ තිරිසන් සතෙකුගේ, ප්‍රේතයෙකුගේ, අසුරයෙකුගේ මිථ්‍යාදෘෂ්ටික මව්කුසක පිළිසිඳගන්නවා මනසින් දකින්න. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ප්‍රමාදීභාවය යනුවෙන් දේශනා කරන්නේ, උදේ ම නැගිටින්න, කාර්යාලයට යන්න, පාසලට යන්න..... ප්‍රමාද වෙනවය කියන කාරණය නො වේ. මේවා මොන ප්‍රමාදයන් ද? මෙම ප්‍රමාදයන් ගැන දේශනා කරන්න, සාරාසංඛ්‍ය කල්පලක්ෂ ගණනක් පෙරුම්පුරා බෝධිසත්වයන් වහන්සේ නමක් සම්මා සම්බුද්ධත්වයට පත්වෙන්න අවශ්‍ය ද? ඔය ටික පාසලක පිංවත් ගුරුවරයෙකුට කියලා දෙන්න පුළුවන් ඔබට. ප්‍රමාදීභාවය කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ සත්වයා සතර අපායට වැටිලා, කල්ප ගණන් ප්‍රමාදවීම සම්බන්ධව යි.

පිංවත් ඔබේ ඇසට පෙනෙන සෑම තිරිසන් සත්වයෙක් ම පෙර ජීවිතයක මනුෂ්‍යයෙක්. ලැබූ මනුෂ්‍ය ජීවිතයේ දී සිල්පදයක් ආරක්ෂා කරගත්තේ නැහැ; සිල්පදයක වටිනාකමක් දැක්කේ නැහැ; දන් දුන්නේ නැහැ; සද්ධර්ම ශ්‍රවණය කළේ නැහැ; කල්‍යාණමිත්‍ර ආශ්‍රයක් නැහැ. ජීවිතය ආස්වාදයක් ම කරගත්තා. බිරිඳ, දරුවන්, දූනුම, දේපළ...මේවා මත්තෙමයි ජීවත් වුනේ. නොවටිනා දේවල්, වටිනා දේ ලෙසින් ගත්තා. වටිනා දේ නොවටිනා දේ ලෙසින් ගත්තා. කල්‍යාණමිත්‍ර ආශ්‍රය තිබුණේ නැහැ. හිටිය

යාළුවොත් වර්ණනා කළේ, ගුණ කීවේ සාදය ම යි; බෝතලය ම යි; විනෝද ගමන් ම යි; තෙරුවන්ගේ වටිනාකම ගැන කියන්න කෙනෙක් හිටියේ නැහැ. දානයේ, සීලයේ වටිනාකම ගැන කියන්න කෙනෙක් හිටියේ නැහැ. මැරෙන බව හිතුවේ නැහැ. මැරිලා නැවත ඉපදෙනවා ය කියලා හිතුවේ නැහැ. මැරෙන බව දැනගත්තේ මැරෙන්න යන වේලාවෙයි. මැරෙන වෙලාවෙදි පිනක් සිතේ මතුවුණේ නැහැ. නොවටිනා දේවල් තමයි, සිතේ මතුවුණේ. ගැටෙන සිතෙන් මැරිලා, සතර අපායේ නොවටිනා ජීවිතයක් ලබනවා. බුදුරජාණන් වහන්සේ නමක් මේ මොහොතේ ජීවමානව වැඩ සිටියත්, තිරිසන් සතෙකුට, ප්‍රේතයෙකුට ඉන් ඵලයක් නැහැ. මොවුන් තෙරුවන් හඳුනන්නේ නැහැ. ඒ කියන්නේ, කල්ප ගණන් ප්‍රමාදභාවයට පත්වුණා ය කියන කාරණය යි. එම නිසා, ජාති, ආගම් භේදයකින් තොරව, සැබෑ ම ප්‍රමාදභාවය කියන කාරණය, පිංවත් ඔබ හොඳින් දැනගත යුතු යි. මොකද, දානයට, සීලයට, භාවනාවට අප්‍රමාදී පිංවතා ම යි, ලෝකයේ සැප ලබන්නේ. එම නිසා ප්‍රමාදීභාවයේ දුක දෙස විදර්ශනා නුවණින් බලා, පිංවත් ඔබ අප්‍රමාදී වෙන්න.

ධර්මය සරල පිළිතුරක් - එහි කොහිද ගැඹුරක්

බුදුරජාණන් වහන්සේ සොයාගෙන ධර්ම පිපාසයෙන් පැමිණි කිසිවෙකුටත් උන්වහන්සේ කටුසටහන්, මුද්‍රිත පොත් දුන්නේ නැහැ; ආනන්ද ස්වාමීන් වහන්සේ හමුවී වැඩිවිස්තර දැනගන්න යැයි කීවේ නැහැ; සාරිපුත්ත මහරහතන් වහන්සේගේ භාවනා පන්තියට යන්න කීවේ නැහැ. බුදුරජාණන් වහන්සේ දේශනා කළේ, "මහණෙනි, මේ ඇස අනිත්‍ය යි. ඇස අනිත්‍ය නම් ඇස නිසා සකස්වෙන ඵස්ස, වේදනා, සංස්කාර, විඤ්ඤාණ ධර්මයනුත් අනිත්‍ය යි" කියලා. බුදුරජාණන් වහන්සේ බාහිය දාරුචියට දේශනා කළේ, "බාහිය, දුටු දෙය දුටු බව පමණක් සිතන්න. ඇසුණ දෙය ඇසුණ බව පමණක් සිතන්න. සිත, සිතක් පමණක් බව සිතන්න" කියලයි. මෙහි අර්ථය ඵස්සය කෙරෙහි නො ඇලෙන්න කියන කාරණයයි. ඵස්සය අනිත්‍ය වශයෙන් දැකීමේ දී විඳීමක් සකස් වෙන්නේ නැහැ. සරල කමටහනකින් රහතන් වහන්සේ නමක් බිහිවුණා.

ගිහි පිංවතුන්ලාට මීට අමතරව දානයේ, සීලයේ වටිනාකම දේශනා කළා. මේ කොයි දේශනය තුළත් තිබුණේ සරල බව යි. ගැඹුර කියන්නේ කෙලෙස් කියන කාරණය යි. කෙලෙස්වලින් මිදෙන්න මිදෙන්න, ධර්මයේ ස්වභාවයට ම පැමිණෙනවා. යමෙක් ධර්මය ගැඹුරු ආකාරයෙන් දකින්න යනවා නම්, ඒ ඔහු තුළ කෙලෙස් වැඩෙනවා ය කියන කාරණයයි සිද්ධවෙන්නේ. ජීවිතයේ ගැඹුරු බව දකලා කලකිරීමෙන් භාවනා කිරීමට එන පිංවතාට භාවනාවේ ගැඹුරු බව කියන්න ගියොත් ඔහුට ජීවිතයත් එපා වෙන්න පුළුවන්.

ජීවිතයේ ගැඹුර අඩුකරන "භාෂාව" තමයි, විදර්ශනා භාවනාව. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කළ සරල ආකාරයෙන් ම ඔබේ ජීවිතයට ධර්මය ගළපාගන්න. බුදුරජාණන් වහන්සේ දේශනා කළ සතර සතිපට්ඨාන ධර්මයන් ඔබ සරල කමටහනක් කරගන්න. ජීවිතයේ ගැඹුර, භාවනාවේ සරල භාවයෙන් පුරවාගන්න. ජීවිතය නොගැඹුරු කරගන්න. නාමරූප ධර්මයන්ට ඒවායේ ස්වභාවයෙන් පවතින්නට ඉඩහරින්න. පිංවත් ඔබ, නාමරූප ධර්මයන්ගේ සැබෑ ම අනිත්‍ය ස්වභාවය විදර්ශනාවෙන් දකිමින් ජීවත්වෙන්න. මම තුළින් ම 'මම' නිරෝධය කරන මාර්ගයට එන්න. ධර්මය යනු ගැඹුරක්, දිගක්, පළලක්, සුවයක්, වින්දනයක් නො ව අනිත්‍ය ම බවත්, අනිත්‍ය ඔබෙන් වසන් කරන්නේ තෘෂ්ණාව විසින් බවත් හඳුනාගන්න. බුදුරජාණන් වහන්සේ දේශනාකර වදාළ සතර සතිපට්ඨාන සූත්‍රය, ආනාපානසති සූත්‍රය දෙස බලන්න. මේවා තුළින් අපට කියාදෙන්නේ ගොරෝසු ආශ්වාස ප්‍රශ්වාසය සියුම් කරන ස්වභාවය, ගොරෝසු කයේ ඝන සංඥාව සියුම් කරන ස්වභාවය යි. මේ සෑම දෙයක ම තිබෙන්නේ ගොරෝසු දෙය සියුම් කර දකින වැඩපිළිවෙළයි. මේ සියුම් භාවය යටපත් කරන්නේ පංචනීවරණ විසින්. පංචනීවරණ යටපත් කරදැමීම උදෙසා සීලයේ පරිපූර්ණ භාවයත්, ඒ තුළින් ම සමාධිමත් භාවයත් සකස්කරගෙන, පිංවත් ඔබ අර්ථවත් මනුෂ්‍යයෙක් වන්න. ධර්මය තුළට එන්න.

ඔබට ලස්සන රූපයක් අරමුණු වෙනවා. රූපය කියන්නේ අනිත්‍ය දෙයක්. නමුත් ඔබ එම රූපය තෘෂ්ණාවෙන් ගන්නවා. මේ හේතුවෙන් සංස්කාර රැස්වෙනවා. ඒ ඔබ අත්දකින්නේ අධර්මය යි. ඔබට ලස්සන රූපයක් අරමුණු වෙනවා නම් ඔබ එය අනිත්‍ය වශයෙන් මෙනෙහි කරනවා. ඔබ තුළ එම රූපයට තෘෂ්ණාවක් සකස් වෙන්නේ නැහැ. ඒ නිසා ම සංස්කාරයන් රැස්වීමක් නැහැ. මේ ඔබ අත්දකින්නේ ධර්මය යි. ධර්මයත් අධර්මයත් අතර තිබෙන වෙනස පිංවත් ඔබ ම අත්දැකීමෙන් හඳුනාගන්න. එවිට ඔබට දැනේවි, බුදුරජාණන් වහන්සේ ධර්මය මොන තරම් සරලකර අපට දේශනාකර තිබෙනවා ද කියලා.

පිංවත් ඔබ ඉදිරියෙන් සිටින සෑම මනුෂ්‍යයෙක් ම ඔබේ ගුරුවරයෙක් කරගන්න. ඒ සෑම කෙනෙක් ම ඔබට යමක් උගන්නනවා. ඔබ ඒ දෙය හොඳින් ඉගෙනගන්න. මොනවා ද ඒ අය උගන්වන්නේ? ඔහු නරකයි, ඔහු හොඳයි, සත්පුරුෂයි, ඔහු අසත්පුරුෂයි, චපලයි, ගුණමකුයි. එයා මෛත්‍රී සහගතයි, එයා කරුණාවන්තයි, එයා අධාර්මිකයි, අරකෙනා ධාර්මිකයි..... අවසානයේ කුමක් ද මේ සියල්ලන් ම ඔබට උගන්වලා තිබෙන්නේ, අනිත්‍යයි කියන කාරණ යි.

ජීවිතය ආපස්සට හැරිල බලනවිට භික්ෂුවට පෙනෙන්නේ, මේ අනිත්‍ය වූ පාඩම කියාදුන් සමාජය යි. පිංවත් ඔබ තුළ ම, ඔබ අසල ම ධර්මය තිබේ. හොඳින් බලන්න, හොඳින් අසන්න. එය ඔබට මුණගැසේවි. භික්ෂුවක් හැටියට අපි පැවිදිවුණේ "දායක පිරිස් අපේ ළඟට සිව්පසය ගෙනත් පූජාකරාවි, ඒ අය ගරුසම්මාන දක්වාවි, වඳීවි, පුදාවි" කියල නො වේ. අප අත්විඳින දුක දැකලා, ඒ දුකෙන් මිදෙන්න කියන බලාපොරොත්තුවෙන්. බුදුරජාණන් වහන්සේ තුන්සිවුරත්, පාත්‍රයත් පමණක් අපේ අතට දෙන්නේ, අපට ඉන්න ඕන සැබෑ සීමාව තුළ අපව රඳවන්න යි. ඉන් එහාට යන්න යන්න, අපි ධර්මාවබෝධයෙන් දුරස්වෙනවා. භාවනා කරන ගිහි පැවිදි අපි කාටත් බුදුරජාණන් වහන්සේගේ ඉහත කමටහන හුඟාක් වැදගත් වෙනවා. මේ ධර්ම මාර්ගයේ ගමන් කිරීමේ දී ඔබව විකුණන්න පුළුවන්. ඔබව විකිණෙන්නත් පුළුවන්. හුඟාක් පරිස්සමෙන්....! රූපය මාරයා හැටියට, රූපය ඇසුරින් සකස්වෙන පංච උපාදානස්කන්ධය මාරයා හැටියටත් දකින්න. බුදුරජාණන් වහන්සේ කියලා දෙන ඉහත කමටහනත් ඔබට ගොඩාක් වටිනවා. ඉහත සටහන භාවනාව ගැනයි සඳහන් කළේ.

මේ කාරණා ටික සඳහන් කරන්නේ භාවනා නො කරන පිංවතුන්ලාට යි. ඔබ භාවනා නො කරනවා කියලා කොයිම අවස්ථාවකවත් දුක්වෙන්න එපා. දුක කියන්නේ ගැටීම කියන අකුසලය යි. එම නිසා පිංවත් ඔබත් තෙරුවන් කෙරෙහි

සද්ධාවෙන් දානය, සීලය තුළ හොඳින් හික්මෙන්න. එයත් විදර්ශනා භාවනාවට දොර කවුළු විවර කරදෙන උතුම් ම භාවනාවක් ම යි. සෑම විට ම ඔබ ඉන්නා තැන ගැන සතුටුවෙන්න. පියවරක් හෝ ඉදිරියට තබනවා යැයි වීර්ය සකස් කරගන්න. මේ මොහොතේ මේ පිංබිමේ උපත ලැබූ ඔබ සැබෑ ම දක්ෂයින් බව සිතන්න.

ගෝරතර සසරේ
තවත් එක් සන්ධියක
ඉබාගාතේ ඇවිදි
සංසාර සතුන් හට
නොඇලෙන්න කියාදුන්
නොගැටෙන්න සිහිය දුන්
අතහරින සතිය දුන්
නිදුකානගේම පුත්
සඟ මැණික ඔබම විය

කරගන්න මහ කුසල්
බෙදා ලොවටම දහම
ඔබේ අවබෝධයෙන්
සැනසීය මනු කැලක්
එමතු නොව දෙවියෝද
එයින් තුටු වනු දනිමි

සාරිපුත් පරපුරේ
අපේ කාලේ උපන්
මහකසුප් මහතෙරගෙ
එමඟ යන බුදු පුතුනි
එක්කෝ මරණයය
නොමැතිනම් නිවනමය
කියා කළ සිහ නාද
තව කොහෙන් අසන්නද

ඔබේ දම් ගැලපුමට
නොතිත් පැසසුම් එතැයි
කියූ කල මා ඔබට
පුතේ මේ මගෙ නොවෙයි
බුදුරජුන් දහමමය
නිහතමානීව කිවු
ඒ වදන් රාවදෙයි

කොහේ හෝ වන පෙතක
මේ මොහොතෙ වැඩ සිටින
අපේ පිනටම උපන්
හිමියනේ ඔබෙ ගුණෙන්
දකිමු අපි බුදු රජුන්

ඒ අමා මැණියන්
සහස් දෙකකුත් අඩක්
ගෙවී වස් ගතවෙතත්
වදයි ඔබ වැනි පුතුන්
ලෝ සතට සෙනෙහසින්

ISBN 978-955-7887-17-3
9 789557 887173
මුද්‍රණය: ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්

මිල රු. 155/-